**2025 සැප්තැම්බර් මස 09 වන දින පෙරවරු 9.30 ට**
**මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදි පවත්වන ලද**
**මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව**

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |

| | | | |
|---|---|---|---|
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 48. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 49. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 50. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 51. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.එල්. තිලිනි නෙත්සරණී මෙනවිය |

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්.කේ.ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2025.09.09 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, පසුගිය දිනක තංගල්ල නගර සභාවේ ලේකම්තුමා ඇතුළු ඒ කාර්යය මණ්ඩලයේ සේවකයින්, පවුල් වල අය ඇල්ල ප්‍රදේශයේදී සිදු වූ හදිසි බස් රථ අනතුරින් දිවි අහිමි වූවන් පිළිබඳව ශෝකය පළ කිරීම වෙනුවෙන් විනාඩි දෙකක නිශ්ශබ්දතාවයක් පවත්වමු.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

2025.08.12 දින පැවති මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2025.08.12 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු යැයි යෝජනා කර සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මහා සභා රැස්වීම් වාර්තාවේ 11 වෙනි පිටුවේ පෙත්සම් හා පැමිණිලි යටතේ අභියාචනයක් ඉදිරිපත් කළා. ඒකෙ තියෙන්නේ විශ්‍රාමික ගුරු සංගමයේ අභියාචනයක් කියලා. විශ්‍රාමික පෙර පාසල් ගුරු සංගමය කියන එක සඳහන් වෙන්නට ඕනෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 10 වෙනි පිටුවේ සඳහන් වෙනවා පොදුජන මාවතේ අතුරු මාවතක් කියලා. ඒක පොදුජය මාවත කියලා නිවැරදි වෙන්න ඕන.

නියෝජ්‍ය නගරාධිපති, ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය විසින් යෝජනා ස්ථිර කරන ලදී.

**2025.08.12 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව ඒකමතිකව සභා සම්මත විය.**

## 02. ගරු නගරාධිපතිතුමාගේ නිවේදන :-

### 02(1) ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ''පොහොසත් රටක් ලස්සන ජීවිතයක් - පුනරුදයේ පුරවරය'' නමින් ලංකාවේ සියලු පළාත් පාලන ආයතන සම්බන්ධ කරගනිමින් පළාත් පාලන සතිය නම් කරලා තියෙනවා 2025.09.15 දින සිට 2025.09.21 වන දින දක්වා. මොරටුව මහා නගර සභාව විදිහට එම වැඩසටහන සකස් කොට තිබෙනවා 2025.09.15 වන දින එගොඩඋයන දකුණ කොට්ඨාශයේ ජංගම සේවාවන් ගණනාවක්, උප්පැන්න සහතික ලබාදීමේ සේවාව, ජාතික හැඳුනුම්පත් ලබාදීම, වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවාවන්, වරිපනම් බදු ජංගම සේවාව, බටහිර වෛද්‍ය සායනය, ආයුර්වේද වෛද්‍ය සායනය, පශු වෛද්‍ය සායනය, ජලභීතිකා සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන, මාර්ග පිළිසකර කිරීම, මාර්ග සහ පොදු ස්ථාන පවිත්‍ර කිරීම, මේ සේවාවන් ටික මෝදර පැරගන් උත්සව ශාලාවේත්, එහි සමාරම්භක උත්සවයත් එම උත්සව ශාලාවේ තියෙනවා. ජයගත්පුර මාතෘ සායනය සහ මෝදර ජයගත්පුර ප්‍රදේශයේ තමයි මෙම වැඩසටහන් තිබෙන්නේ. ඊළඟට 2025.09.16 වන දින පරිසර සහ රුක් රෝපණ දිනය ලෙස නම් කරලා තිබෙනවා. රුක් රෝපණ වැඩසටහන්, රුක් රෝපණය සහ පරිසරය සුරැකීමේ වැදගත්කම පිළිබඳ දේශන, මාර්ග පිළිසකර කිරීම, මාර්ග සහ පොදු ස්ථාන පවිත්‍ර කිරීම, පුවක්අරඹ මෙතෝදිස්ත උසස් විදුහල, පුවක්අරඹ සහ ඉදිබැද්ද ප්‍රදේශය නම් කරගෙන තිබෙනවා. ඊළඟට 2025.09.17 වන දින සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය ලෙස යොමු කරගෙන තියෙනවා. ජංගම ආයුර්වේද වෛද්‍ය සායන, ජංගම පශු වෛද්‍ය සායන, අඟුලාන සුසාන භූමිය ශුද්ධ පවිත්‍ර කිරීමේ වැඩසටහන, මාර්ග පිළිසකර කිරීම, මාර්ග සහ පොදු ස්ථාන පවිත්‍ර කිරීම, අඟුලාන සයුරුපුර නිවාස සංකීර්ණය සහ අඟුලාන ප්‍රදේශය යොදාගෙන තිබෙනවා. 2025.09.18 වන දින ආදායම් ප්‍රවර්ධන දිනය ලෙස නම් කරගෙන තිබෙනවා. ඒ වරිපනම් ජංගම සේවා මාර්ග පිළිසකර කිරීම්, මාර්ග හා පොදු ස්ථාන පවිත්‍ර කිරීම්, විශේෂයෙන් සිරි නිකේතනාරාමයේ විහාරස්ථානයේ තෙලවල ප්‍රදේශය යොදාගෙන තිබෙනවා. 2025.09.19 වන දින සාහිත්‍ය, අධ්‍යාපන හා පුස්තකාල ප්‍රවර්ධන දිනය ලෙස නම් කර තිබෙනවා. පුස්තකාල පාඨකයින් බඳවාගැනීමේ වැඩසටහන්, ජංගම පුස්තකාල සේවාවන් පැවැත්වීම, පුස්තකාල අඩුපාඩු සකස් කර ගැනීම සහ ශ්‍රමදාන වැඩසටහන්, පෙර පාසල් දරුවන් කතන්දර කියාදීමේ වැඩසටහන් ලෙස නම් කරගෙන තියෙනවා. සභාව සතු සියළුම පුස්තකාල ආශ්‍රිතව. 2025.09.20 වන දින මහජන උපයෝගීතා හා ක්‍රීඩා දිනය. එහි සුසාන භූමි පිළිසකර කිරීම, පිරිසිදු කිරීම, රාවතාවත්ත පොදු සුසාන භූමියත්, කොරළවැල්ල පොදු සුසාන භූමියත්, යොදාගෙන තිබෙනවා. ඒ වගේම 2025.09.21 සහතික පත්‍ර ප්‍රදානය සහ සමාප්ත උළෙල. ඊට පෙර මොරටුව මහා නගර සභාවේ නාගරික මන්ත්‍රීවරුන්, සේවකයින් සම්බන්ධ වෙන සය සාමාජික ක්‍රිකට් තරඟාවලියක් සොයිසාපුර ක්‍රීඩාංගනයේ පැවැත්වීමට කටයුතු යොදාගෙන තිබෙනවා.

## 03 සභාව අමතා එවන ලද ආයවනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබිම.

### 03(1) මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමනි, ලක්ෂපතිය අර්නස්ට් පෙදෙසින් එම මාර්ගය වසරක දෙකක පමණ කාලයක සිට අබලන් වෙලා තිබෙනවා. පාරේ තැන් තැන් වල වලවල් සෑදී තිබෙනවා කියලා ඒ මාර්ගයේ පදිංචිකරුවන් විසි දෙනෙකු පමණ අත්සන් කරලා මට ලිපියක් භාරදීලා තියෙනවා. මම ලිපිය සභාවට ඉදිරිපත් කරනවා ඔබතුමාගේ අවධානය යොමු කරලා ඉක්මනින් මෙම මාර්ගයේ තිබෙන වලවල් කිහිපය හරි ප්‍රතිසංස්කරණය කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**03(2)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඉදිබැද්ද, සුධර්මරත්නාරාම පටුමගෙන් මට ලිපියක් ලබාදීලා තියෙනවා ඉඳුල් කුණු සති දෙකකට වරක් පමණ තමයි ගෙනියන්න එන්නේ කියලා. මේ වෙනකොට සමහර අවස්ථා වල සති දෙකකටවත් එන්නැති තත්වයක් තමයි තිබෙන්නේ. ඒ මාර්ගයේ පදිංචිකරුවන් ඉන්නේ පර්චස් දෙක තුනක ඉඩම් කැබලි වල. ඒ අයට සති දෙකක වගේ කාලයක් මේවා තියාගන්න බැරි තත්වයක් තියෙනවා. ඒ නිසා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා මේකටත් පිළිතුරක් ලබාදෙන්න කියන ඉල්ලීම කරනවා.

**03(3)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටුව බල ප්‍රදේශයේ පුරවැසියෙකුගේ අවමංගල්‍ය අවස්ථාවක් වුණාම වසර ගණනාවක සිට මොරටුව බල ප්‍රදේශයේ තිබෙන ප්‍රධානතම රාජ්‍ය ආයතනය හැටියට ලොකු කුඩා කාගේ මරණයක් සිදු වුණත් ඔවුන්ට කරන ගෞරවනීයම සේවයක් හැටියට අපි වසර ගණනාවක සිට අපේ පාලනය තුළත්, කොමසාරිස්තුමියගේ පාලනය තුළත් මරණය අවසාන කටයුතු සිදු කරන දිනයේදී කොඩි 10 ක් පමණ ශෝකය ප්‍රකාශ කරලා ප්‍රදර්ශනය කරනවා. මම හිතන්නේ දිනතට අපි කොඩි 100 ක් පමණ ප්‍රදර්ශනය කරනු ලැබුවා. නමුත් අද මේ වෙනකොට තමුන්නාන්සේලාගේ පාලනයත් සමග ඒ ගෞරවනීය සේවාව ඉටු කරගන්න බැරි තත්වයට ඔබතුමන්ලාගේ පාලනය පත්වෙලා තියෙනවා. බොහොම කණගාටුදායක තත්වයක්. මොකද මේ ලිපි ඉදිරිපත් කරන කෙනාගේ මාමණ්ඩි ඒ කියන්නේ ප්‍රසන්න පෙරේරාගේ මාමණ්ඩි 2025.09.06 වන දින මරණයට පත්වෙලා තිබෙන්නේ. එතුමා එතකොට අපිටත් කතා කළා. මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ටත් කතා කරලා තිබෙනවා මේ වැඩ කටයුතු කරගන්න. මටත් කතා කළා. එතකොට මම කිව්වා ඔබතුමා කියපු දේම. කාලයක සිට පාවිච්චි කරපු කොඩි තමයි තියෙන්නේ. මේවා අද දිරාපත් වෙලා තිබෙනවා. අපිරිසිදු වෙලා තිබෙනවා. ඒ නිසා එතුමාට අපි දැනුම්දීමක් කළා මේවා අපි ප්‍රදර්ශනය කරන්නේ නැහැ. ටික කාලයකට නවත්වලා තියෙන්නේ කියලා. නමුත් එතුමා ඔබතුමාලාව බලයට ගේන්න වැඩ කරපු ඒ ප්‍රදේශයේ ඉන්න ඔබතුමන්ලාගේ සාමාජිකයන්ට කිව්වාම මෙහි පැහැදිලිව ඒක තියෙනවා, ඒගොල්ලෝ කියලා තියෙනවා නැහැ අනිවාර්යෙන්ම අපි කොඩි ලබා දෙන්නම් කියලා. අපි කිව්වා අපේ පැත්තෙන් ඒක වෙන්නේ නැහැ කියලා. නමුත් එතුමන්ලා ලොකු බලාපොරොත්තුවකින් ඉඳලා තියෙනවා ඊයේ දිනයේ මේ කොඩි ලැබෙයි කියලා. එතුමා මට කිව්වා එහෙමම කියන්න කියලා. දුරකථනයකින් කතා කරලත් කිව්වාලු අනිවාර්යෙන් කොඩි දෙනවා කියලා. අපි කිව්වා නැහැ එහෙම දෙන්නේ නැහැ කියලා කොඩි දිරාපත් වෙලා අපිරිසිදු වෙලා තිබෙන නිසා, කොඩි නැති නිසා. එතුමා ඒකත් කියන්න කිව්වා. මේ වෙනකොට ඒ මිනිස්සු කණගාටුදායක තත්වයකට පත්වෙනවා දෙන්නම් කියලත් මේක නොදීපු එක සම්බන්ධව. ඔබතුමාත් මේ සභාවේ ලොකු කාලයක් නියෝජනය කළා. කොමසාරිස්තුමියගේ පාලන කාලයෙත් නියෝජනය කළා. එතකොටත් ඔබතුමා දකින්න ඇති මරණ ගෙවල් වලට යනකොට මේ කොඩි ඉරිලා තිබුණා. අපවිත්‍ර වෙලා තිබුණා. අපේ පාලනයෙන් ගිලිහුණාට පසුව අපි කොමසාරිස්තුමියට දැනුම්දීමක් කළා අළුත් කොඩි ගන්න. අපි ලේකම්තුමාට දැනුම්දීමක් කළා. ඔබතුමා කිව්වද දන්නේ නැහැ. අපි ඒක දන්නේ නැහැ. ඔබතුමාලත් දැන් බලය ඇවිත් මාස තුනයි අදට සතියක් වෙනවා. හැබැයි ඔබතුමාලට ඒක කරගන්න බැරි තත්වයකට අද පත්වෙලා තියෙනවා. ඒ නිසා ඔබතුමාගේ කාරුණික අවධානය මේකට යොමු කරන්න. මොකද මොරටුවේ පුරවැසියා බදු ගෙවමින්, ඒකෙන් නඩත්තු වෙන ආයතනයක් හැටියට ඔවුන්ට ලබාදෙන්න තියෙන අවසාන ගෞරවය, හැමෝම නැති වුණත් යම්කිසි පිරිසක් මේක බලාපොරොත්තු වෙනවා. ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා ඉදිරි දින කිහිපයේදී මේ ගෞරවනීය සේවාව ලබාදෙන්න කියලා ඉල්ලනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මමත් ඒ සම්බන්ධව තමයි පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ. විශේෂයෙන්ම මේ මරණය සම්බන්ධව විශාල පිරිසක් ඒ අවස්ථාවට පැමිණුනා. විශාල ඥාති පිරිසක් සහ අපේ හිතවත් මංජුල අප්පුහාමි, ඒ වගේම ප්‍රසන්න, ඒ වගේ විශාල පිරිසක් අපේ හිතවත් අයත් හිටියා. ඒ

අයගේ මාමණ්ඩිය. ඒ මරණ ගෙදර මම ගියාම මට කිව්වා මේ කොඩි ටික දූර්වර්ණ වෙලා තියෙනවා කියලා නගර සභාවෙන් දැනුම්දීමක් කළා කියලා ඒ කොඩි ටික ගහන්න විදිහක් නැහැ කියලා. ඒ අය ලොකු බලාපොරොත්තුවක් තියාගත්තා මේ කොඩි ටික ලැබෙයි කියලා. මම ඒ අවස්ථාවේදී ධර්මසේන මහත්මයාට කතා කළා එතුමා පොරොන්දු වුණා මේ කොඩි ටික දානවා කියලා. ඒ පොරොන්දුව උඩ මම ඒ අයට කෝල් කරලා කිව්වා කොඩි ටික ලැබෙනවා කියලා. ඊටපසුව මම ගන්නකොට ධර්මසේන මහත්මයාට ගන්නත් බැහැ මට. ඊට පසුව මම දන්නේ නැහැ එයා අරන් තිබුණා මට. හැබැයි ඒ වගේ වැඩ කරන්න එපා. දෙන්න බැරි නම් බැහැ කියන්න ප්‍රශ්නයක් තියෙනවා නම්. මොකද ඊට පසුව අපි ඒ මරණෙ ගෙදරට යන්න ඕන. අපි එතකොට අපහසුතාවයට පත්වෙනවා. ඒ මිනිස්සුන්ට අපි පොරොන්දු වුණා නමුත් අපි යනකොට කොඩියක් නැහැ. එහෙම දේවල් කරන්න එපා. ආණ්ඩු පක්ෂයක් විපක්ෂයක් කියලා බලන්නෙපා හැමෝටම දෙන්න බැරි නම් එක පාරටම බැහැ කිව්වා නම්, අපි කියනවා මේක වෙන්නෙ නැහැ මේ හේතුව උඩ කියලා. අපි අපහසුතාවයට පත්වෙනවා එතනට ගිහිල්ලා. එයා මට පස් හය පාරක්ම කතා කරලා කිව්වා සේනක අයියේ තාම ආවේ නැහැ, තාම ආවේ නැහැ කියලා. මම ආපහු තව පැය භාගයකින් අහනවා ආවද කියලා. නැහැ. ඊට පසුව මම සෞඛ්‍ය අංශයට කතා කරලා කිව්වා මෙහෙම දෙයක් වුණා මම දැනුම් දුන්නා, මේක ගිහිල්ලා ගහන්න කියලා. ඒ අය බලාපොරොත්තු වුණා අවසාන මොහොත දක්වාම ඒක වුණේ නැහැ. ඒ නිසා ඒක අපේ දූර්වලකමක්. එහෙම කරන්න එපා මොකද මේ මිනිස්සු වරිපනම් බදු ගෙවන, ඒ සේවාවන් ලබාගන්න සුදුසුකම් තියෙන පුද්ගලයෝ. මරණයක පක්ෂ පාටක් නැහැ. ඒ නිසා මේ කාරණාව සම්බන්ධයෙන් කණගාටු වෙනවා. මේක සුළු දෙයක්. අපි නම් පක්ෂෙක කොඩි ටිකක් ගහනවා නම් මහරගමට ගියා නාවින්නෙන් කොඩි ටිකක් ගෙනාවා හවස් වෙනකොට මහලත් ඉවරයි. නගර සභාවක ප්‍රතිපාදන තියෙනවා, ප්‍රතිපාදන වෙන්කිරීමේදීත් පොඩි ප්‍රශ්න තියෙන්න පුළුවන්. නමුත් අනවශ්‍ය දෙයකට මුදල් ලබාගන්නවා නෙමෙයිනේ. මේ වගේ වැදගත් දෙයකට මුදල් ලබාගන්න කියන ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරු දෙන්නෙක්ම මේ ගැන කතා කරපු නිසා කෙටි උත්තරයක් දෙන්නම්. ඇත්තටම ඔබ නිවැරදියි. මේ පිළිබඳව යම් අඩුවක් සිදු වුණා. ඒ අඩුව භාරගන්නවා. ඒකට යම් හේතු සාධක ප්‍රමාණයක් තිබුණා. ඉදිරිපත් කරන්නේ නැහැ හේතු. මේ සැළකිය යුතු කාලයක් ඉල්ලීම් කළා මේ කටයුත්ත. දමමින් තිබුණු කොඩි ඔබ දැක්කා. දූර්වර්ණ වෙලා දාන්න බැහැ. ඒවා වෙනස් කිරීම සඳහා කරපු ඉල්ලීම දිගින් දිගටම නිලධාරීන්ගේ පැත්තෙන් පමාවක් වුණා. මිල ගණන් ඉදිරිපත් වුණා. එක කොඩියකට විශාල ගානක්. මම කිව්වා ඔය ගණන් වලට අවශ්‍ය නැහැ. අදාළ රෙදි රෝල සඳහා එවෙලෙම කෝටේෂන් අරන් ඇවිල්ලා කිව්වා මට කොඩි රෝල ගෙනත් දෙන්න මම මහලා ප්‍රින්ට් කරලා දෙන්නම්. ඉතින් මම පොරොන්දු වෙනවා තව දින දෙකක් නැත්නම් තුනක් ඇතුලත මෙය විසඳනවා.

**03(4)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මහරගමින් ගන්න ගියාම මීටර් 100 ගන්න පුළුවන් රුපියල් දහදාහට අඩුවෙන්. ලොකු ගණන්වලටම යන්න ඕනම නෑ. පෞද්ගලිකව මැදිහත්වෙලා ඒක ඔබතුමා බලන්න බොහොම ස්තුතියි. ඒ එක්කම සඳහන් කරන්න ඕනෙ පසුගිය මාසයේ මම හිතන්නෙ 31 වෙනිදා තමුන්නාන්සේලා ශ්‍රමදානයක් කලා කටුබැද්ද ඇවිදින මංතීරුවේ. හැබැයි මම 29 වෙනිදා මගේ දුව වෙන් කරලා තිබ්බ සර්කිට් බන්ග්ලෝ එකට යන්න වුනා දවස් තුනකට. ඒ නිසා මට ඒ අවස්ථාව නියෝජනය කරන්න බැරුව ගියා. ඒකට කණගාටු වෙනවා මම ඒක තිලක් විජේතුංග අපේ මන්ත්‍රීවරයාටත් දැනුම්දුන්නා. තමුන්නාන්සේලා ඒ ශ්‍රමදානය කලා. විශේෂයෙන්ම ඒකට සහභාගි නොවීම සම්බන්ධව මගේ කණගාටුව වෙනවා. විශේෂයෙන්ම නගරාධිපතිතුමනි, ඇවිදින මංතීරුවේ තියෙන තත්වය බලනකොට ශ්‍රමදානයකින්ම සම්පූර්ණයෙන්ම කරලා ඉවර කරන්න පුළුවන් තත්වයක් නෙමෙයි. දවස ගානෙම වටාපිටාවෙන් තාම හරි වැස්සක් වැස්සෙ නෑ. වැස්සක් වැස්සහම ලොකු බෝතල් ප්‍රමාණයක් හා කැළිකසල ප්‍රමාණයක් ඒ අවස්ථාවේ රැඳෙනවා. තැන් තියෙන තත්වෙ මේ සේවකයෝ කලින් හරියාකාරව වැඩ කලා.බොහෝම ක්ලීන් එකට තියාගත්තා. විශේෂයෙන්ම අපි ගත්තට ඉස්සෙල්ලා පහත්බිම් එකෙන් බොහොම හොඳ සර්විස්

එකක් දුන්නා. නමුත් අපේ සේවකයොත් බොහොම විධියට මහන්සි වෙලා වැඩ කරනවා. හැබැයි දැන් තියෙන තත්වය අර කිඹුල්ලු. මම හිතන්නෙ නගර සභාවට ලියුමක් දාලා ඒ කිඹුලන්ව අයින් කරන්න කියලා ඉල්ලනකොට මට ලියුමක් එව්වා කිඹුල්ලු 8 දෙනෙක් ඉන්නවා කියලා. මම අටදෙනාම එක පාර දැකලා නෑ. මම දකින්නෙ එක්කෙනයි දෙන්නයි හැබැයි විශාල ප්‍රමාණයේ කිඹුල්ලු. නගර සභාවෙන් ලිඛිතව එවලා තියෙනවා මට අටදෙනෙක් මේකෙ ඉන්නවා කියලා. තව මේකෙ වැඩිවීමක් වෙනවා මිසක් අඩුවීමක් වෙන්නෙ නෑ ගරු නගරාධිපතිතුමා. මේක විවෘත භූමි ප්‍රමාණයක තියෙන්නෙ. කොයිවෙලාවක හෝ එළියට එන්න ඉඩතියෙනවා කිහිපදෙනෙක්. දැන් පෙරේදා වෙනකොට පාර්සලයක් තියෙනවා මම ඇවිදිනකොට මම දැක්කා පෙරේදා හෝ ඊට කලින් දවසෙ ඔක්කොමලා ඒක දිහා බලාගෙන ගියා. බලනකොට බල්ලෙක් මැරුණම අරගෙන ඇවිල්ලා උරයක දාලා, දාලා තිබ්බා. මිනිස්සු බලන් හිටියා ඒ බලන් ඉන්නකොට කිඹුලා ඇවිල්ලා එක කටටම මේක ඩැහැගෙන ගියා. මිස්සුන්ටත් ඔය වගේ දේවල් වෙන්නට පුළුවන්කම තියෙනවා. අර සේවකයන්ට අපි කොච්චර බලපෑම් කලත් වැඩක් නෑ ඒ මිනිස්සුන්ගේ ජීවිත ආරක්ෂාව අපි සලසන්නෙ නැතුව.ඒ නිසා ඒ අය බහින්න බයයි එතනට යම්කිසි විධියක හරි නවීන තාක්ෂණය සමන්විත අංගෝපාංග සහ ඒ අයට පහසුකම් ඒ අයට එතන ලබා දීලා නැහැ අපි. ඒ නිසා විධිමත් වැඩපිළිවෙලකට ප්‍රවිශ්ය වීමේ අවශ්‍යතාවයක් කාලීන අවශ්‍යතාවයක් තියෙනවා. ඒ නැත්නම් අපි කොච්චර සේවකයන්ට බලපෑම් කලත් ඒ අයට බැහැලා ඒ කුණු ඉවත්කිරීමේ අපහසුතාවයක් තියෙනවා. මේ පිළිබඳවත් සැලකිල්ලට ගන්න කියන ඉල්ලීම කරනවා. ඒ වගේම අව්දින මංතීරුවේ තමුන්නාන්සෙ දකින්න ඇති ගල් ඉලිප්පිලා ඒ නිසා මේකේ සාමාන්‍ය පාරකට වඩා, සාමාන්‍ය පාරක ඒ ගමන් කරන පිරිස විතරක් යන්නට පුළුවන් නමුත් මේ ඇවිදින මංතීරුවේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම ඉන්නවා මේ ඇවිදින මංතීරුව ප්‍රයෝජනයට ගන්න ඒ අය සාක්ෂි දරයි මේකේ ගල් ඉලිප්පිලා යන්න බැරි තත්වයක් සමහර තැන්වල තියෙනවා. වැස්ස දවසට මඩ ගොහොරු වෙන තැන් තියෙනවා ඒ නිසා ඒකට අපි මුදලක් වෙන් කරලා පුළුවන්කමක් තියෙනවා නම් ඒක ප්‍රතිසංස්කරණය කරන්න කියන ඉල්ලීමත් කරනවා.

**03(5)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මොරටුව නගර සභාව අසල ඇති ප්‍රජා පුස්තකාලය ඉරිදා, සඳුදා දවස් දෙකේම වසා තබනවා ඒ නිසා ඉරිදා දිනයේ විවෘත කරලා දෙන්න කියලා ඒ අවට කිහිපදෙනෙක් ඉල්ලීමක් කරලා තියෙනවා ගරු නගරාධිපතිතුමනි පුළුවන් නම් අපිට ඉරිදා දවසේ ඒ පුස්තකාලය විවෘතව තබා දෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**03(6)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම ලුනාව කලපුව මං තීරුව වටේ ඇති විදුලි පහන් කණු දහතුනක බල්බ් පිච්චිලා. ඒක කිහිප වතාවක්ම දැනුම් දුන්නත් ඒක ප්‍රතිසංස්කරණය කරලා තිබුණේ නැහැ. එතන බාරව ඉන්න මහත්මයා දැනුම් දීලා තියෙනවා ඒක කරලා තිබුනේ නැහැ. පොඩ්ඩක් පුළුවන් නම් ඒකේ බල්බ් ටික දාලා ඒක ලෑස්ති කරලා දෙන්න කියලත් කියනවා.

**03(7)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, වඩු කර්මාන්තය කියන්නේ ගරු නගරාධිපතිතුමනි, මොරටුවේ විශාල පිරිසක් තමන්ගේ ජීවනෝපාය කරගන්න කර්මාන්තය. ඒ වගේම ඔබතුමා දැනුවත් ද මම දන්නෑ මේ මෑතක ඉඳන් මොරටුමුල්ල පොලිසිය පහහමාර හටය වෙනකොට ලී ලොරියකට එන්න දෙන්නෙ නෑ. මෝලෙ ඉඳන් ලී ටික මඩුවට අරන් යන්න දෙන්නෑ. ඔක්කොම ලොරිටික පොලිසිය වත්තට දාගන්නවා. ඔබතුමාව දැනුවත් කරන්නේ මේක සංවර්ධන කමිටුවේදී මේ ගැන කතා කරලා මොරටුවේ ජනතාවට දැව මොරටුව තුල ප්‍රවාහනය කිරීම තහනම් කරලා නෑ. වෙලාවක් නියම කරලා නෑ. ඒක ඕන වෙලාවක මොරටුව තුල කරන්න පුළුවන්. ඉතින් හය හත වෙනකල් දවසේ වැඩකටයුතු කරන පුද්ගලයන් පොඩ්ඩක් රෑ වෙනකල් මේ ලී ටික මෝලෙන් ඇද ගන්නවා. හවස් වරුව තමයි එයාලට ලී ටික ඇද ගන්න තියෙන්නෙ. ඒ අවස්ථාව මොරටුමුල්ල පොලිසිය විසින් නැතිකරනවා. ඔබතුමා මේ ගැන පොඩ්ඩක් සංවර්ධන කමිටුවේදී ඇමතිතුමා දැනුවත් කරලා, පොලිසිය දැනුවත් කරලා පොඩ්ඩක් සහනයක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා.**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මට පොඩි වෙලාවක් දෙන්න. නාගරික ලේකම්තුමා, පුස්තකාලය ඉරිදාට වසා තැබීම පිළිබඳව. අපි තීන්දු කරලා නෑ ඉරිදාට පුස්තකාල වහන්න සඳුදනෙ පුස්තකාල වහන්නෙ. ඒක ඉක්මණින් හොයලා බලන්න.

**03(8) මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පී.විතානගේ මහතා**

ගරු නගරාධිපතිතුමනි, මොරටුව ද සොයිසා ක්‍රීඩාංගනයේ ක්‍රිකට් ක්‍රීඩා පුහුණු පැති විකට්ටුව සිමෙන්තිවලින් හදලා තියෙන පැති විකට්ටුව අපි දන්නවා පුද්ගලික පුහුණුකරුවන් කුඩා දරුවන්ට පුහුණු සැසි පවත්වන ස්ථානයක්. ඒ පුහුණු වාර පවත්වන්න අවශ්‍යකරන ඒ පැති විකට්ටුව ඇත්ත වශයෙන්ම නිසි ආකාරයෙන් නඩත්තු වීමක් වෙලා නෑ. ඒ විකට්ටුවේ ඇත්ත වශයෙන්ම ක්‍රීඩකයින්ට සෙල්ලම් කරන්න පුළුවන් විධියට පන්දු යවන්න පුළුවන් විධියට සකස් වෙලා නෑ. සැහෙන වලවල් සහිතවෙලා තියෙනවා මම පෞද්ගලිකව නිරීක්ෂණය කලා ඒ වගේම පුහුණුකරුවනුත් මට මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් කලා මේ ඉල්ලීම කරන්න කියලා විශේෂයෙන්ම මොරටුවේ දූ දරුවන් අනාගත ක්‍රිකට් ක්‍රීඩාව බාරගන්න ඉන්න ඒ වගේම ලංකාව නියෝජනය කරන්න පුළුවන්, ලංකාවට කීර්තියක් ගේන්න පුළුවන් දරුවන්ගේ ආරම්භය ඇත්ත වශයෙන්ම මේ ස්ථානයේ තමයි සිදුවෙන්නෙ. ඒ නිසා මේ පැති විකට්ටු ගුණාත්මක භාවයෙන් ක්‍රීඩාවට සුදුසු තත්වයෙන් පවත්වාගෙන යාම සඳහා පිළිසකර කරලා දෙන්න කියලා පුහුණුකරුවන් කිහිපදෙනෙක්ම මගෙන් ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

**03(9) මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, මහා සභා දෙක තුනකම ආයාචනා හා පෙත්සම් යටතේ දිගින් දිගටම යම්කිසි කාරණා ලිඛිතව ලබා දුන්නා. නමුත් මම දන්නෑ අපිට ඒ දේවල් සිද්ධ වෙලා නෑ නගරාධිපතිතුමනි, පොඩ්ඩක් බලන්න ගිය සභාවේ දුන්නම මේ සභාවට අපි බලන් ඉන්නවා මොකක් හරි ඒකේ ප්‍රගතියක් තියෙයිද කියලා.

ගරු නගරාධිපතිතුමනි, ඔක්කොම දොස් කියපු නිසා මම සුභ පැතීමක් කරන්න ඕන. මේ දවස්වල මම ලුනාව කලපුව ඇවිදින මංතීරුවට ගියා ඇත්තටම හොඳයි. හොඳට අස් කරලා තියෙනවා. හොඳ ප්‍රවනතාවයක් ලුනාව ඇවිදින මංතීරුවේ දක්නට ලැබෙනවා. ඇත්තටම හොඳට අස්කරලා තියෙනවා කුණු ටිකක්වත් තියන්නෙ නෑ. ඒක නිසා ඒ ගැන සුභ පතනවා.

**03(10) මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, කැලි කසල අදින්නෙ නැති එක පොඩ්ඩක් ආයෙත් තියෙනවා. තැන් තැන්වල ආයෙත් දාලා යනවා. ඒක ගොඩක් කරන්නෙ අර පේමන්ට් එකේ වෙළදාම් කරන මිනිස්සු කුඩුකාරයින්ට දීලා ඒක අද්දලා ගිහිල්ලා තැන් තැන්වල බෝගස් යට එහෙම දාලා යනවා. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරලා ඒකත් සුද්ද කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(11) මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, එගොඩඋයන සාම පෙදෙසේ ජනතාව මා හට පෙත්සමක් භාරදීලා තියෙනවා. එයාලගේ ගෙවල් ටික පල්ලමට වගේ තියෙන නිසා වැස්ස කාලයේදී වතුර සේරම ඒගොල්ලන්ගේ නිවෙස් වලට යනවා කියලා. මම මෙය සභගත කරනවා පොඩ්ඩක් ඒ ගැන සොයලා බලලා පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(12) නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් පැමිණිලි යටතේ බොරුපන ශ්‍රී ධර්මාශ්‍රම විහාරයේ විහාරාධිපති, ශාස්ත්‍රවේදී පූජ්‍ය සූරියගොඩ ධම්මික ස්ථවිරයන් වහන්සේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මම ඉදිරිපත් කරනවා. රත්මලාන බොරුපන ධර්මාශ්‍රම විහාරය සඳහා වූ පිවිසුම් මාර්ගය පිළිසකර කර දෙන ලෙසට කරන කාරුණික ඉල්ලීමයි. රත්මලාන බොරුපන පිහිටා ඇති මෙම විහාරය ප්‍රදේශවාසී බෞද්ධ සැදැහැවතුන්ගේ සිත්කළු පූජනීය ස්ථානයකි. මෙම විහාරය සඳහා එකම ප්‍රවේශ මාර්ගය වනුයේ ශ්‍රී ධර්මාශ්‍රම මාර්ගය නමින් හැඳින්වෙන ජනාකීර්ණ මාවතක් බව

දන්වමු. මෙම මාර්ගය එක් පසකින් බොරුපන මාර්ගයටත්, අනෙක් පසින් මාලිගාව පාර මාර්ගයටත්, මුහුණලා පිහිටා ඇත. දිගු කලකින් කිසිදු අළුත්වැඩියාවක් සිදු නොවූ මෙම මාර්ගය මේ වන විට ප්‍රදේශවාසීන්ට, උපාසක උපාසිකාවන්ට සහ වාහන වලින් යන අයට ඉමහත් දුෂ්කරතාවයකටත්, අනතුරුදායක තත්වයකටත් මුහුණපෑමට සිදු වී ඇත. කරුණු මෙසේ හෙයින් මේ පිළිබඳ අවධානය යොමු කොට කාපට් අතුරා අවශ්‍ය පිළිසකර කටයුතු කරදෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි. මේ විදිහට ඉල්ලීමක් ඉදිරිපත් කරලා තියෙනවා. මම මෙය සභාගත කරනවා.

**03(13)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී. බ්‍රෙන්ඩන් එච්. ක්‍රිස්ට්ල්කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම හිතන්නේ මේ පිළිබඳව මීට පෙරත් සේනක දමයන්ත මන්ත්‍රීතුමා කතා කරලා තියෙනවා කමිටුවකදී. එගොඩඋයන හන්දියේ නගර සභාවට අයත් කඩ පෙළක් තියෙනවා. ඒ කඩ පෙළේ කඩ තුනක් ඊට අල්ලපු යාබද නිවසට තහඩු වලින් වට කරගෙන ඉඩමට සම්බන්ධ කරගෙන තියෙනවා ඉඩමට අයිති වෙන්න වගේ. මම කාරුණිකව ඉල්ලා සිටිනවා මේ පිළිබඳව සොයා බලන්න. මේක නගර සභාවට අයිති දේපල. පුද්ගලික ඉඩමකට සම්බන්ධ කරන්න බැහැ. මම ඒ පිළිබඳව ඔබේ කාරුණික අවධානය යොමු කරනවා.

**03(14)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එගොඩඋයන ලකීසෙවන්පුර පැවති සේපාලි පෙර පාසල වෙනත් ස්ථානයකට ගෙනිහින් තියෙනවා. එම ගොඩනැගිල්ල මේ වෙනකොට නිකන් තියෙන්නේ. ජනෙල් දෙකක් කඩාගෙන ගිහින් තියෙනවා. එය සුදුසු පරිදි වෙනත් දෙයකට යොදවා ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා. මම යෝජනා කරනවා එය නගර සභා සේවකයෙකුගේ නිල නිවාසයකට හෝ පරිවර්තනය කරන්න කියලා.

**03(15)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ ප්‍රදේශයේ ටෙලිකොම් එකට අයිති දුරකථන රැහැන් අදින ඉවත් කළ යුතු කණු කිහිපයක් තියෙනවා. අතුරුදායක තත්වයක් ඇතිවෙන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් අපි කතා කළත් ඒගොල්ලෝ කිසිදු ප්‍රතිචාරයක් දක්වන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් ආයතනයක් වශයෙන් නගර සභාව විසින් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**03(16)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔලිවර් ප්‍රනාන්දු මහතාගේ බොල්ගොඩසිරිපුර නිවාස හිමිකම් ලබාදීමේදී ඔහුට සිදුවුණ අසාධාරණයක් සම්බන්ධයෙන් ලිඛිත දැනුවත් කිරීමක් සහ ඉල්ලීමක් කරලා තියෙනවා.

**03(17)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි මේ සභාවෙදි පසුගිය සභා වාරයක ඉල්ලීමක් කළා. ඒ වගේම මුදල් කමිටුවේත් අවස්ථා දෙක තුනකම මම දිගින් දිගටම ඉල්ලීමක් කළා. මේ සභාවේ භාවිතයෙන් ඉවත් කරන අබලි ද්‍රව්‍ය වෙන්දේසි ක්‍රමයට කරන්න එපා කියලා. මොකද පැහැදිලිවම මම දන්නවා වෙන්දේසි ක්‍රමයට සිදු කළොත් එහෙම මේ සභාවට එය පාඩුවක් වෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කලා දිගින් දිගටම කරන්න එපා කියන එක. නමුත් පසුගිය දිනක වෙන්දේසිය සිදු කළා. මේ කරලා තියෙන්නේ සභාවට පාඩුවක්. පුද්ගලිකව තමන්ගේ මිල ගණන් ඉදිරිපත් කරන්න කිව්වා නම් මම දන්නවා ඔවුන් නියම මිල ඉදිරිපත් කරනවා. ඒක සිදු නොවී රුපියල් ලක්ෂ දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් සභාවට පාඩු කරලා තියෙනවා. මේ වගකීම මම හිතනවා මේ ආණ්ඩු පක්ෂය මාලිමා පක්ෂය භාරගත යුතුයි. මොකද ඔබතුමන්ලාට ඡන්දය ලබාදුන්නේ මිනිස්සු, ඡන්ද දායකයෝ මේ දේවල් නිවැරදි කරන්න. නමුත් අද ඒක සිදුවුණේ නැහැ. විපක්ෂයක් වශයෙන් අපි ඉල්ලීමක් කරලත් ඒ ඉල්ලීම මේ සභාවට වාසිදායක ඉල්ලීමක් කරලත් එය සිදු නොවීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරනවා. වගකීම ඔබතුමන්ලා ගන්න ඕන. ඔබතුමන්ට මේ හැමදෙයක්ම සොයලා බලන්න අමාරු වෙයි. නගරාධිපතිවරයාට සමස්ත මොරටු ජනතාවගේම ප්‍රශ්න එනවා. නමුත් මුදල් කමිටුවේදී නිලධාරීන්ගෙන් මම ඉල්ලීමක් කළා. ඒ වගේම මුදල් කමිටුවේ ඔබතුමන්ලාගේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන, මම හිතන්නේ ආර්ථිකය සම්බන්ධයෙන් හොඳටම දන්න අයත්

ඉන්නවා. ඒගොල්ලෝ පෙන්නන විදිහට. ඒ අයට හරි මේ පොඩ්ඩක් ෆලෝ කරලා කරන්න තිබුණා. උදාහරණයක් වශයෙන් ටයර් ලොට් එකෙන් රු.60,000.00 ක් සභාවට පාඩුයි. රු.60,000.00 ත් වඩා ලාභයක් එනවා ටෙන්ඩර් දැම්මා නම්. ඒ වගේම බැටරි ලොට් එකෙන් ඒ ඔක්කොම ගණනය කරාට පසුව ලක්ෂ දෙකකට වැඩි ප්‍රමාණයක් සෙකන්ඩ් සේල් එකේදී ලබාගත්තා ඒ අය. ඒක තමයි අපි ඉල්ලීමක් කරන්නේ සභාවට වාසියක් කරන්න. අපි හැමෝම ඒ අරමුණේ හිටියම ඒක සිදුවන්නේ නැති එක පිළිබඳව අපි කණගාටුව ප්‍රකාශ කරනවා. ලක්ෂ දෙකක් පාඩු කිරීම සම්බන්ධයෙන් ඔබතුමාලා අනිවාර්යෙන් මේ වගකීම ගන්න ඕන. අපි මේ සභාව තුළත් මුදල් කමිටුවෙත් වරින් වර ඉල්ලීමක් කරළත් ඒ සම්බන්ධයෙන් කටයුතු නොකිරීම සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරනවා. ආණ්ඩු පක්ෂය මෙය භාරගත යුතු යැයි සඳහන් කරනවා.

**03(18)** <u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජීත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මේ සභාව තුළ අපි කතා කළා ඔටිසම් සහ සෙරියෝපෝසිස් දරුවන් පිළිබඳව. ඒකට සමගාමීව මොරටුවේ එස්කෝ ආයතනය තමයි වසර දෙකකට තුනකට වතාවක් දරුවන් වෙනුවෙන් පවත්වන විශේෂ අබාධිත දරුවන්ගේ කලා උළෙල පවත්වන්නේ. එය වසර හතරකට පහකට පසුව නැවත වතාවක් ලබන 28 වෙනිදා එස්කෝ ආයතනය ආසන්නව පැවැත්වෙනවා ස්ථාන වල මොරටුවේ. ඔබතුමාගේ අවධානය යොමු කරනවා ලබන සැප්තැම්බර් 26 වෙනිදා හවස ආරම්භ වන මේ වැඩසටහන ඔබතුමන්ලාටත් ආරාධනා පත්‍ර ඔවුන් ලබාදේවි. 27 සහ 28 වෙනිදා අවසන් උත්සවය පැවැත්වෙනවා. ලංකාවේ හතරවටින්ම එන ඒ අතිවිශේෂ දරුවන්ගේ උත්සවය ඒ සඳහා අපි අපිට පුළුවන් සහයෝගය වැඩි බරක් තියලා ලබාදෙන්න කියලා ගරු ඔබතුමා ඇතුළු සභාවෙන්ම ඉල්ලා සිටිනවා.

**03(19)** <u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජීත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මේ වෙලාවේ ගරු කොමසාරිස්තුමියට ස්තූති කරන්න මම අවස්ථාවක් බවට පත්කර ගන්නවා. ඒ තමයි පසුගිය කාලයේදී කතා කළා අපේ කසළ සම්බන්ධව සමහර මාස වල ලක්ෂ 550 ක් අපි ලබාගෙන තිබුණා. ඒක යම් විදිහකින් අඩු වෙලා තිබුණා. නමුත් එක්තරා අවස්ථාවකදී මේක හිරවීමක් තිබුණා. නමුත් කොමසාරිස්තුමිය මේ සභාව තුළත් මම සෞඛ්‍ය කමිටුවේත් කතා කළාට පසුව ඒකට මැදිහත් වෙලා මම හිතන්නේ ඒක කඩිනමින් කරලා ලක්ෂ 6 ක විතර ආදායමක් ලබාදෙන්න කටයුතු කළා.

**03(20)** <u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජීත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ ඒටී සෙක්ෂන් එකේ ඉන්න සංජය මහත්මයාවත් මතක් කරන්න ඕන මේ සභාවේ. එක්තරා අවස්ථාවකදී හත් අට දෙනෙක් ඇවිත් වැඩ කරද්දී කාර්යක්ෂමව එතුමා තමන්ගේ කටයුත්ත කළා. ඒ නිසා එතනට ආපු කාන්ති කියලා මහත්මියක් ඔබතුමාලට ඡන්දය දුන්න, ටිකක් වෙලා බලන් ඉඳලා ඇත්තටම මොහු ඉතාමත් හොඳින් මේ වැඩේ කරනවා. ඒ නිසා මොහු පිළිබඳ අගයන්න අපිට යම් අවස්ථාවක් නැහැ, ඒ නිසා ඔබතුමාලා තමයි නියෝජිතයෝ, ඒ නිසා මේ සංජය මහත්මයා ඒ කරපු කාරණාව පිළිබඳවත් යම් අගය කිරීමක් මේ සභාවේ කරන්න කියලා කිව්වා. මම එතුමිය වෙනුවෙනුත් මේ සභාවෙ අගය කිරීම කරන්න අවස්ථාවක් බවට පත් කරගන්නවා.

**03(21)** <u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජීත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මේ දවස් වල කන්ටේනර් පිළිබඳව කතා කරන නිසා මීට පෙර මම ගිය සභාවේදී කිව්වා ජල සම්පාදන මණ්ඩලය සම්බන්ධයෙන් ජලය පිරිසිඳු කරන ලයිම් කියන සංයෝගය ක්‍රෝමියම් අගය වැඩි වෙලා තියෙනවා. ඒවා කන්ටෙන්ර් 24 ක් විදිහට ඇවිත් තියෙනවා. පාර්ලිමේන්තුවේදී මේ පිළිබඳව වෙනම විවාදයක් ගියා. ඒ නිසා එහි තියෙන යම් සංයෝග මේ මොරටුවේ ඉන්න සමස්ත ජනතාවට ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. ඒ නිසා මේ පිළිබඳව යම් පරීක්ෂණයක් කරලා හොයලා ඇත්තටම මෙය තියෙනවද කියලා බලන්න. මම ගිය සභාවේත් ඉදිරිපත් කළා. එය නැවත ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

**03(22)** <u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, කටුබැද්ද මංතීරුවේ ඉන්න සේවකයෝ නිශ්චිතව ඉන්න ඕන කියන විශ්වාසය අපි තුළ තියෙනවා. නමුත් සමහර අවස්ථා වලදී සේවකයන් යම් යම් තැන් වලට මාරු වෙනවා. ඒ නිසා මේ නිශ්චිත ක්‍රියාදාමය අඛණ්ඩව අපට කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි සෞඛ්‍ය කමිටුවෙන් තීරණය කරලා කලාප මට්ටමෙන් වෙන් කරපු සේවකයින් යම් ය්ම තැන් වලට ඇදීම තුළ අපිට මේ ප්‍රශ්නය බරපතල විදිහට උග්‍ර වෙනවා.

**03(23)** <u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, පසුගිය කාලයේ ඔබතුමාත් මේ සභාවේ ඉන්න කාලයේ කිව්වා අපිට සූර්ය බල ශක්තිය ලබාදෙන්න ඕන කරන කටයුත්තෙදි ඇස්තමේන්තුව සකස් වෙලා තියෙනවා, අපි කතා කරලා මාස කිහිපයක් ලැබුණේ නැහැ, ඔබතුමා මට කිව්වා ඒ නිසා සජිත් මන්ත්‍රීතුමා, ඔබට මෙහි හැකියාවක් ඇති කියලා. ඔබතුමා කිව්ව විදිහට මම ඒ ඉංජිනේරුවරයාට කතා කළාට පසුව ඒ කිව්ව නිශ්චිත දිනයටම ඇස්තමේන්තුව එවලා තියෙනවා. ඒ කටයුත්ත ඉක්මන් කරන්න. ඒ නිසා ඔබතුමාටත් නිලධාරීන්ටත් මම ස්තුතිවන්ත වෙනවා එය මට කරන්න පුළුවන් කියලා තේරුම් අරගෙන කඩිනමින් කරන්න අවස්ථාව ලැබුණ එක ගැන. ඒ නිසා මේ කටයුත්ත ඉක්මන් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**03(24)** <u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, දිගින් දිගටම මේ සම්බන්ධයෙන් කමිටු වලත් සාකච්ඡා කළා විශ්‍රාමික පෙර පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගිලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් මහජන උපයෝගිතා කමිටුවෙත් මතු කළා. දැන් ඔවුන් සියළු දෙනා මේ විශ්‍රාම වැටුප් අර්බුදය සම්බන්ධයෙන් නගර සභාව සහ ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පවත්වන්න ඉල්ලීමක් කරලා තියෙනවා. ඔබතුමාටත් ඒ සම්බන්ධයෙන් ලිඛිතව දැනුම්දීමක් කරලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරලා මේ මාසේ ඇතුළත හො ඉදිරි සතිය ඇතුළත ඔවුන්ට එම සාකච්ඡාව පවත්වන ලෙස ඉල්ලීමක් කරනවා.

**03(25)** <u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, අපි මේ සභාවේ දිගින් දිගටම ඉල්ලීමක් ඉදිරිපත් කළා දකුණු කලාපයේ වැසි වර්ෂා ලැබෙන අවස්ථා වලදී තියෙන අර්බුදය. පාරවල් උතුරා යාම, කාණු පද්ධති සම්බන්ධයෙන් තියෙන අර්බුදය. මේ සම්බන්ධයෙන් මන්ත්‍රීවරු විවිධ යෝජනා දුන්නට සමස්තයක් වශයෙන් පුළුල් ලෙස අපි ප්‍රශ්නය බලලා විසඳුමක් මේකට ලබාදිය යුතුයි. ඒ සඳහා අපි නගර සභාව හරහා වැඩි මුදලක් යොදවලා සංවර්ධන කටයුත්තක් හැටියට මේ දේ දකිනවා. ඒ ප්‍රදේශ වල අක්‍රමිකවත්ව ගොඩනැගුණු ගොඩනැගිලි තියෙනවා. අක්‍රමිකවත් ලෙස ප්ලෑන් පාස් කරලා අවිධිමත් සංවර්ධනය හේතුවෙන් තමයි මේ පාරවල් වලට මේ තත්වය ඇතිවෙලා තියෙන්නේ. ඊළඟ මාසේ මොරටුව මහා නගර සභාවේ අයවැය සාකච්ඡා කිරීමට නියමිතයි ඉතිරි මාස දෙක තුන ඇතුළත. මම හිතනවා මේක ව්‍යාපෘතියක් ලෙස සළකලා මෙයට පුළුල් ලෙස ඔබගේ අවධානය ලබාදීලා යූ.ඩී. එකේ සහ ආර්.ඩී. එකේ නියෝජිතයන් සම්බන්ධ කරගෙන සංවර්ධන ව්‍යාපෘතියක ලෙස මේක දැකලා මෙය පිළියමක් යෙදීමට කාලය ඇවිල්ලා කියලා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ ගෞරවනීය අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**03(26)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මගේ ගමේ අඟුලානේ පොදුජන විද්‍යාලය විතරයි තියෙන්නේ. මම හිතන්නේ අපේ ගමේ දිළිඳු අසරණ දරුවන්ට යන්න තියෙන එකම පාසල. මේ පාසලේ ගොඩනැගිල්ල තියෙන භූමියේ වල් වැවිලා තියෙනවා. මම තණකොළ ලොකු ගස් වගයක් වැවිලා තියෙනවා. ගරු විදුහල්පතිතුමිය විශාල සටහන් ගෙනියනවා මේ පාසල නොවැසී පවත්වාගෙන යාම සඳහා. ඒ නිසා මේ ගොඩනැගිල්ල සහිත භූමිය ශුද්ධ පවිත්‍ර කරලා දෙන්න කියලා එතුමිය මගෙන් වාචික ඉල්ලීමක් කළා. මම ඒ පිළිබඳව ලිපියක් සකස් කරලා එය සභාගත කරනවා

**03(27)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ ගමේ තියෙන පල්ලිය ශාන්ත ෆ්‍රැන්සිස් සේවියර් මුණිඳුන්ගේ දේවස්ථානයේ කුණු කසළ ගොඩක් ගොඩගැහිලා තියෙනවා. ඒ වගේම තමයි මේ දිනවල දේවස්ථානයේ ඉදිකිරීම් කටයුතු වගයක් කරගෙන යනවා. ඒ නිසා ගොඩනැගිලි සුන්බුන් වගවක් එකතු වෙලා තියෙනවා. මේ අවස්ථාවේදී ලිපියක් සභාගත කරනවා කරුණාකරලා එය ඉටුකර දෙන්න.

**03(28)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම නගර සභාව මගින් ඉදිකරන ලද නාන ළිං හයක් අඟුලාන කොට්ඨාශයේ තිබෙනවා. එයින් 4 ක් විතර පාවිච්චි කරන්න බැරි තත්වයට අපිරිසිඳු වෙලා තිබෙනවා. මම හිතන්නේ අපරාදේ සභාව විසින් ස්ථාපනය කරලා තියෙන මේ නාන ළිං ටික ශුද්ධ පවිත්‍ර කරලා දුන්නොත් ප්‍රදේශයේ ඉන්න සියළුම අයට එයින් ප්‍රයෝජනයක් ගන්න පුළුවන් කියලයි මගේ අදහස. ඒ නිසා අත්සන් කිහිපයක් සහිත ලිපියක් සභාගත කරනවා. මෙය ඉතාම පහසුවෙන් කරන්න පුළුවන් වැඩ කටයුත්තත් නිසා කරුණාවෙන් ඉල්ලා සිටිනවා කඩිනමින් මේ වැඩේ කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලීමක් කරනවා.

**03(29)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පල්ලිය පාරේ කාණු පද්ධතියක් තියෙනවා මාසෙකට කලින් ශුද්ධ පවිත්‍ර කරලා තිබෙනවා. නමුත් මේ වෙනකොට නැවතත් එය අපිරිසිඳු වෙලා තියෙනවා. මම නම් දකින්නේ මේ වැඩේ හරියට කෙරෙන්නේ නැහැ කියන එකයි. ඒ නිසා එය ඉටුකර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**03(30)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම මතක් කරන්න ඕන අඟුලාන ආදාහනාගාරය යාබදව තියෙන කාණු පද්ධතිය ශුද්ධ පවිත්‍ර කරන්න කියලා 08/15 ඔබතුමාට ලිපියක් භාරදුන්නා. මම හිතන්නේ මාසෙකට පසුව ශුද්ධ පවිත්‍ර කරන්න ඇවිල්ලා තිබෙනවා. ඒක හොඳයි. නමුත් අඩුම තරමින් ඉල්ලීම කරපු මන්ත්‍රීවරයාටවත් දැනුවත් කිරීමක් කරලා නැහැ. ඒක හේතුකොටගෙන වැඩේ හරියට කෙරිලා නැහැ. මම සභාගත කරනවා. මම ෆොටෝස් අරගෙන ඔබතුමාට ඉදිරිපත් කරනවා මේ වැඩේ හරියට කරලා නැහැ. එපා වාහෙට හොඳි බෙදන්නා වගේ තමයි මේ වැඩේ කරලා තියෙන්නේ ඒ නිසා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අඩුම තරමින් මේ ඉල්ලීම කරපු මන්ත්‍රීවරයාටවත් දැනුම්දීමක් කරන්න. එතකොට අපිට බලන්න පුළුවන් මේ වැඩේ හරියට කරනවද කියලා. සීමිත සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගන්න ඕන නිසා ඇත්තටම මන්ත්‍රීවරයා හිටියා නම් මේ වැඩේ හරියට කරගන්න තිබුණා. මේ පිළිබඳ සොයා බලන්න කියලා කාරුණික අවධානය යොමු කරනවා.

**03(31)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම මට ලිපියක් ලැබිලා තියෙනවා ඩබ්. ෂෙල්ටන් ලලිත්, 1/10, මහ නුග සෙවන පාර, කටුකුරුන්ද, මොරටුව. මේ අනවසර මිරිස් කුඩු මෝලක් පවත්වාගෙන යාම සම්බන්ධවයි මේ ලිපිය ඉදිරිපත් කරලා තියෙන්නෙ. කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳ සොයා බලලා මෙයට අවශ්‍ය කටයුතු කරන්න කියලා.

**03(32)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පෙත්සම් හා ආයාචනා පැමිණිලි යටතේ විශේෂයෙන්ම පළමු කාරණය සිළුමිණ පුවත්පතේ අගෝස්තු මාසේ 24 වෙනිදා පිටු අංක 06 යටතේ ඉදිරිපත් කරලා තියෙන අනාවරණය කියන වාර්තාව. ඒකෙන් ඉදිරිපත් කරලා තියෙන්නේ තාරක වික්‍රමසේකර කියන අය තමයි මේක ලියලා තියෙන්නේ. මේක මොරටුව මහා නගර සභාවට අති දැවැන්ත ප්‍රහාරයක් එල්ල කරලා තියෙනවා. එකින් එකට කියවගෙන යනකොට පැහැදිලි වෙන්නේ ඔබතුමා විසින් පසුගිය සභා වාරයේදී නෙමෙයි ඊට කලින් සභා වාරයේදී ගළවා ඉවත් කරලා ඉන්පසුව නොසළකා හැරපු විගණන වාර්තාවේ සඳහන් වුණු කරුණු කාරණා තමයි මේ පුවත්පත් වාර්තාවේ තියෙන්නේ. සාමාන්‍යයෙන් නම් මේ වගේ පුවත්පත් වාර්තාවක් එළිදැක්වුවාට පසුව අපි මොරටුව මහා නගර

සභාව හැටියට මේකට පිළිතුරු දෙන්න ඕන. නමුත් මේ දක්වා අගෝස්තු මාසේ 24 වෙනිදා සිට මේ දක්වා මම හිත්නනේ නැහැ මොරටුව මහා නගර සභාවේ අවධානය මේ සඳහා යොමු වෙලා තියෙනවා කියලා. මේකේ තියෙන්නේ කෝටි ගණන් බදු සල්ලි වලට ඇස වසා සුවසේ නිදන පොහොසත් මොරටු මහා නගර සභාව කියන ශීර්ෂ පාඨය යටතේ තමයි මෙය ඉදිරිපත් කරලා තියෙන්නේ. ඔබතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය ඉන්නවා, පත්තරය හැමදාමත් ඔබතුමාගේ කාර්යාලටත් එනවා, කොමාරිස්තුමියගේ කාර්යාලයටත් යනවා සහ විවිධ තැන් වලට යනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් වහාම පිළිතුරු ලිපියක් පුවත්පතේ පළ කරගන්නට අවශ්‍ය කටයුතු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම මේ අවස්ථාවේදී අපි ඔබතුමාට යොමු කරනවා. මොකද හේතුව මේක නගර සභාවට කළු පැල්ලමක්. නිශාන්ත ප්‍රදිනාන්දු කියන නගරාධිපතිවරයාටත් හොඳ නැහැ.

**03(33)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මගේ කතාවේදී නම් මම මන්ත්‍රිවරයෙකු හැටියට ඔබ විසින් මාව පත්කරපු අපහසුතාවයක් සම්බන්ධයෙන් මේ ගරු සභාවට මා මාගේ විරෝධය පළකරන්න මෙය අවස්ථාවක් කරගන්නවා. මම අද මේ බිත්තර කට්ටක් අරන් එන්න හිටියේ හැංගෙන්න. මොකද හේතුව අපි පසුගිය සභා වල දිගින් දිගටම කළේ නගරාධිපතිවරයාට පෙන්වලා දුන්නා නගර සභාවේ විවිධ පුද්ගලයන් කරන වංචා සහ දූෂණ සම්බන්ධයෙන්. ඒවා පෙන්වලා දීලා අපි කිව්වා මේවා අවම කරගෙන යන්න ඔබේ පාලනය නිවැරදි දිශාවකට ගමන් කරවන්න අපි අපේ සහයෝගය ලබාදෙනවා, මේ හොරකම් වංචාවන් අවම කරගෙන මේ ගමන යන්න කියලා. එහි ප්‍රතිඵලයක් හැටියට අපි පෙන්වුවා එදා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් කරපු අක්‍රමිකතාවයක්. ඒ අක්‍රමිකතාවය පෙන්වලා අද වෙනකොට ඒ අක්‍රමිකතාවය කොච්චර දීර්ඝව ගිහිල්ලා තියෙනවද කියලා මා සඳහන් කළ යුතු වන්නේ නැහැ ඔබ හොඳින් දන්නවා. එතකොට එහෙම අවස්ථාවක ඔබ විසින් සමාජ මාධ්‍ය හරහා වීඩියෝවක් ප්‍රචාරය කරනවා ව්‍යංගයෙන් මට ජීවිත තර්ජනයක එල්ල කරලා, සුජිත් පුෂ්පකුමාර කියන නම සඳහන් කරලා, සුජිත් පුෂ්පකුමාර දැනගන්න ඕන තව අපිට කරන්න දේවල් තියෙනවා, වැඩිය දැඟලුවොත් අපි ඒවා කරනවා, සුජිත් පව්, ආදී වශයෙන් තර්ජනාත්මක වීඩියෝවක් ඔබත්, අපේ නියෝජ්‍ය නගරාධිපතිතුමියත්, සුදේශ් ඉන්ද්‍රජිත් මන්ත්‍රීවරයාවත් දෙපැත්තේ වාඩි කරවලා ඔබ ප්‍රකාශයක් කරනවා මා දැක්කා. මා ඒ සම්බන්දයෙන් මාගේ ආරක්ෂාව පතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලකුත් කළා. මොකද හේතුව යම් හෙයිකින් මාගේ ජීවිතයට යම් තර්ජනයක් වුණොත්, යම් ප්‍රශ්නයක් වුණොත් ඒකට වගකිවයුත්තා මොරටු මහා නගර සභාවේ වර්තමාන නගරාධිපතිවරයා නිශාන්ත ප්‍රදිනාන්දු මහත්තයා කියලා. මම මගේ ආරක්ෂාව සඳහා පැමිණිල්ලක් දැම්මා. නගරාධිපති හැටියට අපි මෙතෙක් උත්සාහ කළේ සෑම සභාවකදීම ඔබව නිවැරදි ගමන් මාර්ගයක අරගෙන යන්න. අපි අහලා තියෙනවා එක දෙයක්, ඔබට බනින මිතුරා හොඳ මිතුරෙක්ය, බොරු ගුණ කියන්නා ඔබගේ හතුරෙක්ය කියලා. නමුත් අපි ඔබව විවේචනය කළේ නැහැ කොහේදිවත්. සභා වාර්තා අරන් බලන්න පුළුවන්. යම් යම් තැන් වලින් සිදුවන අකටයුතුකම් තමයි අපි විවේචනය කළේ. අපි පෙන්වුයේ යම් යම් තැන් වලින් සිදුවන අකටයුතුකම්. නමුත් ඔබට විරුද්ධව නැගී හිටීමක් ලෙස ඔබ එය වටහා ගත්තා.

- සභා ඝෝෂා -

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඔබ කවුරුත් දන්නවා සභාවක් පවත්වාගෙන යා යුතු ඒ දීලා තියෙන යම්කිසි ක්‍රියාපටිපාටියක් තියෙනවා. අපිට පහර දුන්නට කමක් නැහැ, හැබැයි එක යම් සීමාවක් ඇතුලේ පාලනය වෙන්න ඕනනේ නැත්තම් කොහොමද මේ සභාව කරන්නේ. ඔබ ඉදිරිපත් කරණ කරුණු සලකා බලන්නම්. මගේ අවදානය හොඳින් යොමු වෙලා තියෙනවා මීට පෙර තිබුණ ඒ මියගිය විපක්ෂයට වඩා යම් ක්‍රියාකාරී විපක්ෂයක් ලෙස හැසිරෙන්න ඔබ කටුයතු කරනවා එක හොඳයි. නමුත් එහි සීමාවක් තිබිය යුතුයිනේ.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, මම මේ තර්ක කරනවා නෙමෙයි. අලුත් මන්ත්‍රීවරුන්ට දැන ගන්න මේ කියන්නේ. මන්ත්‍රීවරයෙක්ගේ වරප්‍රසාද උල්ලංගණය වුනාට පස්සේ, ඒ මන්ත්‍රීවරයාට තමන්ගේ වරප්‍රසාද වෙනුවෙන් කතා කරන්න අයිතමයක් නැහැ. හෙට දවසේ මෙතුමට මෙතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් උනොත් එහෙම ඔහුට අයිතිය තියෙනවා ඒ සම්බන්ධයෙන් නැගිටලා කතා කරන්න. කවුරු හරි කියනවනම් පෙත්සම් හා පැමිණිලි යටතේ මෙය කතා කරන එක වැරදි කියලා එහෙම එකක් නැහැ.

**ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, කවුරුත් ඔබට එහෙම කිවුවේ නැහැ ඉදිරිපත් කරන්න අවස්ථාව තියෙනවා ඔබට අවස්ථාව දුන්නා. ඔබට තියෙන්නේ සංශිප්ත වශයෙන් ඉදිරිපත් කරන්න. නමුත් ඔබ වෙන දීර්ඝ කතාවක් කරනවා. මට කියන්න අවශ්‍යා දෙයක් තියෙනවා. ඔබ දන්නවා ගෙවුනේ මාස 03යි ඒ කාලය ඇතුලේ අපි යම් වෙහෙස කර කටයුත්තක නිරත වෙමින් ඉන්නවා. මොකද අපේ ආයතනයේ තත්වය, එහි හැසිරීම්, එහි සොබාවය. සේවකයින්ගේ, නිලධාරින්ගේ පැත්තෙන් ඊළඟට ජනතාවගේ පැත්තෙන් එන විශාල අඩුපාඩුකම් සැහෙන්න විශාල තෙරපුමක් ඇතුලේ බොහොම සෙමින්මුත් ස්ථාවර ගමනකට අවතීර්ණ වෙනවා. එතකොට විපක්ෂය පැත්තෙන් ඉදිරිපත් කරන කාරණා නොසලකා හැර නැහැ. ඒ හැම කාරණාවක්ම සැලකිල්ලට ලක් කරමින් ඉන්නවා. සමහර එවා සීමා ඉක්මවා ගිය එවා හැබැයි මට අවශ්‍යායි හැමදෙනාවම එකතු කරගෙන යහපත් තැනකට යන්න. එතකොට පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ මම ඉතාමත් තදින් අපේ ඉංජිනේරුතුමා ප්‍රමුඛ  කර්මාන්ත අංශයට මට යමක් කියාගන්න ඕන. දැන් ඔබ දන්නවා සෞඛ්‍ය අංශය පැත්තෙන් ගත්තම හිටියට වඩා සාපේක්ෂව ඒ සේවකයින් වැඩක් කරනවා. ඒ ප්‍රසාදය ඔවුන්ට තියෙනවා. කර්මාන්ත අංශයට පැත්තට ප්‍රසාදයක් නැතුව නෙමෙයි, තිබුණ වංචා දූෂණ යම් අක්‍රිමිකතා සැලකියයුතු ලෙස පාලනය වෙලා තියෙනවා. හැබැයි එනමුදු මන්ත්‍රීවරු ඉදිරිපත් කරන පෙත්සම් පැමිණිලි, දැන් මගේ ලේකම්වරයා ලියුම දුන්නා අයින්වෙන්න. හේතුව ඔහු ඉදිරිපත් කරන ඔබවිසින් දුන් පෙත්සම් පැමිණිලි ප්‍රමාණය කර්මාන්ත අංශයට යවපු ප්‍රමාණයයි ඔහුට මැදහත් වෙලා පෙරලා එවට ලැබුණ උත්තර ප්‍රමාණයයි, විශාල ප්‍රමාණයකින් 5කට තමයි පිළිතුරු ලැබිලා තියෙන්නේ. ඔහුට කළකිරිලා. ඔහු ආවේ වැටුප් ගන්න නෙමෙයි. ඉතින් මම කියන්නේ ඉංජිනේරුතුමාට වැඩි සැලකිල්ලක් දක්වමු. මන්ත්‍රීවරු ජනතාවගේ කාරණාවක්නේ ඉදිරිපත් කරන්නේ. ඒ ඉදිරිපත් කරන කාරණාව පිලිබඳව හොයලා බලලා පිළිතුරක් දෙන්න. වැඩේ කරන්න බැරිවෙයි මම දන්නවා ඔබේ අංශය මුහුණදෙන විශාල සේවක හිඟයයි වැඩ කන්දරාවයි එවත් හරි හැබැයි අපේ මහජන නියෝජිතයින් බලාගෙන ඉන්නවා මොකක් හරි උත්තරයක් ලැබේනකන්. ඒ නිසා ඒ හැම ප්‍රශ්නකටම පිළිතුරු දෙන්නනම් ඒ කාරණා විමර්ෂනයට ලක් කරන්න ඕන, ඒ ස්ථානවලට යන්න ඕන පරික්ෂණ කරලා මට ඉදිරිපත් කරන්න වාර්තාවක් ඕන. ඉතින් මම ඉතාම ඕන කමින් ඉල්ලාසිටිනවා වැඩි සැළකිල්ලක් දක්වන්න මේ පෙත්සම් පැමිණිලි යටතේ ආපු දේවල් ඔබ අරගෙන වැඩි සැළකිල්ලක් දක්වන්න. ඒවා පුළුවන්ස බැරිද කියලා අපිට වාර්තාවක් දෙන්න. අපිට කරන්න පුළුවන් ප්‍රමාණයකුත් මේකෙන් මඟහැරෙනවා කියලා මට හිතෙනවා.

03(34) **මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමා, අපිව දැනුවත් කරනවා යම්කිසි විශේෂ වැඩමුළු වලට, අපිට ගිය වතාවෙත් තිබුනා අල්ලස් හා දූෂණ සම්බන්ධව වැඩසටහනක් එදිනම තියෙනවා අපේ මොරටුව සංවර්ධන කමිටුවේ රැස්වීමක් එතකොට මේ දෙකෙන් අපි මොකද්ද තෝරගන්නේ. දෙකම වැදගත් අල්ලස් හා දූෂණ සම්බන්ධව දැනගැනීමත් වැදගත් ඒ වගේම සංවර්ධන කමිටුවට ඉදිරිපත් වීමත් වැදගත්. මොකද සංවර්ධන කමිටුවට ගියාම තමයි අපි දැනගන්නේ අපේ සභාවේ කොච්චර ප්‍රමානයක් අපේ ව්‍යාපෘති ටික ක්‍රියාත්මක වෙනවද කියලා. එදා අපි දැන ගත්තා මිලියන 50ට වැඩි ප්‍රාග්ධන වියදමක් අපි ඉදිරිපත් කරලා තියෙනවා මොරටුව වෙනුවෙන් ඒ වගේ දේවල් අපිට අතපසු වීමක් වෙනවා එම නිසා මේ දින වාකවානු කලින් හරියට බලන්න. අපිට මේ සම්බන්ධව තීන්දුවක් අරගෙන දැනුවත් කරන්න.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, මෙතුමා දැනුම් දෙනවා. ලබන 11 වෙනිදා කළමනාකරන එකේ වැඩසටහනක් එකට සම්බන්ධ වෙන්න පුළුවන් කියලා මන්ත්‍රීවරුන්ට, සභාවේ 11 දෙනෙකුගේ නම් යවලා තියෙනවා ඒ වැඩසටහනට ඒ අය සම්බන්ධ වෙන්න. ඒ වගේම අපේ සුජිත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු පෙත්සම ඇතුලේ එක කතාවක් කිවුවා මම හිතන්නේ, ඕක මාධ්‍ය වලටත් ගන්න පුළුවන් මම දන්නේ නැහැ අසාර්ථකම නගරාධිපති, මාස 3යි මන් දැක්කා ෆේස්බුක් එකෙත් මේ ආයතනයේම සේවිකාවකුත් එක දානවා. මෙතුමාගෙනුත් ඒ ප්‍රකාශයම කියවුනා. මේක පැවතුන පාලනයයි වර්තමානයේ පවතින තත්වයයි සන්සන්ධනය කලොත් ඊයේ ර. 7 පසුවෙලත් විපක්ෂ කණ්ඩායම් රැස්වීම් තියනවා මේක ඇතුලේ.

**03(35)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ සභාව නමට ආමන්ත්‍රණය කරලා එවන වැඩමුළු සඳහා මන්ත්‍රීවරු සහාභාගිවීමෙදී ඉල්ලීමක් කරනවා, මන්ත්‍රීවරුන්ට ලොකු වැටුපක්, දීමනාවක් ලැබෙන්නේ නැහැ විශේෂයෙන් කාන්තාවන් ගත්තහම පිරිමි අපිටනම් බස් එකක හරි ගමනක් යන්න පුළුවන් කාන්තාවන්ට පොඩි දුරක් ගියත් ත්‍රිවිලරයක තමයි යන්න වෙන්නේ. එම නිසා ප්‍රවාහන පහසුකම් සැපයීමේදී බොහොම අසීරුතාවයකට පත්වෙලා ඉන්නවා කියලා කිහිප දෙනෙක්ම දැනුම් දීලා තියෙනවා. එම නිසා සභාව නමට ආමන්ත්‍රණය කරලා කරන වැඩමුළු සඳහා ප්‍රවාහන පහසුකම් සපයා දෙන්න කියල ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මම ඔබගෙන් ඉල්ලීමක් කරනවා සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු ලෙස ඔබට යම් ගැටළුවක් තියෙනවනම් අපි කළයුතු වැඩේ මෙහෙම කරමු කියලා ඕනෑම වේලාවක මුණගැහිලා සාකච්ඡා කරමු. ඒ සුහදත්වය පවත්වාගෙන යන්න මම කැමතියි.

## 04. ප්‍රශ්න

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, 04(1) යටතේ මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු ඉදිරිපත් කරනවා.

**04(01) මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු ඉදිරිපත් කරන ලදි.**

1. කසළ කළමනාකරණය යටතේ අලෙවිකරණ ලද භාණ්ඩ සඳහා 2023 මාර්තු මස වන තෙක් සභාවට ලැබුණු ආදායම මාසික වශයෙන් මාස 06 ක කොපමණද?

| වර්ෂය | මාසය | විකුණුම් ආදායම රු. |
|---|---|---|
| 2022 | ඔක්තෝබර් | 557,022.00 |
| | නොවැම්බර් | 507,560.80 |
| | දෙසැම්බර් | 685,121.50 |
| 2023 | ජනවාරි | 551,476.10 |
| | පෙබරවාරි | 382,474.00 |
| | මාර්තු | 107,025.00 |

2. 2023 මාර්තු මස 19 වන දිනෙන් ආරම්භ වන ලද කොමසාරිස් පාලනය යටතේ කසල කළමනාකරණ ව්‍යාපෘතියේ භාණ්ඩ සඳහා 2025 ජූනි මස 02 වන දින දක්වා මාසික ලැබීම් මාසිකව වෙන් වෙන් වශයෙන් කොපමණද?

| වර්ෂය | මාසය | විකුණුම් ආදායම රු. |
|---|---|---|
| 2023 | මාර්තු 19 සිට මාර්තු 31 දක්වා | 107,025.00 |
| | අප්‍රේල් | 433,924.75 |
| | මැයි | 479,436.25 |
| | ජූනි | 131,660.00 |
| | ජූලි | 297,416.25 |
| | අගෝස්තු | 463,620.50 |
| | සැප්තැම්බර් | 239,032.00 |
| | ඔක්තෝබර් | 468,400.00 |
| | නොවැම්බර් | 269,428.75 |
| | දෙසැම්බර් | 299,746.50 |

| වර්ෂය | මාසය | විකුණුම් ආදායම රු. |
|---|---|---|
| 2024 | ජනවාරි | 496,279.50 |
| | පෙබරවාරි | 287,314.20 |
| | මාර්තු | 161,970.50 |
| | අප්‍රේල් | 112,902.00 |
| | මැයි 01 සිට ජූනි 12 දක්වා | 442,626.50 |
| | ජූනි 13 සිට ජූලි 17 දක්වා | 450,376.26 |
| | ජූලි 18 සිට අගෝස්තු 15 දක්වා | 362,472.89 |
| | අගෝස්තු 16 සිට සැප්තැම්බර් 18 | 458,779.64 |
| | සැප්තැම්බර් 19 සිට ඔක්තෝබර් 29 දක්වා | 130,349.50 |
| | ඔක්තෝබර් 30 සිට නොවම්බර් 11 දක්වා | 64,420.50 |
| | නොවැම්බර් 12 සිට දෙසැම්බර් 12 දක්වා | 107,650.00 |
| | දෙසැම්බර් 13 සිට ජනවාරි 16 දක්වා | 176,946.80 |

| වර්ෂය | මාසය | විකුණුම් ආදායම (බදු රහිත) රු. |
|---|---|---|
| 2025 | ජනවාරි 17 සිට පෙබරවාරි 13 දක්වා | 628,808.13 |
| | පෙබරවාරි 14 සිට මාර්තු 12 දක්වා | 351,538.15 |
| | මාර්තු 13 සිට අප්‍රේල් 21 දක්වා | 316,093.87 |
| | අප්‍රේල් 22 සිට මැයි 16 දක්වා | 289,417.02 |
| | මැයි 17සිට ජූනි 25 දක්වා | 150,080.00 |

3. 2025 ජූනි 02 දින සිට අගෝස්තු 02 දක්වා කසළ කළමනාකරණ ව්‍යාපෘතියේ භාණ්ඩ සඳහා ලැබුණු ආදායම කොපමණද? (මාසිකව වෙන් වෙන් වශයෙන්)

| වර්ෂය | මාසය | විකුණුම් ආදායම (බදු රහිත) රු. |
|---|---|---|
| 2025 | ජූනි 02 සිට ජූලි 22 දක්වා | 519,954.84 |
| | ජූලි 23 සිට අගෝස්තු 2 දක්වා | 173,413.56 |

4. කරදියාන කසළ අංගනය සඳහා මොරටුව මහා නගර සභාව විසින් 2022 සැප්තැම්බර් මාසයේ සිට 2023 මාර්තු මාසය දක්වා මිශ්‍ර කසළ සහ තෝරා වෙන් කරන ලද කසළ සඳහා කළ ගෙවීම් මාසිකව වෙන් වෙන් වශයෙන් කොපමණද?

| වර්ෂය | මාසය | ගෙවූ මුදල රු. |
|---|---|---|
| 2022 | සැප්තැම්බර් | 2427811.00 |
| | ඔක්තෝබර් | 2458489.41 |
| | නොවැම්බර් | 2352213.31 |
| | දෙසැම්බර් | 2120618.40 |
| 2023 | ජනවාරි | 2202783.17 |
| | පෙබරවාරි | 1424831.74 |
| | මාර්තු | 1580585.80 |

5. 2023 මාර්තු මාසයේ සිට 2024 සැප්තැම්බර් මාසය දක්වා වෙන් වෙන් වශයෙන් කරදියාන කසළ අංගනයට මිශ්‍ර කසළ සහ වෙන් කරන ලද කසළ සඳහා කළ ගෙවීම් මාසිකව වෙන් වෙන් වශයෙන් කොපමණද?

| වර්ෂය | මාසය | ගෙවූ මුදල රු. |
|---|---|---|
| 2023 | අප්‍රේල් | 1487217.11 |
| | මැයි | 2149998.74 |
| | ජූනි | 2785560.00 |
| | ජූලි | 2001205.00 |
| | අගෝස්තු | 2190804.12 |
| | සැප්තැම්බර් | 2200437.46 |
| | ඔක්තෝබර් | 2342158.57 |
| | නොවැම්බර් | 2366952.19 |
| | දෙසැම්බර් | 2286303.00 |
| 2024 | ජනවාරි | 2388060.99 |
| | පෙබරවාරි | 2007745.81 |
| | මාර්තු | 2165240.00 |
| | අප්‍රේල් | 2460640.06 |
| | මැයි | 2497602.38 |
| | ජූනි | 3034082.15 |
| | ජූලි | 3007845.00 |
| | අගෝස්තු | 2417929.59 |
| | සැප්තැම්බර් | 2157357.93 |

6. 2024 සැප්තැම්බර් මාසයේ සිට 2025 ජූනි 02 දක්වා කරදියාන කසළ අංගනය සඳහා වෙන් කරන ලද හා මිශ්‍ර කසළ සඳහා කරන ලද ගෙවීම් වෙන් වෙන් වශයෙන් මාසිකව කොපමණද?

| වර්ෂය | මාසය | ගෙවූ මුදල රු. |
|---|---|---|
| 2024 | ඔක්තෝබර් | 2427445.33 |
| | නොවැම්බර් | 2694267.08 |
| | දෙසැම්බර් | 2965824.02 |

| | | |
|---|---|---|
| 2025 | ජනවාරි | 3289855.12 |
| | පෙබරවාරි | 2927951.55 |
| | මාර්තු | 3289855.12 |
| | අප්‍රේල් | 2956063.36 |
| | මැයි | 3459242.57 |

7. 2025 ජූනි මස දෙවන දින සිට 2025 අගෝස්තු 02 දක්වා කරදියාන කසළ අංගනය සඳහා මිශ්‍ර සහ වෙන් කරන ලද කසළ සඳහා මාසිකව වෙන් කරන ලද කසළ සඳහා මාසිකව වෙන් වෙන් වශයෙන් කරන ලද ගෙවීම් කොපමණද?

   2025 ජූනි මස 02 වන දින සිට 2025 අගෝස්තු 02 දක්වා කරදියාන කසළ අංගනය සඳහා මිශ්‍ර කසළ සහ වෙන් කරන ලද කසළ සඳහා ගෙවීම් කර නොමැත.

**04 (02)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි අංක 04 (02) යටතේ මහා නගර සභා මන්ත්‍රී ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු ලබාදීමට මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**04(02) මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න,**

1. මොරටුව මහා නගර සභාව මඟින් පාලනය වන ජනසෙත කලා කේන්ද්‍රය සංවර්ධන කටයුතු ආරම්භ වූයේ කවදාද?
2. ජනසෙත ගොඩනැඟිල්ලේ සංවර්ධනය කරන ලද කොටස් මොනවාද?
3. ජනසෙත ගොඩනැඟිල්ල සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු ගත මුදල කොපමණද?
4. ජනසෙත ගොඩනැඟිල්ල සංවර්ධනය සඳහා සත්‍ය වශයෙන් වැය කළ මුදල කොමපණද?
5. ජනසෙත ගොඩනැඟිල්ලේ සත්‍ය වශයෙන් සංවර්ධනය කරන ලද කොටස් මොනවාද?
6. ජනසෙත ගොඩනැඟිල්ලේ වැඩ අවසන් කළ දිනය කවදාද?
7. ජනසෙත ගොඩනැඟිල්ලේ සංවර්ධනයෙන් පසු ජනතා අයිතියට පැවරූ දිනය (විවෘත කළ දිනය) කවදාද?
8. ජනසෙත ගොඩනැඟිල්ලේ ඇස්තමේන්තුවට අනුව සියලු කොටස් වල සංවර්ධනය නිම කොට තිබේද?

## 05. <u>යෝජනා</u>

**05(01) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

අඟුලාන පොදු සුසාන භූමිය ක්‍රමවත්ව හා විධිමත්ව සැලසුම් කර පහත පරිදි සැදීමට සභාවට යෝජනා කරන්නීය.

1. මුර කුටියක් සාදා ආරක්ෂක නිලධාරියෙකු යෙදවීම.
2. පොදු සුසාන භූමිය තුළට වීථි ලාම්පු සවිකිරීම.
3. ජලනල පහසුකම් ලබාදීම. (මුර කුටිය තුළට)
4. සුසාන භූමිය තුළ ඉන්ටර්ලොක් ගල් අතුරා අඩි 3 ක පාරක් සැලසුම් කිරීම.

5. ඉදිරිපස ගේට්ටුවක් සවිකිරීම.
6. පොදු සුසාන භූමිය තුළ දේහය රැගෙන ආ පසු තැන්පත් කිරීමට ගොඩනැගිල්ලක් සෑදීම.
7. පොදු සුසාන භූමිය පුළුල් කිරීම සඳහා සභාවේ අවධානය යොමු කිරීම.
8. ආදාහනාගාරය සම්බන්ධව නිසි තීරණයක් ගැනීම.
9. සුසාන භූමිය පිටුපසින් ආරක්ෂිත වැටක් ඉදිකිරීම.

**මහා නගර සභා මන්ත්‍රී පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම කිහිප වතාවක්ම අඟුලාන පොදු සුසාන භූමිය සම්බන්ධව කතා කලා. ගිය සභා වාරයේදීත් කතා කරා. ඒ කතාවෙන් පසුව මේ අඟුලාන පොදු සුසාන භූමිය ප්‍රදේශවාසී විශාල ප්‍රමාණයක් සම්බන්ධවෙන පොදු සුසාන භූමියක් හැබැයි මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ ආදාහනාගාරය පරීක්ෂා කරන්න ගියා මමයි, නාගරික ඉංජිනේරුතුමයි, බේසර ලාල් හිටපු මන්ත්‍රීතුමයි. ගියාම කිසිම දෙයක් වෙලා නැහැ. ඒ ආදාහනාගාරය පාවිච්චි කරන්නේ නැහැ. අපිට ඇතුලට ගිහිල්ලා බැලුවා දැන් ආදාහනාගාරය පාවිච්චි නොකර ඉඳලා ගරු නගරාධිපතිතුමනි, පොඩි පොඩි රෙපයාර් ටිකක් තියෙනවා. දැන් අවුරුදු ගාණකට කලින් කොරෝනා කාලෙත් මේක හදලා. අවුරුදු ගාණක් වහලා තියෙලා එතැන ඒ අවට ඉන්න ප්‍රදේශවාසීන්ගේ යම් යම් ක්‍රියා කලාප නිසා ආදාහනාගාරයේ අවට ප්‍රදේශයේ පොඩි ප්‍රශ්න ගොඩක් තියෙනවා. එය පාවිච්චි කරන්න බැරි හේතුව තමයි මරණයක් ගෙනාවම තියන්න ස්ථානයක් නැති ප්‍රශ්නේ තමයි තියෙන්නේ. ඒ ස්ථානය දැන් ගලවලා ඉවත් කරලා. මේක ලොකු අපරාධයක්. රාවතාවත්ත පොදු ආදාහනාගාරයටම හැම එකක්ම තියාගෙන, මේ අඟුලාන ආදාහනාගාරය තියෙද්දි අපි රාවතාවත්තට හැම මරණයක්ම දානවා. ඒක පාවිච්චි කරන්න පුළුවන් තත්වයක තියෙන්නේ. පොඩි රෙපයාර් එකක් නැවත කරලා අදාහානාගරය ක්‍රියාකරවන්න කියන ඉල්ලීම ඔබතුමාට කරනවා. ඒ වගේම රේල් පාරෙන් එහා පැත්තේ තියෙන පොදු සුසාන භූමිය මෙය හරිම අක්‍රමවත්. මොකද මෙහෙ ජනතාවත් රාවත්වත්ත පැත්තේ ජනතාවත් දෙගොල්ලොම එකයි. එකකට එක විදිහකටත් අර පැත්තට තව විදිහකටත් සලකන්න එපා. මොකද එහෙම සළකලා තමයි පසුගිය කාලයේ මේ තත්වය ඇතිවෙලා තියෙන්නේ. මම ඉල්ලා සිටිනවා ඒ පොදු සුසාන භූමිය මුරකුටියක් හදලා මුර සේවකයෙක් දාලා ගේට්ටුවක් දාලා හතර වටෙන් වට කරලා මෙය ස්ථාපිත කරන්න කියලා. ඒ වගේම පොදු සුසාන භූමිය ඇතුළත පොඩි මාර්ග පද්ධතියක් හදලා මරණයක් ගෙනියන්න පුළුවන් ආකාරයට මේක ලස්සනට හරි ගස්සලා දෙන්න කියල ඉල්ලීමක් කරනවා. ඒ වගේම මෙතන විශාල ඉඩ ප්‍රමාණයක් තියෙනවා. මම කමිටුවේදී බලාගෙන හිටියා රාවතාවත්ත පසු දාකලා පුරවන්න යෝජනා වුණා. එහෙම දෙයක් අවශ්‍ය නැහැ. තෙලවල, බොරුපන ප්‍රදේශ වල අයගේ මරණත් අඟුලාන පොදු සුසාන භූමියේ වළලන්න ඉඩ තියෙනවා. ඒක කළමනාකරණය කරගත්තා නම් ලොකු ප්‍රයෝජනයක් කරගන්න පුළුවන්. යම්කිසි දවසක මෙරීන් ඩ්‍රයිව් එක ඔතනින් ගියොත් ගෙවල් ටික ශුද්ධ වෙනවා. එතකොට ඒවා ඉවර වුණාට පස්සෙ මෙතන හොඳ එළියක් ඇතිවෙනවා. අපි ඒකට මූලික අඩිතාලමක් වශයෙන් අඟුලාන පොදු සුසාන භූමිය හදලා දෙන්න අපිට. පොදු සුසාන භූමි 4 යි අපිට තියෙන්නේ. මේ හතරම හොඳ තත්වයකට ගමු. අපි මූලිකත්වය දෙමු රාවතාවත්තටම නෙමෙයි. අනිත් තැන් වලටත් පොඩ්ඩක් මූලිකත්වය ලබාදෙන්න කටයුතු කරලා අඟාලන පොදු සුසාන භූමිය ගැන වඩාත් ඉක්මනින් අවධානය යොමු කරලා මෙය ඔබතුමා ප්‍රදේශවාසීන් වෙනුවෙන් ඉටු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, එතුමාට ස්තුතිවන්ත වෙනවා අඟුලාන පොදු සුසාන භූමිය පිළිබඳව මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. ඔබ දන්නවා මේ වෙනකොටත් අපි කර්මාන්ත කමිටුවේ අපෙ තියෙන ප්‍රධාන සුසාන භූමි හතර ඉතාම කඩිනමින් ප්‍රතිසංවිධානය කරලා, ප්‍රතිසංස්කරණය කරලා හදලා ජනතාවට වඩාත් පහසුකම් සහිත සුසාන භූමි බවට පත් කරන්න මේ වෙනකොටත්

අපි ඇස්තමේන්තු සකස් කරන්න අවස්ථාව දීලා තියෙනවා. ඒ නිසා අඟුලාන සුසාන භූමියේ ඒ සියළු අඩුපාඩුකම් වලට අදාල මැදිහත්වීම කර්මාන්ත කමිටුවට යොදලා තියෙනවා යොමු කරලා. ඔබතුමා කලින් කිව්වා වගේ ඇත්තටම තාක්ෂණ නිලධාරීන්ගෙන් වන යම් කාලය පිළිබඳ ප්‍රශ්නයක් නිසා තමයි මේ ගැටළු මතුවෙලා තියෙන්නේ. විශාල රාජකාරී ප්‍රමාණයක් තියෙන නිසා අපි ඉතාම ඉක්මනින් අඟුලාන පොදු සුසාන භූමියත් මේ කටයුත්තට දායක කරගෙන අපි උත්සහ කරනවා උපරිම මේ අවුරුද්ද අවසානය ඇතුළත කර්මාන්ත කමිටව විදිහට මේ කටයුතු අවසාන කරගන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාවට අදාළවම අපිට වැදගත්ම කාරණයක් බවට පත්වෙන්නේ හැම සුසාන භූමියකම තිබෙන ඉඩපාඩුව මදි නිසා, අපේ සියළුම සුසාන භූමි වල තියෙන ප්‍රශ්නය තමයි අපි සාමාන්‍යයෙන් භූමිදානය කරනකොට භූමිදානය කරන සිරුර යම් කාල පරිච්ඡේදයක් යනවා දිරාපත් වෙන්න. නමුත් ඉඩපාඩුව මදි නිසා සමහර වෙලාවට වලක් කපන්න ගියාම අර පරණ සිරුරු මතුවෙනවා. ඒත් එක්කම පසුගිය කාලයේ අපි දැක්කා එගොඩඋයන සුසාන භූමියේ ප්‍රධාන පාරේ අපි ගස් හිටවලා තියෙනවා නගර සභාවෙන්. ඒ ගස් තියෙන පාරෙත් වලක් කපලා තිබුණා. ඒ නිසා අපිට භූමි සැලැස්මක්, ලැන්ඩ්ස්කේපින් රිපෝට් එකක් මේ හැම සුසාන භූමියකටම අවශ්‍යයි. ඒ නිස මේ භූමි සැලැස්ම තුළ අපි එක වලක් භූමිදානය කටයුත්තක් කළොත් හරියටම ඒක ෂෙඩ්‍යුල් එකට කරාම කාලපරිච්ඡේදය ඉවර වුණාම මුල් එකට එන්න පුළුවන්. සමහර වෙලාවට යන පාරෙත් වලවල් කැපෙනවා. එතකොට මේ වලේ අයිතිකාරයා එනවා අපේ තිබුණ පවුල් වලක්, සමහර වෙලාවට මේකට කවුරුහරි ඩීල් එකක් දාලා කියලා. ඒ නිසා මේ ප්‍රශ්න සියල්ලක්ම අපි යාවත්කාලීන කරන්න ඕන පවුල් වලවල් මොනවද, භූමිදානය කරන්න පුළුවන් ලැන්ඩ්ස්කේපින් රිපෝට් එක කොහොමද හදන්නේ කියලා. මේකට ඒ සැලසුමත් අනිවාර්යෙන් අවශ්‍යයි. එහෙම නැත්නම් අපේ තියෙන පාරවල් වල තමයි මිනී වළලන්න සිදුවෙන්නේ සුසාන භූමිය ඇතුළේ තියෙන. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. පසුගිය කාලේ නම් සුසාන භූමි වල අපේ නගර සභාවේ හිටපු රවී මන්ත්‍රීතුමා ස්වේච්ඡාවෙන් සමහර ඒවාට ගිහින් උදවු කළා. ඒ වගේම අපේ මළිඳු මහත්මයාත් ඉන්නවා. සමහර වෙලාවට නර්ඩ් එක අපිට කිව්වට පසුව කැඩුණට පසුව යම් කාල පරිච්ඡේදයක් ගන්නවා. ෂෙල්ටන් මහත්මයාත් හිටියා නර්ඩ් එකේ. එතුමා දැන් විශ්‍රාම ගිහින්. ඒ සේවකයෝ මේකට අවශ්‍ය කරන තාක්ෂණ නිලධාරීන් යම් විශේෂ ප්‍රාගුණ්‍යයක් යටතේ පුහුණු වුණු යම් ප්‍රමාණයක් ඉන්නවා. ඒ නිසා මම හිතන්නේ ඔවුන්වත් අපි යම් යම් ආයතන වල සහ මේ ආයතනය තුළ යම් පිරිසක් ඉන්නවා නම් මේකට හැකියාව ඇති, ශක්‍යතාවය තියෙන ඔවුන්වත් අවබෝධ කරගන්න මේ සැකැස්ම යටතේම, යෝජනාව යටතේම අපි ඒක සැලසුම් කරන්න ඕන කියන අදහස තමයි මගේ අදහස.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සුරේෂ් මන්ත්‍රීතුමාගේ යෝජනාව කාලීන යෝජනාවක් විදිහට අපි හිතනවා. ඇත්තටම අඟුලාන සුසාන භූමිය ආදාහනාගාරය සහ භූමිදානය කරන ඒ භූමියට මම ගිය මාසේ වගේ ගියාම විශාල කැළයක් වගේ තිබුණා ඒ භූමිදානය කරන ස්ථානය. ඉන්පසු මමයි තව පිරිසකුයි ගිහින් තමයි ඒක ශුද්ධ කරලා ඒ භූමිදානය කටයුතු කරන්න ඒ ස්ථානයේ හැකියාව ලැබුණේ. අඟුලාන ප්‍රදේශයේ ජීවත්වන මිනිසුන්ට ජනතාවට ආර්ථික අපහසුතාවල් තියෙනවා. ඒ වගේම කල්දෙමුල්ල, ලක්ෂපතිය, කටුබැද්ද මේ ප්‍රදේශවල් වල ජීවත් වන ජනතාවට පහසුවෙන් යන්න පුළුවන් ළඟම තැන තමයි අඟුලාන සුසාන භූමිය කියන්නේ. කවුරුහරි මියගියොත් එයාට දෙන්න පුළුවන් ගෞරවයක් විදිහට මේ සුසාන භූමියත් පවත්වාගනෙ යන්න පුළුවන් ආකාරයට මෙය ස්ථාපනය කළ යුතු වෙනවා. අපි නැත්නම් යන්න ඕන ගල්කිස්ස සුසාන භූමියට. ආයේ මොරටුවට එනවා නම් ළඟම එක තමයි රාවතාවත්ත. ඒ නිසා අවශ්‍ය කටයුතු කරලා ඉතා ඉක්මනින් මේ යෝජනාව ක්‍රියාත්මක කරනවා නම් හොඳයි කියලා මම හිතනවා.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයාට මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මම හිතනවා සජිත් මන්ත්‍රීතුමා මේකට පොඩි මැදිහත්වීමක් කරන්න. මේක කර්මාන්ත කමිටුවට අරගෙන අපේ සුදේශ් මන්ත්‍රීතුමාත් අවශ්‍ය කරන මැදිහත්වීම කරයි. මමත්

ඉතාම දැඩි උවමනාවක ඉන්නවා අපිට වෙන සුසාන භූමි නැහැ. තියෙන්නේ ඔච්චරයි. දීර්ඝ කාලයක් භූමිදාන කටයුතු සිද්ධ වෙනවා. කොච්චර ආදාහන තිබුණත් භූමිදාන කටයුතු සිදු වෙනවා. එකින් එක අපිට කරන්න වෙන්නේ. එකවර ඔක්කොම බැරි වෙයි. අපි පුළුවන් නම් හොඳ බ්ලොක් ප්ලෑන් එකක් හැම සුසාන භූමියකටම පටන් ගන්න. එතකොට මෙතනට ආපුවම මෙතනින් අදාල අංකයට වෙන් කරලා දුන්නාම මේ තියෙන ඉඩකඩ ඉතා ඉක්මනින් කළමනාකරණ කරගන්න පුළුවන්. ඒ හින්දා මම ඉංජිනේරුතුමාටත් කියනවා ඉතාම ඉක්මනින් මේ යෝජනාව පදනම් කරගෙන මෙම කටයුතු ආරම්භ කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ එච්. අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, ඒකට පොඩි එකතු කිරීමක් කරන්න ඕන. අපි කර්මාන්ත කමිටු සභාපතිතුමා එකක් කතා කළා දැන් අඟුලාන සුසාන භූමිය දැන් පිරිලා. අපි රාවතාවත්ත සුසාන භූමියට සැලැස්මක් හදලා තියෙනවා. කර්මාන්ත අංශයේ මහේෂ් ළඟ තියෙනවා ඒ සැලැස්ම. ඒ සැලැස්මත් එක්ක අපි අර ගල් ටික ගලවලා ඉස්සරහට තියලා පුරවලා අපි ඒකට A,B,C,D කියලා අපි ලකුණු කරලා තියෙනවා. ඒ ලකුණු කරන ගල් පුවරු ටික තියෙනවා මේ එහා පැත්තේ සභාව පිටුපස. තාම ඒක කරලා නැහැ. ඒ වගේ අපි පයිලට් ප්‍රොජෙක්ට් එකක් විදිහට රාවතාවත්ත කළාට මම හිතන්නේ අපේ සුදේශ් මන්ත්‍රීතුමාත් දන්නවා අඟුලානත් ඒ වගේ කළොත් ගෘජ් කරලා පරණ පවුල් වලවල් ටික ඉස්සරහට අරගෙන කළොත් අපිට ටික කාලයක් ඇදගෙන යන්න පුළුවන් වෙනවා. රාවතාවත්ත ක්‍රියාත්මක වෙන්නෙත් නැහැ. ඒකත් ක්‍රියාත්මක කළා නම් ගොඩක් හොඳයි. නැත්නම් වළලන්න තැනක් නැති වෙනවා. කුළුණු ටික දාලා ඒ සැලැස්මේ එක කොටසක් හරි ඔබතුමාගේ පාලන කාලයේ වෙනස් කළා නම් බොහොම හොඳයි කියලා මම හිතනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි ඉතා ඉක්මනින් මේ කටයුත්ත කරමු. ඇත්තටම අපි අතීත පරම්පරාවට කරන අතිශය නරකම කටයුත්ත තමයි මොරටුවට වගකියන නායකයො විදිහට මේ සුසාන භූමි වලට අදාල කරන ගෞරවාන්විත භූමිදාන කටයුත්තක් කරගන්න අවස්ථාන නොදීම. මම සතුටු වෙනවා ස්තුතිවන්ත වෙනවා එගොඩඋයන චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා තනියෙන් වෙහෙස මහන්සි නොබලා සුසාන භූමිය සම්පූර්ණ කවුරු හෝ එකතු කරගෙන තීන්ත ගාමින් දැන් ටිකක් අලංකාර මට්ටමකට ගන්නවා. එතුමාට මේ වෙලාව යොදාගන්නවා ස්තුතිවන්ත වෙන්න.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(01) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත කමිටුවට යොමු කරනවා.

**05(02) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

“ලුනාව උයන දකුණ ග්‍රාම සේවා වසමේ පිහිටා ඇති ඉපැරණි මස් කඩය ඉදිකොට වසර 80 ක් පමණ වේ. එම ස්ථානයේ අදට ගැලපෙන පරිදි අලුතින් කඩ කාමර 03 වෙනත් ආකාරයෙන් අලුත් ගොඩනැඟිල්ලක් ඉදිකොට, සභාවට මුදලක් ලබාගත හැකි ආකාරයට මෙය ඉදිකොට එම භූමිය අලංකාරවත් ලෙස සාදන ලෙස මෙම සභාවට යෝජනා කරන්නීය.”

**මහා නගර සභා මන්ත්‍රී එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, ලුනාව උයන මංසන්ධියේ තමයි මේ යෝජනාවට අදාළ අපේ පැරණි මස් කඩය තියෙන්නේ. අවුරුදු 80 ක් විතර පැරණියි මේ මස් කඩයට. එතන විශාල ඉඩ ප්‍රමාණයක් තියෙනවා. එම ඉඩ ප්‍රමාණයෙන් අපි කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. මෙතන අපි යම්කිසි සුදුසු කඩ පේළියක් හැදුවොතින් ඒ කියන්නේ කඩ තුනක්වත් හදා ගන්න පුළුවන් නගරාධිපතිතුමනි. පළමු අදියර වශයෙන් ඒ හන්දියේ දැනට රු.15,000/- කට පොඩි කඩයක් යනවා. මාසෙට

රු.15,000/- ක් කියන්නේ අපිට මාසෙකට රු.45,000/- ක් සභාවට ලැබෙනවා ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම මෙම ඉදිකිරීම මහල් තුනකට වත් ඉදි කළොත්, මේ මස් කඩය තියෙන්නේ ගරු නගරාධිපතිතුමනි, ලුනාව හන්දියේ තියෙන නිවාස ව්‍යාපෘතියට යාබදව. පෞද්ගලික තැන්වල තමයි ක්ලාස් කරන්නේ ලුනාව හන්දියේ විශාල පිරිසක් එනවා. ඒවා මාසිකව රුපියල් 25,000/- ට 30,000/- ට තමයි එක ගොඩනැඟිල්ලක් දීලා තියෙන්නේ. අපිට මෙතැන මහල් දෙකක් ඉදි කර ගන්න පුළුවන්නම් මහල් වශයෙන් අපිට ඒ වගේ තැනකට යන්න පුළුවන්. ලුනාව පැත්තේ විශාල පිරිසක් ජිම් වලට යනවා රාවතාවත්ත, මොරටුව පැත්තේ. ජිම් එකකට බදු දුන්නත් විශාල මුදලක් ලබා ගන්න පුළුවන් ගරු නගරාධිපතිතුමනි. මම යෝජනා කරනවා මෙම ස්ථානය නිකරුනේ අපතේ යවන්නේ නැතුව මෙතැන ව්‍යාපාරික ස්ථානයක්. සභාවට ආදායමක් ලැබෙන පරිදි මෙතන ගොඩනැඟිල්ලක් ඉදි කළොත් හොඳයි කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මන්ත්‍රීතුමා එම ඉඩම සභාව සතු එකක්ද? නැතිනම් ඔබතුමා දන්නවා කාරණය?

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නගර සභාව සතු එකක්. අවුරුදු 80ක් මේ මස් කඩය මෙතැන තියෙනවා. ඊට කළින් ඉඳලම තිබිලා තියෙනවා. මේ ඉදිකිරීම අවුරුදු 80 ක් මස් කඩය.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අප එය තහවුරු කර ගමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාවේ සත්භාවය සම්බන්ධයෙන් මට ගැටලුවක් නැහැ. මේ ඉඩම තියෙන්නේ සී වීව් රෙසිඩන්ස් නිවාස සංකීර්ණයට අයිති භූමියක. එතකොට දැන් අපි කවුරුත් දන්නවා සී වීව් රෙසිඩන්ස් නිවාස සංකීර්ණයට අයිති මේ කොටස වෙන් කර ගෙන මස් කඩය කළාට මෙතැන ගැටලුවක් තියෙනවා ගරු නගරාධිපතිතුමනි, සී වීව් රෙසිඩන්ස් නිවාස සංකීර්ණ ඉඩම මේ වෙනකොට නගර සභාව සතුද, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සතුද කියලා ලොකු කතාබහක් ගියා ඒ හේතුකොටගෙන මේ වෙනකොට සී වීව් රෙසිඩන්ස් නිවාස සංකීර්ණයේ නිවාස වැසියන් දැඩි පීඩාවට පත්වෙලා තියෙනවා. අමතර ලක්ෂ හත අටක පොළී ගෙවන්න වෙලා තියෙනවා මේ නිවාසවල ඉතුරු වාරික ගෙවන්න. එහෙම තත්ත්වයක් යටතේ මේ වෙනකොට ඔබතුමත්, මමත්, මම නිවාසවාසීන් විදියටත්, ඔබතුමා නගරාධිපතිතුමා විදියටත් ගරු නිවාස ඇමතිතුමා සහ හර්ෂණ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වූවා පාර්ලිමේන්තුව තුළ එකේදී අනාවරණය වුණා USD එක නාගරික නිවාස සංවර්ධන අධිකාරියට එම ඉඩම අයිතියි කියලා. නමුත්, ඒ අයිතිය හරියටම තහවුරු කර ගන්න මේ මොහොත වෙනකොට තියෙන්නේ ඒ කටයුත්ත නීතිපතිතුමාට. එතකොට නීතිපතිතුමාගෙන් මේක නිරවුල් වෙනකම් මම ඉල්ලනවා මෙහි නීතිමය කටයුත්තක් තියෙන නිසා මේ ඉඩමේ කොටසක් නගර සභාවට අයිති වෙන්නයි, ඉතුරු ටික නගර සභාවට අයිති නොවෙන්නයි හේතුවක් නැහැ. අයිති වෙනවානම් මුළු ඉඩමම අයිති වෙන්න ඕනෑ. අයිති වෙන්නේ නැත්නම් මුළු ඉඩමම අයිති වෙන්නේ නැහැ. මේ යෝජනාවේ සත්භාවය සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ අපේ මන්ත්‍රීතුමාගේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේක සභාවට අයිති ඉඩමක් තාම. ඔප්පුවකින් දීලා නැහැනේ තාම ඕගොල්ලන්ට. තානායම ඉඩම අපේ නගර සභාවට අයිති එකක්

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේක අපි පොඩි කාලේ ඉඳලා තිබුණ එකක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පොඩි කාලේ ඉඳලා තිබුණා තමයි. පොඩි කාලේ ඉඳලා ලුනාව රෙස්ට් හවුස් එකේ ඉඩම විදියට තමයි තිබුණේ. දැන් ඒක නගර සභාවට අයිතියි කියලා අපි කිව්වට පැහැදිලිව

පෙන්නුවා නගර සභාවට දැන් අයිති නැහැ සික්ස්වන් කියන එක ඇතුළේ නමුත්, මේක අපි තර්ක කරන්න ඕනැ නැහැ. මම දන්න නිසා. නීතිපතිතුමා ළඟ තියෙනවා. නීතිපතිතුමා ළඟ තියෙන නිසා නීතිපතිතුමාගෙන් මේ අයිතිය නගර සභාවේ ද, නැද්ද කියලා තීරණය එනකන් මේ යෝජනාව බහා තියන්න කියලයි මම ඉල්ලා සිටින්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔය ඉඩම සඳහා පළමු පන්තියේ ඔප්පුවක් නගර සභාවට තියෙනවා. මේක තානායම් ඉඩම නගර සභාව නමින් තමයි බදු ගෙවලා තියෙන්නේ තානායම පවත්වාගෙන යනකොට. නගර සභාව තමයි සියලු හිමිකම් දරලා තියෙන්නේ සහ නගර සභාව විසින් තානායම බදු දීලා තියෙන්නේ. එතකොට මේක නගර සභාවේ දේපළක්. නීතිපතිට අයිතියක් නැහැ මේක නිර්වචනය කරන්න නගර සභාවට අයිතියක් නැහැ කියලා. එහෙම අයිතියක් නීතිපතිට නැහැ. එමනිසා යම් හෙයකින් මේ ඉඩම ගිලිහෙනවානම් නගර සභාවෙන් අපි බොහොම ඕනෑකමින් ඉල්ලනවා. කරුණාකරලා නඩුවකට යන්න. මොකද හේතුව මේකේ භුක්තිය මෙතෙක්කල් දරලා තියෙන්නේ නගර සභාව. විමල් වීරවංශ ඇමතිතුමා ඉන්නකොටත් නගර සභාවට වන්දි දෙන්න පොරොන්දු වෙලා තියෙනවා. තක්සේරු කරලා තියෙනවා නගර සභාවට වන්දි දෙන්න. නගර සභා අයිතිය පිළි අරගෙන තියෙනවා. ඒ නිසා කරුණාකරලා නඩුවකට ගිහිල්ලා දක්ෂ ලෝයර්ස්ලා දාලා මේක නඩු කියලා හරි අයිති කර ගන්න ඕනෑ අපි මොකද හේතුව මේ නගර සභා ඉඩම ගිලිහෙන්න දෙන්න බැහැ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඇත්ත පැටලැවිලි ගණනාවක් මෙතැන තියෙනවා. මේක ඉතිහාසය විසින් ඇති කරපු ප්‍රශ්නයක්. මොරටුව කියන නමට ඉස්සරහයින් තිබුණේ මොරටුව තානායම. මොරටුව හඳුනා ගන්න ප්‍රධාන සංකේතය තානායමයි. මේ ඉඩම සොයිසා පරම්පරාවට අයිති ඉඩමක් ලෙස තමයි. ඒ වෙලාවේ සභාවල් තිබුණේ නැහැ. වෙන තිබුණ කොළඹ දිස්ත්‍රික්කයට අදාළ සංවර්ධන කටයුතු සඳහා තිබුණු යාන්ත්‍රණයකට නගර සභාවට මෙය දුන්නා. ලිඛිත සමහර ලේඛන තිබුණත්, පසු කාලයේ ඇති වුණ තත්ත්වයක් යටතේ දැන් ගැටලුව තිබෙන්නේ. ගෝඨාභය ජනාධිපතිවරයා ඔහුගේ බලතල යටතේ මේක පවරා ගත්තා. දැන් තියෙන්නේ ප්‍රශ්නය එතන. ඒකට අදාළ කරන ක්‍රියාවලියක් දැන් යනවා. මම දිගටම මේකට එරෙහිව සටන් කළ කෙනෙක්. අප සතු දේපළක්. අපිට අපේ අයිතිය අවශ්‍යයි. නමුත්, දැන් මේක නිවාස සංකීර්ණයක් හදලා මිනිස්සු පදිංචි කරලා තියෙන්නේ. මම ඉතාම ඕනෑකමින් ඉල්ලනවා මස් කඩේ එතුමා කිව්වා වගේ අපි කුඩා කළේ ඉඳන් නගර සභාව සතු මස් කඩයක් ලෙස මෙතන තිබුණ මස් කඩේ. ඒක අපි සතු ඉඩමක්. ඒ නිසා දැන් මේ ඉඩමත් ගාවන්න යන්න එපා අතන ප්‍රශ්නෙට. ඒක ජනතාවගේ වෙනම ප්‍රශ්නයක් ඒක කොහොමද බේර ගන්නේ කියන සංවාදේ කරමු. මේකත් ඒකට අයිති එකක් කියන එක, මේ වේලාවේ කියන එක එච්චර සුදුසු නැහැ. අපි සතු ඉඩමක් තියෙනවානම් එය ආරක්ෂා කරගෙන අනාගතයට භාර දෙන එක තමයි අපේ වගකීම. ඒ නිසා අපි එතුමගේ යෝජනාව අරගෙන ඒ කොටසට හරි ආරක්ෂාකාරී ක්‍රියාමාර්ගයකට යා යුතුයි කියන ස්ථාවරේ මම ඉන්නේ. නගර සභාව සතු දේපළක්. අපි අර ප්‍රශ්නෙට තිබෙන නීතිමය පැත්තේ තිබෙන බාධා ටික කොහොමද ඉවත් කරගෙන.අපේ අයිතිය දැන් අපිට ගන්න වෙන්නේ ගෙවල් ටික නෙමෙයි. අපිට එකඟවෙච්ච අදාළ මිලියන එකසිය දෙක. අවසානේ එන්න වෙන්නේ ඔතනට. ඒ වෙනුවෙන් අපි අපේ අරගලය අවසන් කරලා නැහැ. ඒගොල්ලෝ ඇමතිවරු ඇවිත් සාකච්ඡා කළාට. අපි විපක්ෂේ මන්ත්‍රීවරු ටික සහ ආණ්ඩු පක්ෂේ මන්ත්‍රීවරු එක්ක කරපු සාකච්ඡාවක් ඇතුළේ එකම ඉල්ලීම වුණේ අපේ අයිතිය කොසේ හෝ ගන්න ඕන කියන එක. මම එතන ඉන්නවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාවට මගේ විරුද්ධත්වය පළ කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, එතකොට අපිට ඡන්ද විමසීමකට යන්න වෙනවානේ. ඒ නිසා

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>
ගරු නගරාධිපතිතුමනි, මේකට උපදෙස් ගන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා කිවුවා වගේ. මෙතුමා කිවුවා වගේ සම්පූර්ණ ඉඩමට නඩු කටයුත්තක් යනවා නම් මස් කඩය තියෙන ගොඩනැගිල්ලත් ඒ නඩු කටයුත්තේ කොටසක් ද නැද්ද කියලා ඔබතුමා සොයලා බලන්න.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මන්ත්‍රීතුමියනි, නැහැ මම හොයලා බලන්නම්. හැබැයි සභාව විසින් ඒ තියෙන ටිකත් දෙන්න යන්න ඕන නැහැ කියන තැන මම ඉන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා**</u>
ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ මතය හරි. මොකද අපි මේ වෙනකොටත් මස් කඩය පවත්වාගෙන යනවා. මහල් නිවාසේ ඉන්න ගොඩක් පිරිස අකමැතියි එතැන මස් කඩය පවත්වාගෙන යනවට. එහෙම ගැටලුවක් තියෙනවා. අපේ භූමිය අපි නිකන් නිස්කාරණේ වෙනත් තැනකට දෙන්න අවශ්‍ය නැහැ. අපි දැනටමත් මාසෙකට රුපියල් 10,500/- ට මස් කඩය බදුදීලා තියෙනවා. මෙතැන වැඩිදියුණු කරලා මෙතන අලංකාරය කළොත් සමහරවිට මහල් නිවාසේ ඉන්න අයත් කැමති වෙයි. මෙතැන අවලස්සන නිසා තමයි මේ අය ගොඩක්ම අකමැති මෙතනට. ඒ නිසා ඔබතුමාගේ අවධානය මූලික වශයෙන් යොමු කරලා අලංකාරවත් ලෙස ඉදිකිරීමක් සිදු කළොත්, මේක කාටවත් දෙන්න අවශ්‍ය නැහැ. මෙය සභාව සතු ඉඩමක්.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (02) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(03) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. ජීවන්ත සුදර්ශණ මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"මොරටුව මොරටුමුල්ල කෝවිල පාර වරිපනම් අංක 33/10 න් ආරම්භ වී වරිපනම් අංක 33/16 න් අවසන් වන මාර්ගය කොන්ක්‍රීට් යොදා පිළිසකර කර දෙන ලෙස යෝජනා කරන්නීය."

**මහා නගර සභා මන්ත්‍රී කේ. ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.**

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (03) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(04) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. ජීවන්ත සුදර්ශණ මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"මොරටුව කඩලාන ගල්පිටහබඩ පාර වරිපනම් අංක 05 දරණ නිවස අසල ෆෙරි පටුමඟ කෙළවර ඇති කාණුව මින් පෙර අළුත්වැඩියා කර ගල් අල්ලන ලද ස්ථාන වල ගල් ගැලවී ඉතාමත් අබලන් තත්ත්වයේ පවතී. එම නිසා එම කාණුව සහ මාර්ගය පිළිසකර කර දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරන්නීය."

**මහා නගර සභා මන්ත්‍රී කේ. ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.**

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (04) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(05)** **මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. ජීවන්ත සුදර්ශණ මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"මොරටුව මොරටුමුල්ල කෝවිල පාර වරිපනම් අංක 67/50න් ආරම්භ වී වරිපනම් අංක 67/06 න් අවසන් වන මාර්ගය ගල් අතුරා ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස යෝජනා කරන්නීය."

**මහා නගර සභා මන්ත්‍රී කේ. ඩබ්ලිව්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.**

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (05) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(06)** **මහා නගර සභා මන්ත්‍රී, පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"මොරටුව එගොඩඋයන ජස්ටින් ඩයස් මාවතේ ප්‍රදේශවාසී ජනතාවට ගමන් කිරීමට නොහැකි අන්දමින් දැඩි ලෙස අබලන් තත්ත්වයට පත්ව ඇත. එබැවින් මෙම මාර්ගය කඩිනමින් සංවර්ධනය කළ යුතු යැයි සභාවට යෝජනා කරන්නීය."

**මහා නගර සභා මන්ත්‍රී එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.**

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (06) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(07)** **මහා නගර සභා මන්ත්‍රී, පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"මොරටුව එගොඩඋයන ජයන්ති මාවත ප්‍රදේශවාසී ජනතාවට ගමන් කිරීමට නොහැකි අන්දමින් දැඩි ලෙස අබලන් තත්ත්වයට පත්ව ඇත. මෙම තත්ත්වය හමුවේ ප්‍රදේශයේ පාසල් යන දරුවන්ට පවා ඉතා කුඩා වැසි සහිත තත්ත්වයකදී පවා ගමන් කිරීමට නොහැකි වී ඇත. රැකිරක්ෂා සඳහා යන විවිධ අවශ්‍යතාවයන් සඳහා පවා ගමන් කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගතව පවති. එබැවින් මෙම මාර්ගය කඩිනමින් සංවර්ධනය කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය."

**මහා නගර සභා මන්ත්‍රී එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.**

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (07) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(08)** **නියෝජ්‍ය නගරාධිපති, ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්වයං රැකියා වල නියැලෙන කාන්තාවන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා නගර සභාවට අයත් භූමියක් තුළ අලෙවි පොළක් සකසා දෙන ලෙස යෝජනා කර සිටින්නීය."

**මහා නගර සභා මන්ත්‍රී ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමනි, මම ගිය මාසේ සභාවට යෝජනා තුනක් ලේකම්තුමා වෙත භාර දුන්නා. එම යෝජනා වලින් දෙකක් න්‍යාය පත්‍රයට ඇතුළත් වුණා. එතකොට ඒ යෝජනාව මෙන්න මෙහෙමයි ඉදිරිපත් කළේ. 2025.07.28 මම කිවුවා මොරටුව මහා නගර සභාවට අයත් කොට්ඨාස 29 හි ජීවත්වන කාන්තාවන්ට නිශ්චිත නිෂ්පාදන වර්ග පහක් සඳහා ස්වයං රැකියා අවස්ථා ලබා දෙමින් ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරිම සඳහා අලෙවි පොළක් ලෙස මම යෝජනා කළා වීර පුරන්අප්පු රථ ගාල ලබා දෙන්න කියලා. පාරිභෝගියන්ට රුපියල් 50/- ක හෝ 100/- ක ටිකට් පතක් නිකුත් කිරීමෙන් මහා නගර සභාවටත් අමතර ආදායමක් උපය ගන්න පුළුවන් කියලා මගේ යෝජනාවේ දැම්මා. මගේ යෝජනාවේ හෙඩ් ලයින් එක වුණේ, මාතෘකාව වුණේ ස්වයං රැකියා සඳහා අලෙවි පොළක් යෝජනා කිරීම කියන එක. එතකොට නගරාධිපතිතුමනි, මට නැවත පිළිතුරු ලිපියක් ලැබෙනවා. මේ යෝජනාව ඇතුළත් කරන්න බැහැ. මොකද දැනටමත් වීර පුරන්අප්පු රථ ගාල, රථ ගාලක් විදියට දෛනිකව පාවිච්චි කරන නිසා, සති අන්තේ දවස් දෙක ඒකට යෙදවීම ප්‍රායෝගිකව සිද්ද කරන්න බැහැ කියලා. මම ඒ සඳහා එකඟ වෙනවා. නමුත්, දැන් 05(8) යෝජනාව අපේ නියෝජ්‍ය නගරාධිපතිතුමිය, මගේ යෝජනාවම ස්වයං රැකියා සඳහා කාන්තාවන්ට අලෙවි පොළක් ලබාදීම කියන මගේ යෝජනාවම නියෝජ්‍ය නගරාධිපතිතුමිය ඉදිරිපත් කරලා තියෙනවා. මගේ පොඩි අප්‍රසාදයක් පළ කරනවා, මේ පිළිබඳව.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අප්‍රසාදය පළ කරන්න එපා. මේ අවබෝධයෙන් කළා නොවේ. අර යෝජනාවේ නිශ්චිත කරලා තිබෙනවා පුරන්අප්පු රථ ගාල. ඒක තමයි භාර නොගෙන ඔබට දෙන්නේ. මෙතැන නිශ්චිත තැනක් කියලා නැහැ. ඒ යෝජනාව අර අදහස නිසා න්‍යාය පත්‍රයේ නොදා ඔබට එවනවා. ඒක සභාවට දීලා ප්‍රතික්ෂේප කළා කියලා දන්නේ ලේකම්තුමයි, මායි, ඔබයි. වෙන කවුරුත් දන්නේ නැහැ. නියෝජ්‍ය නගරාධිපතිතුමිය ඒක දන්නේ නැහැ. ඒ නිසා මම කියන්නේ කිසි ගැටලුවක් නැහැ. ඔබ දෙපළගේම යෝජනා එකට අරගමු. එකට අරගෙන අවශ්‍යතාවයක් අර ස්වයං රැකියා කරන අයගේ අදාළ නිෂ්පාදනයන් අලෙවි කර ගන්න පොදු මධ්‍යස්ථානයක් සකස් කරන එක.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**
ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ යෝජනාව හොඳයි ගරු නගරාධිපතිතුමා. ඒත් මේ අපේ මන්ත්‍රීතුමයත් ඒක සත්භාවයෙන් දාපු එකක්නේ. රථ ගාල අයින් කරන්න. හරි මෙතුමිය නියෝජ්‍ය නගරාධිපතිතුමියනේ, මේ යෝජනාවට කම්බයින් කරලා මන්ත්‍රීතුමියගේ නමත් දාලා එකටම කර ගමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**
ගරු නගරාධිපතිතුමනි, රථ ගාල අවුරුදු කාලේට අපි දෙනවානේ. හැබැයි මේ යෝජනාව ඉතාමත්ම වටින යෝජනවාක්. මොකද මොරටුවෙ ඉන්න අපේ ස්වයං රැකියාලාභීන්ට, ඒගොල්ලන්ගේ භාණ්ඩ අලෙවි කර ගන්න තැනක් නැහැ. ඒ නිසා අපේ සෙනසුරාදා, ඉරිදට මහ ලොකු වාහන සංඛ්‍යාවක් එන්නේ නැහැ ඔෆිස් එකත් වහලා නිසා. ඒ නිසා ඔබතුමා කිවුව විදියට මේ යෝජනා දෙකම අරගෙන මෙතැන දෙන්න පුළුවන්නම් හරි වටිනවා මොරටුවේ වෙන තැනක් දෙනවට වඩා. උත්සව කාලේට නොවෙයි. ස්වයං රැකියා කරගෙන යන සඳහා ඒක නගර සභාවෙන් දෙන පිටුවහලක්, අත්වැලක් හැටියට. ඒක ඔබතුමාලටත් හොඳයි අත්වැලක් හැටියට සති අන්තයේ දිනවල පමණක් මේක දෙන්න පුළුවන්නම් ඉතාමත්ම වටිනවා. මොකද ඒක නගර සභාවේ ස්වයං රැකියාලාභීන්ට දෙන අත්වැලක් හැටයට එය කරන්න පුළුවන්.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය</u>**
ගරු නගරාධිපතිතුමනි, මම මේ යෝජනාව ඉදිරිපත් කරනකොට ඇත්තටම මම දැනගෙන හිටියේ නැහැ විපක්ෂයේ මන්ත්‍රීතුමියක් මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා සහ වීරපුරන්අප්පු එකේ යට තට්ටුව ඉල්ලලා තියෙනවා කියලා. ඒක මම දැනගෙන හිටියේ නැහැ. මට ඇත්තටම වුවමනාව තිබුණේ අපි දැන් දකිනවා ග්‍රාමීය ආර්ථිය, ග්‍රාමීය දුප්පත් බව තුරන් කරලීමේ

වැඩපිළිවෙලක් ආණ්ඩුව මඟින් දියත් කරනවා. ඒ නිසා ඒකත් එක්ක තමයි අපේ ගමේ කාන්තාවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම වෙනුවෙන් ඒ අයට අවස්ථාව ලබාදීම වෙනුවෙන් තමයි මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරන්නේ. ඒ නිසා මගේ විරෝධයක් නැහැ මේ යෝජනාවත් එක්ක එතුමියගේ නමත් සඳහන් වුණා කියලා මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ඒ නිසා මේ යෝජනාවට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගන්න කියන එකයි මගේ ඉල්ලීම.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, යෝජනාව ඇත්තටම හොඳ යෝජනාවක් නිසා එය මොරටුවේ ජනතාවට ඇතත්ටම උපකාරයක් වන නිසා ඒ අයගේ ආර්ථිකය නගා සිටුවන්න යෝජනාව කොහොම ක්‍රියාත්මක වුනත් කමක් නැහැ. නමුත් මම අදහස් කළේ මේ යෝජනාව ප්‍රතික්ෂේප වුණ නිසා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ දැන් කලපුව අවට තිබුණ පොඩි පොඩි අර එදිනෙදා ජීවත් වන අයගේ පොඩි කඩ ටික ඉවත් කළා. ඉතින් ඒ වගේම ස්වයං රැකියා ලාභීන් එක තැනකට ගේන එකත් හොඳ වැඩක්. අපිට පුලුවන්නම් දියත උද්‍යානය වගේ තැනක් ස්ථාපිත කරලා ඒ අයව එක තැනකට යොමු කරලා දිවා රාත්‍රී වෙළඳපොලක් ඇති කරන්න ඒ වගේ ලස්සන වැඩපිළිවෙලකට යන්න පුලුවන් නගරාධිපතිතුමනි ඒ වගේ සුදුසු තැනක් හොයාගෙන කරගන්න පුලුවන්නම් හොඳයි කියලා අදහස් කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මටත් හරි සතුටුයි අද පළවෙනි වතාවට මම ඇහුවේ කාන්තාවෝ දෙන්නෙක් එකඟතාවයකට ආපු එක ගැන. ගරු නගරාධිපතිතුමනි, ප්‍රභාෂණී නියෝජ්‍ය නගරාධිපතිතුමිය ඉදිරිපත් කරපු යෝජනාවට ඇත්තටම මම 500%ක් එකඟයි. මොකද හේතුව මේ සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශය අපි ඉන්න කාලේ මම බොහොම උනන්දු වෙච්ච මාතෘකාවක්. මෙහි ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමියට සඳහන් කරන්න පුලුවන්නම් මෙහි ස්ථානයක් සඳහන් කළා අපේ දිනූෂි මන්ත්‍රීතුමිය. නමුත් ඔබතුමා එයට ඒ ස්ථානය සුදුසු නැහැ කියලා තමයි ඒ යෝජනාව ප්‍රතික්ෂේප වුණේ. දැන් අපේ නියෝජ්‍ය නගරාධිපතිතුමිය ස්ථානයක් සඳහන් කරන්නේ නැහැ. නමුත් යෝජනාව ඉදිරිපත් කරනවා. හැබැයි මමත් පිළිගන්නවා මොරටුවේ තියෙන මේ වගේ වෙළඳාම් කටයුතු වලට තියෙන හොඳම තැනක තමයි අපේ රථගාල පිහිටුවලා තියෙන්නේ. ඉතින් සති අන්තයේ දවස් 02ක් මේ විදියට මොරටුව නගර සීමාවේ සිටින මේ ගෘහ කර්මාන්ත කරන හා මේ කුඩා නිෂ්පාදන කරන කාන්තාවන් ඒ පවුල් වලට ඒ අවස්ථාව ලබා දෙන්න පුලුවන්නම් ගරු නගරාධිපතිතුමනි අපි විශ්වාස කරනවා සභාවක් විදියට ඔවුන්ගේ ආර්ථිකමය ජීවිතය ගොඩනඟන්න ලොකු දායකත්වයක් දක්වනවා කියලා. ගරු නගරාධිපතිතුමනි, මම තව දෙයක් කියන්න කැමති මේ සම්බන්ධයෙන් කටයුතු කරන විශේෂ වුණ රාජ්‍ය ආයතනයක් තියෙනවා. ඒ කියන්නේ මේ කුඩා කර්මාන්ත, කුඩා ව්‍යාපාර ගෘහ කර්මාන්තකරුවන්ගේ මාර්කට්න් පැත්ත ඒ කියන්නේ ප්‍රවර්ධන කටයුතු සහ නිෂ්පාදන අලෙවිකිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයක් තියෙනවා නෙඩා කියලා අපි කියනවා. ඒකට කියන්නේ ව්‍යවසායක සංවර්ධන අධිකාරිය. එහි අයිතිය තියෙන්නේ කර්මාන්ත අමාත්‍යාංශයට. දැන් හඳුන්නෙත්ති ඇමතිතුමා ඉන්නේ. මම හිතන්නේ එතුමා එක්ක සඳහන් කරලා මේ ව්‍යවසායක සංවර්ධන අධිකාරීයේත් උදවු අරගෙන මේ කටයුත්ත වඩා යහපත් විදියට කරන්න පුලුවන්. මොකද ගරු නගරාධිපතිතුමනි, කාලයක් තිබුණා ගෙද ඉන්න අම්මාව බාබා ලඟට යැවුවා. අරාබියේ ඉන්න බාබා ළඟට. හැබැයි ඒ කාරණාව අපි වෙනස් කළා ඒ කාලේ අම්මා ගෙදර ඉන්නවා දරු පවුලත් එක්කතමන්ගේ ස්වාමි පුරුෂයත් එක්ක. අම්මා හදන නිෂ්පාදනය බාබා ළඟට යවන. ඒ නිසා මම විශ්වාස කරනවා ගරු හඳුන්නෙත්ති ඇමතිතුමාටත් ඒකම ඉස්සරහාට අරගෙන ගිහිල්ලා ඔබතුමන්ලා මේ මොරටුවේ වෙසෙන මේ ගෘහ කර්මාන්ත කරගෙන ජීවත්වෙන කාන්තාවන්ට වඩාත් ශක්තියක් වෙන්න අපි සභාවක් විදියට අපි ඒ ශක්තිය එකතු කරන්න අපි ඔක්කෝම එකට එකතුවෙලා කටයුතු කරමු කියන ඉල්ලීම කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**</u>
ගරු නගරාධිපතිතුමනි, රථ ගාලත් සම්බන්ධව මතුවෙච්ච නිසා මට අදහසක් ඉදිරිපත් කරන්න ඕන. මෙයට අපි නම තිබ්බේ වීර පුරන්අප්පු උද්‍යාන චතුරස්‍රය කියලා. මෙහි ප්‍රධාන අරමුණ තමයි අපි රථගාලෙදි අපේ රථ නියාමනය කරන කටයුත්තට අමතරව විශේෂයෙන් එහි උඩ කොටසත් යට කොටසත් අපිට විශේෂයෙන් මේ වෙළඳපොළ ඉලක්ක කරගත්ත බහුවිධ ක්‍රමයකට තමයි අපේ මේ අරමුණු සකස් වෙලා තිබුණේ. එහි ඔය නගර සභාවේ උද්‍යාන චතුරස්‍රයේ උඩ කොටසේ දි අපි විශේෂයෙන් කැලණි තිස්ස, ඇහැළ සහ කරද කියලා ගස් හිටවලා එක තුරු වියනක් සකස් කරලා තිබුණා. ඒක පස්සේ වෙලාවක එය නඩත්තු නොකිරීම නිසා ඒ ගස් වැවුනේ නැහැ. ඒ තුරු වියන යට තමයි මේ අවශ්‍ය කරන ස්වයං රැකියා වෙළඳපොළ පවත්වාගෙන යන්න කටයුත්ත තිබුණේ. ඊට පස්සේ දෙවන අදියරයේදී සැහැල්ලු දුම්රිය ඔතනට ආවාට පස්සේ ඔතනින් නවත්තලා විශේෂයෙන් නගර සභාවත් ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉන්න කොටුවටත් එක්ක ඉන්න අර මහා ලේකම් කාර්යාලය වගේ ඇවිල්ලා සැහැල්ලු දුම්රිය ඔතන නවත්තලා ඒ මිනිස්සුන්ටත් අවශ්‍ය කරන කටයුතු කරන්න ඒ සැලසුම් කිහිපයක්ම තිබුණා. දෙවන අදියරය තමයි අපේ මොරටුව විශ්ව විද්‍යාලයේ තියෙනවා ටෙක්ස්ටයිල් යුනිට් එක. ඒ යුනිට් එකේ තියෙනවා පැජන්ට්ස්. ඒ පැජන්ට්ස් වලට ඕන කරන විවෘත භූමියක් සකස් කර ගැනීමේ අරමුණු කිහිපයක් ඔතන තිබුණා. එකක් නෙවෙයි. ඒ නිසා ඒ අරමුණු තුළම මේ ස්වයං රැකියා නිෂ්පාදන තුල තියෙන වැඩසටහන අපි ශ්‍රම සුරක්ෂා නමින් ඒ අදහස අපිට තිබුණා සහ එය අපිට ක්‍රියාත්මක කරන්න එයට ප්‍රතිපාදනත් තිබුණා. ඒත් එක්කම දෙවන අදියරයේ දී ඔයිට ඉදිරිපිට තියෙන මැලේෂියාවේ ටුවින් ටවර් එක වගේ ඒ අදහස ඉදිරිපත් වෙලා තිබුණා ගොඩනැගිලි සංකීර්ණයක් එන්න. ඉතින් මේ එකට එකක් බද්ධ වෙලා තිබුණ අදහසේ යම් ප්‍රස්තුත කාරණාවක් තමයි මේ වෙළඳපොළ ස්වයං රැකියා සඳහා අවශ්‍ය කරන ඉඩහසර සකස් කරන එක. ඒ නිසා මම හිතන්නේ ඒක ක්‍රියාත්මක වීම කිසි වරදක් නැහැ.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (08) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(09) නියෝජ්‍ය නගරාධිපති, ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.**

“මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ මාර්ග සඳහා සවිකර ඇති ඇතැම් නාම පුවරු මේ වනවිට මැකී ගොස් සහ අබලන් වී ඇත. එම නාම පුවරු නැවත පිළිසකර කර එම බල ප්‍රදේශයේ සියලු මාර්ග සඳහා නාම පුවරු සවිකර දෙන ලෙස යෝජනා කර සිටින්නීය.”

**මහා නගර සභා මන්ත්‍රී ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.**

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනි වල්ගම ද සිල්වා මහත්මිය**</u>
ගරු නගරාධිපතිතුමනි, අංක 05(09) ප්‍රභාෂණී වික්‍රමසිංහ නියෝජ්‍ය නගරාධිපතිතුමිය විසින් ඉදිරිපත් කරපු යෝජනාවට තව පොඩි එකතු කිරීමක් කරන්න. පී.බී.අල්විස් පෙරේරා මාවත අසල තියෙන නාම පුවරුව අධිවේගී මාර්ගයට යන. කාලයක් ගත වෙලත් තවමත් සමහර අය දන්නේ නැතුව ඒ පී. බී. අල්විස් පෙරේරා මාවතට දැඩි වේගයෙන් අධිවේගී මාර්ගයට යන පාර කියලා හිතලා මේ පාරට දානවා වාහන. සමහර ලොකු වාහන බස් එහෙම එනවා ඇත්තටම ඒවා අපේ පාරට ඔරොත්තු දෙන්නේ නැහැ. අපේ ප්‍රදේශවාසීන් මේ සම්බන්ධව මට කියන්න කියලා කිව්වා. දැන් මෙතුමියගේ මාතෘකාවට අදාල නිසා සමහර විට ඒ නාම පුවරුව මහා නගර සභා පාලනයට අයත් නොවන එකක් වෙන්න පුලුවන් සමහර විට ආර්.ඩී. එකට වෙන්න පුලුවන්. පුලුවන්කමක් තියෙනවානම් ඒ නාම පුවරුව ඊට වඩා විධිමත්ව එහි උඩට කෙලින් ඊතලයක් තියෙන්නේ. එතකොට හිතෙන්නේ අල්විස් පෙරේරා මාවත ළඟ තියෙන හින්දා එතැනිනුයි ඒක යන්නේ කියලා.

**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, මෙය ඇත්තටම ඉතාම හොඳ යෝජනාවක් නියෝජ්‍ය නගරාධිපතිතුමිය ඉදිරිපත් කරලා තියෙන්නේ. මට මේ සම්බන්ධයෙන් කොළඹ නගර සභාව දැන් වෙනකොට අවුරුදු ගණනාවක් තිස්සේ යම් ආයතනයකට මේ නාම පුවරු කියන එක ටෙන්ඩර් ක්‍රමයකට ලබා දීලා තියෙනවා. එතකොට ඒ නාම පුවරු වල ස්ටෑන්ඩඩ් එකක් තියෙනවා. ස්ටිකර්ස් ගහලා තියෙන්නේ ත්‍රීඑම් රිෆ්ලෙක්ටිව්ස් ස්ටිකර්ස්. එතකොට රාත්‍රී කාලයේ ඩ්‍රයිව් කරනකොටත් මේ නාම පුවරු හොඳට පේනවා. එතකොට භාෂා තුනෙන්ම ගහලා තියෙනවා. යට බෝර්ඩ් එකක් ගහලා තියෙනවා ඇඩ්වර්ටයිසීන් පර්පසර්ස් වලට. එතකොට මේ නාම පුවරු කියන ප්‍රොජෙක්ට් එක යම් ආයතනයකට ටෙනඩර් කරලා තියෙනවා. එතකොට ඒ ටෙන්ඩරින් වලින් මම දන්න විදියට රිචඩ්සන් ආයතනය තමයි කොළඹ නගර සභාවේ බස් ෂෙල්ටර්ස් නාමපුවරු ගැන්ට්‍රීස් ඒ ඔක්කෝම ටික ඒ ආයතනයට ලබා දීලා කම්ප්‍රෙටටිව් බිඩින් සෙස් එකකින් ටෙන්ඩරින් යටතේ තමයි ලබා දෙන්නේ. එතකොට ඒගොල්ලෝ ඒගොල්ලන්ගේම වියදමින් තමයි ඒ නාම පුවරු ගහන්නේ නඩත්තු කරන්නේ සහ ඒවාට ප්‍රමිතිය නගර සභාවෙන් ලබා දීලා තියෙනවා. එතකොට ස්ටීල් අර සුදු යකඩ වලින් මලකඩ කන්නේ නැති ඇලුමීනියම් ගැල්වනයිස්ට් ඇලුමිනියම් වලින් තමයි ඒක ගහන්නේ. ඒ බෝර්ඩ් එකට ලෙන්ත් එකයි විත් එකයි දාලා තියෙනවා ත්‍රීඑම් රෙෆ්ලෙස්ටිව් ස්ටිකර්ස් එක ගහන්න කියන ඒ ස්ටෑන්ඩර් එක මෙයින්ටේන් කරලා. එතකොට භාෂා තුනෙන්ම තියෙනවා. යටින් බෝර්ඩ් එකක් ගහලා තියෙනවා ඇඩ්වර්ටයිසින් පර්පසස් වලට. එතකොට ඒ ඇඩ්වර්ටයිසින් කම්පැනි එක හරහා ඒ ආයතන රිචඩ්සන් කියන ආයතනය තුන්වැනි පාර්ෂවය ඇඩ්වර්ටයිසින් පර්පසස් වලට ලබාදීලා ඒගොල්ලෝ ඒ කොස්ට් එක කවර් කරගන්නවා. නොමිලේ මේවා ගහලා දෙනවා. ඉතින් ටෙන්ඩරින් ප්‍රොසේස එකක් යන්නේ නගර සභාවට ඒ ටෙන්ඩර් එක හරහා කොළඹ නගර සභාව විශාල ආදායමක් උපයනවා. මම යෝජනා කරනවා අපිටත් බැරිද මේකත් මොරටුව මහා නගර සභාවට ලබා දෙන්න. අඩුම ගානේ අපි ළඟ රෆ්ලි අසෙස්මන්ට් එකක් තියෙන්න ඕන මොරටුව නගර සභාවේ දැන් වෙනකොට වීපී කොපමන ප්‍රමාණයක් තියෙනවාද කියලා. අඩුම ගානේ මෙය ඇතුල් පාරවල් වලට නැති වුණත් පාර දෙපැත්තේ තියෙන ප්‍රධාන පාරවල් වලට හරි අපි අසෙස්මන්ට් එකක් ලබා දීලා මේකේ පළවෙනි අදියරය ලබා දෙන්න පුලුවන්නම් මම යෝජනා කරනවා මෙය නගර සභාවට ආදායම් උපයා ගන්න පුලුවන් හොඳ මාර්ගයක්. ඉතින් මෙය කමිටියකට දාලා සාකච්ඡා කරලා, දැන් අපි එක එක ප්‍රදේශ වලට කිසිම ස්ටෑන්ඩඩ් එකක් නැතුව මේක ගහන්නේ නැතුව ටැස්න්ඩර්ලයිස් කරලා මේක කරානම් මම හිතනවා නගර අලංකරණය සහ භාෂා 03කින් ගැහීම සම්බන්ධයෙන් සහ රාත්‍රියේ දී මේ බොර්ඩ් රිෆ්ලෙක්ටිව් වෙන විදිය අනුව නගරයේ කොලිටි එකත් රිෆ්ලෙක්ටිව් වෙනවා නේම් බෝර්ඩ්ස් ටික ස්ටෑන්ඩඩ් විදියට කරන්න පුලුවන්නම්.

**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, අපි කමිටුවකට ආවා මේ ස්ටෑන්ඩඩ් එක කොහොමද කරන්නේ කියලා. ඒක නිසා මම කියන්නේ භාෂා තුනෙන්ම ගහමු. අපි ඉස්සෙල්ලාම හොයා ගමු අබලන් මොනාද තියෙන්නේ මැකිලා ගිය මොනාද තියෙන්නේ කියලා. ඒ ගැන අපිට වාර්තාවක් හොයාගන්න වෙනවා ඉස්සෙල්ලාම. හොයාගත්තාට පස්සේ මම දැක්කා කමිටුවට ආවා පාරේ බෝර්ඩ් එක සෙන්ටිමීටර් ගාණක් ඇඩ්වර්ටයිසින් බෝර්ඩ් ඒක අඩි 10යි 04යි. එහෙම බැහැ. මම දැක්කා ටියුෂන් ක්ලාස් කරන සර්ලා දාලා තියෙනවා ඒවා වලට අපි 10ක් 12 ක් වගේ ඒගොල්ලෝ දාන්න හදන්නේ. එහෙම නැතුව ප්‍රමිතියකට, එක පාටකට ත්‍රීඩී ත්‍රීඑම් එකකට දාලා අපි ප්‍රමිතියකට වැඩේ කරමු නගරාධිපතිතුමා එතකොට වැඩේ සාර්ථක වෙයි කියලා මම හිතනවා.

**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**

ගරු නගරාධිපතිතුමනි, මීට පෙරත් මේ ස්ටෑන්ඩඩ් එක ජාත්‍යන්තර ප්‍රමිතියකට අනුව තියෙන ප්‍රමිතිගතකරණයට අනුව අපි විශේෂයේ ඔපල් ඩිජිටල් ආයතනයේ අනුග්‍රහයත් ඇතුව ඊට අමතරව මීට පෙර අපේ හිටපු චම්පික ඇමතිතුමාගේ ප්‍රතිපාදන යටතේ නගර සභාවේ ඒ බෝර්ඩ් ගැහුවා. ඉතින් මමම කරපු දේ තමයි කිවුවේ. නගරාධිපතිතුමනි ඔබතුමා දකිනවා අපි මෝදර ඉදලා කාපට් කරපු ලයින් වලත් ඒ බෝර්ඩ් ටික ප්‍රමිතිගත ආයතනයෙන් ගහලා තියෙනවා. මම කියන්න හැදුවේ

ඒක නෙවෙයි සමහර පැති ඒ කියන්නේ කොරළවැල්ල, කටුකුරුන්ද සහ එගොඩඋයනේ මුහුදු හුබාව වැඩියි. ඒ නිසා අපිට ඒකෙන් අපි අර සුදු යකඩ මට්ටමේම ලෝහ අපිට පාවිච්චි කරන්න බැහැ සමහර වෙලාවට කුඩුකාරයෝ කපාගෙන යනවා. ඒ නිසා දෙවන අදියරය ඔපල් ඩිජිටල් ආයතනය නොමිලේ අපිට මේ කටයුත්ත කරන්න කටයුතු කළා. හිටපු නගරාධිපති අපේ සමන්ලාල් මහත්තයා ඒකට කැමති වුණේ නැහැ. ඊට පස්සේ අපි බෝර්ඩ්ස් ටික ගහලා දුන්නා ලුනාව ආයුර්වේදයට. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අද මේ ඔපල් ඩිජිටල් ආයතනය ඒ වගේම අනික් පැත්තට ගත්තාම අපේ තියෙන මන්ත්‍රීතුමිය කිවුව විදියට ඕනම ආයතනයක් ඒ සී. එස්. ආර්. ප්‍රොජෙක්ට් එක යටතේ මේ බෝර්ඩ් ගහන්න අද සැම නගර සභාවක්ම කටයුතු කරනවා. ඒ නිසා ඒ ප්‍රමිතියත් ඔවුන් ළඟ තියෙනවා. ඒ නිසා අපිට ජැටි හෝල්ඩින් එක අනෙක් පැත්තෙන් ගත්තාට පස්සේ ඒ ඔපල් ඩිජිටල් ආයතනයට කතා කළොත් නොමිලේ අපිට ගන්න පුලුවන්. ඒ එක්කම මම අවධානයට යොමු කරන්නේ අපේ මේ මුහුදු හුබාව තියෙනවා කිවුව පැත්තට ගහනකොට අපිට මේ මොරටුවට ආවේනික වෙච්ච ලී හරි මොකක්හරි ක්‍රමයක් පාවිච්චි කරලා අර අනික් පැත්තට මේකේ යකඩ ටික ගියොත් හොඳයි. නැතිනම් අපි අවුරුදු ගණනාක් ගියාට පස්සේ අර ගහපු ටික මලකඩ කන එක නවත්තන්න බැහැ. ඒ නිසා ඒ තාක්ෂණයත් පාවිච්චි කරන්න කියලා මම මේ යෝජනාවට එකතු කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ සම්බන්ධයෙන් අවශ්‍යතාවයක් තියෙනවා. මම දකිනවා මාර්ග ගණනාවක බෝර්ඩ් නැහැ. කඩාගෙන වැටිලා, මැකිලා. ඒ නිසා මේ කටයුත්ත ඉතාම වේගයෙන් ඉක්මනින් කළ යුතුයි. දැන් ඔබේ අදහස් ඉක්මනින්ම මේ කර්මාන්ත කමිටුවට අරගෙන අවශ්‍ය විදියට, ඒ වගේම ඉල්ලීමක් තියෙනවා මමත් වරදක් කළා කියලා මට හිතෙනවා එක යෝජනාවක් ඉදිරිපත් වුණා එක පවුලක මියගිය දියණියට පිං පිණිස බෝර්ඩ් එකක් අපි දීපු වෙලාවට බෝර්ඩ් එක දානවා අර දරුවගේ, එතකොට මට ඒක ප්‍රතික්ෂේප කරන්න බැහැ. මම හිතන්නේ එවැනි ආදර්ශයක් ගියොත් ඒක හොඳ නැහැ. මම ආපු එක අත්සන් කළා. ඒක ප්‍රතික්ෂේප කළොත් ඒ අය හිතනවා වෙන එකක්. මම කියන්නේ අපි ඒක නොකොට එකක් අපේ සභාවේ ආදායමක්. දැන් මෙය ඉක්මනටම ටෙන්ඩර් කරගන්න හම්බවුනොත් ආයතන ගණනාවක් ඉදිරිපත් වෙයි.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (09) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(10) නියෝජ්‍ය නගරාධිපති, ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

“තෙලවල ප්‍රදේශය ආශ්‍රිතව පෝච්චි කර්මාන්තය තම ජිවනෝපාය කරගත් විශාල පවුල් සංඛ්‍යාවක් සිටියි. මේ වනවිට එම කාර්මාන්තය විශාල ලෙස කඩා වැටී ඇත. එම නිසා එම කර්මාන්තය නැවත ගොඩනැඟීම වෙනුවෙන් හා එම ජනතාවගේ ජීවිත ගොඩනැඟීම වෙනුවෙන් එම ප්‍රදේශයට පෝච්චි නිශ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් ලබා ගැනීමට කටයුතු කරන ලෙසට යෝජනා කර සිටින්නීය.”

**මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමිය ඉදිරිපත් කරපු යෝජනාවේ යම් සංශෝධනයක් තිබිය යුතුයි කියලා මම විශ්වාස කරනවා. මේ යෝජනාවේ නිශ්චිත අදහසක් නැහැ. මෙන්න මෙහෙම මෙහි තියෙන්නේ කර්මාන්ත ශාලාවක් ලබා ගැනීම සඳහා කටයුතු කරන්න කියලා. එතකොට කර්මාන්ත ශාලාවක් ලබා ගන්නේ කාගෙන්ද? එතකොට දැන් නගර සභාවෙන්ද? කියලා. මම විශ්වාස කරනවා නගර සභාවෙන් කර්මාන්ත ශාලාවක් ලබා ගන්නවාට වඩා මෙය කර්මාන්ත ආමාත්‍යාංශයෙන්, ඒ නිසා මේ යෝජනාව සංශෝධනය වෙන්න ඕන මෙන්න

මෙහෙම, ලබා ගැනීමට ගරු කර්මාන්ත ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවානම් ඇමතිතුමා කෙලින්ම මෙය ආමාත්‍යාංශයට වඩා ඇමතිතුමාටනේ මෙහි බලය තියෙන්නේ.

**නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, ගරු මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා.මොකද මම අදහස් කළෙත් එහෙම තමයි. නමුත් යෝජනාවට එහෙම ඇවිල්ලා නැති එකේ පොඩි අඩුවක් තියෙනවා. ඒ නිසා මෙය කර්මාන්ත අමාත්‍යාංශයට යොමු කිරීමට කටයුතු කරන්න කියලා සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම සඳහන් කරන්න ඕන දැන් මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු යෝජනාව කිසි ගැටලුවක් නැහැ. දැන් ඒ යෝජනාවේ කර්මාන්ත ශාලාවක් ඉදිකරන්න මම විශ්වාස කරන විදියට මම දන්න විදියට තෙලවල පෝච්චි වත්ත කියලා හඳුන්වන්නේ ව්‍යවහාරික භාෂාවෙන් ඒ පළවෙනි පයටුමඟ තෙලවල. ඒ ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවක් ඉදිකරන්න තරම් ඉඩමක් තියෙනවාද කියන්න මම දන්නේ නැහැ. ඒ නිසා මෙයට හොඳම විදිය තමයි අපේ අයි.ඩී.බී. එක කාර්මික සංවර්ධන මණ්ඩලය අයිති භූමිය සහ ලක්සල කියන භූමියේ තියෙනවා කොටසක්, ඒ කොටසේ ඔය ශාලාව ඉදි කරන්න පුලුවන්. ඒ වගේම මන්ත්‍රීතුමියට සහ ඔබතුමාට මම මතක් කරනවා, ඔබතුමාට ඒක මතක ඇති 2004 නැතිනම් 2005 ආණ්ඩුව තියෙන කාලේ කුඩා කර්මාන්ත ඇමති වෙලා හිටියේ ලාල්කාන්ත ඇමතිතුමා. ඒ කාලේ මට මතකයි ගුරු පැහැයෙන් රත් පැහැයට කියලා මැටි කර්මාන්තයට අදාළ ව්‍යාපෘතියක් ගියා. එතකොට ඔය ව්‍යාපෘතියට මල් පෝච්චි හදන වත්තක් ඇතුලත් කළා. එතකොට මම හිතන්නේ එහි ලොකු ව්‍යාපෘතියකුත් කළා. ඒකත් පොඩ්ඩක් අධ්‍යනය කරලා මේ වැඩසටහන ක්‍රියාත්මක කරනවානම් ඵලදායකයි කියලා මම විශ්වාස කරනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා, ඔය පෝච්චි කර්මාන්තය සඳහා කර්මාන්ත ශාලාවක් ඉදිකරනවා කියන එක කොච්චර ප්‍රායෝගිකද කියන එක පිළිබඳව හිතන්න වෙනවා මොකද හේතුව පෝච්චි කර්මාන්තය කියලා කියන්නේ වෙනම කලාවක්. එතකොට මෙතෙක් කල් ඒක කරගෙන ගියේ ඒ මිනිස්සු, ඒ මිනිසුන්ගේ ගෙවල් වල, ගෙවල් ආශ්‍රිතව තමයි ඒගොල්ලෝ මෙය කරගෙන ගියේ. හැබැයි අද වෙනකොට ඒකට කණ කොකා හඩලා තියෙනවා. අද වෙනකොට පෝච්චි කර්මාන්තය 90%කට වැඩි පිරිසක් අත්හැරලා විවිධ රැකියාවන් වලට යන්න පටන් අරන් තියෙනවා. මොකද හේතුව ඒ මිනිස්සුන්ට ප්‍රායෝගිකව ඇති වෙච්ච ආර්ථික අවපාතයෙන් පස්සේ ප්‍රායෝගිකව ඇති වෙච්ච ප්‍රශ්ණ නිසා වැලි ගන්න විදියක් නැතුව, ඒ සිමෙන්ති විශාල වශයෙන් ඉහළ යෑම නිසා ආදී විවිධ හේතුන් නිසා ඒ කර්මාන්තය අත්හැරියා. අත්හැරලා ඒගොල්ලෝ දැන් වෙන වෙන ආයතන වල ඔය මෑන් පවර් ආයතන වල වගේ තැන් වල වැඩට යන්න පටන් අරගෙන තියෙනවා. හැබැයි මේක මේ කර්මාන්ත ශාලාවක් කියලා කියන්නේ ඒ ගෝල්ලොන්ට අවශ්‍යතාවය තියෙන්නේ අමුද්‍රව්‍ය සපයා ගැනීම සහ ඒගොල්ලන්ට තියෙනවා ප්‍රශ්ණයක් මෙතන නිවාස ආශ්‍රිතව කරපු නිසා නිවාස ආශ්‍රිතව කරනකොට දැන් ජන ගහනය වැඩි වෙන්න වැඩි වෙන්න ඒගොල්ලන්ට ඉඩ ප්‍රස්ථාව මදි මෙය කරන්න. කාන්තාවෝ තමයි මෙය බහුතරයක් කරන්නේ, පිරිමි අය කරන්නේ මෙය විකුණන එක. කාන්තාවෝ කරන්නේ මෙය නිෂ්පාදනය කරන එක. එතකොට මෙය බොහොම හොඳ ස්වයං රැකියාවක්. හැබැයි මෙයට තවමත් ඉල්ලුම තියෙනවා රටේ. හොඳම දේ තමයි මම දකින්නේ සුරේෂ් මන්ත්‍රීතුමා කිවුවා වගේ කර්මාන්ත ඇමතිතුමාට හරි කතා කරලා මෙයට නව තාක්ෂණය හඳුන්වලා දීලා ඒ කාන්තාවෝ ටික නැවත වරක් මෙයට යොමු කරවගෙන, ඒගොල්ලන්ව දිරිමත් කිරීමක් කරලා නැවත වරක් මෙය යොමු කරගෙන ඒගොල්ලන්ට ස්ථානයක්, කර්මාන්ත ශාලාවක් කියන්නේ ස්ථානයක් දීම පමණයි කියන එක. නව තාක්ෂණය සහ ස්ථානයක් දුන්නොත් එහෙම ඒගොල්ලෝ කැමැත්තෙන් ඇවිල්ලා මේ වැඩේ කරයි. එහෙම වුණොත් එහෙම මුළු ප්‍රදේශයටම අපේ තෙලවල ඉන්නවා පවුල් 300ක් විතර පෝච්චි කර්මාන්තයම කරන. එතකොට ඒ පිරිසට මෙය ලොකු පිටුවහලක් වෙයි. ඉතින් ඒ නිසා මේ යෝජනාව බොහෝම හොඳ යෝජනාවක්, කාලෝචිත යෝජනාවක්. මේ යෝජනාවේදී මම කියන්නේ මෙහිදි වෙන්න ඕන කර්මාන්ත ශාලාවක්

කියන්නේ අර ගාර්මන්ට් එකක් වගේ එකක් නෙවෙයි. මෙහිදී වෙන්න ඕන අවශ්‍ය නව තාක්ෂණය දැන් පෝච්චි ගත්තාම ඉස්සර පෝච්චි දැන් මිනිස්සු පාවිච්චි කරන්නේ නැහැ. දැන් අලුත් අලුත් ඒවාට යනවා. ඒ නිසා ඉතින් ඒවා කොහොමද නිෂ්පාදනය කරන්නේ කියලා ඒගොල්ලන්ට අවබෝධයක් දීලා ඒවා නිෂ්පාදනය කරන්න අවශ්‍යතාවය දීලා සහ අලෙවිය, අලෙවිය සම්බන්ධයෙන් විශේෂයෙන්ම අවධානයක් යොමු කරලා ඒ ටික ඉටු කර දෙන්න ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මෙහිදි ආයතන කිහිපයක් විශේෂයෙන්ම අපේ ආණ්ඩුකාරතුමා යටතේ තියෙන ඉස්සර කර්මාන්ත අමාත්‍යාංශයේ තිබුණා, ඒ අමාත්‍යාංශයේ මේ සඳහා අවශ්‍ය ඕනතරම් ප්‍රතිපාදන තියෙනවා. ඒත් එක්කම අර මෙතුමා කිවුව විදියට කර්මාන්ත අමාත්‍යාංශයෙත් තියෙනවා. අනෙක් පැත්තෙන් ගත්තට පස්සේ වෙනම කාන්තා කටයුතු අමාත්‍යාංශයකුත් තියෙනවා. එතකොට මේ ටික සමෝදානයට එකතු කරගෙන ඔවුන්ට අවශ්‍ය කරන මඟ පෙන්වීම විතරයි කරන්න ඕන. ඒත් එක්කම අපි විශේෂයෙන්ම මම ඔබතුමාට මතක් කරනවා ඔවුන්ට අවශ්‍ය කරන උපකරණ වල යම් අඩුපාඩුවක් තියෙනවා. ඒ නිසා අපි පසුගිය කාලේ ඔබතුමා කලබල වෙන්න එපා සුරේෂ් මන්ත්‍රීතුමා. ඒ නිසා අපි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ විශේෂයෙන් ඔවුන්ට ඕන කරන පොච්චිකරුවන් විශේෂයෙන් තුෂාන් බණ්ඩාර අපේ හිටපු ඒ නියෝජිතයත් එක්ක එකතු වෙලා ඔවුන්ට විල්බැරෙක්කේ, ඒ වගේම අත්මුල්ලු, මේවත් එක්ක ලොකු පැකේජ් එකක් අපි ලබාදුන්නා කර්මාන්ත අමාත්‍යාංශය හරහා ඒ කාලේ. ඊට අමතරව ඔවුන්ට ප්‍රධාන වශයෙන් බලපාන ගැටලු තමයි ගරු නගරාධිපතිතුමනි, සමහර වෙලාවට මේ ව්‍යාපාරය පවත්වාගෙන යනකොට ඔවුන්ට අවශ්‍ය කරන මේ සරල පොත් තබා ගැනීමේ කටයුත්ක්වත් බොහො දෙනෙක්ට කරගන්න බැහැ. ඒ නිසා ඔවුන්ට කඩා වැටෙන්න බලපාන තව හේතුවක් තමයි සාමානයෙන් අපි මේ යන පිරිවැයට පුංචි ලාභයක් එකතු කරලා තමයි විකුණුම් මිල හදාගන්නේ. හැබැයි ඔවුන්ට අවබෝධයක් තිබුණේ නැහැ. ඒ නිසා හුඟක් වෙලාවට ඔවුන් මේ නිෂ්පාදන පිරිවැය මෙයට එකතු කරන්නේ නැති නිසාම මොවුන්ට කාලයක් ගියාම මෙයින් ඉවත් වෙනවා. ඒ නිසා අතිශය අවශ්‍ය කාරණයක්. මොවුන් ඒ පිළිබඳව දළ අවබෝධයක් ලබා දෙන්න අපි කටයුතු කරන්න අවශ්‍යයි. ඒත් එක්කම ඊළඟ එක තමයි වැලි ප්‍රශ්ණය. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, වැලි ප්‍රශ්ණයට සහයෝගය ලබා දෙන්න පුලුවන් හොඳම තැනක් තමයි ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවේ තියෙන වැලි බොහොම ලාභෙට ගන්න පුලුවන්. බෙල්ලන්විල තියෙන ආයතනයෙන් අපි පසුගිය කාලේ සම්බන්ධීකරණය කළා. හැබැයි ඔවුන්ට ගේන්න ඕනකරන ප්‍රවාහන ප්‍රශ්ණ තියෙනවා. ඒ නිසා මේ ප්‍රශ්ණ ටික සම්බන්ධීකරණය කරලා ආයතන සමෝදායනය කිරීම ඉතාම වැදගත් පළවෙනි කාරණය. දෙවන කාරණය තමයි සුජිත් මන්ත්‍රීතුමා කියන විදියට ගරු නගරාධිපතිතුමනි, අපේ දැන් මෙය නව්‍යකරණයට ලක්වෙලා තියෙනවා. හුඟක් වෙලාවට අලුත් පෝච්චි ගත්තාට පස්සේ ඒ පෝච්චි ලාක්ෂා කියන ද්‍රව්‍ය යොදාගෙන ලාක්ෂා කියන කර්මාන්තයත් එක්ක තමයි පිටරටට යන මාර්කට් එක තියෙන්නේ. යුරෝපා රටවලට. ඒ වගේම අලුතින් දැන් අප්‍රිකානු රටවල් වලට හැදිලා තියෙනවා අලුත්ම එකක් ඒ නිසා ඒකට අවශ්‍ය කරන ඉල්ලීම කරන් පුලුවන්. ඊළඟ එක තමයි මේ පොල්කටු වලින් පොල්කටු ආශ්‍රිතව කරන ඒ පෝච්චි නිර්මාණ තුළ මේ අපේ ලංකාවේ ඉන්නවා උපකාර ගුරුවරයෙක් වසන්ත මහත්තයා. ඔබතුමා හිතන්න දහස් ගණන් වලින් ආදායම් ලබන්නේ ඒ මිනිස්සු ටික. ඒ නිසා මේ ලාක්ෂා කර්මාන්තයත් ඒ වගේම අනික් පැත්තෙන් ගත්තාට පස්සේ මේ අලුත් පොල්කටු ආදි නව නිර්මාණත් එක්ක මේ කිවුව විදියට සමෝදායනය කරලා අවශ්‍ය පහසුකම් සැපයුවාට පස්සේ අලුතින් ඉදිවෙනවානම් කර්මාන්ත ආයතනයක් අලුත් නිර්මාණවලට යනවා වගේම විශේෂයෙන් ගෘහස්ථ පවුල් කිහිපයක් තමයි එකතු වෙලා තියෙන්නේ. සමහර තැන් වල ඔවුන් අතර තියෙනවා සමහර අයගේ එකට එකතුවීමේ ගැටලු තියෙනවා. අපි එය සමාජ විද්‍යාත්මක පසුබිමත් අපි අවබෝධ කරගන්න ඕන. ඒ නිසා ඒ පවුලේ තුන්හතර දෙනෙක් එකතු වෙලා තමයි කරන්නේ. ඒවත් අවබෝධ කරගෙන මම හිතන්නේ මෙයට හොඳ ඇනලයිස් එකකුත් කරලා සියලු දෙනාවත් එකතු කරගෙන, ආයතනත් සමෝදානය කරලා අවශ්‍ය කරන පහසුකම් සැපයීම සිදු කරන්න ඕන. අපට කරන්න පුලුවන් ටික අපි කළා. ඒ නිසා අපේ සුදේශ් මන්ත්‍රීතුමාටත් කලබල නොවී ඒකට අවශ්‍ය කරන දායකත්වය ලබා දෙන්න ඔබතුමාට ශක්තිය වෙන්න කියලා මම ප්‍රාර්තනා කරනවා.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (10) දරණ සංශෝධිත යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(11) මහා නගර සභා මන්ත්‍රී, ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"මොරටුව මහා නගර සභාවේ මාසික රැස්වීම් හා විවිධ අවස්ථා සඳහා මාධ්‍ය ආවරණය ලබාදුන් අප අතරින් සමුගත් හෙන්රි ප්‍රියශාන්ත මහතාගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය පල කරන අතර, ඔහු හා මේ වනවිටත් අප සභා කටයුතු සඳහා මාධ්‍ය ආවරණය ලබා දෙන මාධ්‍යවේදීන් ඇගයීමක් සිදුකරන ලෙස මෙසේ යෝජනා කර සිටින්නීය."

**මහා නගර සභා මන්ත්‍රී, එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.**

**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඒ යෝජනාව ගැන මම අදහස් දක්වන්න කැමතියි. අපේ මහා නගර සභාව මම දන්න කාලේ ඉඳලා මම මේ නගර සභාවට පත්වන්නේ 1997. මම දන්න කාලේ ඉඳලා මේ මහා නගර සභාවෙ මාධ්‍ය කටයුතු වලට සම්බන්ධ වෙච්ච ප්‍රවීණ මාධ්‍යවේදියෙක් තමයි, ප්‍රාදේශීය මාධ්‍යවේදියෙක් තමයි හෙන්රි ප්‍රියශාන්ත මැතිතුමා. එතකොට එතුමා පසුගිය කාලයේ අප අතරින් සමුගත්තා. නමුත් එතුමාට එතුමාගේ ඒ මාධ්‍ය මෙහෙවර සම්බන්ධයෙන් කාලයක් වෙනකොට එතුමාගේ එක ඇසක් පෙනෙන්නේ නැති තත්ත්වයට පත්වෙලා තිබුණා. නමුත් එහෙම තත්ත්වයක් තුළ වුණත්, එතුමාට පුළුවන් විදියට මේ සභාවේ වාර්තාකරණය කළා. ඒ වගේම ඊට අමතරව වෙනත් කාරණා වලටත් එතුමා පැමිණියා. ඉතාම දුෂ්කර තත්ත්වයන් යටතේ. සමහර වෙලාවට එතුමා හිටියේ ටිකක් මොරටුවේ ඉඳලා කළුතර පයාගල පැත්තට වෙන්න. මෙහි මාධ්‍යවේදියෙකුට දෙන්නේ ඉතාම කුඩා දීමනාවක් ඒ කාලේ. ඒ දීමනාව ගැන නොසලකා එතුමා බස් එකේ ඇවිල්ලා තියෙන අපහසුතා සියල්ල සලකගෙන, ඒ සියල්ල දරාගෙන එතුමා මේ මාධ්‍ය මෙහෙවර සිදුකළා. ඉතින් ඒ නිසා එතුමා මේ මාධ්‍ය කටයුතු මෙහෙයවීම කිරීම සම්බන්ධයෙන් මම හිතන්නේ අපි හැමෝම කෘතගුණ දන්න මහජන නියෝජිතයෝ විදියට අපේ දෙපැත්තේම ඉන්න නවක මන්ත්‍රීවරු එතුමාට සම්බන්ධ නොවී ඇති. නමුත් නගරාධිපතිතුමා ඇතුළු ඔබතුමාත්, අපි බහුතරයක් එතුමා ආශ්‍රය කළා. එතුමාගේ මේ මාධ්‍ය කලාව සම්බන්ධයෙන් අපි කවුරුත් දන්නවා. ඒ නිසා එතුමාට ශෝකය පල කරන්න මෙය අවස්ථාවක් කරගන්නවා එතුමාගේ අභාවය සම්බන්ධයෙන්. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, දැන් අපි ජීවත්ව සිටියදී, අපි ඇගයීමක් නොකර, අපි ජීවිතයෙන් සමුගත්තට පසුව ඇගයීමක් කරලා ගුණ කථනය කරනවා වගේම, ජීවත්ව සිටින මාධ්‍යවේදීන්ටත් අපි ඇගයීමක් කරන්න ඕන. විශේෂයෙන්ම අපේ නගර සභාවට මාධ්‍යවේදිනියක් සහ මාධ්‍යවේදීයෙක් මේ අවස්ථාවට සම්බන්ධ වෙනවා. දීර්ඝ කාලයක් ඉඳලා. එතුමන්ලටත් යම් ඇගයීමක්, පැය ගාණක් සමහර වේලාවට පැය හත අටක් ඒ අය මේ සභාවේ කටයුතු කරන අවස්ථා තියෙනවා. එතකොට මේ දෙන දීමනාව එතුමන්ලට මේ පැය හත අට. සාමාන්‍යයෙන් කම්කරුවෙක් වුණත් පැය හත අටක් වැඩ කළොත් රුපියල් හාර පන්දහක් හම්බ කරනවා. නමුත්, ඒ මාධ්‍යවේදීන් එහෙම මුදලක් බලාගෙන එන එක නෙමෙයි තමන්ගේ මාධ්‍ය කලාවේ ගෞරවය රැක ගැනීම සහ අපේ අදහස මොරටුවේ අදහස රටට ගෙනි යන්න එතුමියන්ලා, එතුමන්ලා ලොකු සේවාවක් සිදු කරනවා. මේ කාලය ගත කරමින් ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඒ පිළිබඳව අපගේ ගෞරවනීය ඇගයීම සිදු කරන්න කැමතියි.

**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම අපි ස්තූතිවන්ත වෙනවා. සුරේෂ් ඉන්දික මන්ත්‍රීතුමාට හෙන්රි ප්‍රියශාන්ත අපේ මාධ්‍යවේදියා. අපි 2018 මේ නගර සභාව නියෝජනය කරන්න එනකොට ඔබතුමා දීර්ඝ කාලයක් ඉන්නවා, මේ අවුරුදු දහයකට වඩා වැඩි කාලයක් මේ නගර සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු ගොඩක් ඉන්නවා. අපි ආදරයට කියන්නේ හෙන්රි අයියා කියලා.

හෙන්රි අයියා කියන්නේ හැමවේලාවෙම හරි සුහදශීලී චරිතයක්. මේක ඇතුළට එනකොට ඔහුට පක්ෂ බේදයක් නැහැ. හැමෝම එක්ක සුහදශීලීව කටයුතු කළ කෙනෙක්. අපි එක්ක වුණත් නිතර දේවේලේ මේ සභාවේ ඇතුලේ තිබුණ කාරණා ඔහුටත් උවමනාව තිබුණා මහා නගර සභාව මීට වඩා තැනකට ගෙනිය ගන්න මාධ්‍යවේදියෙක් විදියට. ඔහු ඒ වෙනුවෙන් ඔහුගේ පෑන හැමවේලාවේම පාවිච්චි කළා. මාධ්‍යවේදියෙක් විදියට ඔහුගේ කාර්යභාරය පිළිබඳව කිසිදු විවාදයක් නැහැ. ඉතාම හොඳ මාධ්‍යවේදියෙක් සුහදශීලී චරිතයක්, ජ්‍යෝෂ්ඨයෙක්. ක්ෂේත්‍රයේ විශාල ගෞරවයකට ලක් වුණ කෙනෙක්. මේ අවස්ථාවේදී ජාතික ජන බල වේගයේ මන්ත්‍රී කණ්ඩායම විදියට ඔහුගේ අභාවය පිළිබඳව. අපි මේක දැන ගන්නකොට පරක්කු වෙලා ඔහුගේ ගම් ප්‍රදේශයේ තමයි අවසන් කටයුතු සිදු වුණේ. අපි කාටත් සම්බන්ධ වෙන්න හැකියාවක් ලැබුණේ නැහැ මම හිතන්නේ. අපේ ශෝකය ඒ පවුලේ අයට අපි පිරිනමනවා ජාතික ජන බල වේගයේ අපේ මන්ත්‍රී කණ්ඩායම විදියට. ඒ වගේ චරිත හරි විරලයි. අපි හිතනවා හෙන්රි වගේ මාධ්‍යවේදීන් අපට ඕනේ. තවදුරටත් මේ සමාජය මීට වඩා යහපත් තැනකට ගෙනියන්න. ඒ එක්කම මේකේ අනිත් කොටසත් මේ මොහොත වෙනකොටත් අපේ මාධ්‍ය ආවරණය ලබා දෙන මාධ්‍යවේදීන් දෙපළ විශේෂයෙන් තුන්පොළක් ඉන්නවා. ඒ මාධ්‍යවේදීන් සියලු දෙනාම ඔවුන්ගේ කාර්ය භාරය පිළිබඳව අපට කිසිදු වාදයක් විවාදයක් නැහැ. ගරු නගරාධිපතිතුමා කිව්වා වගේ යම් සිදුවීමක් පසුගිය කාලයේ සිදුවුණානම් ඒ පිළිබඳව අපේ කණගාටුව පළ කරනවා. අපි ඒ වගේ කිසිදු අදහසකින් ඉන්න දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. නමුත් කිසියම් මොහොතක ඒ සිදුවුණ සිදුවීම පිළිබඳව අපි විශාල කණගාටුවකට පත් වුණා. නමුත්, නැවත ඉදිරියට එවැනි දේවල් සිදු නොවන්න අපි වග බලා ගන්නවා. ඒ වගේම අපි ස්තුතිවන්ත වෙනවා දීර්ඝ කාලයක් තිස්සේ විශේෂයෙන් අපේ රේඛා මහත්මිය, දර්ශන් මහතා සහ නවක මහත්මයෙක්. මම අවබෝධ නැහැ එතුමා පිළිබඳව. දිවයිනෙන් හෙන්රි අයියා වෙනුවට ආවේ. හෙන්රි අයියා දිවයින පත්තරේ වැඩ කළේ. ඔවුන්ට අපේ විශාල ඇගයීමක් තියෙනවා. අපි පුද්ගලිකව බොහොම හිතවත්. අපිත් එක්ක ඕන වෙලාවක කථා බහ කරනවා. අපිත් එක්ක ඉතා සුහදශීලීයි. අපි පිළිබඳ විවේචන ඉදිරිපත් කරන්න පුළුවන් ඕනෑම මොහොතක ඔවුන් බය නැතිව විවේචනත් ඉදිරිපත් කරනවා. ඒ තමයි මාධ්‍යවේදියාගේ කාර්ය භාරය අපි බලාපොරොත්තු වෙන්නේ. සුදු හුණු ගාන එක නෙවෙයි. අපේ අඩුපාඩු පෙන්නලා දෙන එක. අපිට පුද්ගලිකවත් කථා කරලා විශේෂයෙන් රේඛා මහත්මිය, දර්ශන වගේ අය සමහර අපේ තිවයන දුර්වලතාවයන් පවා අපිට පෙන්වනවා. එහෙම අය තමයි අපිට ඕනේ. අපි ස්තුතිවන්ත වෙනවා ඔබතුමන්ලා මේ කරන කාර්ය භාරයට. මන්ත්‍රී කණ්ඩායම විදියට නැවතත් ස්තුතිවන්ත වෙමින් දීර්ඝ කාලයක් මේ කටයුත්ත සාර්ථකව කර ගෙන යන්න ඔබට ශක්තිය, ධෛර්යය ලැබෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, හෙන්රි ප්‍රියශාන්ත කියන ඒ සොඳුරු මිනිසා. මට ආරංචි වුණේ එතුමාගේ අවසන් කටයුතු වලින් පසුව. නැතිනම් අනිවාර්යයෙන්ම අපි අවමංගල්‍යය සඳහා සහභාගී වෙනවා. “2006 අප්‍රේල් මාසේ දිවයින පත්තරේ යනවා ලාබාල මන්ත්‍රීවරයෙක් අලවංගුවක් අරගෙන ගිහිල්ලා කාණුවක් කඩලා වතුර ටික බස්සනවා කියලා.” මගේ අම්මයි, තාත්තයි අහනවා ලොක්කා ඔයා එහෙම කළා ද කියලා. බැලින්නම් මගේ නම සඳහන් කරලා, හෙන්රි ප්‍රියශාන්ත දැකලා පොලිසිය ළඟ මම අලවංගුවක් අරගෙන කාණුව කඩනවා. දිවයින පත්තරේ ආර්ටිකල් එක ගිහිල්ලා. අපි දිවයින පත්තරේ කියවන හින්දා හෙන්රි අන්කල් තමයි පත්තරේ කොටස අරන් ගිහිල්ලා දෙන්නේ. මේ ඔයාගේ පුතා කථා කරලා කියලා. මාර අඩම්බරයක්. පළවෙනි පාරට නම ගියාම පත්තරේ. අපි ආදරේට කියන්නේ හෙන්රි අන්කල් කියලා. අපි මොනවාහරි කථා කළාම හෙන්රි අන්කල් පොඩි කොටසක් හරි ලියලා ඒක කොළයක අලවලා ගිහිල්ලා අපේ ගෙදරට දෙනවා. ඒක පොඩි ගැම්මක් එන එකක්. හෙන්රි අන්කල් එච්චරටම හොඳ මනුස්සයෙක්. බොහෝ අවස්ථාවල එයාගේ ඇස් දෙක පෙන්නේ නැති වුණාමත් අපිත් එක්ක කථා කරලා අපි ගොඩක් වෙලාවට උදව් කළා. ඇත්තටම මුදලට ආපු කෙනෙක් නෙමෙයි හෙන්රි අන්කල් කියන්නේ. මම දැක්ක හොඳ ලියන්නෙක්. හොඳ වචන ටිකක්. ලස්සන අත් අකුරු තියෙන කෙනෙක් තමයි හෙන්රි ප්‍රියශාන්ත කියන ලේඛකයා. හෙන්රි අන්කල් අවුරුදු අසූ හයක් ජීවත් වෙලා අවසන් ගමන් කිහිල්ලා

තියෙනවා. ඒ වෙලාවේ ඇත්තටම අපි නගරාධිපතිතුමනි, ඔබතුමා සහභාගි වුණා ද දන්නේ නැහැ. මට සහභාගි වෙන්න බැරි වුණා. දන්නේ නැති නිසා. ඇත්තටම කණගාටුයි ඒ වගේ කෙනෙක්ගේ අවමංගල්‍යයට යන්න බැරි වුණාට. ඒ නිසා දැන් වර්තමානයේ අපේ මාධ්‍යවේදීන් ඉන්නවා. ඒ මාධ්‍යවේදීන් අපි සමඟ සුහදව කටයුතු කරනවා. ඒක තමයි වෙන්න ඕන මාධ්‍යයෙන්. මාධ්‍ය නිදහස තියෙන්න ඕන. හෙන්රි අන්කල් ඔහු කර ගත්තා වූ ඒ කුසල කර්ම සහ මොරටුවට වැඩදායි ලෙස ඔහු ලියපු දේවල් එක්ක හෙන්රි අන්කල් අපිට දුන්න ඒ අවස්ථාව. එදා ඒ හෙන්රි අන්කල් පත්තරේ දාපු ඒ ආර්ටිකල් එක නිසා තමයි ගරු නගරාධිපතිතුමනි, තාමත් අපි මෙහෙම නැගිටලා කථා කරන්නේ නැතිනම් සබකෝලයෙන් හිටපු අපි, තරුණ මන්ත්‍රීවරුන් හැටියට අවුරුදු විසි හතරක, විසි පහක වයසේදී ඒකෙන් ගත්ත උද්දීපනය තමයි මේ වගේ නැගිටලා කකුල් දෙක වෙව්ලන්නේ නැතිව කථා කරන්නේ. ඒ නිසා නගරාධිපතිතුමනි, හෙන්රි අන්කල්ගේ පවුලේ අයට ශෝකය පුද කරනවා. ඒ වගේම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ ශෝකය මේ අවස්ථාවේදී පුද කරමින්, හෙන්රි අන්කල් ඔයා මේක අහන් ඉන්නවානම්, ඔයා ඒ කර ගත්තා වූ කාරණා කටයුතුත් එක්කම එතුමා නැවත හොඳ තැනක නැවත ඉපදෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, බලාපුවඩුගේ හෙන්රි ප්‍රියශාන්ත මෙන්ඩිස් මහත්මයා, 1939 මග්ගොන, දියලගොඩ ග්‍රාමයේ උපත ලබනවා. මවගේ ග්‍රාමයේ. පියා මොරටුවේ. ඊට පසුව මොරටුවට ඇවිල්ලා, පාසල් අධ්‍යාපනයේ නියැලිලා අවුරුදු විසි තුනේදී, 1962 දී ඔහු මාධ්‍ය ක්ෂේත්‍රයට පිවිසෙනවා. එදා ඉඳලා දීර්ඝ කාලයක්2025 එතුමා මියැදුනත්, එතුමාගේ ගතින් ඔක්තිමත් කාලය, පරාසය තුළම එතුමා පැන අරගෙන මාධ්‍ය ක්ෂේත්‍රයට නොමැකෙන සේවාවක් ලක් ඉතිහාසයේ එතුමා නමින් ලියැවිලා තියෙනවා. ලංකා වලනදීප පත්‍රය, දිවයින පත්‍රය, මොනරා පත්‍රය, ලංකාදීප පත්‍රය ඊට අමතරව ආගමික ඥානාර්ථප්‍රදීපය යන පුවත්පත්වල දීර්ඝ කාලයක් මොරටුව වාර්තාකරු විදියට, එගොඩඋයන වාර්තාකරු විදියට කටයුතු කළා. පෞද්ගලිකව මම දන්න බොහොම නිව්ච්ච ගතිගුණ තිබුණ , බොහොම කාරුණික හදවතක් තිබුණ, පුද්ගලයෙක් හැටියට මතක් කරන්න ඕනේ හෙන්රි ප්‍රියශාන්ත මෙන්ඩිස් මහත්මයා. මේ සභාව තුළ මා නියෝජනය කළ අවස්ථාවලදී එතුමා විශාල සේවයක් කළා, එතුමා උදේන්ම ඇවිල්ලා පැය ගාණක් සභාව නිමා වෙනුතුරු මෙතැන රැඳිලා බඳලා වැදගත් දේ හරයන් අරගෙන, තමන් නියෝජනය කරන පුවත්පත වෙත ගෙනිහිල්ලා අර ඔසඳ මන්ත්‍රීතුමා කිවුවා වගේ කරුණු අරගෙන මන්ත්‍රීවරුන්ටත් සාධාරණයක් කළා. එතුමා බලාපොරොත්තු වුණේ ඒ තුළින් ප්‍රදේශවාසීන්ගේ ප්‍රශ්න මේ සභාව තුළ හරියාකාරව පෙන්නලා දීලා මාධ්‍ය ක්ෂේත්‍රයෙන් පෙන්වන්න කටයුතු කළා. එවන් උත්තුංග මනුස්සයෙක් ඇඟ කෙසඟ වුණත් , උස මහත වැඩිය නැති වුණත්, එතුමා තමන්ගේ සමාජ මෙහෙවර තුළ, තමන්ගේ පුවත්පත් කලාවේදීත්වය තුළ එතුමා කටයුතු කළා. විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕන එතුමා 1977 රුක්මනීදේවිගේ වියෝවෙන් පසුව, විශේෂයෙන්ම ඊට පෙරාතුව එතුමාගේ තරුණ කාලය තුළ රුක්මනීදේවිත්, එඩී ජයමාන්නගේත් පින්තූරයක් දාලා ඒ නිසාවෙන් ඒ අය මෙතුමාව වෙනම ගෙන්නගෙන මෙතුමත් එක්ක බොහොම ළඟ සමීප සම්බන්ධකම් ගොඩ නගා ගත්තා. එතුමිය 1977 මිය ගියායින් පසුව, එතුමිය නමින් 1989 පසුව රුක්මනීදේවි පදනමක් ඇති කරලා , අතුමාගේ ජීවිතයේ අවසන් ගමන් යන දවස දක්වාම ඒ පදනම තුළ කටයුතු කළා. හැබැයි මම දන්නවා පෞද්ගලිකවම මාධ්‍ය ක්ෂේත්‍රය තුළ සම්බන්ධවම, ඒ හා සමානවම ඒ පදනම තුළත් කටයුතු කළා. ලොකු මෙහෙවරක් රුක්මනීදේවිය අභාවයට ගියාට, එතුමියගේ ජීවමාන ප්‍රතිරූපයක් ජනිත කරලා පෙන්නුවා එතුමාගේ හැකියාවන් තුළ නිර්මාණ ප්‍රතිරූපයක් පෙන්නලා. එතුමාගේ අවසාන කාලය තුළ එතුමා ජීවත් වුණේ මොරටුවේ නෙමෙයි. එතුමා අසනීප වුණයින් පසුව එතුමාගේ සහෝදයෙකුගේ පුතෙක් එතුමාව බලා ගත්තා. ඒ ගියේ රත්නපුර ප්‍රදේශයට . අවසන් කාලය තුළදී රත්නපුර රෝහලේ දින කිහිපයක් ප්‍රතිකාර ලබලා අසාධ්‍ය තත්ත්වයට පත් වෙලයි එතුමා නැති වුණේ. එතුමාගේ දරුවෙක් විදියට, එතුමාගේ ඥාතියෙක් විදියට එතුමා සමඟ සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගෙන මේ අපේ සභාව නියෝජනය කළ නාගරික මන්ත්‍රීවරයෙක් වන කුවින්ටස් ප්‍රනාන්දු මහත්මයා ලොකු සේවාවක් එතුමා වෙනුවෙන් කළා. එතුමා ගැන හොයලා බැලුවා ඒ අවශ්‍ය කටයුතු ටික එතුමා වෙනුවෙන් කරන්න ඉදිරිපත් වුණා කියන එක මතක් කරන්නට ඕන. කොහොම වුනත් එතුමාගේ ජීවිතයේ අවුරුදු 86 ක් වැනි කාලයක් සාර්ථක

ජීවිතයක් ගත කරලා මනුෂ්‍යයෙක් විදියට තමන්ගේ යුතුකම් කොටස මේ දෙරණ තුළ ඉෂ්ඨ සිද්ධ කරලා දෙදහස් විසිපහේ ජූලි මාසෙ 30 වෙනිදා එතුමා අවසන් ගමන් ගියා.කොහොම වුනත් මේ සභාවේ මේ යෝජනාව ඉදිරිපත් කරපු අපේ සුරේෂ් මන්ත්‍රීතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මේ කාලෝචිත යෝජනාවක්, මේ සභාවට සේවයක් කරපු කෙනෙකුගේ සේවය අගයකිරීම වස් ගෙනාපු ඒ යෝජනාවට මාගේ කෘතඥපූර්ව ස්තුතිය පලකරනවා. ඒ වගේම එතුමා රචකයෙක්, වේදිකා නළුවෙක්, ඒ වගේම ග්‍රන්ථ කතෘවරයෙක් කියන එකත් මතක් කරන්නට ඕනෙ. එහෙමනම් එතුමාට ශෝකය එලකරන මේ අවස්ථාවේදී මේ මොරටුව මහා නගර සභාවේ සියළුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ ශෝකය විශේෂයෙන්ම පක්ෂයක් විදියටම නෙමෙයි මම සමගි ජන බලවේගය නියෝජනය කලත් ආණ්ඩුපක්ෂය ප්‍රතිපක්ෂ සියල්ලන්ගේම ශෝකය මේ පවුල වෙත ලිඛිතව යොමුකරන හැටියට මේ අපි කරපු අදහස් ලිඛිතව ඉදිරිපත් කරන හැටියට ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, අපි මේ සභාව නියෝජනය කරන්න ආවේ 2006 අවුරුද්දේ. 2006 අවුරුද්දේ එනකොට මම මන්ත්‍රීවරයෙක් හැටියට අවුරුද්දක් එකහමාරක් වගේ කාල සීමාවක් හිටියෙ ඊට පස්සෙ නියෝජ්‍ය නගරාධිපතිවරයෙක් හැටියට පත්වුණා. කොහොමහරි අපි එනකොට අපි දුටුව මාධ්‍යවේදීන්ගෙන් හෙන්රි ප්‍රියශාන්ත මහත්මයා අනිත් මාධ්‍යවේදීන් වගේම බොහොම වයසට ගියත් බොහොම ප්‍රියමනාප විදියට මන්ත්‍රීවරුන් එක්ක සම්බන්ධතාවය ගොඩනගාගෙන හිටියා. පක්ෂද විපක්ෂද කියන එක මොහු බැලුවේ නැහැ. ඔහු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හා විපක්ෂයේ මන්ත්‍රීවරු කියන මේ දෙගොල්ලොත් එක්කම බොහොම නම්‍යශීලීව කටයුතු කරපු මධ්‍යවේදියෙක් විදියටයි අපි දකින්නෙ. ඇත්තටම අර ඔසඳ මන්ත්‍රීතුමා කිව්වා වගේ යම් ඔහුගේ වාර්තාවක් පත්තරේ පලවුනාට පස්සෙ ඔහු ඒ  මන්ත්‍රීවරයාට කතා කරලා කියනවා අන්න මන්ත්‍රීතුමා ඔබතුමා කතාකරපු එක පත්තරේ අද ගිහිල්ලා තියෙනවා කියලා. ඒ වගේ බොහොම පුවත්පතත් එක්ක මොරටුව මහා නගර සභාවත් එක්ක බොහොම බැඳිච්ච චරිතයක් තමයි හෙන්රි ප්‍රියශාන්ත කියලා කියන්නෙ. මේ වගේ පුද්ගලයෙක්ගෙන් වර්තමානයේ ඉන්න මාධ්‍යවේදීන්ට ගන්න ලොකු ආදර්ශයන් රාශියක් තියෙනවා කියන එකයි අපේ හැඟීම. මොකද හේතුව ඔහු ඉතාමත්ම ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීයෙක්. ඒ විතරක් නෙවේ ඔහු හොඳ කලාකරුවෙක්. ඔහු රුක්මණීදේවි සංසදය පිහිටවාගෙන ඒ හරහා රුක්මණීදේවි කළාකාරිණියට කරන්න පුළුවන් උපරිම ගෞරවය ඔහු දැක්වුවා. ඒකෙදි ඔහු ඒ සංසදය හරහා සෑම සෑම වසරකම රුක්මණීදේවි අනුමස්රණ දිනයක් යොදාගෙන ඒ කටයුතු ඔහු බොහොම හොඳන් කරගෙන ගියා. ඇත්තටම අපේ මන්ත්‍රීවරුන් සමඟ පමණක් නෙමේ නිලධාරින් සමඟ පවා ඔහු බොහොම කුළුපගව ආශ්‍රයක් පවත්වාගෙන ගියා බොහොම හොඳින් ඒ සහසම්බන්ධතාවයන් මාධ්‍යවේදියෙක් හැටියට ඔහු කරගෙන ගියා. ඉතින් ඇත්තටම පෞද්ගලික ජීවිතයේ විශාල ප්‍රශ්න ගොඩක හිටපු පුද්ගලයෙක් හැටියට ඔහුගේ වයස ගැනවත් ඔහු නොතකා මොරටුව මහා නගර සභාවේ මහා සභාව වාර්තා කරන්න එක සභාවක්වත් මඟහරින්නේ නැතුව ඔහු මොරටුව මහා නගර සභාවේ මහා සභාව වාර්තා කරන්න පැමිණියා. සමහර වෙලාවට පෞද්ගලික ජීවිතයේ ඔහුට ප්‍රශ්න ගොඩක් තිබ්බා. හැබැයි ඒ මොන ප්‍රශ්නෙ තිබ්බත්, අවසානයේ ඔහුට ඇස් පේන්නෙ නැතුව ගියා ඔහුට හරියට පේන්නෙ නැහැ, හැබැයි අපිට කියලා අපි කතාකරන එක නැවත නැවත අහගෙන ඔහු ඒ වාර්තාකරණය සිදු කලා. ඔහු කායික වශයෙන් දුර්වල වුනා, ඔහුට ප්‍රශ්න තියෙද්දි ඔහු මානසික වශයෙන් දුර්වල වුනා හැබැයි මාධ්‍යවේදියෙක් හැටියට ඒ කොයිවෙලාවකවත් ඔහු ඔහුගේ මාධ්‍ය ජීවිතය අතහරින්න ඔහු සූදානම් වුනේ නැහැ. මම හිතන්නේ අවසාන මොහොත දක්වාම ඔහු මධ්‍යවේදියෙක් හැටියට කටයුතු කරමින් හිටියා. ඒ නිසා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අපි දැකපු බොහොම සංවේදී මාධ්‍යවේදියෙක් හැටියට තමයි හෙන්රි ප්‍රියශාන්ත මහත්මයාව හඳුන්වලා දෙන්න පුළුවන් වෙන්නේ. අපේ සභාව නියෝජනය කරන මාධ්‍යවේදීන් අතර, අනිත් මාධ්‍යවේදීන් බොහොම තරුණ මාධ්‍යවේදීන් හැබැයි ඔහු බොහොම මුහුකුරාගිය වයසක හිටපු මාධ්‍යවේදීයෙක් හැබැයි අනිත් උදවියත් එක්ක උරින් උර ගැටිලා ඔහු ඒ තමන්ගේ කාර්යභාරය නිවැරදිව ඉෂ්ඨ සිද්ධ කලා. ඉතින් මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවේගය, ඒ වගේව අපගේ පෞද්ගලික සංවේගයත් හෙන්රි ප්‍රියශාන්ත මහත්මයාගේ වියෝවීම වෙනුවෙන් ඒ පවුලේ උදවියට පුදකරනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා.</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, විශේෂයෙන් ඇත්තටම සේනක දමයන්ත මන්ත්‍රීතුමාත්, සුජිත් මන්ත්‍රීතුමාත් ඒ වගේම ඔසඳ මන්ත්‍රීතුමාත් සුරේෂ් මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඇතුලෙ දක්වපු සියළු කරුණුවලට එකඟයි. ඉතාම හොඳින් ඔහු පිළිබඳව අදාල ශෝක පලකිරීමේ යෝජනාවට ඇතුලත් විය යුතු කරුණු ඔවුන්ගේ අවබෝධය ඇතුලේ ඉතාම හොඳින් ඉදිරිපත් කලා. මම දැක්කේ දේශපාලඥයා සහ මාධ්‍යවේදියා අතර පවත්වාගතයුතු සහසම්බන්ධය ඉතාම හොඳින් පවත්වගත්තු මාධ්‍යවේදියෙක්. ඔහු කිසිදවසක දේශපාලඥයාට ඕන විධියට, දේශපාලඥයාගේ යම් වරප්‍රසාද ලබන්න ලිව්වෙ නෑ. එහෙම කරන්න පුළුවන් කෙනෙක් නෙවෙයි. මාධ්‍යවේදියා යනු කවුද කියලා අපි ඉගෙන ගත්තෙ ඔහුගෙන්. ඉතාම පුංචි මනුස්සයෙක්. ප්‍රාදේශීය මාධ්‍යවේදීයෙක් ලෙස නම්වුණත් ඔහු ජාතික මට්ටමේ මාධ්‍යවේදියෙක්ටත් එහා ගිය මට්ටමේ ගුණයන්ගෙන් පිරිච්ච පොදු සමාජමය අවශ්‍යතා වෙනුවෙන් සැලකිය යුතු නිර්මාණශිලිත්වයක් ගොනුකරගත්තු පුද්ගලයෙක්. මොරටුව මහා නගර සභාව අර ඔසඳ මන්ත්‍රීතුමා කිව්වා වගේ එන නවක මන්ත්‍රීවරයෙකුට ජවයක් ලැබුණානම් ලැබුනෙ අර පුවත්පත් වාර්තාවක් ඔහු ඉදිරිපත් කරනවා විතරක් නෙවෙයි ඒ වාර්තාව මන්ත්‍රීවරයාට පෙන්වනවා. ඒක ඉතාම වටින එකක්. ඒ නිසා මම දැක්කෙ හෙන්රි ප්‍රියශාන්ත යනු මම මුලින් දැකපු දවසයි අවසානෙ දැකපු දවසයි ඔහු පිළිබඳව අපේ ඔළුව ඇතුලට ඔහු එකතු කරපු මතකය ඔහුගේ චිත්‍රය එකම චිත්‍රයක්. කවදාකවත් වෙනස් නොවිච්ච මුලින් දැකපු ප්‍රියශාන්ත මහත්මයාම තමයි අවසාන කාලයේත් මේ හොඳටම වයසයි හැබැයි අර මුලින්ම දැකපු කෙනාම තමයි දැක්කෙ. ඒක හරිම සුවිශේෂයි. ඒ නිසා අවසාන මොහොත වෙනකල් තමන්ගේ අතපය දුර්වලයි, තමන්ගේ ඇස් පේන්නෙ නෑ. හැබැයි අරමුණ අත්හැරියෙ නෑ. අපට කණගාටුවක් තිබෙනවා. කණගාටුව තිබෙන්නේ එවන් විශාල සමාජ මෙහෙවරක් කරපු මාධ්‍යවේදීයෙක් අවසන් ගමන් යනකොට අපි අත්හැරලා හේතු ඇති, අප ඊට වඩා සංවේදී විය යුතුයි, මාධ්‍යවේදීන් පිළිබඳව සොයා බැලිය යුතුයි. ඒ නිසා මම හිතන්නේ අපේ පැත්තෙන් යම් අඩුවක් ඔහුට වුනා. දැන් කරන්න දෙයක් නෑ. නමුත් ඇත්තටම මේ යෝජනාව ගෙනාපු සුරේෂ් මන්ත්‍රීතුමාට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. කතාකලයුතු කෙනෙක්. ආදර්ශයන් ගොඩක් ලබා ගත යුතු කෙනෙක්, ඒ වගේම ඔහුගෙ මග යමින් අපට තිබෙන මතකය අවධිකල යුතුයි කියලා හිතුනා බන්දුල ආරියතිලකයන් මෙම සභාව වෙනුවෙන් මේ සමාජය වෙනුවෙන් විශාල යුග මෙහෙවරක් කලා ඒ වගේම ඊළඟ මතකය අපට තිබෙන්නෙ අපේ වර්තමාන රේඛා මහත්මිය පිළිබඳව. ඉතාම හොඳ මාධ්‍යවේදී කර්තව්‍යක් ඉෂ්ඨ කරනවා. ඉතින් ඒ නිසා මාධ්‍යවේදියා සහ දේශපාලඥයා විශේෂයෙන් අප මුණගැහෙන අපේ සමීප සම්බන්ධතාවය ඒ බැඳීම ශක්තිමත් වෙන්නෙ මෙන්න මේ අයතනය පදනම් කරගෙනම තමයි. ඒ නැතත් හෙන්රි අයියට කිව්වොතින් එහෙම මෙහෙම අපේ උත්සවයක් තියෙනවා කියලා හෙන්රි අයියා දුවගෙන එනවා. අනිත අයත් එහෙමම තමයි. මම කියන්නගියේ ඉතාම හොඳ ඉතාම ගුණවත් ඉතාමත් ශ්‍රේෂ්ඨ කිසිවෙකුට පක්ෂපාතී නොවෙච්ච ජනතාවටම ඉතාම හොඳින් ප්‍රවෘත්ති ලියන්න උත්සාහ කරපු මාධ්‍යවේදියෙක් ලෙස හෙන්රි ප්‍රියශාන්ත මහත්මාට විශේෂයෙන් ජාතික ජනබලවේගය වුනත්, ජනතා විමුක්ති පෙරමුණ විධියට මගේ සාතිශය සංවේගය ශෝකය පලකරමින් ජාතික ජනබලවේගය ආණ්ඩු පක්ෂය විධියටත් මේ වෙලාවේ එම පවුල වෙත අපේ ශෝකය පලකරමින් මගේකතාව අවසාන කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි මේ සභාවට අවාට පස්සේ මාධ්‍යවේදියෙක් විදිහටත් ඔසඳ මන්ත්‍රීතුමා කියපු විදිහටත්, අපි මුලින්ම දැකපු පුවත්පත් මධ්‍යවේදියා තමයි හෙන්රි ප්‍රියශාන්ත මැතිතුමා. එතුමා විශේෂයෙන්ම මම හිතන විදිහට ලංකාවේ සුප්‍රකට රුක්මනි දේවි මැතිණිය මියගියාට පස්සේ එතුමියට නැවත පණ දුන්නේ මෙතුමා කිවුවොත් නිවැරදි. එතුමියගේ ගුණ සැමරු වැඩසටහනක් එ වගේම එතුමිය වෙනුවෙන් සංගමයක් පිහිටවලා හැම අවුරුද්දකම ඒ යුතුකම ඔහු ඉෂ්ඨ කළා. එත් එක්කම ඇයගේ ගීත, රංගන විලාශයන් පිළිබඳ ඒ සභාව තුළ ඔහු කතා කළා ඒ නිසා එකට මුල් වුනේ වෙන කවුරුත් නෙමෙයි හෙන්රි ප්‍රියශාන්ත මැතිතුමා. ඊළඟ කාරණය තමයි එතුමා මධ්‍යකරණයට එනකොට කළුතර ඉඳලා ඒ මධ්‍යකරණයේ වගකීම ඉෂ්ඨ කරන්න කලින් එතුමා ගෙදර වගකීමක් ඉෂ්ඨ කරලා ආවා. ඔබතුමා කිවුවා අපි හැමෝටම අතපසු වුණ දෙයක්

තියෙනවා ඒ යුක්තිය යුතුකම ඉටු කරන්න අපිට බැරි වුණා. එක සමහරක් වෙලාවට අපේ අඩුවක් හැබැයි හෙන්ඩ්‍රි ප්‍රියශාන්ත මහත්මයාගේ බිරිඳ ඔත්පල වෙලා හිටියේ, ඇයගේ ඇස් පේන්නේ නැහැ. ඔහු අවේ ඇයව උණු වතුර රත්කරවලා නාවලා ගෙදර කටයුතු ඔක්කෝම කරලා උයලා කන්න තියලා තමයි එතුමා මේ සභාවට ආවේ එතුමාගේ වගකීම ඉෂ්ඨ කරන්න. අපි දන්නවා විශේෂාංග ලිපි තියෙනවා. තීරු ලිපි තියෙනවා එවගේම සිනමා ලිපි තියෙනවා. මේ හැම දෙයක්ම ආවරණය කරපු මාධ්‍යවේදීයෙක් තමයි එතුමා. ජන මාධ්‍ය පිළිබඳ මමත් ආයතනයක වැඩ කරපු නිසා එතුමාගේ තිබුණ සුවිශේෂී ගුණාංගයක් තිබුණා එක මම මතක් කරන්න ඕන විශේෂයෙන් මේ න්‍යාය පැත්තෙන් එතුමා ලියපු හැම තැනකම මම පරික්ෂා කරලා බලලා තියෙනවා. අපි මාධ්‍යකරණයෙදී ඉගෙන ගන්නවා. මම ඒ සම්බන්ධයෙන් දේශනත් කරලා තියෙනවා. ප්‍රවෘත්තියක නිරවද්‍යතාවයේදී ප්‍රධාන කරුණු තුනක් තියෙනවා. එකේ පළවෙනි එක තමයි ප්‍රවෘත්තියක ඇකියුරසි නිරුවුල් භාවය, බැලන්ස් සමබර භාවය, කැරටි නිරවුල් භාවය මේ තුනම ප්‍රේක්ෂකයගේ කෙරබිලිටි එකට එහෙම නැත්නම් විශ්වාසනීයභාවයට සමාන වෙන්න ඕන. දැන් අපි සමහර මාධ්‍යකරණයෙදී එක දකින්නේ නැහැ. හැබැයි මම ප්‍රවෘත්තියක් ගත්තට පස්සේ ඉගෙන ගත්තු දැනුම එක්ක මම මේක බලනවා. හැබැයි ඔහුගේ මේ නිරවද්‍යතාවය නිරවුල් බව ප්‍රේක්ෂකයාගේ විශ්වාසනීයත්වය සමඟ සමානකරණය යටතේ ඒ න්‍යාය හරියට භාවිත කරනවා. ඊලඟ එක තමයි හැම එකකම තියෙනවා. හඳුන්වාදීම ඒ හඳුන්වාදීමෙන් පස්සේ මොස් සපෝටින් පැක් කියලා එකක් අපි පාවිච්චි කරනවා. ඒ කියන්නේ අතිශය වැදගත් තොරතුරු අනිවාර්යෙන් තහවුරු කරගන්න සපෝටින් පැක් කියලා එකක් අපි පාවිච්චි කරනවා ඒ කියන්නේ උදව්කරන තොරතුරු, එවා හරියටම ඔහුගේ ගැලපීම තිබුණා ඊට පස්සේ එඩිටට ගියාට පස්සේ තමයි අන්ත්‍රසෝදනය කියලා අපි කියනවා. ඒ දක්වාත් එතුමාගේ කාර්ය භාර්ය විද්‍යාත්මකවත් එතුමා ඉෂ්ඨ කරා කියලා මම විශ්වාස කරනවා. එම නිසා එතුමා පිළිබඳව අටුවා ටිප්පනි ඕන තරම් පවිච්චි කරන්න පුළුවන් එත් එකක්ම මම හිතනවා අපට හම්බවෙච්ච සත්භාවයෙන් වැඩ කරන ඒ ගෞරවනීය මාධ්‍යවේදීයා අපෙන් නික්ම ගිහිල්ලා. ඒ නිසා හෙන්රි ප්‍රියශාන්ත නම් වූ ඒ මාධ්‍යවේදියා හැමෝටම ප්‍රිය වූ ශාන්ත වූ ඔහුගේ නමේ අර්ථයෙන්ම ඔහු අපට ප්‍රිය වුනා ශාන්ත වුනා ඔහු එක මේ නගර සභාව තුළත් ප්‍රකට කරා. ඒ නිසා එතුමාට මට බෞද්ධයෙක් විදිහට ප්‍රර්ථනා කරන්න තියෙන්නේ ජාතිජාරා මරණ ආදීයෙන් තොරව අමා මහා නිවනින් සැනසෙන්න ඔහුටත් අපිටත් ලැබේවා කියලා. එතුමා පිළිබඳ ගුණකදම්බය සංශිප්තව මා අවසන් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ශෝක යෝජනාව න්‍යාය පත්‍රයේ උඩට ගන්න තිබ්බනම් වටිනවා කියන එකයි මගේ විශ්වාසය. නමුත් මේ අවස්ථාවේදී හැමදෙනාම මේ උතුම් මිනිසා සම්බන්ධයෙන් කරපු ඒ කතා සියල්ලන්ටම මගේ ගෞරවනීය ප්‍රණාමය පුදකර සිටිනවා. මේකද අපි කළගුණ දත් මිනිස්සු විදිහට. නගරාධිපතිතුමා, ඔසඳ මන්ත්‍රීතුමා ඇතුළු කිහිපදෙනෙක්ම කතා කරා අපේ නම සහිත වාර්තාවක් ගියොත් එක කපලා ගෙනත් දෙනවා. එතුමා සමහර එවා ෆොටෝ කොපි කරලා ගෙනත් දෙනවා. සල්ලි අතේ නැත්තම් අපිට ෆොටෝ කොපි එකක් ගහගන්න කියලා ගෙනත් දෙනවා. එක හරි ගුණයක් මොකද අපි හැමවෙලාවෙම පත්තර බලන්නේ නැහැ කියලා හිතලා එතුමා එතුමාගේ අතින් ලියවුන හැම එකක්ම බොහොම නිරාමිස සතුටකින් තමයි අපිට ඒ වාර්තාවන් කපලා ගෙනත් දෙන්නේ. හිටපු හැම මන්ත්‍රීවරුයෙක්ටම එය අත්දැකීමක්. හෙන්රි ප්‍රියශාන්ත ගරු මාධ්‍යවේදීයාට ජාතික නිදහස් පෙරමුනේ අපේ ශෝකය ප්‍රකාශ කරන්න අවස්ථාව යොදා ගන්නා ගමන්ම. අනිත් මාධ්‍යවේදීන් තුන්දෙනාටම යම් ඇගයීමක් සහිතව අපි කටයුතු කරන්න ඕන විශේෂයෙන්ම ලංකාදීප පුවත්පතේ රේකා මහත්මිය විශාල විදිහට මැදිහත් වෙනවා අනිත් මාධ්‍යවේදි අපේ අරුන පත්තරෙ මාධ්‍යවේදීතුමා එක්කම විශාල මැදිහත් වීමක් කරනවා. එතුමිය ඒ කරපු මැදිහත්වීමත් ඇතුලේ එතුමිය සම්මානත් දිනා ගත්ත කෙනෙක්. එක මොරටුව මහා නගර සභාව විදිහට අපිට වටිනාකමක් ඒ පිළිබඳවත් සිහිපත් කරමින් දිවයින පත්තරය වෙනුවෙන් මේ අවස්ථාවට පැමිණුන. දිවයින පත්තරය කියන්නේ ජාතික කර්තව්‍යක් ඉටු කරන ජාතික අරමුණක් වෙනුවෙන් පෙනී සිටින ජාතික පුවත්පතක්. එ ජාතිකවාදය තමන්ගේ අනන්‍යතාවය බවට පරිවර්තනය කරගෙන ක්‍රියාත්මක වෙන පුවත්පතක් ඉතින් එම පුවත්පතේ සුවිශේෂී කාර්යභාර්යක් මොරටුව වෙනුවෙන් සහ රට

වෙනුවෙන් කරපු හේන්රි ප්‍රියශාන්ත අභාවයට පත්වුන මාධ්‍යවේදී මහතාගේ ඉදිරි කාර්ය ඒ යෂ්ටිය හෙන්රි ප්‍රියශාන්ත මහතාගෙන් ඉදිරියට රැගෙන යන දිවයින පුවත්පතේ නව මාධ්‍යවේදී මහතාට මේ ඉදිරි ගමන යන්න මේ අවස්ථාවේදී සුබ පතමින් මේ ශෝක යෝජනාව ඇතුළු මේ ඇඟයීමේ යෝජනාවට අදහස් දැක්වූ සියළු දෙනාට නැවත වරක් මාගේ ගෞරවනීය ප්‍රණාමය පුදකර සිටිනවා.

අංක 05(11) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනී, මෙම ශෝක යෝජනාව පිළිබඳ හෙන්රි ප්‍රියශාන්ත මහත්මයාගේ පවුලේ සියළු දෙනා වෙත යැවීමට කටයුතු කරන්න කියන ඉල්ලීම ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අතුරු ව්‍යවස්ථාවේ 13(ඌ) වගන්තිය යටතේ මන්ත්‍රීවරු හත්දෙනෙකු විසින් අත්සන් කර ඇති යෝජනව සභාවට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**05(12) මහා නගර සභා මන්ත්‍රී, ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා, හරිෂ් චන්දන පිලාන විතානගේ මහතා, සුරේෂ් ප්‍රේමකුමාර මහතා, ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය, එච්.එල්. තිලිනි නෙත්සරණී මෙනවිය, පී. සුලක්ෂිකා තිලක්ෂනි මෙනවිය, ඕ. දිනුෂි කෞශල්‍යා පෙරේරා මහත්මිය යන මහත්ම මහත්මීන් විසින් අතුරු ව්‍යවස්ථාවේ 13(ඌ) වගන්තිය යටතේ ඉදිරිපත් කර ඇති පහත සඳහන් යෝජනාව මහා නගර සභා මන්ත්‍රී ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.**

"පසුගියදා ඇල්ල වැල්ලවාය මාර්ගයේ ඇතිවුනු බිහිසුන මාරන්තික බස් අනතුරකින් මිය ගිය තංගල්ල නගර සභාවේ ලේකම්තුමා ඇතුළු සේවක සේවිකාවන් සහ ඔවුන්ගේ පවුල් වල සමාජිකයන් හට අප සභාවේ සාතිශය සංවේගය මෙසේ පළ කරන අතර, තුවාල වුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන අතර, එම අනතුරින් පසු විපතට පත්වුවන්ට සහන සැලසීමට ඉදිරිපත්වූ ත්‍රිවිධ හමුදාව පොලීසිය, වෛද්‍යවරුන් හා විශේෂයෙන් ප්‍රදේශවාසී සියලු දෙනාගේ එකී මගමානවක ගුණය වෙනුවෙන් අප සභාවේ ගෞරවනීය ප්‍රණාමය මෙසේ පළ කර සිටි."

මහා නගර සභා මන්ත්‍රී, එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මෙය අප කවුරුත් සංවේගයට පත්කල පුවතක් ඇල්ල වැල්ලවාය මාර්ගයේ තංගල්ල නගර සභාවේ ලේකම්තුමා ඇතුළු සේවක සේවිකාවන් සහ ඔවුන්ගේ පවුල් වල සමාජිකයන් පිරිසක් විනෝද චාරිකාවක් ගොස් එන අතරතුර ඇතිවුන මේ භයානක අනතුරෙන් 15 දෙනෙක් මියගියා 18 දෙනෙක් තුවාල ලැබුවා. ගරු නගරාධිපතිතුමනි, අපි සභාවක් නියෝජනය කරන අය ඉතින් මේ අවස්ථාව ඉතාමත් කණගාටුදායක අවස්ථාවක්. මේ සම්බන්ධව විදේශ මාධ්‍යන් පවා ඉතා කණගාටු ලෙස වාර්තා කරලා තිබුණා. අපි ඒ මිය ගිය සියළුදෙනා සම්බන්ධයෙන් ශෝකය එළ කරනවා වගේම, තුවාල වුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරනවා වගේම අපි කතා කළ යුතු විශේෂ ගුණයක් අපි දැක්කා. විදේශ රටක මෙය සිදුවුනානම් එතනට පොලීසිය හෝ අදාල කවුරුන් හෝ එනකම් එතනට කවුරුත් අතවත් තියන්නේ නැහැ. නමුත් අපේ රටේ බෞද්ධ සංස්කෘතියත් එක්ක ගොඩනැගුණු මහා සංස්කෘතික මිනිසා තවමත් ජීවත් වෙනවා කියලා අපි දැක්කා. එයට එක උදාහරණයක් තමයි මේ අනතුරෙදී එක එස්ටීඑෆ් එකේ රණවිරුවෙකු යන අතරතුරදී ඔවුන් ලණු අරගෙන බැහැලා අඩි 1000ක ප්‍රපාතයට අපිට එක දකිනකොටත් ඇඟ හිරි වැටෙනවා. ඒ ප්‍රපාතයට බැහැලා ඒ ඉන්න තුවාලකරුවන් රැගෙන එනකොට ගල්පරයක වැදිලා ඔලුව පැලිලා ලේ එනකොටත් ඒවා නොසලකා හැරපු ඒ මගමානවක ගුණය අපි හැමෝම කිසිම භේදයකින් තොරව අපි ඇගයීමකට ලක්කරන්න ඕන. ඒ මිනිස්සු එදා ඒ කරපු අසීරු ක්‍රියාවලිය ඒ මිනිස්සුන්ව බේරගන්න කරපු ඒ මැදිහත් වීම අපි ජාතියක් විදිහට ආඩම්බර වෙන්න ඕන තමත් මනුස්සකම මේ මාතෘ භූමියෙන් මියදිලා නැහැ කියන උදාහරණය ජීවමානව සැපයුවාට ඒ ප්‍රදේශවාසී ජනතාවට, අපේ ත්‍රිවිධ හමුදාව අපේ රණවිරුවන් වගේම පොලීසිය, වෛද්‍යවරු මිහිපිට

දෙවිවරු වගේ මේ අය සම්බන්ධවෙලා මේ කරපු ක්‍රියාන්විතයේ ආදර්ශයට අපි අපේ හිස නමා ආචාර කරනවා.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, පහුගිය දවසක ඇල්ල වැල්ලවාය ප්‍රදේශයේ සිදුවුන ඒ ඛේදවාචකය පිළිබඳව ශෝකය ප්‍රකාශ කිරීම වෙනුවෙන් මෙම යෝජනාව ගෙන ඒම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම අපි දැක්කා සුරේශ් මන්ත්‍රීතුමා කිවුවා වගේ අපේ රටේ ඉන්නේ උතුම් මානුෂීය ගුණාංග තියෙන පිරිසක් අපි දැක්කා සමාජ මාධ්‍ය ඔස්සේ එවගේම ජනමාධ්‍ය ඔස්සේ අපේ රටේ ජනතාව කොයි තරම් මනුස්සකම් වෙනුවෙන් පෙනී සිටිනවද කියලා මම එක විඩියෝ එකක දැක්කා. ගලක වැදිලා කකුල කැඩිලා හිටපු කන්තාවක් බේරගන්න දරුණ වෙහෙස සර්පයෝ හිටියා ඒ කැළෑවේ, එපමණ අනතුරු දායක තත්වයන් තිබියදී විශාල වශයෙන් ජනතාව මුදවාගැනීම වෙනුවෙන් හමුදාව,පොලීසිය,වගේම ප්‍රදේශවාසී ජනතාව විශාල වශයෙන් කැප කිරීමක් කළා. එය අපි ඉතාම අගයකොට සලකන්න ඕන. අපි දැක්කා එතනට විශාල ජනකාය එකතු වෙලා ඉන්නවා. එක තමයි අපේ රටේ මනුස්ස ගතිය. ඒ අතර අපි දැක්කා තව සමහරක් අය ගොඩක් ජාතිකත්ව මත පදනම් වෙලා විවිධ විවේචන කරනවා. අපි දැක්කා මුස්ලිම් පල්ලිවලින් ඒ අයගේ මළ සිරුරු ප්‍රවාහනය කරන රථ වලින් නොමිලේ ප්‍රවාහනය කරා අපි එක අගය කරන්න ඕන. එවැනි මනුෂ්‍යත්වයක් අපි දැක්කා. ඒ වගේම ඒ අනතුරෙන් මියගියපු සහෝදර සහෝදරියෝ කුඩා දරුවන් වෙනුවෙන් අපේ ශෝකය ප්‍රකාශ කරනවා. අපි ජනතාවිමුක්ති පෙරමුණ විදිහටත්, ජාතික ජනබලවේගය විදිහටත් අපේ හෘදයාංගම ශෝකය ප්‍රකාශ කරනවා එ වගේම ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් විදිහට මියගිය අය වෙනුවෙන් වන්දි මුදලක් ලබා දීමට කටයුතු කරලා තිබුණා. මේ අනතුරින් තුවාල ලබපු සියළු දෙනාට ඉක්මන් සුවය අපි ප්‍රර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පසුගිය දිනක ඇතු වූ මේ දැවැන්ත ඛේදවාචකය පිළිබඳව කණගාටුව ප්‍රකාශ කර සිටිනවා. මේ අනතුර අපි ෆේස් බුක් එකෙන් දකිනකොට ඇල්ල ප්‍රදේශයම තනිකර මරණ ගෙයක් බවට පත්වෙලා ගමේ මිනිස්සු නිදි වර්ජිතව තමන්ට හැකි පමණ දේවල් සපයගෙන ලණු, කඹ ඇදගෙන පිරිස එකතු වෙලා ඒ වැටුන අයව බේරා ගන්න උත්සහ කරනවා, ඒ ප්‍රපාතය දිහි බැලුවහම පේනවා දහස්ගානක් අවශ්‍ය වෙනවා ඒ සිරුරු හෝ තුවාලකරුවන් උඩට ගන්න. හැබැයි එය කිසිම අඩුවක් නැතුව නිමේෂයකින්ම ඉෂ්ඨ වෙලා තිබුණා. එය ඉතාමත්ම අගය කළ යුතු කරුණක් මම මගේ ජීවිතේ දැකපු ලොකුම ඛේදවාචකය තමයි මොරටුව නව ගාලු පාර හදනකොට විශාල පිරිසක් රිය අනතුරකින් මිය ගියා. ඒ අවස්ථාවේදී මම ඒ ගෙවල්වලට ගියා පාර සම්පූර්ණ තාර දාලා තිබුනේ නැහැ. මේ වෙගේම ඛේදවාචකයක් හැබැයි තංගල්ල නගර සභාවේ නිලධාරින් සේවකයින් එකතු වෙලා වාර්ෂිකව යන විනෝද ගමනක් වෙන්න පුළුවන් බොහොම උදෑසන යන්න ඇත්තේ දහසකුත් බලාපොරොත්තු එක්ක හොඳට විනෝද වෙලා එන්න කොයි විදිහකට සිදු වුනත් මේ අනතුර ඉතාමත් ඛේදජනක සිදුවීමක්. ඒ අවස්ථාවේදී මියගිය ඒ 15 දෙනාටම අපේ සාතිශ්‍ය සංවේගය පළකරන අතරම එම අවස්ථාවේදී තුවාල ලැබූ සියළු දෙනාටම ඉක්මන් සුවය ප්‍රර්ථනා කරන අතර ඒ වෙනුවෙන් දැඩි කැපවීමක් සිදු කර ත්‍රිවිධ හමුදාව අපේ රණවිරුවන් වගේම පොලීසිය, වෛද්‍යවරු, අවට ප්‍රදේශවාසී ජනතාවට අපේ ස්තූතිය සභාවක් විදිහට ප්‍රකාශ කරන ගමන් අපි මේ සභාව පටන්ගැන්මෙම විනාඩිය නිශ්ශබ්දතාවයක් පළකරා ඔවුන් වෙනුවෙන් ඒ අපේ යුතුකම වගකීම සභාවක් විදිහට සහ අපි පසුගිය කාලසීමාව තුළ බොහෝමයක් දැක්කා මෙවැනි සිද්ධින්, කාටවත් ඇඟිලි දික්කරන්න අවශ්‍ය සිදුවීම් නෙමෙයි මේක. අපිට දකින්න නෙමෙයි මෙවැනි සිදුවීම් අහන්නවත් නොලැබෙන රටක් ගොඩනැගෙවා කියලා කියන ගමන් අපේ සමගිජන බලවේගය කණ්ඩායම වෙනුවෙන් සහ සියළුම විපක්ෂ කණ්ඩාම් වෙනුවෙන් ශෝකය පළ කර සිටිනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, සිදුවීම් සිද්ධ වෙනවා එවා සිදු වෙන්නේ අපි අහලා තියෙනවා කොක් හඩලා සිනා සීමටත් ඔලුව බදාගෙන හඩා වැටීමටවත් නොවෙයි, එම සිදුවීම ඇතුලේ අප දුටු

අපේ රටේ අධ්‍යාත්මය අපි කාටත් හැඟීම් දනවනවා. එක තමයි අපේ රටේ අධ්‍යාත්මය අත්මාර්තකාමීත්වයට ගිලිච්ච සමාජයක් මහා පරාර්තකාමීත්වයක් තමන්ගේ ජීවිත නොතකා අනතුරට මුහුණ දුන් පිරිස බේර ගන්න මම දැක්කා හමුදා සොල්දාදුවෙක් ගෙදර ඇවිල්ලා ආරංචිවුන ගමන් ඔහු ගිහින් එතනට බහිනවා මේක තමයි අපේ රට අපි ඒ සිදුවීම ඇතුලේ දැකපු ඒ පිඹීදීම අවාසනාවන්ත සිදුවීමක් නමුත් ඒ ජනතාවගේ ජීවිත බේරගන්න වෛද්‍යවරයාගේ ඉදලා ගමේ පහල ජනතාව දක්වා දක්වපු ඒ මහා මානුෂීය ගුණයට අපි අපේ ගෞරවනීය ප්‍රණාමය පළ කරන ගමන් මේ අවාසනාවන්ත ඉරණමට මුහුණ දුන් අපේ තංගල්ල නගර සභාවේ ලේකම්තුමා ඇතුළු සියළු දෙනාට මොරටුව මහා නගර සභාව විදිහට මේ වේලාවේ අපේ ශෝකය පළ කර සිටිනවා.

අංක 05(12) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කමිටු ආරම්භයේදී කතා කරන්න ඕන අපි පසුගිය සභා වාරයේදී විමසීමක් කරා ඔබතුමාගෙන් කමිටු පත් කිරීමේදී ඇතිවුනු අර්බුදකාරී තත්වය මත නීත්‍යානුකූල නොවන කමිටු විදිහට අපි එදා පෙන්නලා දුන්නා. එදා කණ්ඩායම් නායකයින් ගෙනල්ලා සාකච්ඡාවක් කරා නීත්‍යානුකූල භාවය පැහැදිලි කරගෙන පලාත් පාලන කොමසාරිස්ගෙන්, නීති නිලධාරීගෙන් නීත්‍යානුකූල බාවය පැහැදිලි කරගෙන ඒ කමිටු නැවත පිහිටවනවද කියල එක ගැන අපි ඊලඟ සභාවට යොමු කරලා ප්‍රශ්නේ එතැනින් නැවතුනා. අපි අහන්න කැමති නීති නිලධාරිගෙන් හෝ පළාත් පාලන කොමසාරිස්වරියගෙන් හරි ගත්ත නියෝගයක් හෝ උපදෙසක් තිබෙනවද, ඒ අනුව මේ කමිටු නීත්‍යානුකූල භාවයකින් ක්‍රියාත්මක වෙනවද ඒ වගකීම කවුද ගන්නේ කියල එක සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් අවශ්‍යයි.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනී, එම සාකච්ඡාවෙදී අපි අපු එකඟතාවයන්ට අනුව නීති ක්ෂේත්‍රයේ සැලකිය යුතු පිරිසකගෙන් උපදෙස් ගත්තා ඔබ කිවුවා වගේ පාලිත මහත්මයාටත් අපි කතා කරා කෙසේ නමුත් මේ පාලනය කිසිදු ස්ථාවර කමිටුවක්වත් අළුතින් පිහිටුවේ නැහැ. කමිටු පත්කරන ආකාරය කිසිදු වෙනසක් කරෙත් නැහැ, මේ පිළිබඳව දීර්ඝ පැහැදිලි කිරීමක් මා කරන්නේ නැහැ. නමුත් මේ පත්කීරීම් ඇතුලේ කිසිදු මන්ත්‍රීවරුයෙකුට කිසිදු අසාධාරණයක් ජනතාවට කිසිදු අගතියක් සිදුකරලා නැහැ ගිය පාර පනතට අනුව කරන විග්‍රාහයන්ගේ පොඩි පරස්පරයන් තිබෙනවා. නමුත් මා සභාවෙන් ඉල්ලන්නේ 2012 සිට කමිටු පත්කරන ලද ක්‍රමය මම සභාගත කරනවා. මේ වාර්තාව ඉතා හොඳින් අධ්‍යානය කරන්න මේ පාලනය පත්කරපු ක්‍රමයේ වෙනසක් තිබෙනවනම් මට ඔබ කියන්න. මේක තමයි මේ ආයතනය පවත්වන් ගිය ක්‍රමය මේක තමයි මමත් කලේ. මේකේ තියෙනවා මේ කතා කරන මන්ත්‍රීවරු, මම එකයි මේ වාර්තා ගෙන්න ගත්තේ. 2012, 2013, 2014, 2015, 2016, 2022, 2023 වර්ෂ වල. මන්ත්‍රීවරයෙක් කිසිම කමිටුවකට පත්කරන්න කලින් මන්ත්‍රීවරයෙක් කමිටු දෙකකට පත්වෙච්ච වාර්තාවක්. ඒත් ඉතින් මම කියන්නේ ඔබ මෙය කියන විදිහටම යමු, මම ඊට එකඟයි හැබැයි මේ වේලාවේ මම කියන්නේ ඒ බාධාකාරීත්වය කරන්න එපා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කිවුවනේ 2012 ඉඳන් 2023 දක්වා මේක වෙලා තියෙනවා කියලා එක හරි. එක ප්‍රොසිඩ් එකකට ආපු එකක්.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනී, නැහැ 2012 තිසර රසාංජන මෙන්ඩිස් මන්ත්‍රීතුමා එක කමිටුවකටවත් පත්වෙන්න කලින් සජිත් දුමින්ද මන්ත්‍රිතුමා පරිසර කමිටුවටත් කර්මාන්ත කමිටුවටත් පත්වෙනවා. මම මේ කියන්නේ ඔබතුමා කියපු නිසා, ඒ විතරක් නෙමෙයි ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා කමිටු දෙකකට පත් වෙනවා තිසර රසාංජන මෙන්ඩිස් මන්ත්‍රීතුමා එකකටවත් පත්වෙලා නැහැ. 2013 එත් තිසර

රසාංජන මෙන්ඩිස් මන්ත්‍රීතුමා පත්වෙන්න කලින් නදීෂ් කුමාර මන්ත්‍රීතුමා ඉඩම් කමිටුවට හා ඵලදායිතා කමිටුවට දෙකටම පත් වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, වැරැද්දක් වෙලා තියෙනවා නමුත් එය අපිට පෙන්නලා දීලා තිබුනේ නැහැ. දැන් අපි වැරැද්ද පෙන්නලා දුන්නා ඒ නිසා මම කියන්නේ මෙය නිවැරදි කරන් යමු කියලා. ඔබතුමාලා විපක්ෂේ ඉන්න ඇති නමුත් විපක්ෂයෙන් කිවුවේ නැහැ මෙය වැරදි කියලා. ඒ නිසා හිටපු නගරාධිපතිතුමා මෙය ඇදන් ගියා. නමුත් අපි දැන් මෙය වැරදි කියලා පෙන්නනවා. අපිට එදා පුහුණුවේදීත් මෙය කිවුවා ඔබතුමාත් හිටියා එතනදී කිවුවා මන්ත්‍රීවරු 51 දෙනා ආවාට පස්සේ තමයි ඊළඟ කමිටුවට යන්න ඕන කියලා. එකයි අපි පෙන්නුවේ. අපේ වැරැද්ද නිවැරදි කරන් ඉස්සරහට යමු කියලා ඉල්ලනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමනී, එකඟයි ඔබ කියන දේට පොඩ්ඩක්වත් විරුද්ධ නැහැ. හැබැයි මේ පත්කිරීම සභාව විසින් පත් කරා ඒ පත් කරන වෙලාවේ තමයි වරද පෙන්නන්නේ, එතකොට මේ පත්කිරීම් කරලා. ඒ පත් කරපු සභාවක් නැවත වෙනස් කිරීමට ප්‍රතිපාදන කොහෙවත් පනතේ නැහැ. ඒ නිසා සභාව ලෙස අපි එකඟතාවයකින් යමු ජනවාරි වල ඉදලා අර සිස්ටම් එකට හදමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මහා නගර සභා ආඥා පනතේ පැහැදිලිව අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිසි පරිදි සඳහන් වෙලා තියෙන වේලාවක ඒ කාර්ය පටිපාටියෙන් බැහැරව කටයුතු කිරීම මම හිතන්නේ නීතියට පටහැනි තත්වක් තමයි ඇතිවෙන්නේ. 26(3) පැහැදිලිව කියලා තියෙනවා ස්ථාවර කමිටු එකකට වැඩි ගණනකට සභිකයින් තොරා පත්කර ගැනීමට ඒ කිසිම සභිකයෙක් සුදුස්සෙක් නොවන්නේය යන්නය. ඒ නීතියේ වුන අඩුපාඩුවක් නිසා තමයි දිගින් දිගටම විපක්ෂයෙන් මෙම කාරණය මතු කරන්නේ. දැන් එය නිවැරදි කර ගන්නවද නැද්ද යන්න ඔබතුමාට බාරයි. ඔබතුමා දැන් කිවුවා මීට කලින් පූර්ව අවස්ථාවලදී වෙච්ච වැරදි සහගත ක්‍රියාකලාපය එක වරදක් නෙමෙයිනම් මේ අපි අනුගමනය කරලා තියෙන පිළිවෙත වරදක් නෙමෙයි කියලා. නමුත් නීතිය පැහැදිලිනම් ඒ ලිඛිත නීතියේ තියෙන පැහැදිලි කාර්ය පටිපාටිය අපි අනිවාර්යෙන් අනුමනය කරන්න ඕන. අපිට ලිඛිත නීතියෙන් බැහැර වෙන්න පුළුවන් වෙන්නේ ලිඛිත නීතිය පැහැදිලි නැත්තම් අපිට නඩු තීන්දුවකට යන්න පුළුවන් එහෙම නැත්නම් චක්‍රලේඛනයකට යන්න පුළුවන් එහෙමත් නැත්තම් අපිට සම්ප්‍රදායකට යන්න පුළුවන් අපිට සම්ප්‍රදායකට යන්න වෙන්නේ නීතියේ ලිඛිත බවක් පැහැදිලි කරලා නැතිනම්. මම හිතන්නේ දිගින් දිගටම විපක්ෂයේ තර්කය තමයි කමිටු පත්කිරීමෙදී වෙලා තියෙන නීතිය අනුව තියෙන කාර්ය පටිපාටිය අනුගමනය නොකිරීම තුල මේ කමිටු නීත්‍යානුකූලද නැද්ද යන්න ඒ නිසා මෙය නිවැරදි කිරීමට ඔබතුමා කටයුතු කරන්න එහෙම නැත්තනම් මේ කමිටු වල නීත්‍යානුකූල භාවය පිළිබඳව අනාගතයෙදී ඇතිවෙන ගැටළුකාරී තත්වය හෝ ඒහා සම්බන්ධවන යම් කිසි වගකීමකට හෝ ගනු ලබන තීරණ සම්බන්ධව එවා ක්‍රියාත්මක කිරීමේදී නීත්‍යානුකූල භාවය සම්බන්ධ තත්වයකදී ඇතිවෙන වගකීම භාර ගැනීමට සිදු වෙනවා. මෙය නිවැරදි කර ගැනීම යම්කිසි සාකච්ඡාවක් තුල කර ගන්නවද කියන එක ඔබතුමාට තීරණය කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඇත්ත වශයෙන්ම මෙතන විවාදයක් තියෙනවා ඒ තමයි කමිටු පත්කිරීමෙදී ඔබතුමා ලැයිස්තුවක් සඳහන් කරා ඔබත් ඒ සභාවේ හිටියා මමත් හිටියා ඒ සභාවේ නමුත් මෙතන තිබෙන ප්‍රශ්නය තමයි එදා හිටපු විපක්ෂය කිසි කෙනෙක් මෙය අභියෝගයට ලක් කරේ නැහැ මේ පූර්වා දර්ශය වැරදි කියලා දැන් තමයි මෙන්න මේ ආඥා පනත අනුව සහ අපි ලබා ගත්තු අධ්‍යාපනයේ දැනුම අනුව අපිට වැටහෙන්න පටන් ගත්තේ එතකොට ගරු නගරාධිපතිතුමනි, දැන් අපි විපක්ෂයේ ඉදලා මේ අභියෝගය කරනවා. මේ පත්කිරීම වැරදි කියන අභියෝගය එය මහා

නගර සභා ආඥා පනතේ කමිටු පත්කිරීම සම්බන්ධව තියෙන කරුණේ තියෙන වගන්තිය එක්ක මම හිතනවා මේ කමිටු ඔබතුමන්ලා නැවත පත්කරනවද අලුතින් නීත්‍යානුකූලව ආඥා පනත අනුව ඉදිරියෙදී කටයුතු කරනවද නැද්ද කියන තීරණය තියෙන්නේ ඔබතුමාගේ අතේ. අපේ හරිෂ් මන්ත්‍රීතුමා මේ සම්බන්ධ නීතිමය තත්වය පැහැදිලි කරා එහි සියළු වගකීම් දරන්න වෙන්නේ ඔබතුමාට මොකද අපි මේක කඩාකප්පල් කරන්න මේක වනසන්න සූදානම් නැහැ මොකද හේතුව මේ කමිටු වල තියෙන්නේ මොරටුව ජනතාව වෙනුවෙන් සාධනීය කාරණා ඒ සාධනීය කාරණා සම්බන්ධයෙන් අපිට විරුද්ධත්වයක් නැහැ අපේ විරුද්ධත්වය තියෙන්නේ සාධනීය හෝ නිශේදනීය හෝ මොන යම් කාරණාවක් වැරදී පූර්වාදර්ශයක් සහිතව ආඥා පනතට පටහැනිව ක්‍රියාවට නංවනවනම් ඒ ක්‍රියාවට නන්වන්නේ මේ කමිටු හරහානම් මේ කමිටු නීත්‍යානුකූල නැත්නම් අන්න එකට විරුද්දවයි අපි මේ කතා කරන්නේ. ඔබතුමාලා මේක දිගටම කරගෙන යනවනම් යන්න. හැබැයි මේ කාරණාව වාර්තාවල පැහැදිලිව සඳහන් වෙන්න ඕන. මේ කමිටු පත් කිරීමේ ක්‍රියාවලිය මහා නගර සභා ආඥා පනතට අනුව පටහැනි නමුත් ඔබතුමන්ලා ඔබලාගේ තනි කැමැත්තට මෙ ක්‍රියාවට නංවනවනම් අපි අපේ විරුද්ධත්වය සටහන් කර ගන්නවා. මේ කියන ආඥා පනතට පටහැනිව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ කණ්ඩායම සම්පූර්ණයෙන්ම ඇතිවෙන ගැටළුකාරී තත්වයන්ට ඔබතුමා මුහුණ දෙන්න ඕන.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා දිගින් දිගටම ඉල්ලීම කරනවා මේ මාස කිහිපය තුල මෙය පවත්වාගෙන යන්න ඕන කියන එක සම්බන්ධව. අපේ පැත්තෙනුත් අපි එකඟත්වය එල කරනවා. මොකද සභාවක් හැටියට මේ විදිහට යන්න බැහැ මේ මාස කිහිපය ඔබතුමා කියන විදිහට අපි මෙය පවත්වාගෙන යමු. මේ ගැටළුව මතු වුනේ මේ වැඩමුළුවට ගියාට පස්සේ පාලිත මහත්තයා කියපු කතාවෙන්. මොකද ඒ අයම තමයි මේ වැඩමුළුවෙදී මේක පැහැදිලි කරේ. එක තමයි අපි මේ වරද දැනගත්තට පස්සේ මේ වරද නිවැරදි කර ගන්න උත්සහ කරේ. නමුත් නීතිමය පැත්තෙන් මෙයට ගැටළුවක් නොවෙනවනම් අපි මේ මාස කිහිපය මේ විදිහට පවත්වාගෙන යමු. පසුව මෙය නිවැරදි කරගෙන යමු කියන ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මෙය ඔබතුමාගේ අවදානයට යොමු කරනවා මන්ත්‍රීවරු ප්‍රකාශ කරපු පරිදි මහා නගර සභා ආඥා පනතේ 14 වන කොටසේ මධ්‍ය පාලනය 277 වන වගන්තිය 1 පොඩ්ඩක් කියවනවා. කවර අවස්ථාවකදී වුවද 277(1) අ නගරාධිපතිවරයාගේ හෝ යම් මහා නගර සභාවක හෝ නගර සභාවක යම් සභිකයෙකුවේ අදක්ෂතාවය මත හා නොමනා පාලනය හෝ (ආ) එම ආඥා පනත මඟින් නැතහොත් ලිඛිත නීතියක් මඟින් නියමවී ඇති කාර්ය ඉටු කිරිම නගරාධිපතිවරයා විසින් හෝ යම් නගර සභාවක් විසින් හෝ මහා නගර සභාවක යම් සභිකයෙකු විසින් හෝ නිරතුරුව පැහැරහැර තිබීම හෝ නීතියේ විදිවිදාන වලට අනුකූලව ක්‍රියා කිරීම නගරාධිපතිවරයා හෝ යම් නගර සභාවක් විසින් හෝ මහා නගර සභාවක යම් සභිකයෙකු විසින් හෝ නිරතුරුව ප්‍රතික්ෂේප කිරීම හෝ නොසලකා හැර තිබීම (ඇ) මෙම ආඥා පනත මඟින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මඟින් පිරිනමා ඇති බලතල කිසිවක් නගරාධිපතිවරයා විසින් හෝ යම් නගර සභාවක් විසින් හෝ මහා නගර සභාවක යම් සභිකයෙකු විසින් අනිසි ලෙස යොදවා තිබිම හෝ පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට අපි මේ සම්බන්ධයෙන් අමාත්‍යවරයාට පැමිණිල්ලක් කරොත් ඇමතිවරයා සෑහීමකට පත්වුව හොත් එක් එක් අවස්ථාවට අනුව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන නියමයන් පරිදි නගරාධීපතිවරයා ධූරයෙන් පහා කිරීම කළ හැකිය. නැතහොත් සභාව හැකිය යනුවෙන් සඳහන් වෙනවා. මේක මම ඔබතුමාට සත්භාවයෙන් පැහැදිලි කරලා තියෙන්නේ මේ අවස්ථාවෙදී නගර සභාවේ සභිකයන් විසින් ඔබතුමාට සත්භාවයෙන් දැනුම් දීමක් කරනු ලැබුවා හැබැයි නීතියෙත් සඳහන් වෙනවා. වරද නොදැනීම කාරණාවක් නෙමෙයිනේ වරද පෙන්වා දීලා ඒ පිළිබඳ ඉදිරියටත් නොදැක්කා සේ කටයුතු කිරිම, ඒ ඔබතුමා විසින් ගනු ලබන තීරණය නගරාධිපතිවරයා හැටියට ඔබතුමාට ඒ අභිමතය තියෙනවා. හැබැයි අපි විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපේ වගකීම එය පැහැදිලි කර දීම සහ නීතියෙත් පැහැදිලිව සඳහන් වෙනවා. ඒ නීතිය නොසලකා හැරීමෙන් කටයුතු කිරීම ආදීනවත් 1981 අංක 19 දරණ මහා නගර සභා ආඥා

පනතෙත් පැහැදිලිව සඳහන් වෙනවා. විපක්ෂය හැටියට අපි මේ සම්බන්ධයෙන් කටයුතු කරනවද ඉදිරියට ගෙනයනවද කියන එක විපක්ෂය කණ්ඩායමේ තීරණයක් නමුත් අපි දිගින් දිගටම ඔබට පැහැදිලි කර දුන්නා. එතනින් එහාට තීරණය ඔබ සතුයි. හැබැයි මෙතනින් එහාට මේකේ නීත්‍යානුකූල බාවයත් නැති බවත් අපි පැහැදිලි කරලා දෙනවා ඊලඟට ගනු ලබන තීන්දු තීරණ සම්බන්ධයෙන් විපක්ෂය අපි බැහැර වන අතර ඒ සියළු තීන්දු තීරණ සම්බන්ධයෙන් වගකීම ඔබතුමාලා විසින් දරණු ඇතැයි අපි විශ්වාස කරනවා

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පළවෙනි දවසේ ඔබතුමාගේ කතාව වුනේ නීතිගරුක පුරවැසියෙක් වෙන්න ඕන කියන එක. මගේ කතාවේදී මමත් කිව්වා ඔබ ඉතාම නිවැරදියි. අපි අනිවාර්යෙන් නීතිගරුක පුරවැසියෙක් වෙන්න ඕන කියලා. අපි ආදර්ශයක් වෙන්න ඕන මේ මොරටුවේ ජනතාවට අපි ඉස්සෙල්ලා නීතිගරුක වෙලා ඉන්න ඕන එතකොට අපිට පුළුවන් අනිත් අයට කියන්න. එතකොට පළවෙනි කාරණය ඉතා පැහැදිලිව නීතියේ සඳහන් වෙලා තියෙනවා මේ කාරණය කරන්න බැහැ කියලා. මගේ උගත් මිත්‍රයා කිව්වා ලිඛිත නීතියේ මේක තියෙනකොට අපිට පරිජේද යන්න හැකියාවක් නැහැ. නීතිය නිශ්ශබ්දයිනම් තමයි අපිට පරිජේදයකට යන්න පුළුවන් එතකොට පහුගිය කාලේ ඔබතුමා අවුරුදු ගාණක් මේ සිද්ධිය වුනා කියලා කිව්වට පහුගිය කාලේ මේ වැරදි ක්‍රියාපටිපාටිය සිද්ධ කරා කියලා මේක නීතියක් බවට පත්වෙන්නේ නැහැ එය වැරදිනම්. ඔබතුමා හොඳටම දන්නා ඉහළ අධිකරණයේ නඩු තීන්දු තිබෙනවා. අපි හොඳාකාරවම දන්නවා වැරදි පූර්වා දර්ශයක් කරගෙන ගියා කියලා එක නීතියක් වෙන්නේ නැහැ. කවුරු හරි වැරදි නියෝගයක් දුන්නත් එ නියෝගය පිළිපදින්න ඔබතුමා බැදිලා නැහැ. ඉතින් මම විශ්වාස කරනවා මේ පැහැදිලිව නීතියේ තියෙද්දි එය දැන දැනත් මේ අඳුරේ අත පත ගාන්න එපා. අනිත් කාරණය මම ඔබතුමාට ඉතා යටහත්ව කියනවා මම විපක්ෂය කියන්නත් කැමති නැහැ අපි ඔක්කොමලා වැඩ කරන්න සහෝයගය දෙන්න කියලා. පහුගිය 75 වසරක සාපය වගේ අපි කකුලෙන් අදින්නේ නැහැ බල්දි පෙරළන්නේ නැහැ හැබැයි අපි ඔබතුමන්ලට මේ නීතිය පැහැදිලිව පෙන්නලා දීලා තියෙද්දිත් ඒකාධිපති වෙන්න එපා පොඩ්ඩක් නම්‍යශිලි වෙන්න මොකද නම්‍යශිලි නොවුනොත් කැඩෙනවා. ඔබතුමා මට වඩා දේශපාලනය සම්බන්ධයෙන් හසල දැනුමක් තියෙන තැනැත්තෙක්. මම පළවෙන් වාතාවේ ඔබතුමාගෙන් ඉල්ලුවා සභාවෙන් අපිට නවක මන්ත්‍රීවරයාගේ කාර්ය භාර්ය සම්බන්ධයෙන් අපිට දේශනයක් දෙන්න කියල ඉල්ලීම කලා. ඒ දේශනය ඇත්තටම වාසනාවකට ලැබුණා. ඒ නිසා මේ නීතිමය තත්වය වඩාත් පැහැදිලි වුනා දැන් ඔබතුමන්ලාගේ පක්ෂයෙත් කිහිපදෙනෙක් ඇරෙන්න ඉන්න විශාල ප්‍රමාණයක් ඉන්නේ නවක මන්ත්‍රීවරුන්. අපි මේ කාරණය දැන දැනත් වැරදි පාරේ යන්න එපා. අපිට මේ සම්බන්ධයෙන් අදාල නීතිමය ක්‍රියාමාර්ග ගන්න පුළුවන් මේ තීරණයෙන් පස්සේ. එහෙම යන්න එපා අපිට මුහුණ බලාගෙන තව අවුරුදු 05ක් වැඩ කරන්න ඕනි ඔබතුමන්ලා එක්ක. අපි මේ හැමෝම ඇවිත් ඉන්නේ මොරටුව ජනතාවට සේවයක් කරන්න ඒ නිසා අපි මේ පොඩි දේකට රණ්ඩු වෙන්න ඕන නැහැ. ඔබතුමාට කවුරුහරි තරහට වැරදි උපදෙස් දෙනවද කියලා අපි දන්නනේ නැහැ, එවා පිළිපදින්න එපා ඔබතුමා ඉතා පරිස්සමින් මේ නීතිමය රාමුව ඇතුලේ පමණක් මේ කාරණය කරන්න කියලා ඉල්ලනවා. මොකද අපි සියළු දෙනා නීතියට යටත් නීතියට ඉහළින් කිසිවෙක් නැහැ. ඊලඟ කාරණය නීතිය නොදැන සිටීම නිදහසට කාරණයක් නෙමෙයි. ඒනිසා මේ කාරණය තවදුරටත් වැඩිදුර අරන් යන්න එපා කාලය නාස්ති කරන්න එපා මුදල් නාස්ති කරන්න එපා ඔබතුමන්ලා පොඩ්ඩක් නම්‍යශිලි වෙලා මෙය හරි ගස්වගෙන අපි ඉස්සරහට යමු කියන එකයි මගේ යෝජනාව.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ එල වුන අදහස් එක්ක ගත්තහම අණ්ඩු පක්ෂය විදිහට අදහසක් අපිත් පළ කරන්න ඕනි. මෙතුමන්ලා කියන විදිහට මේ කමිටු නිවැරදි කර ගන්න මෙතුමන්ලා කියන විදිහට ආපස්සට හැරෙවුවොත් ඉතිහාසයේ 2012 ඉඳලා ගත්ත සියළුම ක්‍රියාමාර්ග ආපස්සට හරවන්න වෙනවා. දැන් මේ අපි අහන්නේ නගරාධිපතිතුමා හරි පැහැදිලිව කිව්වා අපිට අවබෝධයක් තියෙනවා ඒ ආඥා පනතට අනුව අපි ලැයිස්ති නිවැරදි කර ගන්න ඉදිරි මාස 03කින් නැවත කමිටු පත් කරනවා. එතකොට මෙහි ප්‍රතිපාදන කොහෙවත් නැහැ නැවත ආපස්සට හරවලා

නීතිමය ප්‍රතිපාදනයක් කොහෙවත් නැහැ මාස 3ක් අපිට මෙහෙම යන්න දෙන්න. කාටවත් අසාධාරනයක් වෙලා නැහැ අපි මාස 03න් පස්සේ එය නිවැරදි කරමු. ඉතින් මේ එකඟතාවයකුත් ආවා තිලකසිරි මන්ත්‍රීතුමත් කතා කළා ඉතින් මෙය දිගින් දිගටම ඔහෝම ඇදගෙන යන්න ඕන නැහැ කියන එකයි අපේ අදහස. ඔබතුමන්ලත් දීර්ඝ කාලයක් හිටියා දැක්කේ නැහැ දැනුයි දැක්කේ කියන එකට අපි සතුටු වෙනවා දැන් හරි දැක්ක එකට ඒ නිසා අපි කියන්නේ මෙහෙම යමු තවදුරටත් අදින්න එපා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපි පෙන්වා දුන්නා ක්‍රියාත්මක කිරීම ඔබලා සතුයි අපේ වගකීම අපි කරා, තීරණය ඔබ සතුයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි ඇත්තටම ඔබතුමාගේ කාර්ය භාර්යටත් නිරන්තරයෙන්ම සහයෝගය දෙන්න සැදී පැහැදී ඉන්නවා මොකද අපි විශ්වාස කරා සහ විශ්වාස කරනවා ඔබතුමා අවුරුදු 29ක් තුල අපිත් එක්ක අපේ කණ්ඩායම නියෝජනය කරන අපේ මනුස්සයෙක් කියලා අපිට දැනිච්ච නිසා. මේ නගරාධිපතිකම ඔබතුමාටත් ලැබෙන්නේ යම් පිනකට නැත්තම් අපි වෙන්න ඕනිනේ නගරාධීපති. ඔබතුමාට ඒ පින තියෙනවා. මෙතුමා කියපු විදිහට මෙතන යම් විදිහකින් පළාත් පාලන කොමසාරිස්තුමියටත්, නීති අධ්‍යක්ෂකතුමාටත් වගේම අපි මෙතන කතා කරලා මේකට අභියෝගයකට ලක් වෙච්ච නිසාම තමයි. මෙය තවදුරටත් නිවැරදි වෙන්න ඕන. ඒ නිසා ඔබතුමා කියන විදිහට ඔබතුමාගේ වැඩ වලට අපි කිසිම බාධාවක් වෙන්නේත් නැහැ. මේකේ මහා ලොකු දෙයක් කරන්නත් නැහැ. එකක් තමයි අපි මේ කමිටු ටික නැවත වතාවක් 26 (3) කියන විදිහට පත් කරනවා වගේම අනිත් පැත්තෙන් මෙහි කොයි අවස්ථාවකදීවත් කියලා නැහැ ප්‍රතිපාදනයක් නැති නිසා මෙය වෙනස් කරන්න බැහැ කියලා. නිවැරදි කර ගන්න පුළුවන්, මෙය අභියෝගයට ලක්වුන නිසා මෙය ඉටු කරන්න ඕන කියන විශ්වාසය මත තමයි අපි ඉන්නේ. ඒ වෙලාවේදී ඔබතුමාලාගේ සභාභපතිවරු ඒ විදිහටම තියලා. පුංචි වෙනසක් කරන්න විතරයි තියෙන්නේ ඒ නිසා ගරු නගරාධිපතිතුමනි අපි හොඳට මතක් කරගන්න ඕන කාරණයක් තියෙනවා. එකට හොඳම උදාහරණය තමයි සප්තඅපරිහානි ධර්මය. බුදුහාමුදුරුවෝ කියනවා වජ්ජිපුත්ථක භික්ෂූන්ලාගේ රාජ්‍යය බිඳවැටෙනකොට එ රටේ පිරිස ඒ පනවපු නීති හරියට පිළිපදිනවද බලන්න ආනන්ද කියලා. ඉතින් හරියට ක්‍රියාත්මක කරනවනම් කමක් බැහැ හැබැයි යම් විදිහකින් වජ්ජි රටේ පිරිස ඒ පාලකයෝ පළවෙනි අවස්ථාවෙදීම තමන්ගේ මේ පනවපු නීති කඩකරනවනම් එතනින් තමයි මෙය බිඳවැටෙන්න පටන්ගන්නේ කියලා. ඒ නිසා ඔබතුමාට මේ පිනට ලැබිච්ච නගරාධිපතිකම අපි විශ්වාස කරනවා ඔබතුමාගේ පින් මහිමය නිසා. අපි කැමති නැවත වතාවක් මෙය යම් විදිහකින් අපි හිතමුකෝ මෙතනින් එළියට ගිහිල්ලා අපි කැමති ඉතිරි අවුරුදු හතරම ඔබතුමා නගරාධිපතිවෙලා ඉන්නවට. අපේ 26 දෙනා කැමති. ඊට පස්සෙත් කැමති, පින මෝරලා තියෙනවනම් අනුර මහත්තයගෙන් පස්සේ ජනධිපති වුනත් අපි කැමති. ඒ නිසා අපි මෙය නිවැරදි කරගෙන යමු. මම හිතන්නේ මෙතන තියෙන ප්‍රශ්නය මෙය නෙවෙයි අපිට මේ 14 වෙනි වගන්තිය අනුව ඇමතිතුමා පිළිගන්නත් නොපිලිගන්නත් පුළුවන්. හැබැයි අපි කවුරු හරි අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 / 141කට අනුව ගිහිල්ලා අභියෝගයට ලක් කරාම මැණ්ඩාමුස් ආඥාවක් ගත්තොත් ෂර්ශියෝරාරි, කෝවොරන්ට්ඕපි කියන එකක් එකෙදි ඔබතුමාගේ මේ නිලය අහෝසි වෙන්න පුළුවන් ඒ නිසා පූර්වයෙදි අපි මෙය අභියෝගයට ලක්කරපු නිසා. නීතිමය කාරණයක් නිසා අභියෝගයට ලක් නොවුනත් මෙය අභියෝගයට ලක් වෙනවා. මොකද මේ වෙනකොට මම හිතන්නේ ලිපියක් යවලා තියෙනවා පළාත් පාලන කොමසාරිස්තුමා ලඟට ගිහින් තියෙනවා. ඒ වගේම ඒ නීතිමය කටයුතු සිදුවෙනවා. මේක මහලොකු දෙයක් නෙමෙයි එ නිසා මේ කටයුත්ත කරනවට අපි කැමති. මහා ලොකු වෙනසක් වෙන්නේ නැහැ, හැබැයි මේ මාස 3 ඇතුළත කවුරුහරි මෙය අභියෝගයකට ලක් කරොත් එහෙම මෙහි ප්‍රශ්නයක් තියෙනවා. ඉතින් මම කියන්නේ පොඩි නිවැරදි කිරිම කරගෙන ඉස්සරහට යමු කියලා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මෙය අපිට කෙටියෙන් විසඳගන්න තිබුණ ප්‍රශ්නයක් අපි මේ සභාව අරම්භයෙදීම කමිටු පත්කිරීමේදී අපි මේක පෙන්නලා දුන්නා. ඒ අවස්ථාවෙදී අපි කෙලින්ම කිවුවා අපි ඡන්දයකට යන්නේ නැහැ. අපි කිසිම සභාපතිත්වයක් ඉල්ලන්නෙත් නැහැ. අපි කියන්නේ අපි එකඟතාවයෙන් කටයුතු කරමු කියලා. අපි ඒ ශ්‍රද්ධාවෙන් තමයි කටයුතු කරේ. එදා මේ වරද පෙන්වල දෙන වෙලාවේ එක නිවැරදි කර ගන්න ඕන තරම් අවස්ථාව තිබුණා එත් එදා එක තැකීමක් කරේ නැහැ. නමුත් අද ඔබතුමා පූර්වාදර්ශ පෙන්නනවා. පූර්වාදර්ශ ගැලපෙන්නනේ නැහැ අපි මේක පෙන්නලා දුන්නට පස්සේ පිළිගන්න ඕන වරදක් වෙලා තියෙන්නේ කියලා. මොකද හේතුව පළාත් පාලන කොමසාරිස්තුමිය අපි හම්බවුනා, නීති නිලධාරිව හම්බවුනා. ඒ අයගේ අදහස තමයි අපි මෙතනට ප්‍රකාශ කරේ. මෙහි නීත්‍යානුකූල නොවන බාවය අපි පැහැදිලි කරේ. කවදාවත් මේ සභාව අපි මේක කඩාකප්පල් කරන්න සූදානමක් නැහැ. ඔබතුමාම මින් ඉදිරියටම සම්පූර්ණ වගකීම ගන්නවනම් මේක යම්කිසි කාලයක අධිභාරයක් හෝ වෙන දේකට නීතිමය ක්‍රියාමාර්ගයකට යොමු වෙනවනම් ඒ වගකීම ඔබතුමා ගන්නවනම් අපි මින් ඉදිරියට කතාවක් නැහැ. ඔබතුමන්ලාට මේ මාස 03 කරගෙන යන්න අපි අවස්ථාව දෙනවා. අපි කමිටු වලදි ගන්න ස්වාධීන තීරණ අපි ගන්නවා. හැබැයි අඩුම තරමින් මින් ඉදිරියටවත් ඊළඟ කමිටු පත්කිරීමේදීවත් මේ වරද නොකරන්න වගබලා ගන්න කියන ඉල්ලීම කරනවා.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, විපක්ෂය පැත්තෙන් ඉදිරිපත් කරන මෙම කාරණාව පිළිබඳව ඉතාම දැඩිව සැලකිල්ලට ලක් කරපු කාරණාවක් විපක්ෂය කියන හින්දාම නෙමෙයි. කවදා හරි දවසක මේ ආයතන මේ නීතියට අවනතව ගමන් කළ යුතුයි. ඒ නිසා මේ ආයතනය පවත්වානෙ ගිය ඒ වැඩ පිළිවෙල දේශපාලනය මාරු වුනාට ආණ්ඩු මාරු වුනාට පහුගිය ආණ්ඩු පවත්වාගෙන ගිය සිස්ටම් එක ඇතුලේ තමයි මමත් හිටියේ. පසුව මේ පනත හරියටම විග්‍රහ කර ගනිද්දි. ඔබ කියන දේ සත්‍යක් වුනත් මම කල්පනා කරන්නේ සත්භාවයෙන් මේ පනතේ මේ වගන්තියේ පැහැදිලිව කියන්නේ පත්වෙන හැම මන්ත්‍රීවරයාම ස්ථාරව කමිටුවකට හෝ පත්වෙන තෙක් එතකොට මම කල්පනා කරා 52යි අපේ මන්ත්‍රීවරු කමිටු 9ක් තියෙනවා. 8 සම්පූර්ණ වෙනකොටම 48යි ඉතුරු වෙන්නේ 4යි එත් එක මන්ත්‍රිවරයෙක් නැහැ. අයේ අර පනතට අනුව නැවත පිළිවෙලට යායුතුයි. ඒ පාරෙන් තමයි අපිට පනතෙන් යන්න කියන්නේ. අපි මෙතෙක් ගිහින් තියෙන පාර ගත්තොත් ඒ පාර ඇතුලෙත් මේ පාර ඇතුලෙත් මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙන්වෙත් නැහැ, ජනතාවට අසාධාරණයක් වෙන්නේ නැහැ. නමුත් අපි යා යුත්තේ අර නීතිමය පාරෙ, එම නිසා පාලිත මහත්මයා මුණගැහිලා මේ පනත් ඇතුලේ නීතිමය තත්වය තුල වෙනසක් කරන්න පුළුවන්නම් මේ ඉතිරි මාසය තුල ඉක්මනින් එය කරන්න මැදිහත් වෙනවා. මොකද ඔබ ඉදිරිපත් කරන කරුණු වලට විරුද්ධව ඒකාධිපති එහෙම එකක් නැහැ. මේ ආපු ගමන ඇතුලේ මේ වාර්තාවත් ගත්තේ මේ වාර්තාවෙත් පැහැදිලිව තියෙන නිසා මම ඉතාම වගකීමෙන් කියනවා පාලිත මහත්මයා මොකක් කිවුවත් ජනවාරි වල සිට නියත ලෙස අර සිස්ටම් එකට යනවා. මේ කාලය ඇතුළත ඔබ කියන අර මොකක් හරි මට එරෙහිව ප්‍රශ්නයක් එනවනම් මම සහ මගේ පාලනය භාර ගන්නවා.

## <u>2025 අගෝස්තු මස ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.</u>

**06(1) 2025.08.19 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඉඩම් කමිටුවේ 02(3) සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තියෙන කරුණේ නිවැරදි කිරීමක් සම්බන්ධයෙන්, මෙහි තියෙනවා මොරටුවැල්ල දකුණ ජනජය විදුහල පිටුපස මෙල්රෝස් වත්තට පිවිසෙන මැටි පාර සභාවට පවරා ගතයුතුයැයි පහත

සඳහන් ඉල්ලීම. දැන් සමානයයෙන් මෙතන ඉන්න අනිත් මන්ත්‍රීවරු පවරා ගැනීම් බෝහොමයක් තියෙනවා ඉල්ලලා. හැබැයි ඒ පවරා ගැනීම් හැම එකකම වගේ තියෙනවා ඒ පාරේ ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක් එක්ක එතකොට ඒකේ ගැටළුවක් නැහැ. එතකොට එක පැවරුවා අත්සන් ලේඛනයේ විරෝධතා කැදෙව්වා පාර පවරා ගත්තා. සමානය අපේ පිලිවෙත එහෙමනේ. නමුත් දැන් ඔබත්මා ඉදිරිපත් කරලා තියෙන එක මොකක්හරි විදිහකින් මඟ හැරෙන්න ඇති, ඔබතුමා අනිත් කාරනාව හරියට කරලා තියෙනවා. අත්සන් ලේඛනය නැහැ. ඇමුණුම් වලත් බැලුවා එතනත් නැහැ. ඒ නිසා මම කියන්නේ අත්සන් ලේඛනයක් එක්ක මේ කාරණාව අනිත් එවා එහෙම කිසි ප්‍රශ්නයක් නැහැ පිළිවෙලට තියෙනවා. මෙතන විරෝධතා කැඳවන්න ගියාම මෙය ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයාට දොෂාරෝපණයක් එනවා අපි දන්නේ නැහැ ඔයා කොහොමද පාර පවරා ගන්නේ කියලා. ඒ නිසා මෙය නිවැරදිව ඉදිරිපත් කරන්න පුළුවන්නම් හොඳයි කියලා මම විශ්වාස කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, 04 වන කරුණ සම්බන්ධයෙන් දැන් අපි පාරක් සංවර්ධනය කිරීමට පෙර පවරා ගනු ලබන කාර්ය පටිපාටිය සම්බන්ධව පැහැදිලිව 49 වන වගන්තියේ සඳහන් වෙනවා නමුත් මෙතනදී කියනවා සභාවෙද පවරා නොගෙන මාර්ග සංවර්ධනය කිරීමෙදී පැන නැගෙන ගැටළු සම්බන්ධව තීරණයකට එළඹීම එතකොට මෙතන ඔබතුමා කියනවා නීත්‍යානුකූලව පවරා දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගන්න කියලා නීති නිලධාරිගෙන් ඉල්ලීමක් කරනවා මට දැන ගන්න පුළුවන්ද එතකොට මෙතෙක් කල් කරපු ක්‍රමවේදය අභියෝගයට ලක් කරනවද ඒ අවස්ථාවේ මේ සම්බන්ධයෙන් නැවත විමසීම කරන්නේ මොන පදනම මතද කියලා. දැන ගන්න පුළුවන්ද, හේතුව 49 වන වගන්තියේ පැහැදිලිව සඳහන් වෙනවා කොහොමද නීත්‍යානුකූලව පවරා ගන්නේ කියලා එතකොට මෙතෙක් කල් සභාව විසින් කරගෙන ගිය කාර්ය පටිපාටිය වැරදිද, නැත්නම් මෙය වෙනස් විදිහකට කළ යුතුයැයි ඔබතුමා විශ්වාස කරනවද?

<u>මහා නගර සභා මන්ත්‍රී - අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරේ මාර්ග සංවර්ධනය සම්බන්ධයෙන් නිතර නිතර මතුවෙන ගැටළු සම්බන්ධයෙන් වඩා ඵලදායි ආකාරයේ විසඳුම් වලට යන්න ඕන කියන කාරණාව මත.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මම හිතන්නේ මන්ත්‍රීතුමියත්, සභාවටත් හොඳයි ඉංජිනේරුතුමන්ගෙන් පිළිතුරු ලබා ගැනීම. මෙය නීති නිලධාරිතුමියට තමයි යොමු කරලා තිබෙන්නේ වඩාත් නිරවුල් පැහැදිලි කිරීමක් ගන්න පුළුවන් කියලා මම හිතනවා.

<u>නාගරික ඉංජිනේරු - සී. අයි. යමසිංහ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ කරුණ මම කමිටුවට ඉදිරිපත් කරේ අපිට 49 වන වගන්තිය යටතේ ඒ මාර්ය පවරන්න පුළුවන් ඇත්තටම භූමියේ හිමිකරුට තමයි. නමුත් අපිට එන ඉල්ලීම් වලදී එන්නේ ඒ අයිතිකරුගේ නෙමෙයි එතනදී ඉන්න පදිංචිකරුවන්ගේ ලැයිස්තුවක් විතරයි එන්නේ. අන්න ඒ ගැටළුව නිරාකරනය කරගන්න තමයි. මම මේ කරුණ ඉදිරිපත් කරේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, සොයිල් රයිට් එක තියෙන අය පවරලා දෙන්න ඕන කියලද ඔබතුමා කියන්නේ නැත්නම් පදිංචිකරුවන් කියන්නේ රයිට්ටොෆ් වේ ඔනර්ස්ලානේ ඔවුන් ලියුමක් අත්සන් කරලා දෙන එක නිවැරදි නැහැ සොයිල් රයිට් ඔනර්ගෙන් ලියුමක් එන්න ඕන කියදල ඔබතුමා අදහස් කරන්නේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, මම හිතන්නේ මේ සම්බන්ධයෙන් අපි ලේකම්තුමාගෙනුත් විමසීමක් කරමු

**<u>නාගරික ලේකම් - එම්.කේ.ඩී. තාරක මුණසිංහ මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 49 වගන්තියේ තියෙන්නේ සභාවට ඉඩම් තෑගි කිරීම සම්බන්ධව එතනදි පාරවල් කියලා නිශ්චය කරලා නැහැ. ඒ වගන්තියේ සඳහන් ආකාරයට වන්දියක් නැතුව මුදලක් නැතුව ඉඩමක් තෑගි කරන්න. අපි සමහර වෙලාවට දන්නවා පාරක් කියන්නෙත් ඉඩමක් හෝ ඉඩමක කොටසක්. නමුත් බොහෝ පාරවල් වල පදිංචකරුවන්ට තියෙන්නේ ප්‍රවේශ අයිතිය එතකොට මේ පාරේ අයිතිය සභාවට පවරා දියයුත්තේ ඊට අදාළ මුල් අයිතිකරුද, ප්‍රවේශ අයිතිය ඇති අයිතිකරුවන්ද? දැන් අපිට මෙතන ප්‍රායෝගිය ප්‍රශ්නයක් තියෙනවා. එතුමා මේ ප්‍රශ්නයට තමයි උපදෙසක් ඉල්ලන්නේ. එක තමයි දැන් නීති නිලධාරිට යොමු කරලා තියෙන්නේ මේ වගේ අවස්ථාවකදී මොකද්ද කරන්න පුළුවන් කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, පැහැදිලියි අපිට. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න ඕන එතකොට සමහර අවස්ථාවල සොයිල් රයිට්ව සොයා ගැනීම ප්‍රායෝගිකව අපහසුයි රයිට්ටොෆ් වේ ඔනර්ස්ලට පැවරීමට අයිතියක් නැහැ. එයාලට තියෙන්නේ රයිට්ටොෆ් වේ එක පමනයි. එතකොට ඒ අවස්ථාවල සංවර්ධනය කිරීමට නගර සභාවෙන් ඒ අයගෙන් රයිට් එක ගැනීම සහ නෝ ඔබ්ජක්ෂන් එක ගැනීම විතරක් ප්‍රමාණවත්ද. මම හිතන්නේ මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස ඉඩම් කමිටුවෙන් සාකච්ඡා කරලා මම යෝජනා කරනවා නීතිය පැහැදිලිව ඩොකිව්මන්ට් කරන්න කියලා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, නීති නිලධාරිගේ පැත්තෙන් ඉදිරිපත් වෙන උපදෙස අපි බලමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, 7 වෙනි කරුණ සම්බන්ධයෙන් මෙහි 2011 ඉදන් යනු ලබන ගැටළුවක්, 2011 ඉදන් මේ සම්බන්ධයෙන් විවිධවූ ඩිස්කෂන් ගොඩක් ගිහින් තියෙනවා. සමන්ලාල් නගරාධිපතිතුමා ප්‍රධානත්වයෙන් සාකච්ඡා තියලා තියෙනවා. දැන් 2025.08.26 දින ඉදලා ස්ථානිය පරික්ෂාවක් ඉඩම් කමිටුව විසින් කරාද කියලා දැන ගන්න කැමති. එහි ප්‍රමිතිය සම්බන්ධයෙන් පොඩ්ඩක් සභාව දැනුවත් කරනවනම් කැමති. මේ වාර්තාව කියෙවුවනම් මුලින් කියන දේ සහ දැන් කියන දේ අනුව පොඩි පැහිදිලි මදි ගතියක් තියෙනවා. එතකොට මේ අවස්ථාවෙදී බිම්සවිය කාර්යාලය හරහා ඔප්පුවක් ලබා ගැනීමට මුලින් පැවති විරෝධතා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරාද පොඩ්ඩත් ඒ සම්බන්ධයෙන් පැහැදැලි කිරීමක් අවශ්‍යයි.

ගරු නගරාධිපතිතුමනි, මම මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්නනම්. 7 වෙනි කරුණ නාගරික ඉංජිනේරුතුමා ඔබතුමාත් පොඩ්ඩක් පැහැදිලි කරානම් මේක සභාවට මේකේ ඇමුණුම 05 හේ, මෙතන ප්‍රශ්නය වෙලා තියෙන්නේ මේකේ කට්ටියක් පැමිණිලි කරනවා. පැමිණිලි පාර්ශවය කරන්නේ මොරටුව එගොඩඋයන අඩි 12 ක පිරිස් මාර්ගය කිහිපදෙනෙකු විසින් අල්ලාගෙන තිබෙන බැවින් මොටර් රථයක් හෝ ප්‍රවේශ කිරීමට හැකියාවක් නැත. ඒ පිළිබඳ විධිමත් නිරික්ෂණයක් පවත්වා අඩි 12 පාර නැවත ලබා දෙන ලෙස තමයි මෙන්න මේ පැමිණිලි පාර්ශවය කියන්නේ. එතකොට විත්තිකාර පාර්ශවයක් නම් කරලා නැහැ. එතකොට මේක සම්බන්ධයෙන් දිගින් දිගටම මීටින් තියෙනවා සමන්ලාල් නගරාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා තියෙනවා. 2011 හේ ඉදන් එන සාකච්ඡාවක් එතකොට මෙහි වර්තමාන තත්වය කුමක්ද කියලා බලන්න සම්පූර්ණ වාර්තාව කියවන්න අවශයයි. නමුත් අවසානයෙදී 2014.10.10 දින පැවැත්වූ ස්ථානිය පරික්ෂණ වාර්තාව මෙහි මුල් පිඹුරු සැලැස්මේ. මුල් පිටපත මානකගෙන් ලබා ගැනීම සඳහා අදාල ගාස්තු ගෙවීමට දෙපාර්ශවයේ එකඟතාවය පළ නොවිය. එතනින් ගිහිල්ලා ඉදිරි කටයුතු සිදුකිරීම සම්බන්ධව තීරණ සහ නිර්දේශයන් ලබා ගැනීම සඳහා ඉඩම් කමිටුවට වෙත යොමු කිරීම සුදුසු වේ. මේ 2014 එතකොට 2014නුත් ගිහිල්ලා දැන් 2025 මේ ලෙස්ලි ලයනල්ද සිල්වා කියන මහතා විසින් බිම්සවිය කාර්යාලයට ඉදිරිපත් කරනවා ලිපියක් හරහා එතුමාට ඕන එතුමාගේ හිමිකම් ඔප්පුව නිදහස්කර ගන්න. එතකොට හිමිකම් ඔප්පුවේ අනිවාර්යෙන් මේ අවහිර

වෙලා තිබෙන පාර හිමිකම් ඔප්පුවේ සඳහන් වෙනවද එතකොට එතුමාට හිමිකම් ඔප්පුව නිදහස් කිරීමට අපි ඉඩම් කමිටුවෙන් එකඟ වෙනවනම් ඒ කියන්නේ මේ අනවසරෙන් බ්ලොක් කරලා තියෙන පාරට අපි අනුමැතිය ලබා දීම හා සමානයි. එතකොට මට දැන ගැනීමට අවශ්‍ය වෙලා තියෙන්නේ ඉඩම් කමිටුවෙන් මේ අවහිරතාවය සම්බන්ධයෙන් තීරණයක් ගත්තද, නැත්තම් ඒ ගැටළුව එහෙම්මම තියෙනවද, එහෙම තියෙද්දි මේ දැන් පරිභාහිරව ඇවිල්ලා තිබෙන කරුණක් එතුමට හිමිකම් ඔප්පුවක් ලබා ගැනීමට මේ පාර නිදහස් කරලා දෙන්න යන කතාවක්. මේක පටන් ගත්තේ එකකින් මේ ගැටළුවට විසඳුමක් ලැබිලත් නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි වෙනම ස්ථාන පරීක්ෂාවක් දැනට කරා. තාක්ෂණික නිලධාරිතුමිය ලඟ තියෙනවා එහි තොරතුරු ටික. එය පරීක්ෂා කරමින් යනවා. බිම්සවිය අයිතිය නිරවුල් කරලා දෙන්න ඕන කියන එක සාධාරණ කාරණයක් මේ පාර ඇත්තටම අවහිර වෙනවද නැද්ද කියන එක අපි සියළුම තැන් මැන්නා මුළු පාරේම අවස්ථා 3ක 4ක මැන්නා. මැන්නට පසු ඒ අය කරන ඉල්ලීමේ අසාධාරණයක් නැහැ කියලා පේනවා. නමුත් අපිට එකපාර්ශවිය ලෙස තීන්දු ගන්න බැහැ. මොකද අයදුම් කරලා තිබෙන ඒ කණ්ඩායම් කැඳවලා දෙපාර්ශවයම එකමුතු කරවලා අපි ඒ පිළිබඳව තීන්දුවක් ගන්න අවශ්‍ය නිසා අපි ඉදිරි කමිටුවට මේ පිළිබඳව සාකච්ඡාවක් කරන්න කියලා තීරණයක් ගත්තේ ඒ අවස්ථාවෙදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, යම් හෙයකින් මේ පාර දීමට විරුද්ධත්වයක් නැහැ කියලා එයාලාගෙන් ලිඛිතව ගන්න ඕන.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, මගෙත් අවබෝධය තියෙනවා දිර්ඝකාලීනව විශාල පීඩාවකට පත්වෙලා ඇති ප්‍රශ්ණයක් මෙය කොයිම හෝ අවස්ථාවක නිරවුල් වෙන්න ඕන මෙය මේ එක පවුලක් තමයි මට ඒ කාලෙත් මතකයි අපි ධීවරපුර තට්ටු නිවාස වලිනුත් ගෙයක් දෙන්න සූදානම් කලා නමුත් ඒ අවස්ථාවෙදීත් ඒ පවුලේ එක් අයෙක් විරුද්ධ වුනා මේක කරගන්න බැරි වුනා. තමත් තියෙන්නේ මේ බාධාව ඉතා ඉක්මනින් මෙය මැදිහත් වීමක් කරලා බේරගතයුතු ප්‍රශ්නයක් විදිහට තිබෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, 8 වෙනි කරුණ සම්බන්ධවත් ගැටළුවක් තියෙනවා. මාර්ග 50ක් ගැසට් කරලා තියෙනවා. මේක ඉඩම් කමිටුවේ ඉල්ලීම සඳහා වෙන දෙයක්ද නැත්නම් මෙය සිද්ධවියයුතු කරුණක්ද. මොරටුව මහා නගර සභා බල ප්‍රදේශයේ නගර සභාව සතු මාර්ල ගැසට් කිරීම මේකේ මාර්ග 50ක් දාලා තියෙනවා. මාර්ග 50 මොන පදනම යටතේද තොරා ගත්තේ නැත්නම් මොරටුව බල ප්‍රදේශයේ තිබෙන සෑම පාරක්ම නැවත ගැසට් වෙනවද. දැන් අපි දන්න දෙයක් තමයි බිම් සවිය ව්‍යාපෘතිය අනුව මේ හැම පාරක්ම නැවත මැනීමකට ලක් කරලා කැඩැස්තර සීතියම ඇඳලා. ස්ට්‍රීට් ලයින්ස් වෙනස් කරලා තියෙනවා රිසර්වේශන් වෙනස් කරලා තියෙනවා. එතකොට එකට අනුව ද මෙවා නැවත ගැසට් කරන්නේ, එතකොට මේවා ගැසට් කරනවනම් මම ඔබතුමාට කියනවා මේ බිම් සවිය කැඩැස්තර සිතියම අනුව ඔබතුමා මීන් ඉදිරියට ප්ලෑන් පාස් කරනකොට අන්න ඒ නිර්නායක අනුව තමයි කටයුතු කරන්න ඕන. මෙතන පොඩි ගැටළු සහගත තත්වයක් තියෙනවා කියලා හේතුව මේ පාරවල් ගැසට් කරනකොට ඒ එතන තියෙන මායිම් ප්‍රමානයයි ඔබතුමාට ප්ලෑන් පාස් කරන්න එනකොට එන මායිම් වලයි අතර පරස්පරතා තිබෙන්න ඕන එම නිසා ගැසට් කරනවානම් නිර්නායකයක් තියෙනවද, මොන පදනමකින්ද යන්න එවා සම්බන්ධයෙන් ඉදිරි දිනයේදී අපිට සභාවට පොඩි පැහැදිලි කිරීමක් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙහි ගැසට් එකට දාලා තියෙන නම් අතර අපේ සුප්‍රකට අපේ ගායකයෙක් වෙච්ච නිහාල් නෙල්සන් මහත්මයාගේ පාරත් අපි නම් කරලා එතුමා වෙනුවෙන් ගෞරවයක් විදිහට තියලා තියෙන්නේ. එතුමාගේ පුතා ආවා පහුගිය දිනයක. එතුමා මෙතන ආපු වේලාවේ

කිවුවා අපේ තාත්තාගේ නම තාම ගැසට් එකේ නම් වෙලා නැහැ ඉතින් වරිපනම් ලේඛනයෙත් ඇවිල්ලා නැහැ කියලා. ඒ නිසා එ නමත් මේකට ඇතුළත් කරලා එ අඩුපාඩු හොයලා බලලා ඒ අඩුපාඩු තියෙන පාරවල් මෙයට ඇතුළත් කළානම් හොඳයි කියලා මම හිතනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, 2017 මම විල්ලෝරාවත්ත බොරොළුවේ ඉඩමක් ගත්තා එතකොඩ සීලා කොඩිතුවක්කු කියන තැනැත්තියකගෙන්, ඒ අයගේ මුල් අයිතිය ඇයගේ සැමියාගේ නමට තිබිලා එක නැති වෙලා තියෙනවා. නැතිවීමෙන් පසුව ඒ අක්කර 2යි ගාණක ඉඩමෙන් අක්කර 1යි ගාණක් ගන්නවා පිට්ටනියට එය ප්‍රදේශිය ලේකම් කාර්යාලය හරහා තමයි ගන්නේ. ඊට පසුව එයාලට ලක්ෂ 50ක වන්දියක් ගෙවලා තියෙනවා. සීලා කොඩිතුවක්කුගේ සැමියටයි ඔහුගේ පවුලේ අයටයි. එය සහෝදරයෝ බෙදා ගන්නවා. නමුත් ඒ අය දැන් ජිවතුන් අතර නැහැ. එතකොට වරිපනම් බදු ගෙවන්නේ සීලා කොඩිතුවක්කුගේ මහත්තයාගේ නමට එතකොට මැරුණට පසුව නඩු තීන්දුවෙන් අයිති වෙනවා සීලා කොඩිතුවක්කුට ඉඩමෙන් පර්චස් 50ක් ඒ අයිති විමෙන් පස්සේ එයා ප්‍රකාශන ඔප්පුවක් හදනවා. එක දැන් අවුරුදු 20ක් පැනලා මම ඒ ඉඩම අරගෙනත් දැන් අවුරුදු 8ක් වෙනවා. මේකේ බිම් සවිය කැඩැස්තරත් මම අරගෙන තියෙනවා. දැන් මේ ළගදි ඒටී එකක් දාලා හරවන්න ආවට පස්සේ මුදල් ඔක්කොම ගෙවන්න කියලා. ගෙවුවට පස්සේ බැනලා එලවලා මේ ඉඩමට ඔප්පු නැහැ මේවා වල ඒටී හරවන්න බැහැ කියලා. සල්ලි ඔක්කෝම ගෙවලා අවට පස්සේ නගර සභාවේ ආදායම් පරික්ෂක අංශයෙන් බැනලා එලවලා.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, අපි මෙහෙම කරමු ඔබතුමා ඒකත් අරගෙන එන්න අදාල වගකිව යුතු නිලධාරින්වත් ගෙන්නගෙන අපි එක කතා කරමු. කතා කරලා මොකද්ද කරන්නේ කියලා බලමු.

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, පෞද්ගලිකව මම දන්නවා මෙතුමා ගොඩක් කල් ඉඳන් මේ වෙනුවෙන් වෙහෙසෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මේ තියෙන්නේ පුද්ගලික පලි ගැනීමක්, කාගෙන්වත් විරෝධතාවයකුත් නැහැ. බිම් සවි ප්ලෑන් එකත් අරන් තියෙන්නේ. නමුත් මේක හිටපු නගරාධිපතිගේ චුඩ මණිකාය ඉන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, ඉඩම් හා නගර සංවර්ධන ස්ථාවර කමිටුවට මා විසින් ඉදිරිපත් කරන ලද 02(2) යෝජනාව සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය නැවත යොමු කරන්න කැමති ඊට අදාලව ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා යෝජනාව ක්‍රියාත්මක කිරීමට යොමු කිරීම සම්බන්ධව. මම කැමති දැන් වත්මන් තත්වය සම්බන්ධයෙන් සභාපතිතුමාගෙන් කිසියම් විමසීමක් කරන්න.

<u>**මහා නගර සභා මන්ත්‍රී - අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් අපි සාකච්ඡා කලා ඊට පසුව මේ පිළිබඳව, මොකද මෙතන තිබෙන නිවාස 23නේ ඔප්පු ලබා දීම සම්බන්ධ ගැටළුව නේද, මේ සම්බන්ධව ගැටළුවක් තිබෙනවා අපිට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමඟ මෙය සාකච්ඡා කරන්නේ නැතුව තින්දුවක් ගන්න අපිට බැහැ. ඒ නිසා අපි තීරණය කළා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගිහිල්ලා මේ ප්‍රශ්නය ඉතා ඉක්මනින් සාකච්ඡා කරලා හැකි ඉක්මනින් විසඳුමක් ලබා ගන්නවා කියලා අපි තීරණය කරලා තියෙන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මම කලින් සඳහන් කරපු කාරණාවෙම තව කරුණක් තියෙනවා. පිටු අංක 04, 05 ඩී. ලිලාරත්න හේවාවිතාරණ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තියෙන රාවතාවත්ත බටහිර පාර පවරා ගැනීම. දැන් මෙකෙත් අර වගේම අත්සන් ලේඛනයක් නැහැ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔය ගිය සැරේ කමිටුවෙන් ආපු එවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ අත්සන් ලේඛන හරියට ලබා ගන්න නැත්තම් මේ පාරවල් ගොඩක් වේලාවට ප්‍රධාන පිවිසුමක් නොමැති පාරවල් එතකොට ගොඩක් වෙලාවට මේවාවල එන්නේ ටර්නින් සර්කල්, නගර සභාවට පවරා ගන්නවනම් අනිවාර්යෙන් ටර්නින් සර්කල් එකක් දාන්න ඕන. එතකොට ගොඩක් වේලාවට පිටිපස්සේ ටර්නින් සර්කල් එකට අහුවෙන අය කැමති වෙන්නේ නැහැ තමන්ගේ ඉඩම් වලින් කොටසක් දෙන්න එතකොට මේ විරෝධතා එනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් පවරා ගැනීම් කරනකොට මේ පිළිබඳව අවධානයට ලක් කරන්න කියා ඉල්ලා සිටිනවා.

**2025.08.19 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**2025.08.19 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |

| | | | |
|---|---|---|---|
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | මෙරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය |

**2025.08.19 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ සියලුම නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී මහා නගර සභා මන්ත්‍රී ඩී. සමන්ත සිල්වා මහතා සභා ගැබෙහි නොසිටියහ.)**

**06(2) 2025.08.19 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම අපිට මේ කමිටු වල තියෙන සාධනීය දේවල් සම්බන්ධයෙන් ගැටළුවක් නැහැ නමුත් කමිටු පත් කිරිමේ ක්‍රමවේදය හේතුකොට ගෙන ඒ විරුද්ධත්වය පිලිගන්න. අංක 05 ඇමුණුම මේ සාහිත්‍ය උත්සවය ගැන මේක ඇමුණුම විදිහට ආවාට කමිටුවට ආවේ නැහැ. කමිටුවට ආවනම් ටිකක් කතා කරන්න තිබුණා. මේ රූවිදුන් රේඩියෝව කියලා කරන්නේ, ගැටළුවක් නැහැ. නමුත් මම හිතනවා රුවිදුන් රේඩියෝවට වඩා රුවිදුන් අපේ වයර්ලස් එක කියන වචනයක් දැම්මනම් පොඩි කැලැසික් ගතියක් එනවා. මේකේ තියෙන්නේ රේඩියෝ ඉතිහාසය ගැන. මේකේ තියෙනවා ප්‍රධාන සාහිත්‍ය දේශන සහා යෝජනා සම්බන්ධයෙන් දේශකයන්ගේ නම් කිහිපයක් තියෙනවා. මගේ අදහස මම කියන්නේ. මේකේ ප්‍රවීන සහිත්‍ය මාධ්‍යවේදීන් පිරිසක් ඉන්නවා. අපේ රත්නත්ශ්‍රී විජේසිංහ මහත්මයාගේ නමත් මෙතන තියෙනවා, ඉතින් මම හිතනවා මේ වගේ මාතෘකාවකට වඩා හොඳ ප්‍රවීන මාධ්‍යවේදී සමන් අතාවුදහෙට්ටි එතුමා ගුවන් විදුලියේ සුවිශේෂී කාර්ය භාර්යක් සිදුකරලා තියෙනවා. මම කියන්නේ අපිටත් මේ සාහිත්‍ය සම්බන්ධ යම් හැකියාවක් තිබෙන නිසා කමිටුවට දාලා ආවනම් අපිට මීට වඩා ඵලදායි අදහසකට යන්න පුළුවන් වෙනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, එතුමාව තමයි අපි ගෙන්වන්නේ. දැනට ඒ පිළිබඳ සාකච්ඡා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, කමිටුවට ආවා අපි සාකච්ඡා කලා. ඔබතුමාට යම් අතපසුවීමක් සිදුවෙලා තියෙනවා. මම හිතන්නේ සජිත් දුමින්ද මන්ත්‍රීතුමාත් හිටියා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා.</u>**

ගරු නගරාධිපතිතුමනි, අංක 09 කරුණ බලන්න, නගරාධිපතිතුමා ඉදිරිපත් කරලා තියෙනවා කටුබැද්ද සුපර්සිටි වෙළඳ සංකීර්ණයේ ලිෆ්ට් එක. මොකද දන්නැ දැන් තත්ත්වය.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, කටුබැද්ද වෙළඳ සංකීර්ණයේ සභාපතිතුමා ඇතුළු පිරිසක් සමඟ සාකච්ඡා කරමින් තිබුණා. මේ වෙනකොට ලිෆ්ට් එක අක්‍රිය වෙලා තියෙනවා. ඒක යාන්ත්‍රික ඉංජිනේරු මහත්මයාටත්, ප්‍රධාන නාගරික ඉංජිනේරුතුමාටත් පවරලා තියෙනවා ඒ පිළිබඳව සොයාබලා කඩිනමින් කටයුතු කරන්න. ව්‍යාපෘති වාර්තාව තවම ඉදිරිපත් කරලා නැහැ කමිටුවට. ගියවර වාර්තාවේදී තමයි මෙය ඉදිරිපත් වුණේ. මීළඟ කමිටුවට මේ සඳහා වාර්තාවක් ඉදිරිපත් කරන්න නියමිතයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා.</u>**

ගරු නගරාධිපතිතුමනි,කම්පැනියක් තියෙනවානෙ ඒකට කතා කරන්න ගැරන්ටියක් තියෙනවානෙ ඉතින් ඒක කරන්නෙ නැත්තෙ ඇයි? ලොකු ආයතනනෙ ඒවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා.</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මෙතන සැලකිය යුතු ප්‍රශ්න ගණනාවක් තියෙනවා. එකක් දෙකක් නෙවෙයි. ඔවුන් ගෙන්නලා ඔවුන් සමඟ සාකච්ඡා කරලා ඔවුන් මුහුණ දෙන ගොඩනැගිල්ලේ තිබෙන භෞතික ප්‍රශ්නවලට වඩා ඔවුන් අනවශ්‍ය ලෙස පීඩාකාරී තත්වයකට හිරකරපු වැඩ කිහිපයකුත් තිබෙනවා. ඔවුන් විශාල මුදලක් ගෙවාගෙන ඉන්නවා බිස්නස් නැතුව සමහර ප්‍රවේශ ගාස්තු කියලා අදාලම නැති දෙයකට ඔවුන්ගේ හිඟයකුත් එකතුකරගෙන ඉන්නවා. ඒ නිසා මම එකින් එක එකින් එක ඒ ටික බේරමින් ඔබ කියන එක හරි. මේ ගොඩනැගිල්ල බාර දෙන විධිය අපිට යම් එකඟතා ගිවිසුමක් ඇතිනෙ.ඒ ගිවිසුමට අනුව කටයුතු කලානම් මේ ලිෆ්ට් එකත්. සියල්ල දැනට අත් හැරලා තියෙන්නෙ. ඊට අනුව නාගරික ඉංජිනේරුතුමා මොකක්ද දැන් අපිට අවබෝධයක් තියෙනවද අපිට මේ ගොඩනැගිල්ල බාර දෙනකොට අපිට මොකක් හරි එකඟතා ගිවිසුමක් ඇතුලෙද මෙය බාරදීලා තියෙන්නෙ. මෙතන ආයතන කීපයක් සම්බන්ධ වෙනවා. මේ සම්බන්ධයෙන් අදහස දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

**<u>නාගරික ඉංජිනේරු - සී.අයි.යමසිංහ මහතා.</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ ලිෆ්ට් එක සම්බන්ධයෙන් කිසිම ගැටළුකාරී තත්ත්වයක් තිබිලා නැ බාරගන්නා අවස්ථාවේදී. නමුත් ඩිසයින් එකේ ගැටළුවක් නිසා තෙමීමකට ලක්වෙලා තියෙනවා දිගින් දිගටම. එතකොට ඒ නිසා ලිෆ්ට් එක අද තියෙන තත්ත්වයට පත්වෙලා තියෙනවා කියන එක තමයි දැනට අඳුරගෙන තියෙන්නෙ. අපි ඒ සම්බන්ධයෙන් බාරගන්නකොටත් ඔය තෙමීම ගැන යූ. ඩී. එක දැනුවත් කරලා තිබුනා. ඒක නිසා තමා ගොඩ කාලයක් ඕක බාරගන්නෙත් නැතුව ඉඳලා තියෙන්නෙ. මම හිතන්නෙ විවෘත කිරීමේ අවශ්‍යතාවය මත කොහොමහරි භාරගැනීම කරලා තියෙනවා. ඒකත් එක්ක අඩුපාඩු ටික නිරාකරණය කරලත් නැහැ. ඒ අඩුපාඩු ටිකටත් මම හිතන්නෙ අපි කොමසාරිස්තුමිය ඉන්න කාලයේදීත් ඒ තෙමීමට ලක්වෙච්ච ගොඩක් දේවල් නිරාකරණය කරලා තියෙනවා ලොකු වියදමක් දරලා නමුත් දැනටත් ඒකෙත් යම්කිසි කොටසක් තියෙනවා තවම තෙමීමට ලක්වෙන. ඒ කොටස නිරාකරණය කිරීමේ අවශ්‍යතාවයත් තියෙනවා.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, දැනට මේ ලිෆ්ට් එක සම්බන්ධයෙන් අපිට අදහසක් දක්වන්න නාගරික යන්ත්‍රික ඉංජිනේරුතුමා හට අවස්ථාව ලබා දෙනවා.

<u>නාගරික යාන්ත්‍රික ඉංජිනේරු - එච්. එන්. ප්‍රියශාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැනට වොරන්ටි පීරියඩ් එක ඉවරයි. එතකොට අලුතින් ආව සර්විස් ඇග්‍රිමන්ට් එකට යන්න සර්විස් ඇග්‍රිමට් අරගෙන තියෙනවා. ඊට පස්සේ පසුගිය කාලේ හදිසි අළුත්වැඩියා කිහිපයක් නියෝජිත ආයතනයෙන් කළා. කරලා ඉවරවෙලා මම හිතන්නේ සතියකට වැඩි කාලයක් වැඩ කරන්න බැරි වුණා. මේ අවස්ථාවේ ලිෆ්ට් එකේ දොරේ සිරවීමක් මත දැන් ආයේ දොරවල් ඇරෙන්නේ වැහෙන්නේ නැහැ. නියෝජිත ආයතනයෙන් කියන්නේ තෙමිලා හින්දා අදාළ පීලි හරියට නැති හින්දා තමයි ඒ ගැටලුව ඇති වෙලා තියෙන්නේ කියලා. නියෝජත ආයතනයට දැනුම් දුන්නායින් පසුව කියනවා අර සර්විස් ඇග්‍රිමන්ට් එක ආවට පස්සේ මේ වැඩ ටික කරලා දෙන්නම් කියලා. ඒක සභාවට යොමු කරන්න ඕන. තෙමෙන එක ඇත්තටම ඩිසයිනර් ෆේලියර් එකක්. නමුත් ඒක දැනට අපිට තමා කරන්න වෙලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙය හරි වැරදි දෙයක් මෙච්චර විනාශයක් වෙලා තියෙන්නේ මේ තෙමුන නිසානම් මෙච්චර කාලයක් මෙය දැනගෙනත් ඇයි නොකර හිටියේ. ඉතින් ඒකට විසඳුමක් ලබා දෙන්න එපැයි. මේ හැම එකම වෙලා තියෙන්නේ තෙමුන නිසා නම් ඉතින් තවත් ඒක ගැන කිය කිය ඉන්නවා කියන්නේ ඒක සභාවට කරන අපරාධයක්. මේක ඇතුලේ හිරවෙලා ජීවිතයක් එහෙම නැතිවුනොත් ලොකු ප්‍රශ්නයක් ඒක.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් ඔබතුමා සංවර්ධන කමිටුවේදී යූ.ඩී එකේ නිලධාරීන්ට කිවුවා ඕගොල්ලෝ හරියට වැඩේ කරලා දෙන්න කියලා. මම දැක්කා ඔබතුමා තර්ජනය කරලාම කියනවා ඒක. ඒක කරන්න ඕන නමුත් සර්විස් ඇග්‍රිමන්ට් එක ඉවර වෙන්න අවුරුදු කීයක් තිබුණාද? ඒක අපි දන්නේ නැහැනේ. එතකොට බොල්ගොඩ ග්‍රෑන්ඩ් හෝටලයේ ළමයෙක් මැරුණා ලිෆ්ට් එක කඩන් වැටිලා. ඒ වගේ දෙයක් වුනොත් බරපතළ චෝදනාවකට අපි ලක් වෙනවා. ඒක නිසා තෙමෙන තැන හදමු. අපේ ඉන්න ඩිරෙක් ලේබර්ස්ලා දාලා වැඩේ කරලා ඉවර වෙලා ඉස්සෙල්ලා තෙමෙන තැන හදමු. ඊට පස්සේ ලිෆ්ට් එක කඩන් වැටිලා කරන්ට් එක වැදුනොත් ළමයෙකුට මොනාහරි වුනොත් නගරාධිපතිතුමා අපරාධයක් වෙන්නේ. සුදේශ් මන්ත්‍රීතුමා කිවුවා වගේ අපි පයින් යමු.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදින්නාදු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අපි ඉක්මනට තෙමෙන තැන හැදීම පිළිබඳ නාගරික ඉංජිනේරුතුමාගෙන් විමසා සිටිනවා.

<u>නාගරික ඉංජිනේරු - සී. අයි. යමසිංහ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පහුගිය ටිකේ අපි තෙමීමට ලක්වෙන එක සම්බන්ධයෙන් ලොකු වියදමක් දරලා ජනෙල් දාලා ඒ අවශ්‍ය කටයුතු ටික කළා. නමුත් තව පොඩි කොටසක් ඉතුරු වුනා. ඒ කොටසත් අපි කළාට පස්සේ මෙය නිරාකරණය වෙනවා. අපිට තව ඒ ජනෙල් දැම්මා වගේ තව කොටසක ජනෙල් ටිකක් දාන්න තියෙනවා. එතකොට ඒ ටික දාලා අවසන් කළොත් අපිට මාස 02ක්වත් යනවා නගරාධිපතුමනි.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් මේ මාර්කට් එක ඔපන් කරලත් වැඩි කාලයක් නැහැ. දැන් අවුරුදු 03ක් වගේ කාලයක්. ඒ වගේ කාල සීමාවක් තුළ ඔය සර්විස් ඇග්‍රිමන්ට් එක මම හිතන්නේ ලිෆ්ට් එකකට දෙන්නේ අවුරුදු 02, 03 ක කාල සීමාවක් ද? ඒ ෆයිල් එක බලලා ඉවර වෙලා අදාළ පියවර කඩිනමින් ගන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම දන්න විදියට සර්විස් ඇග්‍රිමන්ට් මෙච්චර ඉක්මනට අවලංගු වෙන්න විදියක් නැහැ. අවුරුද්දක් තියෙනවා ගැරන්ට පීරියඩ්. සාමාන්‍යයෙන් අපිත් ආයතන වල හිටියා. එහෙම සර්විස් ඇග්‍රිමන්ට් අවුරුද්දෙන් අයින් වෙනවානම් තව අවුරුද්දකට දික් කරන්න ඕන. ඒකයි

ක්‍රමය. නමුත් දැන් මෙතන වෙලා තියෙන්නේ සර්විස් ඇග්‍රිමන්ට් අවුරුද්දෙන් ඉවරනම් හරි දැන් ඒක ඉවරයි ඊළඟට බලන් ඉන්නවා. එහෙමනම් නෙවෙයි මම දන්නේ නැහැ මෙතුමන්ලා කොහොමද එහෙම කරන්නේ කියලා. මේ ලිෆ්ට් එකත් වැඩ කරන එකේ, සර්විස් එකක් තියෙන්න ඕනනේ. සර්විස් ඇග්‍රිමන්ට් එක සම්පූර්ණයෙන්ම එහෙම වෙන්න බැහැ. ගැරන්ටි පීරියඩ් එකක් අයින් වෙන්න පුලුවන් අවුරුද්දෙන් හරි අවුරුදු එකහමාරෙන් හරි. සර්විස් ඇග්‍රිමන්ට් එකක් ඉවර වෙනවානම් ඒක ආයේ දීර්ඝ කරන්න පුලුවන්. ඒක නිසා ඒ උත්තරය වැරදියි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, දැන් ඔබතුමාට දාලා තියෙන ලිපිය, ඒවා ඇත්තටම මේ සභාවට එන්න ඕනත් නැහැ. සුපර් සිටි වෙළඳ සංකීර්ණයට ඇතුලත් වෙන ප්‍රධාන දොරටුව සාදා දීම, විදුලි සෝපානය විටින් විට අක්‍රිය වන අතර සැමදා ක්‍රියා කරන තත්ත්වයට පත්කර දීම, ඔසු සළක් මෙම ව්‍යාපාරික ස්ථානයට අත්‍යාවශ්‍ය බැවින් ඔබතුමාගේ අවධානය, අපිට මේ ටික කරන්න පුලුවන් කමිටුවට දාලා මේවා සභාවට එන්න ඕනත් නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි නාගරික සංවර්ධන අධිකාරිය යටතේ අපේ ඒ යෝජනාවන් අනුව සැකසුනාට පස්සේ කාලයක් ගියාට පස්සේ ඒක හිටපු නගරාධිපති සමන්ලාල් මහත්තයා එතුමාගේ නම් ගහගෙන මේක විවෘත කළා අවුරුදු ගාණකට පස්සේ. ඒ නිසා ඒ මොඩ්ල් එකත් ඒ වෙනකොට අතරමැදි අවස්ථාවේ දී සැලසුමුත් යම් යම් ආකාරයකින් වෙනස් වෙලා තියෙනවා. ඒත් එක්කම මෙහිදි අපි විශේෂයෙන්ම හිටපු කොමසාරිස්තුමියටත් මම හිතන්නේ ඒ කාලෙදිත් හම්බවුණා මෙහි යම් කාල පරිච්ඡේදයක් තියෙනවා ගරු නගරාධිපතිතුමා අපිට ඒ කන්ට්‍රැක්ට් හදලා දෙන්න ඕන කාලේ. හැබැයි ඒ කාලයේදීවත් මම හිතන්නේ සමහර කටයුතු මෙයින් කරගන්න උත්සහා කළේ නැහැ. කෙරුනෙත් නැහැ. ඒ නිසා අපි දිගින් දිගටම කිවුවා ෂෙඩ් එකක් ඉස්සරහාට ගහන්න ඕනා. ඔබතුමා එක්කමත් අපි ඇවිල්ලා කිවුවා. මොකද මේ හිරිකඩ එන නිසා හිරිකඩ නවත්තන්න. ඒකට ඕනතරම් ඇලොකේෂන්ස් තිබුණා. ඒත් එක්කම ඒ ආයතනත් එක්ක ගත්තාම 2022ට ඉස්සෙල්ලා මම හිතන්නේ මට දිනේ මතක නැහැ. හිටපු නගරාධිපතිතුමා ඒක විවෘත කලේ. ඊට පස්සේ මේ ආයතනත් එකක් ගත්තාම නගරාධිපතිතුමා ඒකෙන් බැහැර කරන්න බැහැ. ආයතන වලට වගකීම මට අයිති නැහැ මේ ලිෆ්ට් එක හැදුවාට පස්සේ ඒකට සල්ලි ගෙවනවානම් ඒ සර්වියස් එක අනිවාර්යෙන් දෙන්න ඕන. ඒ නිසා එහෙම නැතිනම් ඒක ගිවිසුම් කඩ කිරීමක් වෙනවා. ඔබතුමා කිවුව විදියට මේ ගිවිසුම නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් සභාවේ මෙය තියෙනවා නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා ළඟ. ඒ නිසා ඒ ගිවිසුම් ටිකත් අපි අනිවාර්යෙන්ම ගෙන්න ගන්න ඕන මේක විතරක් නෙවෙයි. අපේ ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවත් එක්ක ගහපු ගිවිසුම් ටිකත් තියෙනවා. මම එදා අපේ කොමසාරිස්තුමියටත් මතක් කළා ඒ නිසා ඒ ගිවිසුම් වලින් බැහැර වෙන්න අපේ ඒ ආයතන වලට, මම දන්නේ නැහැ ඒ මොන ආයතනයෙන්ද කළේ කියලා. ඒ නිසා ඒ ගිවිසුම් වලට අනුව ඒ රෙගුලාසි වලට අනුව තමයි කෙරෙන්නේ. ඒ නිසා ඒ ගිවිසුම් ටික අනිවාර්යෙන් තියෙනවා. ඒ නිසා ගිවිසුම් ටික කාල පරිච්ඡේදයක් ගත්තාට පස්සේ අර මෙතුමා කියපු විදියට මේක නැවත වතාවක් ස්ථාපිත කරන්න අපිට කාලයක් ගියාට අපිට සර්විස් එකද දෙන්න බැහැ කියන්න බැහැ. ඒ නිසා අනිවාර්යෙන්ම ඒ ගිවිසුම් ටික අපි ගෙන්නගෙන ඒ අනුව කටයුතු කරන්න ඕන කියන එක තමයි, අනික් එක තමයි අපෙත් වගකිමක් තියෙනවා පුංචි පුංචි නඩත්තු කටයුතු ඉක්මනට නොවීම නිසා තමයි මෙහෙම වෙන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මට මේ පෙර පාසල් සම්බන්ධව ප්‍රශ්ණ නගන්න ඕන. පෙර පාසල් සම්බන්ධව ගිය සභා වාරයේත් වාර්තාවේ තිබුණා. ස්ථානීය පරීක්ෂණයක් කරලා තිබුණා නිර්දේශ තියෙනවා ඉතාම වැදගත් කොරළවැල්ල පෙර පාසලක් සම්බන්ධව. ඒ පෙර පාසලේ වහලය මතට ගස් අතු පතිතවීමෙන් එහි බිත්තයට අවධානමක් තියෙනවා කියලා. ඒ සම්බන්ධයෙන් ගත්ත පියවර මොනවාද කියලා, ඒක ඉවත් කරලා ද? නැතිනම් අපිට වෙන්නේ මොරටුව ස්ටේඩියම් එක වගේ

වහලයක් දරුවෙකුගේ හිස මතට කඩා වැටිලා අපිට නඩු කටයුත්තකට යන්න සිද්ධ වුනා. ඒ නිසා මෙයට ගත්ත පියවර මොනවාද කියලා මම දැනගන්න කැමතියි.

**මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, ඒ පිළිබඳව තාක්ෂණික නිලධාරීතුමියට වාර්තාවක් දෙන්න කියලා ඉල්ලලා තියෙනවා. ඒ වගේම තමයි ඔබතුමිය මතු කරපු දිමුතු පෙර පාසල ඒ සම්බන්ධයෙන් ඒ අය ටෙන්ඩර් පටිපාටියකට යන්න සූදානම් වෙලා කියලත් කිවුවා. ඊයේ දිනයේ තාක්ෂණ නිලධාරීතුමිය තුෂාරා මහත්මියව හමුවුණාම එතුමිය ප්‍රකාශ කළා මම ඊයෙත් ඉල්ලීක් කළා කඩිනමින් කටයුතු ටික සොයා බලා දරුවන් අනාරක්ෂිත ස්ථානයකට පත්වන්න ඉඩ නොදී ඉක්මනින්ම ඒ සඳහා ගන්න ඕන සුදුසු ක්‍රියාමාර්ග ටික නිර්දේශයන් අනුව ගන්න කියලා.

**2025.08.19 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**2025.08.19 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |

| | | | | |
|---|---|---|---|---|
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය |

**2025.08.19 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ සියලුම නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු සභාවේ නොසිටියහ.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා) |

**06(3) 2025.08.19 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - හරිස්චන්ද්‍රන පිලානවිතානගේ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඇමුණුම 17 යටතේ ඉදිරිපත් කර ඇති ඇමුණුම සම්බන්ධයෙන් මම අදහසක් ප්‍රකාශ කරනවා. එහි මේ සම්බන්ධව නඩු පිළිබඳ කමිටුවේ දී සාකච්ඡා වුණේ මේ හා සම්බන්ධ නඩුව මොරටුව මහා නගර සභාවට අයිතිවාසිකම් ප්‍රකාශ ඉදිරිපත් කරන්න පුලුවන් අයිතිවාසිතමක් තියෙන නිසා මේ නඩු කටයුත්ත කරගෙන යන්න අවශ්‍ය බවත්, ඉදිරි නඩු දිනයේ දී මේ අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු බවටත් තමයි අපේ ස්ථාවරය වුණේ. නමුත් නීති නිලධාරීතුමිය වාර්තා කරලා තියෙන්නේ මේ සම්බන්ධයෙන් සභාවේ මේ නඩු කටයුත්ත පවත්වාගෙන යාමෙන් මොරටුව මහා නගර සභාවට ජයගත හැකි නඩුවක් නොමැති නිසා මෙම නඩු කටයුත්ත සම්බන්ධයෙන් මහා සභාවෙන් යෝජනාවක් සම්මත කිරීම සඳහා තමයි ඇය නිර්දේශ කරලා තියෙන්නේ. ගරු නගරාධිපතිතුමනි මේ ඇමුණුමට අදාළව දැන් මොරටුව මහා නගර සභාව මේ දේපළට අදාළව 1997 ප්‍රකාශන ඔප්පුවකින් අයිතිය ලබාගෙන තියෙනවා. මේ ප්‍රකාශන ඔප්පුව මත අයිතිය ලබා ගත්ත මොරටුව මහා නගර සභාවේ ඔප්පුව ඇමුණුම 1 හැටියට මෙහි අමුණා තියෙනවා. නමුත් ඊට අදාළ පිඹුර මෙහි අමුණා නැහැ. මම දන්නේ නැහැ ඇයි මේ පිඹුර මෙම ඇමුණුමට ඇතුලත් වෙලා නැත්තේ. 1997 දී මේ මොරටුව මහා නගර සභාව මේ දේපළේ ප්‍රකාශන අයිතිය මත අයිතිය ලබා ගැනීමෙන් පස්සේ මෙය රජයේ දේපලක් වුණා.

ඊටපස්සේ කිසිම පාර්ශවයකට මේ දේපළ සම්බන්ධයෙන් අයිතියක් කියන්න අවස්ථාවක් නැහැ. මේ රජයේ දේපළක් වුණාට පස්සේ මේ නඩුව සම්බන්ධයෙන් වන සම්පිණ්ඩන වාර්තාවේ කියනවා පසුකාලීනව ගොඩනැඟිල්ලක් ඉදි කරනු ලැබ මොරටුව සමෘද්ධි ප්‍රජා බැංකුව පවත්වාගෙන ගියා කියලා. එහෙනම් මේ ගොඩනැඟිල්ලත් රජයේ දේපළක්. අපිට මේ නඩු කටයුත්තෙන් අයින් වෙන්න අපි තීරණය කළොත් පොදු දේපළ පනත යටතේත් වැරදිකාරයෝ වෙන්න පුලුවන්. ඒ නිසා නගරාධිපතිතුමනි, මේ දාලා තියෙන සංෂිප්ත වාර්තාව සම්පූර්ණයෙන්ම එතුමියගේ වාර්තාවේ සඳහන් වන ආකාරයට එකඟවෙන්න බැහැ මේ මොරටුව මහා නගර සභාව 1997 ප්‍රකාශන ඔප්පුවකින් නගරාධිපතිවරයා ලියාගත්ත ප්‍රකාශන ඔප්පුවේ පැහැදිලිව සඳහන් වෙනවා මෙහි ඉඩමක් හැටියට නෙවෙයි නගරාධිපතිතුමනි පැහැදිලිව කියනවා අන්ඩර් ඇන්ඩ් බයි වර්චුවර් ඔෆ් ලෝං අන්ඩිස්ටර්බ්ඩ් ඇන්ඩ් අන්ඉන්ටරප්ටඩ් පොසිෂන් එයින් අදහස් වන්නේ පූර්ණ කාලීන අඛණ්ඩ සහ නිර්බාධිත සන්තකයේ තිබුණා කියලා මේ ප්‍රකාශන ඔප්පුවේ පැහැදිලි වෙනවා. ඒ වගේම පැහැදිලිවම කියනවා එහි පහළ කොටසේ එනි අදර් පර්සන්ස් හුම්සොඑවර් ද සෝල් ඇන්ඩ් අබ්සලූඩ් ඕනර් කියලා එයින් පැහැදිලිව සඳහන් වෙන්නෙත් අන් අයගේ අයිතියට ස්වාධීන වූත් ප්‍රතිවිරුද්ධ වූත් අයිතියක් තිබුණා කියලා. දැන් නීති නිලධාරීතුමිය කියනවා අපි භුක්තිය විතරක් පවත්වාගෙන ගියා කියලා. මේ ප්‍රකාශන ඔප්පුවේ පැහැදිලිව කියනවා මෙහි පැහැදිලිව සඳහන් වන්නේ ලැන්ඩඩ් ප්‍රමිසස් කියලා. ඉඩමක් සහ දේපළක්, ඉඩමක් විතරක් නෙවෙයි. ඒ වෙලාවෙත් මෙහි දේපලක් තිබිලා තියෙනවා. එහෙනම් ඉඩමක් වුනානම් මෙහි ලැන්ඩඩ් ප්‍රමිසස් කියලා මෙහි සඳහන් වෙන්න විදියක් නැහැ. ඒ නිසා 1997 පැහැදිලිව මොරටුව මහා නගර සභාව මේ දේපළක, යම් දේපළක ඉඩමක් දේපළක් සහිත ඉඩමක අයිතිය ප්‍රකාශ කරගෙන තියෙනවා. ඒ ප්‍රකාශ කර ගැනීමෙන් පස්සේ මේ දේපළ රජයේ දේපළක් බවට පත්වුණා. ඊට පස්සේ මේ දේපළට කිසිම පාර්ෂවයකට අයිතිවාසිකම් කියන්න අයිතියක් නැහැ නීතියෙන්. රජයේ දේපළකට කිසිම ආකාරයකින් කාලාවරෝධීව අයිතියක් ගන්න බැහැ. ඒ නිසා මේ දේපළ මත අපි අයිතිවාසිකම් කියලා මේ නඩුවට අපි ඇතුලත් වෙලා මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරන්න අවශ්‍යයි. මගේ ස්ථාවරය ඒකයි. මේ දේපළ මොරටුව මහා නගර සභාව සතු දේපළක්. ඒ දේපළ 1997 ප්‍රකාශන ඔප්පුවකින් මේ දේපළ අයිති කරගන්නවා. ඉන් පස්සේ මේ දේපළ 2019 දී තමයි මේ නඩු කියන පාර්ෂවය විසින් ප්‍රකාශන ඔප්පුවකින් තමන්ට අයිති කියලා ප්‍රකාශ කර ගන්නේ. ඔවුනුත් ප්‍රකාශන ඔප්පුවකින් කියන්නේ අයිතිකරුවන් කියලා. එහෙනම් අපි රජයේ ආයතනයක් වෙලා මේ ඔප්පුව 1997 ලිය වුණානම් රටේ තියෙන නීතිය අනුවත් මුලින්ම ලියාපදිංචි වුණ ඔප්පුවට පූර්ණතාය ලැබෙනවා. එහෙනම් 1997 රජයේ දේපළක් බවට පත්වෙච්ච මේ දේපළ කිසිම පාර්ෂවයකට කාලාවරෝධී අයිතිය ලබා ගැනීමට හැකියාවක් නැහැ. ඒ නිසා මේ ඉදිරිපත් කරලා තියෙන නිර්දේශය කිසිසේත්ම පිලිගන්න බැහැ. මේ නිර්දේශයේ අවසාන වශයෙන් කියනවා දිගු කාලීන භුක්තිය ප්‍රකාශ කරමින් ලියන ලද ප්‍රකාශන ඔප්පුවක් මත පදනම්ව මොරටුව මහා නගර සභාව විසින් මෙම නඩුවේ දී එම දේපළට අයිතිවාසිකම් ඉදිරිපත් කිරීම ප්‍රතිඵලදායක නොවන බැවින් මෙය සම්පූර්ණයෙන්ම වැරදි. දිගු කාලීන භුක්තිය විතරක් නෙවෙයි මේ ඔප්පුවේ පැහැදිලිව කියනවා භුක්තිය හා අයිතිය දෙකම අපි ප්‍රකාශ කරලා තියෙනවා. ඒ වගේම මේ නඩු පිලිබඳ කමිටුවේ දී අපේ මන්ත්‍රීවරු දන්නවා අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදිත් කිවුවේ නගර සභාවට තියෙන අයිතිවාසිකම ඉදිරි නඩු දිනයේ දී හිමිකම් ප්‍රකාශ මඟින් ඉදිරිපත් කරන්න. ඉතින් එහෙම තත්ත්වයක් තියෙද්දි මේ වගේ වාර්තාවක් ඉදිරිපත් කිරීම සම්පූර්ණයෙන්ම වැරදි සහගතයි. ඒ වගේම සභාව නොමඟ යවන වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙන්නේ. ඇය කියනවා හිමිකම් සනාථ කල හැකි වෙනත් ලේඛන හෝ සාක්ෂි නොමැති බැවින් ගරු අධිකරණයට කරුනු සැළ කර මොරටුව මහා නගර සභාව මෙම නඩු කටයුත්තෙන් ඉවත් වීම සුදුසු බව පෙන්වා දෙමි. එහෙම ඉවත් වෙන්න පුළුවන් කියලා කියන්නේ කොහොමද? මෙය 1997 මොරටුව මහා නගර සභාව අයිතිය ප්‍රකාශ කරගත්ත දේපළක්. එතුමියට පුලුවන්කමක් නැහැ තමන්ට අවශ්‍ය විදියට දේපළ වල අයිතිය අත්හරින්න කියලා නිර්දේශ කරන්න. රජයේ ආයතනයක් ඊට පස්සේ එහි සමෘද්ධි මූල බැංකුව පවත්වාගෙන ගිහිල්ලා තියෙනවා. ඒ අනුව ඒ දේපළෙහි පැහැදිලිව ගොඩනැඟිල්ලක් තිබිලා තියෙනවා. මේ විදියට ගියොත් මේ විදියට දේපළ අතරහැරියොත් අපිත් වැරදිකාරයෝ වෙනවා. නීතියට අනුව පොදු දේපළ අවභාවිතා කරන්න අවස්තාවක් දුන්නා

වෙනවා. ඒ නිසා අපි නඩු කමිටුවේ දී පැහැදිලිව සාකච්ඡා කරලා කිව්වේ මේ නඩු කටයුත්ත ඉදිරියට කරගෙන යන්න ඕන. මේ සම්බන්ධයෙන් මොරටුව මහා නගර සභාවේ හිමිකම ඉදිරි නඩු වාරයේ දී ඉදිරිපත් කරන්න ඕන. ඒ හිමිකම ඉදිරිපත් කිරීමට අමතරව මේ සම්බන්ධයෙන් මැදිහත් වන නිතිඥවරුන් සමඟ සාකච්ඡා කරලා විශේෂයෙන් මේ නඩු කටයුත්තේදී මූලික විරෝධතාවයක් අරගෙන මේ ඉඩම රජයේ ඉඩමක් බැවින් මෙවැනි නඩු කටයුත්තක් පවරාගෙන පවත්වගෙන යන්න බැහැ කියන මූලික විරෝධතාවය ගතයුතුයි කියන ස්ථාවරයේ තමයි එදා අපි නඩු කමිටුවේ දී සාකච්ඡා කරලා කරුණු ඉදිරිපත් කළේ. ඒ නිසා මෙයට සම්පූර්ණයෙන්ම පරස්පර වාර්තාවක් මේ ඉදිරිපත් කරලා තියෙන්නේ. ඒ නිසා මේ වාර්තාව සම්පූර්ණයෙන්ම බැහැර කරලා මේ නඩු කටයුත්ත සම්බන්දයෙන් නැවත සාකච්ඡා කරලා මේ ඉදිරි නඩු දිනයේදී මොරටුව මහා නගර සභාවේ අයිතිවාසිකම් ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, එතුමිය මේ දීලා තියෙන වාර්තාව කමිටුව පිළිඅරගෙන නැහැ. ඒ නීති නිලධාරිනිය දුන් වාර්තාව. එතුමියගේන නීති උපදෙස් ගත්තාම එතුමිය නීති උපදෙස් දෙනවා. දැන් මේ කාරණාව මම කියවපුවහාමත් මටත් ඔබ ඔය මතුකරන තර්කයම ආවා. ගැටලු සහිතයි. ඒ නිසා අපිට ඉදිරි නඩු පිලිබඳව කමිටුවට මෙය අරගෙන එතැනදී සාකච්ඡා කරලා අපි තීන්දුවක් ගමු.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිනි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, නඩු කමිටුව 11 වෙනිදාට පැවැවෙනවා. එදාට මම හිතන්නේ ට්‍රේනින් ප්‍රෝග්‍රෑම් එකකුත් තියෙනවා. ඒ දිනටම කරනවාද කියලා. නගරාධිපතුමනි, නඩු කමිටු දිනට පොඩි ඉල්ලීමක් කරන්න කැමතියි. මොරටුව මහා නගර සභාවේ මේ සමහර නඩුවලට කරලා ගෙවලා තියෙන ගෙවීම් සම්බන්ධයෙන් අපි දැනගැනීමට කැමතියි. ඒ හින්දා එදිනට රැස්වීමට පැමිණෙන විට මේ නඩු ෆයිල් පරිශීලනය කිරීමට අපිට අවස්ථාවක් ලබා දෙන්න. මේ නඩු සම්බන්ධයෙන් කරන ලද ගෙවීම් වලට අදාළව රිසිට් පත් ඇති. දැන් මෙතන අපි දන්නවා සමහර අවස්ථා වල අධික මුදල් ගෙවලා තියෙනවා. මම හිතන්නේ අපිට දැනගැනීමට අවශ්‍යතාවයක් තියෙනවා. මේ ලෝයස්ලාට රිසිට් මත ද ගෙවුවේ. ලෝයර් කෙනෙක් රිසිට් එකක් දෙනවා. එතකොට කොහොමද ගෙවලා තියෙන්නේ එකපාර ගෙවලාද? කොටස් වශයෙන් ගෙවලාද? මේ පළවෙනි නඩුවේ ඉඳන් කතා කරන්න ඕන කියලා ඉල්ලීමක් කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ මධුරංග විජේරත්න මන්ත්‍රීතුමා මොහු හොඳ යෝජනාවක් දැම්මා ආයතන කමිටුව තුළ අපි ඒක මතු කරන්න ඕන නිසා ඔබතුමාගේ අවධානය සහ අපේ සභාවේ සහා අනුමැතියටත් යටත්ව අපි මේ ඊළඟ කමිටුවෙන් පස්සේ ඊලඟ සභාවට ඉස්සෙල්ලා මෙය ක්‍රියාත්මක කරන්න පුලුවන්නම් හොඳයි. එතුමා කිව්වා මේ කමිටුව තුළත් මතුකලා අපේ මේ නීති අංශය වඩා හොඳට පුළුල් කරන යෝජනාවක් සම්බන්ධයෙන් විධිමත් විදියට. ඒ නිසා මම හිතන්නේ ඒක ඉටුකර ගැනීම වැදගත් වෙනවා අපේ අනාගතේ විධිමත්ව සහ පුළුල් කර ගැනීම නිසා. ඒකට අවධානය යොමු කරන ගමන් මම තවත් අපේ විවිධ අංශ තියෙනවා විශේෂයෙන් අපේ ලේකම් අංශය තාරක මැතිතුමා අපේ ලංකා මහත්මිය ඇතුලු සියලුදෙනා මේ අඩු පිරිසකගෙන් තමයි අවශ්‍ය කරන පහසුකම් සපයා ගන්නේ. ඒ නිසා මගේ අදහස නාගරික ලේකම් අංශය සහ අනික් අංශත් අපිට පුළුල් කරලා වඩා විදිමත් නගර සභාවක් කරගන්න ඕන පහසුකම් අපි සාකච්ඡා කරමු. ඒකට වෙනත් ආකාරයකින් මධ්‍යම ආණ්ඩුවෙන් හෝ ඒ වගේම පළාත් සභාවෙන් ගන්න පුලුවන් ප්‍රතිපාදන තියෙනවා. ඒවා අරගෙන ඒවා කරන ගමන් ඒ වගේම ආයතන සම්බන්ධයෙන් බලපාන ප්‍රශ්ණ කිහිපයක් මෙතැන තියෙනවා. ඒ තමයි අපේ සේවකයන් සම්බන්ධ ප්‍රශ්ණය. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඒ අඩුපාඩුත් පුරෝගන්න අපේ ඊළඟ සභාවට ඉස්සෙල්ලා උත්සහාය උත්සුක වීම අපි කරමු කියන ඉල්ලීම මම මතක් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

අංක 2(9) සේවක නිල ඇඳුම් ලබා නොදීම සම්බන්ධව. නගර සභාවේ කොහේ ගියත් නගරාධිපතිතුමා කට්ටිය අහන්නේම නිල ඇඳුම් සල්ලි දෙන්නේ නැද්ද කියලා. ඒක නිසා මෙයට අද අපිට උත්තරයක් දෙන්න කොහොමද නිල ඇඳුම් සල්ලි දෙනවාද? දැන් 2025.05.09 දින අපේ කොමසාරිස්තුමිය ලිපියක් එවලා තියෙනවා පළාත් පාලන කොමසාරිස්ට බස්නාහිර පළාතේ. ඊට පස්සේ ආයේ 2025.08.06 යවලා තියෙනවා. එයින් අපිට මොකක්ද ආව උත්තර ටික. ඊට අමතරව දැන් තීන්දුවක් අරගෙන තියෙන්නේ චක්‍රලේඛ ප්‍රකාරව නිල ඇඳුම් ලබා දීම සුදුසු බවට, සුදුසුයි තමයි. මොකද්ද චක්‍රලේඛන ප්‍රකාරව කියන්නේ. අපි සල්ලි දෙනවාද නැතිනම් නිල ඇඳුම් ලබා දෙනවාද ඒක නිසා ඔබතුමා අපිට දිනයක් දෙන්න.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි මේ කාරණය පිළිබඳව කමිටුවේ දී දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක් කළා. එතකොට මෙය සාකච්ඡාවට ලක් කිරීමේ දී තිබුණ දේ තමයි අපි මුදල් ලබා දෙන්න අනුමැතියක් නැහැ. අවසාන වශයෙන් දීර්ඝ සාකච්ඡාවකට පස්සේ අපි තීරණය කළා නිල ඇඳුම ලබා දෙන්න. ඊට අදාළ වාර්තාවකුත් අපි ඉදිරිපත් කරලා තියෙනවා. ඒ අනුව නිල ඇඳුම ලබා දෙන්න අවශ්‍ය කටයුතු ඉදිරියට කරන්න තමයි අපි කතා කරලා තියෙන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, අපි නිල ඇඳුම දුන්නාම නැවත වතාවක් බලන්න නිල ඇඳුම අපි දෙන්නේ පසුගිය ෆයිල් ටික මම පරීක්ෂා කළාම කොළඹ කොටුවේ හීල්ස් ස්ට්‍රීට් එකේ පොඩි තැනක නිල ඇඳුම් මහන තැනක කොටේෂන් කෝල් කරලා එහෙම නෙවෙයි. හරි තැනක ප්‍රමිතියකින් යුතුව දෙනවානම් හොඳයි. සමහර ආර් අයි වරුන් කිව්වා මට කලිසම අදින්නත් බැහැලු. සමහර වෙලාවට හිරයිලු. ෂර්ට් එක දාගන්න බැහැලු. ඒ නිසා හොඳ තැනකින් පී.ඕ බ්‍රාන්ච් එකට ඕන විදියට නෙවෙයි ඔබතුමිලාට ඕන විදියට ඒ ටික මහලා දුන්නානම් හොඳයි. නැතිනම් ලොකු ප්‍රශ්ණ ටිකකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි නිල ඇඳුම් දෙනකොට ප්‍රමිතියෙන් යුතු නිල ඇඳුමක් දෙන්න තමයි අපි කටයුතු කරන්නේ. සමහර සේවකයෝ අපෙන් ඉල්ලනවා නිල ඇඳුමම අපිට දෙන්න කියලා. ඒ නිසා අපිට සිද්ධ වෙනවා අනික් එක ප්‍රතිපාදන ලැබිලා තියෙන්නේ නිල ඇඳුම දෙන්න තමයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ආයතන කමිටුවේ ඔය නිල ඇඳුම් සම්බන්ධයෙන් තීන්දුව අපි ගත්තානේ එදා. හැබැයි මෙතෙක් මම හිතන්නේ නැහැ එය ක්‍රියාත්මක වෙලා කියලා. දැන් සැප්තැම්බර් මාසේ. මොකද හේතුව සැප්තැම්බර් මාසේ ඊට පස්සේ ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් අවුරුද්ද ඉවර වෙන්නත් ළඟයි. ඒ නිසා අපි අවධානය යොමු කරනවා හැකි ඉක්මනින් මේ නිල ඇඳුම් ප්‍රශ්ණය විසඳන්න කියලා සේවකයන්ගේ. මොකද හේතුව දැන් මේ නිල ඇඳුම් එක එක සේවකයාගෙන් සේවකයාට නිල ඇඳුම් බෙදන්න තීන්දු කළාට පස්සේ මැෂිමන්ට් ගන්න ඕන. එතකොට සේවකයාගෙන් සේවකයාට ගොඩක් දේවල් තියෙනවා කරන්න. එතකොට විශාල කාල පරාසයක් යනවා. ඒ නිසා දැනටමත් පරක්කු වැඩි. මම හිතන්නේ මාස 03 ක විතර කාලයක් ගතවෙයි ඕක කරන්න. මාස 03කින්වත් කරන්න පුලුවන් වෙයිද දන්නේ නැහැ. ඉතින් ඒ නිසා හැකි ඉක්මනින් ඒ කර්තව්‍ය ආරම්භ කරන්න කියන ඉල්ලීම කරනවා. ඊට අමතරව අපි ආයතන කමිටුවේ ගන්න තීන්දු දැන් අපි පැහැදිලි තීන්දුවක් ගත්තා නඩු සම්බන්ධයෙන්. විශේෂයෙන්ම මේ විදුලි උප පොළ ඉඩමෙ නඩුව සම්බන්ධයෙන් පැහැදිලි තීන්දුවක් ගත්තා අපි ඒකට නඩු කියන්නේ මොකද හේතුව පර්චස් 02ක් තමයි නමුත් ඒක අපිට ඉතාම වටින තැනක තමයි පිහිටවලා තියෙන්නේ. ඒ නිසා ඒ දේපළ ආරක්ෂා කර ගැනීම සඳහා නඩු කියන්න කියලා. ඉතින් ඒක තියෙද්දි වෙන වෙන නිර්දේශයන් පැමිණිම එච්චර හොඳ දෙයක් නෙවෙයි. ඒ නිසා අපි බොහෝම වුවමනාවෙන් ඉල්ලනවා අපි කමිටුවේ ගන්න තීන්දු තීරණ ඒ ආකාරයෙන්ම සභාවට එවනකොට කමිටු තීන්දු හැටියට එවන්න

කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.මොකද හේතුව නැතිනම් එහෙම අපි දැන් හිතාගෙන ඉන්නවා අපි ගත්ත තීන්දුව මේකයි මෙන්න මේක තමයි ක්‍රියාත්මක කරන්නේ කියලා. හැබැයි බලාගෙන යනකොට ඒක නෙවෙයි කමිටුවේ තියෙන්නේ. හදිස්සියේවත් අපි ඕක බලන්නේ නැතුව දැන් අපි විරුද්ධ වුණාට, ආණ්ඩු පක්ෂය කැමති වෙනවා. එතකොට ආණ්ඩු පක්ෂය කැමති වෙලා මෙය අනුමත වෙනවා. අනුමත වෙලා ක්‍රියාත්මක කරන්න යනකොට තියෙන්නේ වෙනම තීන්දුවක් වෙනම නිර්දේශයක්.

ගරු නගරාධිපතිතුමනි, සේවක බඳවා ගැනීම සම්බන්ධයෙන් එහි දාලා තිබුණා ඇමුණුමක්. ඇමුණුම් අංක 8 දෛනික කුලී පදනම මත සේවකයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් මම හිතන්නේ නිම්තෙර මැන්පවර් එක සැප්තැම්බර් මාසෙන් ඉවර වෙනවා කියලා තිබුණා. එතකොට ඉන් එහාට ගත්ත තීන්දුව සම්බන්ධයෙන් තියෙනවා දෛනික කුලී පදනම මත සේවකයින් බඳවා ගන්න මැන් පවර් එකක් තෝරගන්න තීන්දුවක් ගත්තා. ඒ තීන්දුවේ ලංසු ලේඛණය කියලා මෙහි ඇවිල්ලා තියෙනවා. නමුත් මම හිතන්නේ අපිට කාලය මදි නිසා ඉක්මන් කරලා මෙයත් කරගත්තොත් හොඳයි. නැතිනම් සේවකයෝ පුරප්පාඩු වෙනවා. සේවකයෝ මදි වෙනවා. මොකද බෙල් එකට එහෙම සේවක හිඟයක් තියෙනවා කියලා දහදෙනෙක්ගේ මම දකිනවා. ඉතින් ඒ සම්බන්ධයෙනුත් ඔබේ අවධානය යොමු කරනවා.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්. පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, පුංචි කාරණයක් මම ආණ්ඩු පක්ෂය විදියට ඉදිරිපත් කරන්න ඕන. මෙහි 07 වෙනි කාරණය විදුලි උප පොළේ නඩුව සම්බන්ධයෙන් මෙතුමත් පැහැදිලි කිරීමක් කළා. ඇත්තටම අපි කමිටුව විදියට මෙවැනි එකඟතාවයකට ආවේ නැහැ. මොකද අපේ පැත්තෙන් අපි ඉදිරිපත් කළා නඩු කමිටුව යොමු කරලා එතැනින් සාකච්ඡාවකට බඳුන් කරලා තීන්දුවක් ගන්න ඕන කියන එක.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරධිපතිතුමනි, ඒ කියන්නේ කමිටුවට ආවේ නැද්ද මේ ඇමුණුම?

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්. පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ කාරණය කමිටුවට ආවා නමුත් අපි සාකච්ඡා කරනකොට අපි මෙහිදි කිවුවේ නඩු කමිටුවට යොමු කරලා මේ පිළිබඳව දීර්ඝ සාකච්ඡාවක් ගන්න ඕන කියන කාරණය. එතකොට ඒ සාකච්ඡාවෙන් පස්සේ තමයි අපිට තීන්දුවකට එන්න ඕනව කියන එක අපි සාකච්ඡා කළේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරධිපතිතුමනි, දැන් මේ මොරටුවේ තියෙනවා විශාල ඉඩම් ප්‍රමාණයක් නගර සභාවට. නමුත් අපි ඔප්පු පරිශීලනය කිරීමේ දී ඔප්පු නැහැ සමහරක් තැන් වල. හදිසියේ ඔය ඉඩමක පරණ මනුස්සයෙක් ඇවිත් කිවුවොත් මේ ඉඩම මට අයිති මම දැන් මෙයට නඩුවක් දානවා කියලා. දැන් මොකක්ද අපි ගන්න තීරණය. දැන් ඒ වගේ ඉඩම් කොච්චර තියෙනවාද කියලා කියන්නකෝ. මොකද මෙය විශාල ප්‍රශ්ණයක්. මොකද අපි හැත්තැනවයේ තමයි මේ විදුලි උප පොළ දාන්නේ කඩලානේ. අවුරුදු 15ක් ගියාට පස්සේ තමයි ප්‍රකාශන ඔප්පුවක් හදාගත්තේ. දැන් මෙතන ඉඩමේ දෙමහල් ගොඩනැඟිල්ලක් හදද්දි ඔය විරුද්ධතාවය ප්‍රකාශ කරපු මිනිස්සුන්ට කියන්න බැරි වුනාද මේකේ අයිතිය අපිට කියලා. ඉතින් මේවා නැති ප්‍රශ්ණ.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, ඔච් මෙහෙම නිර්දේශයක් දෙන්න හිතන්න ඕනත් නැහැ. අපි සතු අපි පවත්වාගෙන ගිය දේපළක් සම්බන්ධයෙන් නීති නිලධාරී මේ අදාළ ඇමුණුම සම්බන්ධයෙන් සෑහෙන කණගාටු වෙනවා. අපි නඩු කමිටුව ගමු. ඉක්මනින්ම මේ නඩු සම්බන්ධයෙන් මීට වඩා ගැඹුරු විදියට සාකච්ඡා කරමු.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්.සුජීත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, දැන් එකක් දෙකක් නෙවෙයි මේ නීති අංශයෙන් වුණේ. ඒ නිසා අපි බොහෝම ගෞරවයෙන් ඉල්ලනවා මේ නිලධාරීන් හැටියට කරන වැරදි ඔතන කතා කරලා ඉවර කරන්න බැහැ. ඒ නිසා මේවාට මේ වගේ මේක ප්‍රබල වරදක් ඒ නිසා මේවාට විනයානුකූල පියවර ගන්න ඕන. පරීක්ෂණයක් තියලා හරි අහන්න ඕන මොකද මෙහෙම කළේ කියලා හරි. ඒ නිසා ඒ සම්බන්ධයෙන් කරුණාකරලා අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, සභාව නියෝජනය කරන නීතිඥවරු ගණනාවක් ඉන්නවා. නීතිඥවරියන් ඉන්නවා. මේ නඩු කමිටුවේදී ඔබට තමයි පුලුවන්, දැන් අපි නීති ක්ෂේත්‍රයේ විශාරදයෝ නෙවෙයි. දැනුම අඩුයි. නමුත් අපිට ප්‍රායෝගිකව ලබා ගත්තු ආදර්ශයන් ඇතුලේ යමක් තියෙනවා මෙය වැරදි. දැන් මට ඉතාම ඉක්මනින් ඕන පැනල් එකකට යන්න. පැනල් එකක් ඇතුලේ තමයි තීන්දු කරන්න ඕන ඒ නුඩුව මොකද කරන්නේ කියලා. අපිට විශ්වාස නීතිඥයො ගණනාවක් ඉන්නවා. ඒ නිසා ඉක්මනින් ඒ කටයුත්ත කරමු.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග මහතා**

ගරු නගරාධිපතිතුමනි, කාරණා කිහිපයක් තියෙනවා. පළවෙනි එක මේ ලිපිය ගැන කතා කළා. ඇත්තටම එදා කමිටුවේ දී අපි සාකච්ඡා කලේ මෙය අපි ප්‍රොසීඩ් කරමු කියන එක. අපි ඕන වෙලාවක නඩුවෙන් අයින් වෙන්න පුලුවන් හැබැයි මුලින්ම නඩුවෙන් අයින් වුණාට පස්සේ ආයේ නඩුවට ඇතුලත් වෙන්න බැහැ. ඒ නිසා මම දීර්ඝව කියන්නේ නැහැ. මේ වාර්තාව වැරදි. මමත් ඒක තහවුරු කරනවා මමත් ඒ ආයතන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් සිටින නිසා. ඊළඟ කාරණය මේ නිල ඇඳුම් සම්බන්ධව සාකච්ඡා වුණා. ඒ ගැන එක කාණයක් කියන්න ඕන. අපි කමිටුවේ සාකච්ඡා කරපු නිසා දීර්ඝව ඒ පිළිබඳව සාකච්ඡා කළා අපේ උප නගරාධිපතිතුමිය කිවුව ආකාරයට. නමුත් අපේ මන්ත්‍රීවරු දන්නේ නැති නිසා මම මේ කාරණය දැනුවත් වීම සඳහා කියන්නේ. දැන් එතැනදි යෝජනා වෙච්ච කාරණයක් තමයි මේ සේවකයන්ට අපි ඇඳුම් දෙන එක ප්‍රැක්ටිකලි ඉතාම අපහසු කාරණයක්. මේ අයගේ මැෂිමට් ගන්න දීර්ඝ කාලයක් යනවා නිලධාරීන්ට විශාල මහන්සියක් හැබැයි දැන් එතැනදි යෝජනා වෙච්ච දෙයක් තමයි මේ ඇඳුම් දුන්නත් සේවකයෝ මේ ඇඳුම් අඳින්නේ නැහැ. අපි සල්ලි දුන්නත් සේවකයෝ ඇඳුම් ගන්නෙත් නැහැ. මම මේ කියන්නේ ආයතන කමිටුවේ නොසිටි සාමාජිකයෝ දැනගන්න ඕන ඔවුන්ටත් සම්බන්ධතා තියෙනවා ඔවුන් සමඟ මේ ගැටලුව ආයතනයේ සේවකයෝ කතා කරනවා ඇති. එතකොට මේ ආයතනයේ සේවකයෝ කියන කාරණය හරි කියලා අපි නිශ්ශබ්දව ඉන්න බැහැ. එතකොට අපි ඇඳුම් දෙන එකනම් කළේ දැන් එතැනදි කියවුණා පැහැදිලිව අපේ කට්ටිය පිලිගත්තා අපි ඇඳුම් දුන්නාට මේ අය ඇඳුම් අඳින්නේ නැහැ. ඊළඟට ඒ අය ඉල්ලන්නේ සල්ලි. දැන් ඇත්තටම පවු අහිංසක මිනිස්සු. එදා ගොඩක් කිවුවා මේ අය බයිසිකලයේ එන්නේ, වේලක් කන්නේ නැහැ, කලන්තේ දාලා වැටෙනවා. ප්‍රශ්න ගොඩක් තියෙනවා. ඒ ඔක්කෝම අපි පිලිගන්නවා. හැබැයි අපි ආයතනයක් විදියට යම් විනය නීතිරීති මාලාවක් එක්ක යනකොට අපිට කියන්න බැහැ අපි ඇඳුම දුන්නත් ඇඳුම අඳින්නේ නැහැ ඒක අපි දන්නවා හා කමක් නැහැ කියලා අහක බලාගන්න බැහැ. ඊළඟට ඇඳුම ලොකුයි ඇඳුම පොඩි ඇඳුම අඳින්නේ නැහැ කියලා අපිට සල්ලි දෙන්න කියනවා. හැබැයි සල්ලි දුනනත් මේ මිනිස්සු කොහොමත් අඳින්නේ නැහැ. අපිත් ආසයි සරමක් ඇඳගෙන මොකක්හරි ෂෝට්ක් ගහගෙන එන්න අපිත් ආසයි. උසාවියටත් එහෙම යන්න, එහෙම බැහැ. අපි හැමෝටම නීතිරීත් මාලාවක් තියෙනවා. ඒ නීතිරීති මාලාවට අපි අනුගත වෙන්න ඕන. එතකොට මම මේ සියලුම මන්ත්‍රීවරුන්ට කියන්නේ යුතුකමක් තියෙනවා කවුරුහරි කෙනෙක් මෙතැනින් එළියට ගියාට පස්සේ අහන්න පුලුවන් අපේ ඇඳුමවත් නැහැ අපේ සල්ලිත් නැහැ. අපිට ඇඳුම් එපා, අපේ සල්ලිවත් දෙන්න කියලා. අපි ඒ අයට කියන්න ඕන. අපි තරහක් නැහැ ඒ අයත් එක්ක. නමුත් ඒ අයට කියලා දෙන්න ඕන තමන් මේ නිල ඇඳුමක් අඳින්නේ මේ කර්තව්‍ය නිසා ඒ නිසා මෙය අමාරුවෙන් හරි අඳින්න කියලා. අපි ඒකේ ගහන්නේ නැහැනේ සේවකයාගේ රස්සාව ඒ නිසා ඒක අනිවාර්යෙන් අපේ සාමාජිකයෝ දැනුවත් කරන්න කියලා ඉල්ලීම මම කරනවා

ගරු නගරාධිපතිතුමනි, මේ නීතිය සම්බන්දයෙන් අපේ නීති නිලධාරී, එදත් මම කිවුවා මගේ නම කිවුව නිසයි මම නැඟිට්ටේ. ඒ ගැන කියන්න නැත්තම් මම නොකියන එක හොඳ නැහැ. ඇත්තටම මේ මොරටුව මහා නගර සභාවේ සියලුම ප්‍රශ්ණ වලට තියෙන හේතුව මම බැලුවාම සමහර දේවල් වල ගිවිසුම් තියෙනවා, ගිවිසුමේ කොන්දේසි නැහැ. මේ කොන්දේසි සම්පූර්ණ නැහැ. අපේ මැක්සි මන්ත්‍රීතුමා කිවුවා වගේ ඉඩම් තියෙනවා. ඒවගේ ඔප්පු තිරප්පු තියෙනවාද කියන්න දන්නේ නැහැ. විශාල ගැටලු රාශියක් තියෙනවා. මේ සියල්ලටම මුල වෙන්නේ අපි හරි නීතිමය අඩිතාලම දාගත්තේ නැති නිසා. ඉතින් මගේ පුද්ගලික අදහස පුද්ගලිකව නඩුවක් කලත්, අපිට කරන්න පුලුවන් කැපැසිටි එකක් තියෙනවා. නීති නිලධාරීනි මේ සියල්ල දත් තැනැත්තෙක් නෙවෙයි. නමුත් අපි කවුරුත් සියල්ල දත් අයත් නෙවෙයි. එතකොට මම ඒකයි කිවුවේ නීති අංශය පුලුවන්නම් අපිට පුළුල් කරන්න අපිට මේ එළියේ ලෝයර්ස්ලට ගෙවන විශාල මුදලක් අපිට ඉතුරු කරගන්න පුලුවන්. අපිට පෙරකලාසි දාන්න පුලුවන්නම් ලෝයර් කෙනෙක් හරහා ඒ පෙරකලසි ගාස්තු හරි ඉතුරු කරගන්න පුලුවන්. නීතිඥවරු කිහිපදෙනෙක් නිසා මම මේ කියන්නේ අනික් අයටත් දැනගන්න. එතකොට අපිට පුලුවන්නම් මේක එක පුද්ගලයෙකුට මේ ඔක්කෝම ඇගේ ගහලා ඒ පුද්ගලයාගේ අඩුපාඩු නිසා අන්තිමේ දී සමස්ථයම පාඩු වෙන්නේ මුළු මොරටුවේ ම ජනතාවට. මොරටුව නගර සභාවට. ඒ නිසා පුලුවන්නම් මේ නීති අංශය මීට වඩා පුළුල් කරන්න අපිට පුලුවන්නේ කොන්ත්‍රාත් පදනම මත හරි කාවහරි බඳවා ගන්න පුලුවන්නම් ඒ අපි ගෙවන වේතනයට වඩා විශාල වැඩ ප්‍රමාණයක් ගන්න පුලුවන්. ඒ නිසා මම කියන්නේ කලින් කිවුවා වගේ මේ නිලධාරීනීගේ වැරදි අඩුපාඩු තියෙනවා වෙන්න පුලුවන්. ඒ වැරදි අඩුපාඩු හදාගන්න ගමන් අපි මේ ආයතනය පුළුල් කරලා තවත් නිලධාරීන් බඳවාගෙන, මේ කියනවා වගේ ඉඩම් සම්බන්ධ සමස්තය අපිට එක ජොබ් එකක්. ඒක ජොබ් එකක් කරන්න පුලුවන් ඒ නිලධාරිනියගේ වගකීම තමයි ඒ සියල්ල හොයලා අපිට යාවත්කාලීන කරන්න ඕන. එහෙම නැති වුනොත් අපිට අර කිවුවා වගේ නඩුවක් එනකොට අපි සූදානම් වෙනවා. අර බැබුන්ලා ගෙවල් හැදුවා වගේ. ප්‍රශ්ණ එනකල් අපි දන්නේ නැහැ. ඒ නිසා මේ ආයතනය මීට වඩා පුළුල් කරලා විධිමත් කරලා හරි යාන්ත්‍රණයක් හදා ගන්න ඕන මේක අප්ඩේට් වෙන්න. එහෙම වුනොත් මේ ප්‍රශ්ණ ආවට පස්සේ උත්තර හොයනවා නෙවෙයි, ප්‍රශ්ණය එන්න කලින් අපි සිස්ටම් එක හදලා තියාගන්නවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම මට අවශ්‍ය වෙන්නේ මේ ආයතන කමිටුවට ස්තුතියි කරන්න. ඔබ දන්නවා අපේ මේ මැන් පවර් සේවකයන් බඳවා ගැනීමේ දී පසුගිය කාල සීමාවේ දී ඔවුන්ගේ වැටුප දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන්ගේ වැටුප ගෙව්වේ 1000ක 1050ක වගේ ඉතාම සොච්චම් වැටුපක්. ඒ නිසා අපිට හැකියාව ලැබුණා අභියෝග ගොඩක් තියෙද්දී සභාවේ මුදල් පිළිබඳ මූල්‍ය පිළිබඳ විශාල ගැටලු සහගත තත්ත්වයන් තියෙද්දිත්, අපි සමත්වුණා ආයතන කමිටුවේ සියලුම සාමාජිකයන් එකහවෙලා ඒ සේවකයන්ගේ දෛනික වැටුප රුපියල් 1800ක් කරන්න පුලුවන්කම ලැබිලා තියෙනවා සහ එය අද මේ සභාවේ සම්මත වෙනවා. එය සතුදායක දෙයක්. සේවකයන්ට අපි සලකන්න ඕන. ඒ සේවකයන්ගෙන් සේවය ලබා ගැනීමේ දී. ප්‍රතිපත්තිමය කාරණාවක් උඩ අද මෙයට විරුද්ධව ඡන්දය දුන්නත් අපි දන්නවා විපක්ෂයේ මේ සියලු මන්ත්‍රීවරු එයට එකහයි. සුජිත් මන්ත්‍රීතුමා ඇතුලු මේ සියලුම කමිටු සාමාජිකයන්ට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

**2025.08.19 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |

| | | | |
|---|---|---|---|
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**2025.08.19 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | මෙරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය |

**2025.08.19 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ සියලුම නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභාවේ නොසිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා)

**06(4) 2025.08.20 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,සෞඛ්‍ය කමිටුවේ 05 අයිතමය,2006 සිට 2011 වෙනකම් කොන්ක්‍රීට් කොම්පෝස්ට් බින් එක ජනතාව කැමැත්තෙන් පාවිච්චි කලා. තත්ත්ව පරික්ෂාවකට ලක් කරලා මේක දෙන්න පුලුවන් නම් ගොඩාක් හොඳයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,අවුරුදු විස්සකට විතර ඉස්සර මොරටුව නගර සභාවෙන් කරපු පයිලට් ප්‍රොජෙක්ට් එකක්,මේක සාර්ථක වුනා.ජාත්‍යන්තර ආයතන එකක් දෙකක් රැස්වීමකට ලක් කලා.ඇත්තටම ප්‍රයෝජනය ලැබුනේ ගෙවත්තක් තිබෙන තැන් වලට.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනි,අපි ප්‍රොජෙක්ට එක ක්‍රියාත්මක කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අංක 03 අයිතමය, ලුනාව කලපුවේ විධිමත් ලෙස බැහැර කරන්න යන්ත්‍ර සූත්‍ර දාන්න කියලා. අපි ඒ කාලෙනම් යන්ත්‍ර සූත්‍ර ගෙනල්ලා පිළිසකර කරා. ඔබතුමත් ඒක බලලා කරන්න කියලා ඉල්ලීමක් කරනවා. අංක 06 අයිතමය, කොම්පෝස්ට් ව්‍යාපෘතිය සම්බන්ධව. පසුගිය සතියේ පුවත්පතක තිබුනා දිගරොල්ල කොම්පෝස්ට් අංගනය සුදු අලියෙක් විදියට දැක්කා කියලා. සේවකයො ඉන්නවා මේ වෙනකොට අංගනයෙන් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. අවුරුද්දකටත් වැඩියි. බැක් ටික එහෙමම තියනවා. බැග් ටික ඉවත් කරන්නේ නැද්ද? එතනින් දැඩි දුගදක් හමනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී- ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,අපි ගියවර මොරටුව මහා නගර සභාවේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වංචාවන් සම්බන්ධයෙන් සභාවට එළිකලා.එතකොට ඔබ ඔය පුටුවේ හිඳගෙනම් කිව්වා වහාම ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන්න කියලා.පරීක්ෂණය පැවැත්වූවා ගොඩක් දෙනෙක් ගිහිල්ලා සාක්ෂි දුන්නා .හැබැයි ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ තනතුර ගලවලා තියනවා සහ ඔහුට තියෙන ජීරියා එක අයින් කරලා තියනවා.එතනින් එහාට ගත්ත විසඳුම මොකක්ද කියන එක පිළිබඳව අපි දන්නෙ නැහැ.අපිට ආරංචිය හැටියට සහ ඔහුට එරෙහිව සාක්ෂි දුන්න පිරිස අපිට කියපු හැටියට ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් හොරු අල්ලනවා. අතට අහුවුනු හොරාව තවම නිදැල්ලේ ඉන්නවා.

ගරු නගරාධිපතිතුමනි, ඒ විතරක් නෙමෙයි අපිට තව වංචාසහගත ගණුදෙනුවක් සම්බන්ධයෙන් හෙලිවෙලා තියනවා.නගර සභාවේ බේල් යන්ත්‍රයෙන් ගන්න පැක් සඳහා බේල් පටි අරගෙන තියෙන්නේ එස්.එම්.එන්ටප්‍රයිසස් කියන ආයතනයෙන්.එම ආයතනය මිහිපිට තියෙන ආයතනයක් නෙමයි ඒක නිකම්ම නිකම් නමක් විතරයි.තව කොටේෂන් අරගෙන තියනවා ඔන් ඇප්රුවල්

බිල්වල.මොරටුව මහා නගර සභාව කියන්නේ ආයතනයක්.ටෙලිෆෝන් නොම්බරයක්වත් නැති බිල් මෙම ආයතනයට කොහොමද එහෙම භාණ්ඩ ගන්නෙ කියලා ප්‍රශ්නයක් තියනවා. සමන්ලාල් මහතා නගරාධිපති වෙලා ඉන්න කාලෙ පී.එච්.අයි මහත්තුරු බේල් පටි ගාමන්වලින් අරගෙන තියෙන්නේ නොමිලේ.හැබැයි ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක යසන්ත කියන කෙනා බේල් පටි අරගෙන තියෙන්නේ 2023 ජූලි මාසෙ කිලෝ තුන්සිය පනහක් අරගෙන තියනවා රුපියල් තුන්සිය හැට ගානේ එක්ලක්ෂ අනුහයදාහයි.කිලෝ එකසිය හැත්ත පහක් අරගෙන තියනවා පන්සිය හැටගානේ එක් ලක්ෂ අනුඅටදාහයි.ලක්ෂ දෙකට මෙහා පැත්තෙ සප්ලයි ගන්න දෙපාර්තමේන්තු වලට අවස්ථාවක් දුන්නනෙ.ඒකට මුවා වෙලා 2024 අප්‍රේල් මාසෙ අරගෙන තියනවා කිලෝ එකසිය හැටපහක් රුපියල් හයසිය ගානේ අනු නමදාහක් ජූලි තුන්වෙනිදා අරගෙන තියනවා රුපියල් තුන්සිය විස්ස ගානේ කිලෝ හයසිය විස්සක් එක්ලක්ෂ අනුඅටදහස් හාරසීයයි.නොවැම්බර් මාසේ අරගෙන තියනවා එකසිය හැටගානේ කිලෝ හයසිය විස්සක් අනුනමදහස් දෙසීයයි.දෙසැම්බර් දහනමවෙනිදා අරගෙන තියනවා කිලෝ තුන්සිය විස්සක් රුපියල් හයසිය විස්ස ගානේ එක්ලක්ෂ අනුඅටදහස් හාරසීයයි.මේවා ගෙනල්ලා තියෙන සැපයුම් කරුවෙක් නැහැ. සැපයුම්කරුවා කවුද කියලා නැහැ. හැබැයි සෙනසුරාදාට ඉරිදාට මේ බේල් පටි එනවා. ඇවිදගෙන එනවාද කොහාම එනවාද දන්නෙ නැහැ. සැපයුම්කරුවෙක් පේන්න නැහැ. අදෘශ්‍යමාන හස්තයක් තමයි මේ බේල් පටි ගෙනල්ලා දෙන්නෙ. බේල් පටි ගෙනල්ලා ගබඩාවට දෙන්නෙ නැහැ. ගබඩාවට යන්නෙ ඉන්වොයිස් එක විතරයි. බඩු ටික බේල් එකට යනවා. සාමාන්‍යයෙන් ගබඩාවට ගිහිල්ලා ගබඩාවෙන්නෙ බෙදා හරින්නෙ. එහෙම වෙන්නෙ නැහැ. අන්තිම කාලේ පානදුරේ රාජපක්ෂ කියලා  සැපයුම්කරුවෙක්ගෙන් අරගෙන තියනවා එක්ලක්ෂ අනුඅටදහක බේල්පටි. සැපයුම්කරුවා වෙනස් වුනාට ඔන් ඇප්රුවල් බිලකින් තමයි ඒක අරගෙන තියෙන්නේ. මේවල චෙක්පත් පවා අරගෙන තියෙන්නේ ආදල සී.පී.එච්.අයි යසන්ත කියන පුද්ගලයා.සේවකයන්ට බලපෑම් කරලා සේවකයන්ව එකවුන්ස් එකට යවලා තමයි චෙක්පත් අරගෙන තියෙන්නේ.අපි ඔබතුමාගෙන් ඉල්ලනවා පරීක්ෂණයක් පවත්වන්න කියලා.මේවා මහදවල් වෙන හොරකම්.බේල් පටි සම්බන්ධයෙන් එස්.එම් එන්ටර්ප්‍රයිසස් එක්ක එකතු වෙලා ගහපු ගේම් එක ඒ.මේක ගහන්නෙ හිටපු ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක.නගර සභාවට බඩු සප්ලයි කරලා තියනවා කේ.එන්.කේ එන්ටර්ප්‍රයිසස්.මේකෙ සැපයුම් නිලධාරියා හැටියට ඉදලා තියෙන්නේ සෞඛ්‍ය අංශයේ වැඩ බලන පරිපාලන නිලධාරි එතුමියගේ ගෙදර තමයි කේ.එන්.කේ.එන්ටර්ප්‍රයිසස් තියෙන්නේ.ලක්ෂපතිය 06 වන පටුමගේ. අත්ග්ලව්ස් සහ ඉදල් සහ අවශය උපකරණ තමයි තියෙන්නේ.ඒ ප්ලාස්ටික් ඉදලක් දවස් දෙකතුනයි පාවිච්චි කරන්න පුලුවන්.කොහු මිටවල් කෙලින් නැහැ.වෙළදපොලේ තියෙන බාලම ඉදල් තමයි ගෙනල්ලා තියෙන්නේ.බොහෝ වේලාවට අත්ග්ලව්ස් ටික නගර සභාවට එනවා.ගඩබාවට එන්නේ නැහැ.ගබඩාවට යන්නේ ඉන්වොයිස් එක.සෞඛ්‍ය අංශයේ නිලධාරියෙක්ව ගිණුම් අංශයට යවලා චෙක් එක ගේන්න ගන්නවා.එයා චෙක් එක ගෙනල්ලා දිමුතු මහත්මියට දෙනවා.ඒවගේ චෙක් ගත්ත අවස්ථා හතරක් තියනවා.අවසානයේ ඔබතුමන්ලාගේ පාලනය ආවම චෙක් ගන්න එක මාට්ටු වෙනකොට රුපියල් පන්ලක්ෂ හතලිස්තුන්දාහක චෙක් එකක් මස්සිනා අරගෙන යනවා. ගරු නගරාධිපතිතුමනි,ටෙන්ඩර් එක බලනකොට හිනායන සැපයුම්කරුවො තමයි ඉන්නෙ.ගනන් බලනකොට වැඩිම මිල ගණන් තමයි සංසංදනය කරන්නේ.අඩු මිල ගණන් දුන්න කට්ටියව අයින් කරනවා.වැඩි මිල ගණන් තියන සැපයුම්කරුවාව සංසංදනය කරලා  කේ.එන්.එන්ටර්ප්‍රයිස් ආයතනයෙන් තමයි බඩු සප්ලයි කරන්නෙ.2024.06.12 චෙක්පත් අංක 114344 එක්ලක්ෂ අනුහයදහස් විසිපහක චෙක් එක ගන්නෙ දිමුතු මහත්මිය.තනකොල කපන නූල් සපයලා ජූලි 25 චෙක්පත් අංක  114449 එක්ලක්ෂ අනුහයදහස් නමසිය හැත්ත පහයි.2025.12.11 දින චෙක්පත් අංක 123980 තුන්ලක්ෂතිස්හයදහස් නමසිය පනහයි. 2025.12.26 චෙක්පත් අංක 126899 දෙලක්ෂ අනුඅටදහස් අනුවයි.ගරු නගරාධිපතිතුමා මේ විදියට නිලධාරියා තමන්ගෙ ගෙදර ලිපිනය දාලා ලියාපදිංචි කරලා තමන්ම චෙක් එක අරගෙන ගෙදර යනවා.එහෙම තමයි ගණුදෙනු සිද්ධ වෙලා තියෙන්නේ.අපි පසුගිය කාලෙ නියෝජ්‍ය නගරාධිපතිතුමියගේ යෝජනාවක් පිට එතුමිය මන්ත්‍රීවෙලා ඉන්න කොට සමන්ලාල් මහතා නගරාධිපති වෙලා ඉන්න කොට මිනිස්සුන්ගේ රුධිර පරික්ෂාව සදහා රසායනාගාරය විවෘත කරා. හැබැයි වර්තමාන උප නගරාධිපතිවරිය හිතන්නෙ නැතිව ඇති ඒක දාපු සමන්ලාල් මහතා

හිතන්නෙත් නැතුව ඇති ඒකට අත උස්සපු අපි හිතුවෙත් නැහැ,ඔබතුමත් හිතන්නෙ නැතුව ඇති ඒකත් හම්බකරගැනීමේ ව්‍යාපෘතියකට පරිවර්තනය කරගනී කියලා.නගර සභාව ගිහිල්ලා තියෙන්නෙ කොයි දිසාවටද කියලා.කොමසාරිස්වරිය මිනිට් එකක් ගහනවා ෆයිල් එක පැහැදිලි නැති නිසා.අදාල නිලධාරියාට කියනවා කතා කරන්න කියලා.ඊට පස්සෙ ෆයිල් එක පිටින්ම අතුරුදහන් වෙනවා.ඊට පස්සෙ අලුත් ෆයිල් එකක් හදනවා.කාටද මේවා කියන්නේ.සාමාන්‍යයෙන් අවුරුද්දක් ඉවරවුනාම තමයි අලුත් ෆයිල් එකක් හදන්නෙ.මේක හදන්නෙ පෙබරවාරි මාසයේ.කාගෙවත් උපදෙසත් නැහැ. තනි තීන්දු.මේ ෆයිල් එකේ තියෙනවා රසායනාගාරයට ගත්ත ද්‍රව්‍ය පරීක්ෂා කලයුතු තැන් විශාල ප්‍රමාණයක් තියනවා.මිලදී ගැනීමේදී බොහෝ දුරට ගබඩාවට ඇවිල්ලා ගබඩාවෙන් පරික්ෂා කරලා නෙමෙයි යවන්නේ. රසායනාගාරයට ඇවිල්ලා දින කිහිපයකට පස්සෙ තමයි අදාල ලේඛණය ගබඩාවට යන්නෙ.විශේෂයෙන් රසායනාගාරයට භාණ්ඩ ගන්න කොට එක පුද්ගලයෙකුට ඕන විදියට භාණ්ඩ ගන්න බැහැ.සන්සයින් ආයතනයෙන් මැෂින් එක ගත්තා කියලා එම ආයතනයෙන්ම රසායන ද්‍රව්‍ය ගන්න ඕන නැහැ.එම ආයතනයේම තමයි පුනපුනා රසායන ද්‍රව්‍ය ගන්නෙ.ටෙන්ඩර් පෙට්ටියේ ලිපි එහෙමම තියනවා.මේල් වලින් තමයි ගණුදෙනු කරලා තියෙන්නේ.ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක යසන්ත රුවන්සිරි සහ වැඩ බලන පරිපාලන නිලධාරී දිමුතු සෙන්දනායක කියන තැනැත්තිය දිගින් දිගටම මේ ආයතනයේ වංචාවල් සිදු කරලා තියනවා.ගරු නගරාධිපතිතුමා දැන් අලුත් සෙල්ලමක් පටන් අරන් තියනවා ඒ තමයි තමන්ට බලපෑමක් වන නිලධාරීන්ව නගරාධිපතිතුමා එන්න කිව්වා කියලා නගරාධිපති කාර්යාලයට ගෙන්නලා නිලධාරීන්ට අමුවෙන්ම බනිනවා.නගරාධිපති ලේකම් කාර්යාලය මානසික වදකාගාරයක් බවට පත්වෙලා තියනවා.තමන්ට විරුද්ධව යම් හෝ දෙයක් කරලා තියනවානම් නගරාධිපති කාර්යාලයට ගෙන්නලා ඔබතුමාගේ නම විකුණලා දැඩි ලෙස දෝෂාරෝපණය කරන්න පටන් අරන් තියනවා.හිටපු ප්‍රධාන මහජන සෞඛ්‍ය මහතාගේ සහ පරිපාලන නිලධාරියාගේ ක්‍රියා කලාපය නිසා විශාල සේවකයන් පිරිසක් එතනින් මාරුවෙලා ගිහිල්ලා තියනවා.සමහරු රැකියාව දාලා ගියා.නිවාඩුව අනුමත වුනාට පස්සෙ නිවාඩුව අනුමතයි කියලා අත්සන් කරාම ඔබතුමාගේ කාර්යාලයට ඒ සේවකයාව ගෙන්නලා නිවාඩුවට අත්සන් කරපු ලියුම් ඉල්ලා අස්කරගන්න කියලා බලපෑම් කරා.නිවාඩුව ගන්න විදියක් නැති නිසා රස්සාව තියලා ගියා.තව සමහරු තැන් තැන් වලට මාරුවුනා.තව සමහරු කොමසාරිස්තුමිය ලඟ ඇඬුවා මාරු කරලා දෙන්න කියලා.විශාල ගැටලු සහගත තත්ත්වයන් පසුගිය කාලයේ සිදුවුනා.අපි බොහොම ගෞරවයෙන් ඉල්ලනවා කේ.එන්.කේ එන්ටප්‍රයිස්,එස්.එම්.එන්ටර්ප්‍රයිසස් තත්ත්වය, මේ සේකයන්ට බලපෑම් කිරීම ගැන ඔබතුමාට අයිතියක් තියනවා. නාගරික කොමසාරිස්වරයාට අයිතියක් තියනවා.සෑම සේවකයෙක් ගැනම පෙනී සිටිනවා.ගෞරවයෙන් ඉල්ලනවා ඔබතුමන්ලාගෙන් කරුණාකාරලා මේ සේවකයන්ට සාධාරණය කරන්න.කරපු හොරකම් වලට දඬුවම් කරන්න.දිමුතු සෙන්දනායක කියන තැනැත්තිය සම්බන්ධ වෙලා තියෙන වංචාවලට අදාල කටයුතු කරන්න.ඔබතුමා හිතන්නෙ නැතිව ඇති ඔබතුමා ලඟට සේවයට ගන්න කොට මේ තරම් ප්‍රශ්න තියනවා කියලා.සාක්ෂි පිටින් ඔබතුමාට ඔප්පු කරලා තියනවා.ඔබතුමාගෙන් ඉල්ලනවා මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න කියලා.

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම මේ අවස්ථාවේ මට ස්තුතියක් කරන්න තියනවා.තුසිත් ද සිල්වා මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා තියනවා.කොම්පෝස්ට් බින් ලබාදෙන්න කියලා. ඇත්තටම හොද යෝජනාවක්.ඒ සම්බන්ධයෙන් අපි සංතෝෂ වෙනවා.ඒ යෝජනාවාම අංක 06 යෝජනාවෙත් තියෙනවා.මේ යෝජනා දෙකම එකතු කරලා දැම්මනම් තමයි හොද.පර්චස් හයේ ගෙවල් වල ඉන්න මිනිස්සු බොහෝම අපහසුතාවයකට පත්වෙනවා කොම්පෝස්ට් බින් එකක් නැතුව.ප්ලාස්ටික් බින් නම් දීලා වැඩක් නැහැ.කොන්ක්‍රීට් බින් එකක් දුන්නනම් වඩා හොදයි.අපි ඔබතුමාගෙන් ඉල්ලනවා අපි කියපු කරුණ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මට කෙටි අවස්ථාවක් දෙන්න සෞඛ්‍ය කමිටුව වෙනුවෙන් මෙතුමා මතු කරපු කාරණා සම්බන්ධයෙන් බරපතල කාරණා කීපයක් ඉදිරිපත් කරනවා.ඔබතුමාගෙන් පළමුවෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳ කඩිනමින් විධිමත් පරීක්ෂණයක් කරන්න.අපිට කිසි කෙනෙක් ආරක්ෂා කරන්න,කිසි කෙනෙක් රකින්න,කිසි කෙනෙක් වෙනුවෙන් පෙනී සිටින්න මේ පැත්තෙ ඉන්න කිසිම මන්ත්‍රීවරයෙක් සූදානම් නැහැ කියලා මම හොඳටම දන්නවා.ඒ නිසා මේ චෝදනා එල්ල කරද්දී මම කැමතියි මෙහෙමත් පටන් ගන්න.කේ.එන්.කේ. එන්ටර්ප්‍රයිසස් රෙජිස්ටර් කරන්නේ 2023 දෙවන මාසයේ විසිහත.කවුද එතකොට නගරාධිපතිතුමා ඒක නිසා මේවා අපි කතා කරන්න ඕනෙ මේවා ඇතුලෙ එක පුද්ගලයෙකුට හා පුද්ගලයන් දෙදෙනෙකුට චෝදනාව දියත් වෙද්දී මේවා පිටිපස්සෙ තව බොහෝ අය ඉන්න ඇති.දේශපාලන හස්තයෙකුත් හිටියා. ඒවත් අපි හොයමු නගරාධිපතිතුමා.ඒවත් හොයන්න ඕනා.දේශපාලන නායකත්වය නැතුව මේ මහත්තුරුන්ට තනියම වැඩ කරන්න බැහැ.කොමසාරිස් පාලනයෙන් පස්සේ සමහර තීන්දු තීරණ ගන්න ඇති අපි ඒවත් හොයමු.කේ.එන්.කේ.එන්ටර්ප්‍රයිසස් සහ බේල් සම්බන්ධයෙන් ගැටලු ගණනාවක් මතුවුනා.මේ පිළිබඳව විධිමත්ව පරීක්ෂාවක් කරන්න.අපි සතුටින් දැනුම්දෙනවා පසුගිය මාස එකහමාරක කාලය ඇතුල අපි විශාල මහන්සියක් දරලා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය යම් විධිමත් ක්‍රමයකට ආරම්භ කරා.ඒකෙ ප්‍රතිඵලයක් ලෙස අගෝස්තු මාසෙ පළවනදා සිට ඊයෙ වන විට ලක්ෂ දහයකට ආසන්න ආදායමක්,අපේ සැලසුම් තාම ක්‍රියාත්මකත් නොකර,අපි මැදිහත් වෙලා ඒ ආදායම සභාවට උපයලා දුන්නා.අපි සෞඛ්‍ය කමිටුව විදියටත් මේ නගර සභාව පාලනය කරන පාලක කණ්ඩායම විධියටත් දූෂකයෝ රකින්නෙ නැහැ කවදාවත් මෙතුමා ඉදිරිපත් කරපු චෝදනාවට නගරාධිපතිතුමා මැදිහත්වුනා කොමසාරිස්වරයාට අවස්ථාව දුන්නා අපිත් ඒකට මැදිහත්වුනා.දැන් තවත් චෝදනා ප්‍රමාණයක් ඉදිරිපත් වෙනවා. මේ ගැන කරුණු සැලකිල්ලට අරගෙන ඉතාම කඩිනමින් මොකද අපි නිවැරදි වෙන්න ඕනා.අපේ පාලනයට තමයි මේ චෝදනාව එල්ල කරන්න උත්සාහ කරන්නෙ.මේ එන්න හදන්නෙ දෙදාස් විසිදෙකේ සිට විසිතුන විසිහතර කාලය තුල තමයි මේ මහා නගර සභාවේ සියලු හොරකම්,වංචා,දූෂණ සියල්ල සිද්ධ වෙලා තියෙන්නෙ.ඊට පෙර මොකුත් වෙලා නැත.ඒකට තමයි මේ එන්න හදන්නෙ.ඒක නිසා නගරාධිපතිතුමනි,අපි මේ බේල් එක ආරම්භ කරපු දවසෙ ඉඳලාම හොයමු.අපි උත්සාහ කරනවා බේල් එක යථා තත්ත්වයට පත්කරමින් අලුත් ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක,අපේ කණ්ඩායම අපි ගැණුම්කරුවො රෙජිස්ටර් කරලා තියනවා.කොටේෂන් කොමසාරිස්තුමිය ලගට ඇවිල්ලා තියනවා.ඒ කොටේෂන් විධිමත් ලෙස ඒවා කැඳවලා වැඩිම ගැණුම්කරුවො වෙනුවෙන් එකතු කරලු කසල සූදානම් කරලා තියනවා.ඒවා ඉතාම විනිවිද භාවයෙන් සිද්ධ වෙනවා.ජීපීඑස් සිස්ටම් එක ඊයෙ හයි කරා.අපේ කසල සේවකයන්ට කතා කරා. අපේ විශේෂ ව්‍යාපෘති ආරම්භ කරා කසල ආදායම වැඩිකරගන්න.නියම ව්‍යාපෘතිය ආරම්භ කරලා හැම කොට්ඨාශයකටම ඒ ව්‍යාපෘතිය අපි ගෙනියනවා.අපිට සේවක ප්‍රශ්න,වාහන ප්‍රශ්න තියනවා.මේ සියල්ල අභියෝගයක් විදියට අරගෙන මේ කටයුත්ත සාර්ථක කරගන්න කරගෙන යන්න අපි සූදානම්.නැවත වතාවක් ඔබතුමාගෙන් ඉල්ලන්නෙ මේ ඉදිරිපත් කරපු චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණය කරලා නීතිය හමුවට වැරදි කරුවො කවුරු වුනත් මාලිමා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න මහා නගර සභාව සූදානම් ඒ වෙනුවෙන් ඔබතුමා මැදිහත් වෙන්න කියලා ඉල්ලීම කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී – සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි,පරිසර,සෞඛ්‍ය කමිටුවේ අංක 02(01) සම්බන්ධව ඒකෙ ඇමුණුම 01 ගලි බව්සර් සම්බන්ධ ලියවිල්ල හදපු නිලධාරීයාගේ නම,අත්සන නැහැ.නිකන් කොලයක් විතරයි.මේක සභාගත වෙන ලියවිල්ලක්.මේක කවුරුත් වගකීමක් නැහැ.මේ සම්බන්ධව අපේ අවධානය යොමු කරන්න් ඕනා.අනෙක් එක තමයි අංක 02,කසල සම්බන්ධව,සකස් කලේ අත්සන් කලේ කියලා ඉනිෂියල් දෙකක් ගහනවා. ඒ වගේම ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක මොරටුව කියලත් ඉනිෂියල් එකක් ගහනවා.මම යෝජනා කරනවා මේවා හදනකොට යටින් නම සඳහන් කරන්න කියලා.අනුමත කරලා කමිටුවට යවන්නෙ කවුද කියලා නම සඳහන් කරන්න.ඉදිරියට මේ ලියවිලි

පිළිවෙලට එවන්න.අපේ මොරටු පුරවරය පිරිසිදුව තබා ගැනීම සඳහා සෞඛ්‍ය කමිටුව ඉදිරිපත් වෙලා කාණු පද්ධතිය පිරිසිදුවට තියා ගැනීම සඳහා කලාප වශයෙන් වෙන් කරලා අපිට වැඩ සටහනක් ඉදිරිපත් කලා.මමත් ඉල්ලීමක් කරා එගොඩඋයන,දකුණ ප්‍රධාන කාණු ටික පිරිසිදු කරලා දෙන්න කියලා.එක කොටසක් නිමකරා,සෞඛ්‍ය පරීක්ෂකවරු කවුරුත් නැහැ.එයාලට දුරකථන ඇමතුම් දුන්නා දෙපාරක් කවුරුත් ආවේ නැහැ.වැඩමුළුවක ඉන්නෙ දැන් එනවා කියලා කියනවා.මම ස්තුතිවන්ත වෙනවා රංගන මන්ත්‍රීතුමාට පස්සෙන් ඉඳලා හොඳට හොයලා බැලුවා.එතුමා පහුවෙනිදාත් දුරකථන ඇමතුමක් දුන්නා මන්ත්‍රීතුමිය අද එවන්න බැහැ.මම හෙට අනිවාර්යයෙන් එවනවා කියලා.ඊට පහුවදා පාන්දර හයාමාරට කෝල් කරා අද කාණු කණ්ඩායම එවනවා කියලා.එක කොටසක් පිරිසිදු කරන්න දවස් පහක් ගතවුනා.පළවෙනි දවසෙ කාණු කණ්ඩායමේ හත් දෙනෙයි.දෙවෙනි දවසෙ තුන්දෙනයි.කපපු තණකොළ ඉවත් කරන්න කවුරුත් නැහැ.එතුමා ප්‍රයන්තයක් දැරුවා ටිපර් එකක් ඉල්ලගන්න. නමුත් බැරිවුනා.කොහොමහරි මන්ත්‍රීතුමා පොරොන්දු වුනා සිකුරාදා වෙනකොට ඉවත් කරනවා කියලා.ඒ වැඩේ කරලා තිබුනා.ඒක නිසා මම මන්ත්‍රීතුමාට ස්තුති වන්ත වෙනවා.කලාපයට වෙන්කරලා තියෙන පීඑච්අයි මහත්තුරු සහ පරිපාලක අයගෙ කාර්යභාරය මොකක්ද කියලා අපි දැනගන්න කැමතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ එච්.අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා,සුදේශ් මන්ත්‍රීතුමා කිව්වා බේල් එකේ ප්‍රගතියක් හාරලක්ෂ හතලිස්තුන්දාහක් හම්බවෙලා තියනවා. සභාවට එන ආදායම වෙන සාක්කුවකට යන්න නොදී ඒක කියපු නිසා තමයි බේල් එකට මෙහෙම ආදායමක් ඇවිල්ලා තියෙන්නේ.ගිය සතියේ ප්ලාස්ටික් ගන්න සැපයුම්කරුවො එනවා.කිලෝ හත්සිය අසූවක් කිරනවා.එක්ලක්ෂ පනස්පන්දාහයි.සැපයුම්කරුවා කියනවා මාස දෙකකට සැරයක් ඇවිල්ලා ප්ලාස්ටික් කිලෝ තුන්දාහ හාරදාහ අරගෙන යනවා.සල්ලි කොහෙටද ගියෙ කියලා ඇහුවාම හිතාගන්න බැරි උත්තර දෙන්නෙ.සුජිත් මන්ත්‍රීතුමාල කියලා කියලා හොරු අල්ලපු නිසා තමයි බේල් එකේ ආදායම වැඩිකරගන්න පුලුවන් වුනේ.විසිහතකට හතලිස් දෙකකට වෙන්කරනවානෙ තාම දහතුනක් දාහතරක් ඇවිල්ලා තියෙන්නේ.ඒ වෙන්කරද්දි අපිට පුලුවන් වෙනවා හොඳ ආදායමක් ලබාගන්න.පටිය අපිට හම්බවුනේ නිකන්.ඒකෙ කිලෝ එකේ ගාන රුපියල් තිහයි.දෙසිය තිහ තමයි හයසිය ගානට හත්සිය ගානට දැම්මෙ.එහෙම දාලා.ඒක තියෙන්නෙ ගෙදරක.ඒක තමයි නිල් පාට කාර් එකක දාගෙන ඇවිල්ලා පටිය බෙදනවා.අන්තිම වෙක් එකට කලින් වෙක් එකේ කිලෝ එක එකසිය විස්සයි.ඊලග මාසයෙ හයසිය විස්සයි.එයාම මිල තීරණය කරනවා.එයාම බඩු ගෙනල්ලා දානවා.අපි දන්නෙ නැහැ.පොහොට්ටුව ආණ්ඩුව කාලෙ පටි වලට වියදමක් කලේ නැහැ.මන්ත්‍රීතුමා කිව්වා වගේ දෙදහස් හයේ ඉඳලාම හොයන්න ඕනා.මේ වාට් එක හතලිස් දෙකක් වෙනකම් ඊලග මාසෙ ආවනම් ගොඩාක් හොඳයි කියලා හිතෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ඔබතුමන්ලාගේ පාලනය කාලෙ ආරම්භ කරපු සෞඛ්‍ය කමිටුවේ පලවෙනි දවසෙම තමයි මම ද්‍රව්‍ය ප්‍රතිසාදන මධ්‍යස්ථානයේ තියෙන මාසික මුදල් ලැබීම විස්තර ඉල්ලන්නෙ.ඊට පෙර මේ මධ්‍යස්ථානයෙන් ද්‍රව්‍ය විසිහතකට මුදල් එකතු වෙනවා.නමුත් වාර්තාවල කිසිම සඳහනක් නැහැ.ඉල්ලපු නිසා තමයි මාසයෙන් මාසයට මේ මුදල ඇවිල්ලා තියෙන්නේ දැනට ඇවිල්ලා තියෙන්නේ සීමිත ප්‍රමාණයයි.නමුත් මෙක විසිහත දක්වා යනවා.දැනට පත්වෙලා ඉන්න සෞඛ්‍ය පරීක්ෂක මහත්තයා හොඳ අධීක්ෂණයකින් මේක කරනවා. අපි කියලා තියෙන්නේ සම්පූර්ණ විස්තර දෙන්න කියලා.සෞඛ්‍ය කමිටුවේ එදා කරපු ඉල්ලීමට අපිට එවලා තියෙන්නේ මාසයකට ලැබිච්ච මුදල් විතරයි.ඒ මුදල් විතරක් අපිට ප්‍රමාණවත් මදි.කරුණාකරලා මේ සභාව විසුරුවා හැරපු දා ඉඳලා ඒ පාලනය කාලය තුල ලැබුණු සියලුම වාර්තාවන් අපිට ලබාදෙන්න කියලා ඉල්ලීමක් කරා.අපිට පොරොන්දු වුනා.ඊලග කමිටුවේදී මේ අවශ්‍ය කරුණු සිදු කරන්න කියලා.යම්කිසි ප්‍රශ්නයක් ගැටලුවක් නිරාකරණය කරන ආරම්භ කරන ඕනම මොහොතක අපිට දැනිච්ච මොහොතක අපි ඔබතුමාට කතා කරනවා.ඒකෙ ප්‍රතිචාරය අපිට නිසි ලෙස ලැබෙනවා.ඒ ප්‍රතිචාරය උඩ තමයි අපිටත් කරන්න පුලුවන් සීමාවල් ඇතුලෙ අපි මේ දේවල් කරන්නෙ.ඒ නිසා

ඔබතුමාගෙ වගකීමක් වෙනවා.අපේ සුදේශ් මන්ත්‍රීතුමා සඳහන් කරා මේ මොහොතෙදි මම කැමතියි සෞඛ්‍ය කමිටුවේ සභාපතිවරයාගෙන් යම් කිසි එකතු කිරීමක් කරගන්න.මොකද එතුමා සෞඛ්‍ය කමිටුවේ සභාපති නිසා. ඒ වගේම සෞඛ්‍යට අදාලව සේවකයො තිබෙන සෞඛ්‍ය පහසුකම් ගැන ආදෝනාවක් ඉදිරිපත් කරනවා.ඔවුන්ට වැක්සින් කරන එක ගැන,සෞඛ්‍ය පහසුකම් ලබාදෙන එක ඒවගේ ඒවා ඔවුන් ඉදිරිපත් කරනවා.අපිට දැනගන්න ලැබිලා තියනවා.රීසයිකලින් ප්‍රොජෙක්ට් එකේ සෞඛ්‍ය පහසුකම් නිසි ලෙස එන්නත්කරණය,ප්‍රතිශක්ති කරන දේවල් ඔවුන්ට ලබාදීමට සෞඛ්‍ය අංශය සමග සාකච්ජා කරලා දවසක් දාලා තිබුනා.ඒ අය කැමති වුනා.මේ නගර සභාවට ඇවිල්ලා සේවකයන් පරීක්ෂා කරලා මේ දේවල් කරන්න.මං හිතන්නේ එය එදා දවස තුල කොළඹින් පැමිණෙන නිලධාරීන්ව වැලැක්වුවා.ඒ පිළිබඳව ඔබතුමා අවධානය කරන්න ඕනා.සෞඛ්‍ය සේවකයන්ගෙ පහසුකම අපිට ලබාදීමට නොහැකි වුනේ.සේවකයන්ගේ යම් කිසි අසනීප තත්ත්වයක් රෝගී ආබාධයක් එනවා නම් සම්පූර්ණ වගකීම පැවරිලා තියෙන්නේ නගර සභාවට.සේවකයො විශාල ප්‍රමාණයක් වැඩ කරනවා.කුණු අදින සේවකයො පවා විශාල වැඩ කොටසක් නගර සභාව වෙනුවෙන් සිදු කරනවා.ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න ඕනා.තව කාරණයක තියනවා කැලි කසල එකතු කරලා වෙන වෙනම ගන්නෙ නමුත් අපි ආයතන වලින් ගන්න කැලි කසල ලබාගැනීමේදී සියලුම කැලි කසල අපි අරගෙන වෙන්කිරිමක් නොකර අපි අරගෙන නගර සභාවට එන්නෙ නැහැ.සියලුදේම සොයිසාපුර කලාපයේ තමයි බාන්නෙ.එතනින් බාල වෙන වෙනම වෙන්කරලා තමයි නගර සභාවට ගේන්නෙ.ඒක ප්‍රශ්නයකට උඩුදිවීමේ කාර්යයක් වෙනවා.කැලි කසල මෙතනට ගෙනල්ලා හරි වෙන් කරන්න පුලුවන් නම් හොදයි කියලා අපේ අදහසක් තියනවා.ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා,මෙතුමා සොයිසාපුර කලාපය සම්බන්ධ කියපු ගැටලුවක් නිවැරදි කරන්න ඕනෑ. අපි නියමු ව්‍යාපාරයක් විදියට ආරම්භ කරා සොයිසාපුර කොට්ඨාශය තුල නොදිරන කසල එකතු කරන ව්‍යාපෘතියක්.අපි නැවත මෙතනට බර දුන්නෙ නැහැ.සියලු එකතු කරපු ටික එම ස්ථානයේ අපේ සේවකයන් ලවා වෙන්කරගත්තා.මමත් පුද්ගලිකව මැදිහත් වුනා. වෙන්කරපු ටික අපි නැවත ඉරිදා දවල් මෙතනට ගෙනල්ලා බාර දුන්නා.සඳුදා අන්ලෝඩ් කරලා ඒ කටයුත්ත සිද්ධ කරනවා.වටේම එකතු කරපුවා සොයිසාපුරට ගෙනියන්නෙ නැහැ.හැම කොට්ඨාශයකම අපි ආරම්භ කරනවා.අපිට තාමත් සේවකයන්ගෙ හා වාහන වල ප්‍රශ්න තියන නිසා ගැටලුවක ඉන්නවා.ඉදිරියේදී ආදායම් ලබන්න පුලුවන් විශාල දේවල් කරන්න ඉන්නවා.මීට කලින් මේවා සභාවට ආවෙ නැහැ.විශාල ප්‍රමාණයක් අපි එකතු කරා.ප්ලාස්ටික්,කාඩ්බෝඩ්.බෝතල්,පොල්කටු කලින් මේවා සභාවට ආවෙ නැහැ.දැන් අපි වැඩපිළිවෙලක් ආරම්භ කරලා තියනවා.අනෙක් කොට්ඨාශවලත් අපි ආරම්භ කරනවා. මොරටුවේම දේවල් ගෙනිච්චෙ නැහැ.එදා දවසෙ දේවල් ටික වෙන් කරලා අපි නැවත බේල් එකට ගෙනත් දුන්නා.ඒකෙ විස්තර සියල්ල තියනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි,විශේෂයෙන් අපේ කසල,ගලි සේවය පිළිබඳව අපි දුටු පැති සහ අක්‍රමිකතා,අපි දුටු පැති සහ නොදුටු පැති ගැන කතා කරා.ගලි රථ සේවාව සඳහා පසුගිය කාලයේ අපේ ගලි රථ දෙක කැඩිලා තිබුනා.මම ඔබතුමාට කතා කරා. ඔබතුමා සත්භාවයෙන් ඒකට මැදිහත්වුනා.හැබැයි තියෙන ප්‍රශ්නය තමයි එක්දහස් අටසියෙ ගලියට සල්ලි බැන්දට පස්සෙ ගලි රථය කැඩුනොත් ඒ අවශ්‍ය පහසුකම අපි කෙසේ හෝ සැපයිය යුතුයි. අපේ පාරිභෝගිකයා.බලාපොරොත්තු වන සේවා ලාභියට.හැබැයි 2025.08.18 වෙනිදා තිලංක ප්‍රේමචන්ද්‍ර මහතා මුදල් බඳිනවා 2025.08.18 දින.හැබැයි 2025.08.24 වෙනකම් මේ සේවය ලබාදෙන්න හැකියාවක් ලැබෙන්නෙ නැහැ.ඔබතුමාට මම මතක් කරාම ඔබතුමා කිව්වා තුන්දහෙන් හරි බාගයක් ගහමු කියලා.හැබැයි ප්‍රශ්නය තමයි.ප්‍රේමචන්ද්‍ර මහතා ඔහුගේ වත්තේ ඉඩ තියෙන නිසා වලක් කපලා වැඩේ කරගත්තා.ඔහු කියන විදියට අපේ සේවය සපයන්න බැරිවුනාම.ප්‍රයිවට් අංශයේ තියෙන ගලියක් ඔයාලගෙ ගෙදර වැඩක් තියනවා නේද නගර සභාවේ මෙච්චරයි. ලීටර් එක්දහස් අටසියෙ එක රුපියල් දහදාහයි අපේ.ලීටර් තුන්දාහෙ එක රුපියල් පහලොස්දහයි වැඩේ කරගන්න කැමතිද කියලා.එහෙනම් නගරාධිපතිතුමනි, අපෙන් සේවය ලබාගන්න බැරි සේවා

ලාභියෙක්ගෙන් මේ වැඩේ කරගන්න බැරිවුනා කියලා කොහොමද එහෙනම් පෞද්ගලික ගලි රථ සේවයෙන් මේක දන්නෙ.ප්‍රශ්නයක් නගරාධිපතිතුමනි,එහෙනම් මෙතන මොනවාහරි හිල් තියනවා.ඒ හිල් වහන්න ෆිල්ටර්ස් ඕනා.ඒ නිසා අපේ සේවය හරියට සිද්ධ කරන්න බැරි ගලි රථවල කාලය ඉක්මවෙලාද ඵලදායී ජීව කාලය අඩුයිද,කොහොමද නැවත මෙය ලබාගන්නෙ සමහරක් වෙලාවට යම් කෙනෙක්ගෙ අවශ්‍යතාවයක් තියෙන්න පුලුවන් අපේ තියන නගර සභාවේ සේවය අකර්මන්‍යකරලා වෙන ආකාරයකින් මෙය ව්‍යාප්ත කරන්න ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරනවා අපේ මේ කටයුත්ත වඩා විධිමත් විදියට කරන්න අපට රථවල අවශ්‍යතාවයක් තියනවා,අලුත් පහසුකම් පිළිබඳ අවශ්‍යතාවයක් තියනවා. ඒ පිළිබඳව හොයලා බලලා කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි,ඊලගට සභාවේ මතුවෙච්ච ප්‍රශ්නය අපේ නගර සභාවේ තියන කසල කළමනාකරණ මධ්‍යස්ථානය.එහෙම නැත්නම් ජපානයේ මම හැමදාම කියන කම්කස්සු නගරයේ හතලිස් එකට වර්ග කරන එක විතරක් නෙමෙයි.ඒවායෙන් එන මුදල් විතරක් නෙමෙයි ඒ යෝජනා කරන කාලමෙ මම සභාවට කිව්වා හරියට මේක කරොත් එහෙම විශාල ආදායමක් ලබන්න පුලුවන් කියලා.ඒ අනුව තමයි එදා අපි එල්ටීපී ගත්තත් වර්ග කීපයකට වර්ග කරන විදිය මම එදා කිව්වෙ එස්ටීපී ගත්තොත් වර්ග කීපයකට වර්ග වෙන විදිය මම කිව්වෙ.පීවීසී ගත්තත් එහෙමයි.එතකොට මෙහෙම වටිනාකම් තියනවා.ඒ පෙට් බෝතලය ගත්තට පස්සෙ යාන් එක හදන තැන මීට වඩා වැඩි මුදලකින් ගත්තෙ.ඒ නිසා මේකෙ ආදායම දෙගුණයක් නෙමෙයි කොමසාරිස්තුමාට ඉස්සෙල්ලා ස්තූතිවන්ත වුනේ ඒකයි.එක්ලක්ෂ දාහත්දාහකට තිබුනු ආදායම ඉතා කෙටි කාලයකදී වර්ධනය කරන්න ඔබතුමිය යම් මැදිහත්වීමක් කරා.නිෂ්පාදකයාගේ විස්තීර වගකීම කියන කොටස අනුව නිෂ්පාදකයින් ඩේටා වලට ගෙවන ප්‍රමාණය අපි විකුණන මේ .. වලට වඩා වැඩියි.මම එදා හිටපු සීපීඑච්.මහත්තයාගෙන් මේ ප්‍රශ්නය කරනකොට එතුමා මාත් එක්ක සෞඛ්‍ය කමිටුවට පැමිණිලා කිව්වා එහෙනම් ඔබතුමා ඒවා ගැන දන්නවා.මම ඒකෙන් අයින්ට වෙනවා ඕන කෙනෙකුට දෙන්න කියලා.ඒ අනුව ඒකෙ ප්‍රතිඵලයක් විදියට එතුමා ඒකෙන් අයින්ටවුනා.ඊට පස්සෙ තමයි ප්‍රතිසාධන මධ්‍යස්ථානයේ විජේසිරිවර්ධන මහතා පත්වෙන්නෙ.ගරු නගරාධිපතිතුමනි,මේ විකුණන මුදල වගේ තුන් හතර ගුණයක් මේකෙ ඩේටා ටික ඒ නිෂ්පාදකයාගේ විස්තීර වගකීම යටතේ ඒ ආයතන වලින් මිලට ගන්නවා හැබැයි ඒක අපේ නගර සභාවට ලැබෙනවාද නැහැ.ඒ ඩේටා ටික කලෙක් කරන්නෙ වෙනම ආයතනයක්.ඒ ආයතනය ඩේටා ටික තමන්ගේ රිසෝස්වලට අරගෙන රිසෝස් එකේ තියෙන එකක් විදියට තමයි ටොන් ගානක් ලැබුනා එල්ටීපී මෙච්චරයි පීවීපී මෙච්චරයි කියලා වෙන්කරලා බිල් ටික දෙනවා.විශේෂයෙන් පෙට් වලට තමයි මේක තියෙන්නේ.ඒ නිසා අපිට අද ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය පහකට හයකට එදා නැවත වතාවක් මේ නගර සභාවට අවස්ථාව තිබුනා.මං එදා සෞඛ්‍ය කමිටුවේදී මතක් කරා මොකද ඒ විෂය පථය ගැන මම දන්න නිසා.ඒ නිසා තමයි දිගුවක් විදියට හැමදෙනාටම දැනුම දෙන්න ඕන නිසා.නගර සභාවේ සේවකයන්ට මුලින්ම එන් වී කිව් පාඨමාලාව යටතේ ලබාදෙන්න ඕනා කියලා හයහත්දෙනෙක්ම යොමු කලේ.හැබැයි මේකෙ සමහරු කැමතිවුනේ නැහැ.සමහරු යටමඩි ගහලා හිත් කොන් කොන් වල තියාගෙන මේකෙන් මම හම්බකරගන්න ඕනා කියාලා මානසිකත්වයෙන් මිනිසුන් කැමති නැහැ මේ මිනිස්සු එන්වීකිව් එකෙන් මේක උපයාගන්නවාට,අනෙක් පීඑච්අයි දැනගන්නවට ඒ නිසා නගරාධිපතිතුමනි මේ ඩේටා කලෙක්ෂන් එකෙනුත් මීට වඩා විශාල ප්‍රමාණයක් මේ නගර සභාවට අයිති වෙනවා වෙන අයෙක්ට මේක යනවා කියන එක බොහොම පැහැදිලියි.ඒ නිසා මේකට යම් මැදිහත්වීමක් කරලා අපි කරන්න කැමැතියි.අපි සෞඛ්‍ය කමිටුවේ විදියට මේවට සහභාගී වන විට යම් යම් කාරණාවලදී යම් යම් ඉන්ෆෙක්ෂන් වලදී අපිවත් දැනුවත් කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.ඊලග ප්‍රශ්නය තමයි මේ ආයතන වලින් වානිජ කසල බැහැර කරනකොට ඒකෙ ක්‍රමවේදය කොහොමද සෞඛ්‍ය පරිපාලකගෙන් ප්‍රධාන සෞඛ්‍ය පරිපාලකට ගිහිල්ලා යන්නෙ නැත්නම් යම් විදියකින් පරිපාලක විතරක් මේක නඩත්තු කරන්න ගියොත් ඔහු කියනවා තාම බ්ලොක් එක කඩලා ඉවර නැහැ. බිලොක් එක බ්ලොක් වෙච්ච අවස්ථාවේම ඉවරයි. හාර්ට් එකෙත් එච්චර බ්ලොක් නැහැ.නගර සභාවේ ආදායම බ්ලොක් කරන මිනිස්සු ඉන්නවා.ඒ බ්ලොක් කරන මිනිස්සු නගර සභාවට ආදායම අහිමි කරන්නෙ විශාල ප්‍රමාණයෙන්.ඒ නිසා සියුම් සියුම් ස්මාර්ට් ගේම් වලට

වැඩ බදින්න ඕනා. ඒ නිසා නගරාධිපතිතුමනි, මේ සඳහා අවශ්‍ය පියවර ගනියි කියලා හිතනවා.සද්භාවයෙන් යුතුව කරන කටයුතු වලට අපි උදව් කරනවා වගේම අපි කැමතියි මේ නගර සභාව දියුණු මට්ටමට යන්න.ඒකෙ පාලකයා කවුද කියලා නෙමෙයි.කවුද කියන එක නෙමෙයි අපිට වැදගත් වෙන්නෙ මොකක්ද කියන එක.මොකක්ද කියන වැඩේ නිවැරදිව කරන්න අපි කැප වෙලා තියනවා.ඒ තමයි මහජන මතයට අපි ගරු කරන්න ඕනා. එහෙම නැත්නම් වර්ග කිලෝමීටර් විසිතුනයි දශම හතරක ඉන්න ඒ ආදරණීය මිනිස්සුන්ගෙ සද්භාවයෙන් වැඩ කරන සේවකයො සියයට හැත්තපහක් විතර මේකෙ ඉන්නවා.ඒ සියයට හැත්තපහටම මේ ලේබල් එක වදිනවා නරක සේවකයන් දෙන්නෙක් තුන්දෙනෙක් නිසා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි අපි ඒ සේවකයන්ට පහසුකම් සපයනවා වගේම වැඩ කරන නිලධාරීන්ට ගෞරවය පුදකරන්න ඕනා.ඒ වගේම ස්මාර්ට් ගේම් ගහන ස්මාර්ට් බ්ලොක් කරන කැත මිනිස්සුන්ගෙ කැත වැඩ වලට අපි නැවතීමේ තිත තියන්න ඕන කියන යෝජනාව මම කමිටුවට ඉදිරිපත් කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි,තව කමිටු පහක් තියනවා.මම හිතන්නෙ ඔබ කියන දේවල් අහක දැමිය යුතු දේවල් නොවෙයි.අපි කාගෙත් වගකීම තමයි සභාවේ කාලය කළමනාකරණය කරගැනීමකට ලක් කර ගැනීම.ඔබ ඉදිරිපත් කරන කරුණු වලට උත්තර දෙන්න උදේ වෙනකම් පුලුවන්.ඔබ එකගනම් ඉන්න.අපිට වැදගත් වෙන්නෙ මහා සද්දෙන් ප්‍රකාශන ගොඩක් මුදාහරින්න නෙමෙයි.ක්‍රියා මාර්ග වලට අවතීර්ත වෙන්න.මහා කාලයක් ඔබ අරගෙන කියපු දේ මම වචන දෙකෙන් විනාඩි පහෙන් කියන්නම් කොමසාරිස්තුමියට. ප්‍රකාශයක් ආවා නගරාධිපතිවරයාගේ ලේකම් කාර්යාලය වදකාගාරයක් කියලා.කරුණාකරලා මට ඉතාම ඉක්මණින් මාගේ කාර්යාලය ඇතුලේ මගේ බලය පාවිච්චි කරලා මගේ කවුරුහරි ලේකම්වරයෙක් ගෙන්නලා ප්‍රශ්න කිරීමකට ලක්කොට තිබෙනවානම් එහි සත්‍ය අසත්‍යතාවය ඉතාම ඉක්මණින් කියන්න ඔබදෙන පරක්කුවට මම මගේ ක්‍රියාමාර්ග ගන්නවා.පැරණි පාලනය නෙමෙයි මේ.පැරණි පාලනය තුල සිද්ධ වෙච්ච දේවල් කියන්න යන්නෙ නැහැ එතකොට හිතනවා මම දැන් මතුවෙන දේවල් යටගහන්න උත්සාහ කරන්නෙ කියලා.බොරු මිල ගණන් ආවෙ ඕවට නෙමෙයි.විදේශ රටවල් වලට යන ගුවන් ටිකට්පත් වලටත් හොර මිල ගණන් ආවා.කොමසාරිස්තුමියනි, මට ඕක කරලා දෙන්න.ඊලගට එතුමා කියන ඔය ආයතනය,යාලුයි අපි යාලුයි කිය කිය කරට අතදාගෙන හිටපු අය.එකට එකපතේ කාපු අය.අපි කිසි කෙනෙක් රකින්නෙ නැහැ.චෝදනාව ආව පළමුවන පැයේ හැකි වේගයෙන් මට ඉදිරිපත් වෙනකොට හවස පහට විතර ඇති හයට අත්සන් කරා.ඒ නිසා කිසිවෙක් කිසි සැකයක් තියාගන්න එපා.ජීවිත කාලයක දුක් විදලා ආපු ගමනක ප්‍රතිඵලය මේ.වාසනාව නෙමෙයි.මම පිළිගන්නෙ නැහැ ඒක.මේ ඉවසීම,අරමුණකට ගමන් කිරීම යන ගුණයන්ගෙන් තමයි මේ තනතුරට ආවෙ.ඒ හින්දා කාගෙන්වත් තඹ සතයක් වංචා කරා කියලා අහලා මෙතනින් යන්න මම කටයුතු කරන්නෙ නැහැ.මේ ආයතනය කොහොම ආයතනයක්ද කියලා ඔබ දන්නවා.එක්කෙනෙක්ගෙ දෙන්නෙක්ගෙ හොරකම් වංචා නෙමෙයි මේක පිළිකාවක් වගේ.හැම පැත්තෙන්ම හොරකම් දූෂණ සිදුවෙනවා.ඒ නිසා දැන් ටිකෙන් ටික ටිකන් ටික මේවා වලක්වාගෙන යන ගමනක්.හැබැයි මම දන්නෙ නැහැ සමහර මන්ත්‍රීවරුන්ට පුලුවන්කම තියනවා  නිලධාරියාව තමන් ඉන්න කාමරයට ගෙනල්ලා ප්‍රශ්න කරන්න.එහෙමත් වෙනවා.ඔය මතුකරපු ප්‍රශ්නයට අදාල කම්පැනිය අයිති කියන දිමුතුගෙ ගෙදරට යවලා තියෙන්නෙ මම කැමතියි.කිසි දෙගිඩියාවක් නැහැ.අපේ පාලනය තුල ඉක්මණින් මේ කටයුතු සිද්ධ වෙනවා.මම ඒකයි කිව්වෙ.විපක්ෂයෙ සමහරු මන්ත්‍රීවරු කරන දේවල් වලට මම එකඟයි.කේන්තියත් හිත ඇතුලෙ තියනවා.හැබැයි තිබුනට මම ඔවුන්ට අවස්ථාව දෙනවා මොකද මේ ආයතනය ශක්තිමත් කරන්න ඕනා.මේ ආයතනයේ හැම දෙනාටම චකිතයක් වෙන්න ඕනා.අපි කරන වැඩ හොයනවා.හැබැයි මම කියන්නෙ ඒ මන්ත්‍රීවරුන්ට සීමා කරන්න.නිලධාරියෙක් පුටුවෙ නැති වුනාම පුටුව ෆොටෝ ගහලා ෆේස් බුක් එකේ දාන්න එපා.නිලධාරියා ඇයි නැත්තේ කියලා හොයලා බලන්න.

කොමසාරිස්තුමිය,මේ ආයතනයේ මෙතෙක් කරපු ගණුදෙනු වහාම ඔඩිට් එකට දාලා පරීක්ෂණයක් කරන්න.මගේ කාමරයට ගෙනල්ලා ප්‍රශ්න කරලා කාටහරි වද වේදනා වෙන විදයෙ කවුරුහරි හැසුරුනානම් කරුණාකරලා කියන්න.මගේ ලගට එන බාහිර කෙනෙක්ටවත් ඔබ ඇතුලු මේ

ආයතනයේ කිසි කෙනෙක්ගෙවත් හිත් රිදවලා නැහැ.සේවකයො දෙන්නෙක් නැත්නම් තුන්දෙනෙකුට හිත් රිදවන්න ඇති මොකද ඔවුන් කරපු වැරදි නිසා හැබැයි කිසි කෙනෙක්ගෙ හිත් රිදවෙන්න කතා කරලා නැහැ.විශාල ප්‍රශ්න කන්දරාවක් අරගෙන කේන්තියෙන් එන මනුස්සයාව මම සමනය කරලා යවනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමා,ඔබතුමාගේ ඒ තීන්දුව සම්බන්ධයෙන් අපේ ගෞරවය පිරිනමනවා.මොකද හේතුව නගරාධිපතිවරයා හැටියට ඔබතුමා ගත්ත තීන්දුවට අපි ගෞරව කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා ඔබ කියන නිසාම නෙවෙයි.ඔබ කියන එකෙත් මට වාසියක් තියනවා.හැබැයි එහෙම තමයි ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙක් ලෙස ඉස්සරහට මේ ගමන ආවෙ.ඒකෙ දෙගිඩියාවක් තියාගන්න එපා.කොතනකින් හරි මේ ආයතනය නිවැරදි වෙන්න ඕනා.ගහ හැකි යුතු ක්‍රියාමාර්ග ගන්න උදව් කරන්න.කමක් නැහැ ගැටෙන්න,ගහන්න.අවශ්‍ය කටයුතු ටික කරනවා.ඔය කිසිවෙක් මම තෝරාගත් අය නෙවෙයි.ඔබ දන්නවා ඒ කටයුතු කරද්දි මේ ආයතනයේ දන්න කරන අය ඕනනෙ.මේ ආයතනයේ විශ්වාසයි කියල හිතිච්ච තුන්දෙනෙකුගෙන් විමසීම් කරා.තුන්දෙනාම එකඟ වුනේ නැහැ.ඒගොල්ලො තල්ලු වෙච්ච තැන.හැබැයි ඇය හොඳින් වැඩේ කරා.අදත් මම කියනවා මගේ අදාල ඩියුටිය හොඳින් කරනවා.හැබැයි කොච්චර හොඳින් කරත් මට වැඩක් නැහැ.අරවගේ වැඩ කවුරුවුනත් සී පී එච් අයි කියන්නෙ මට ඇත්තටම ඡන්දයට පෙර උදව් කරපු කෙනා.හැබැයි චෝදනාව ආව පළවන පැයේ,එහෙම තමයි මගේ දේශපාලනය.මම ආවෙ ජනතාව වෙනුවෙන් යම් කිසි දෙයක් කරන්න මිස පුද්ගලයන්ගෙ මූණු බලලා පාට බලලා එහෙම වැඩ කරන්න නොවෙයි.ඒ නිසා මට ඉක්මණටම කටයුතු ටික කරන්න.මේ සභාවට වගකීමෙන් කියනවා ඕනෑම වැරදි වැඩක් කරන,හැබැයි සේවකයො ගොඩක් වැරදි වැඩ කරනවා.ඒ වැරදි වැඩ පස්සෙ පන්නගෙනම යන්න බැහැ.ඔවුන් දැන් සැලකිය යුතු ලෙස යම් වෙනසකට භාජන වෙමින් ඉන්නවා.මහජනතාවගෙ මුදල් වංචාකරන යමෙක් සිටීනම්,ඒ වගේම සේවකයන්ට ඉතාම නරකවිදියට ගහන යමෙක් සිටීනම් ඒවා වහාම වෙනස් කරන්න මැදිහත් වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>
ගරු නගරාධිපතිතුමනි,අපි මුලින්ම කිව්වා කමිටුව තමුන්නාන්සේ නිවැරදි වුනානම් අපි ඒකට ඡන්දය පාවිච්චි කරන එක කිසිම පැකිලීමකින් තොරව කරනවා.ඒ නිසා මෙතනදී මහජනතාව වෙනුවෙන් ස්ථානයේ රැදී ඉදලා කමිටුව නියෝජනය කරලා අඩුපාඩු පෙන්නලාදීම අපේ යුතුකමක් වගකීමක්.කමිටුවට විරුද්ධ වෙන්නෙ කමිටුව පත්කිරීමේදී ඇතිවෙච්ච ගැටලුකාරී තත්ත්වයක් මිසක් වෙන කිසිම හේතුවක් නිසා කියන එක මතක් කරනවා.

**2025.08.20 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |

12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2025.08.20 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
16. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
18. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය

**2025.08.20 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභාවේ නොසිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
4. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා)

**06(5) 2025.08.20 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**2025.08.20 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
